නාහුය සම්‍යක්සම්බුදුවරයෝවනාහි කප්ලක්ෂයක් අධිකවූ සාරා
සංඛ්‍යය අටාසංඛ්‍යය සොළසා සංඛ්‍යය යනකාලපරිඡේද තුණ
කින්ම බොධිසම්භාරයන්ගේ මිහිකිරීමට පැමිණෙන්නාහුය මෙසේ
බොධිසම්භාර සම්භරණයෙන් ප්‍රත්‍යෙකබුඩ ශ්‍රාවකබුඩයන්ටවඩා
සඵයක් සම්බුදුවුවරයන්ගේ බොධිසම්භාර සම්භරණයාගේ අධිකබව
කාලපය්‍යන්නවශයෙන් අධිකබවනම්වන්නේහි ආකාර පය්‍යන්නා
වශයන් කෙසේ අධිකවන්නේදයන් ? ප්‍රත්‍යෙක බොධිසත්ව
ශ්‍රාවකබොධිසත්වයෝ වනාහි පාරමිපරිත්‍යාග චය්‍යාවන් එක දෙග
කින්ම සම්පූණිඤකාට ඒ ඒ බොධියට පැමිණෙන්නාහුය ශ්‍රීමහාබොධි
සත්වයෝවනාහි ත්‍රිවිධවය්‍යාවය පවමහාපරිත්‍යාගය දසපාරමිතාය
සමත්‍රිංශත්පාරමිතාවෝය යනාදි ගුණධර්මයෝ නිරවශෙෂවශයන්
නැවත නැවත එක එක ගුණධර්මය දහසක් ක්‍රමයෙන් ලක්ෂයක්
ක්‍රමයෙන් සම්පූණිඤකාටම සම්‍යක් සම්බොධිසමධිගමයකරන්නා
හුය මෙසේ බොධිසම්භාර සම්භරණ ආකාරයෙන්ද ප්‍රත්‍යෙක බොධි
සත්ව ශ්‍රාවක බොධසත්වයන්කෙරෙන් ශ්‍රීමහාබොධිසත්වයෝම අති
ශයින් අධිකවන්නාහුය අධ්‍යාශය පය්‍යන්නවශයෙන් කෙසේ අධික
වේද්දයත් ? පසේබුදුවරයෝ වනාහි තමන්වහන්සේලාම සවඥඥ
ඥානයන් සත්‍යාවබොධයකිරීමට අදහස්කරන්නාහුවනි ශ්‍රාවක
යන්වහන්සේලා මෙරමාගේ අවවාදය අසා පරතොඝොෂ ප්‍රත්‍යය
න්ම සත්‍යාවබොධයකිරීමට අදහස්කරන්නාහුය සඵයක් සම්බුදු

වරයෝ වනාහි අසදෘශවූ සර්ව්‍වඥතාඥානාවබෝධයකොට සංසාරශාශ්වතයෙහි නිමග්නවූ අනන්තසත්ව ප්‍රජාව සංසාරඝෝරයෙන් එතර කොට නිර්වාණමහාභූමියෙහි මහණඟැරලීමට අදහස්කරන්නාහුවෙති එසින් වදාළහ—බුද්ධවංශපාලියෙහි,

"කිංමේ එකෙන නිබ්බුතෙන පරිසෙන ථාමදස්සිනා
සබ්බඤ්ඤුතං පාපුණිත්වා සන්තාරෙස්සං සදෙවකං"යි

මෙසේ ප්‍රත්‍යක්ෂ බුද්ධ ශ්‍රාවකබුද්ධයන්කෙරෙන් සම්‍යක් සම්බුදු වරයෝම අධ්‍යාශය පර්‍යන්තවශයෙන්ද අධිකවන්නාහුමැයි සවභාව පර්‍යන්තවශයන් කෙසේ අධිකවන්නාහුදයත් ? යට දක්වනලද ත්‍රිවිධපර්‍යන්තධර්මයන්ගේවශයෙන් ප්‍රත්‍යක්ෂබුද්ධ ශ්‍රාවක බුද්ධයන්ගේ කුශලධර්මසංඛ්‍යාත සවභාවධර්මයන්ට වඩා ලෝකාධිපතිවූ බුදුවරයන්ගේම පාරමී කුශලධර්මය අතිශයින් අධිකවන්නේමය මෙසේ සම්‍යක් සම්බුදුවරයෝ සවභාවපර්‍යන්තවශයෙන්ද ප්‍රත්‍යක්ෂ බුද්ධ ශ්‍රාවකබුද්ධයන්වඩා අතිශයින් අධිකවන්නාහුමැති මෙසේ සම්‍යක් සම්බුදුරජාණන්වහන්සේ පිරූ පාරමිතාවන්ගේ ආදිය මේය අවශානය මේයයි කියා මහා බුදුවරයන්ගේ ගුණානුවණ මෙපමණය රැස්කළාවූ කුසලධර්ම මෙපමණයයි කියාගහෝ මදලඝ්‍ය සතළිස්දහ සක් මයාදුන් බොල්පෘථිවිය හා සත්කුළුපවී මහමෙරආදි සකලලෝ කධාතුව ඉතා සිහින්වනසේ සුණුකොට උන්වහන්සේගේ ගුණරාශීන් එකිනෙකට එකිනෙක ධූලිමාත්‍රණුවකැහින් නැබූසේද ලෝකධාතුව මහවිසනපමණමුත් උන්වහන්සේගේ ගුණධර්ම මහා රැස්කළාවූ කුශ ලධර්ම සමූහය මහා නොමහවෙන්නේමැයි උන්වහන්සේගේ ගුණරා ශිය මහා පිරූ පාරමී කුසලධර්මරාශිය මහා සිතන්නවුන්ටපවා මහත් භය උපදින්නේය මහත්සංවේග උපදින්නේය මෙසේ සම්‍යක් සම්බු දුවරයෝ වනාහි කාලපර්‍යන්තය ප්‍රහාණසම්පත්තිය ඝන මදයාකා රයෙන් සම්පූර්ණවිමෙන්ම සම්‍යක්සම්බෝධිය සාක්ෂාත්කළබැවින් බුදුවරයන්ගේ පහළවීම අතිශයින් දුර්ලභවීමය එමහයින් බුදුවරයන් පහළවන්නාවූ සාරමණ්ඩාදි සඟපත්කල්පයෝම ඉතා සවල්පවෙති බුදුවරයන් පහළනොවන්නාවූ ශූන්‍යකල්පයෝ අතිශයින් බොහෝවෙත්මය ඊට උදාහරණ මෙහෙස්දහයුතුයි

අපගේ ශ්‍රී මහාබෝධි සත්ත්වයන්වහන්සේ සුමේධතාපසව ඉපිද නියත විවරණශ්‍රීලැබූ සාරමණ්ඩනම් කල්පයෙහි තණ්හංකරය මේධංකරය සරණංකරය දීපංකරයයි සතරබුදුනෙනෙකුන් ලොවපහළවූහ ඊට අනතුරුවූ බුද්ධාන්තර අසංඛ්‍යයෙහි එක්බුදුහක

ඉණඤුන් පහළහුවුබැවින් ශූණ්‍ය අසංඛ්‍යයක්වීය ඒ ශූණ්‍ය අසංඛ්‍ය යට අනතුරුවූ සාරකල්පයෙහි කොණ්ඩඤ්ඤනම්වූ එක් බුදුකෙ නෙක්ම පහළවීය ඊට අනතුරුවූ සාරමණ්ඩනම් කල්පයෙහි මහලය සුමනය රෙවතය සොභිතය යන සතරබුදුකෙනෙකුන් පහළවූහ ඊට අනතුරුවද එක් බුදුකෙනෙකුන් පහළහුවූ ශූණ්‍ය අසංඛ්‍යයික් වීය ඊට අනතුරුවූ වරකල්පයෙහි අනවමදර්ශිය පදුමය නාරදය යන තුන්බුදුකෙණෙකුන් පහළවූහ ඊට අනතුරුවද ශූණ්‍ය අසංඛ්‍ය යක් ඉක්මගාස් මේ මහාභද්‍රකල්පයෙන් කල්පලක්‍ෂයට ඔබ්බෙයිවූ සාරකල්පයෙහි පියුමතුරුතම් එක් බුදුකෙනෙක් පහළවිය මෙසේ සාරාසංඛ්‍යයතුළ තෙලස් බුදුකෙනෙක් පහළවූහ එයින් කීහ අර්‍ය ශාලිණිඅටුවාමගෙහි.

"ඉතෝ කපපසතසහස්සාධිකානං චතුන්නං අසංඛෙය්‍යානං මත්ථකෙ දීපංකරොනාම සත්ථා උදපාදි දීපංකරස්ස භගවතෝ අපරභාගෙ එකං අසංඛෙය්‍යං අතික්කම්ත්වා කොණ්ඩඤ්ඤෝ නාම සත්ථා උදපාදි තස්ස අපරභාගෙ එකං අසංඛෙය්‍යං අතික්කම්ත්වා එකස්මිංයෙව කපපෙ චත්තාරෝ බුද්ධා නිබ්බත්තිංසු මඟලා සුමනොරෙවතා සොභිතෝ නස්ස අපරභාගෙ එකංඅසංඛෙය්‍යං අතික්කම්ත්වා එකස්මිං කපපෙ තයොබුද්ධා නිබ්බත්තිංසු අනොමදස්සී පදුමෝ නාරදෝ නාරද බ්‍රහ්මසපන අපරභාගෙ එකංඅසංඛෙය්‍යං අතික්කම්ත්වා ඉතෝ සතසහස්සකපපමත්ථකෙ එකස්මිංකපෙපෙ එකොව පදුමුත්තරෝ බුද්ධානාම උදපාදි,,යි මෙසේ සාරාසංඛ්‍යය මුළුල්ලෙහි තෙලස් බුදුකෙණෙක්ම ලොවපහළවූහයි දතයුතුයි අපගේ ශාස්තෘ ණන්වහන්සේගේ පහළවීමට මතුකප්ලක්‍ෂයක් අධිකවූ සාරාසංඛ්‍යය මුළුල්ලෙහි පහළවූ සිඟළු බුදුවරයෝ අටවිසිනමක්යයිද සමහරතැ නක ආයේය මෙසේ බුදුවරයන් පහළවන්නාවූ කල්පයාගේ අභිශය දුර්ලභතාවය දතයුතුයි. කල්පකොටි සතසහස්‍රයක් හවගෙණ විනා ශවුවාහුද එක් බුදුකෙනෙකුන්ගේ පහළවීම අනිසයින් දුර්ලභවන් නේයි මෙසේ බුදුවරයන් පහළවන්නාවූ සාරකල්පයක් කල්පකොටි සතසහස්‍රයකිහුත් නොලැබෙන බැවින් ඒ අනන්තාපරිමාණ ශූණ්‍ය අසංඛ්‍යකල්පය සරණගමනකුසලයට ක්ෂෙත්‍රනොවන බැවින් සිඟළු කුශල ධර්ම්යන්ට වඩා මේ සරණගමන කුශලයම දුර්ලභයෙහුත් අති ශයින් දුර්ලභයයි දතයුතුයි.

මෙසේ බුදුවරයන් පහළවන්නාවූ සාරකල්පයක් ලැබුණේද ලොකයෙහි මනුෂ්‍යයන්ගේ ආයුෂ උත්තරාෂ්ටවශයෙන් අවිරුදු ලක්‍ෂ

යම් අධික කාලයෙක හෝ යවත්පිරිසසින් සියක්අවිරුද්දකට උනු ආයුෂඇතතාවූ කාලයෙක හෝ බුදුවරයෝ පහළනොවන බැවින් කල්පයක්හුගේ දීඝීතාවය හා බුදුවරයන්ගේ පහළවීමෙන් රත්නතුය ලොවපවත්නාකාලයද ප්‍රමාණනොව බලාගකල්හි නිස්සැයකින් ප්‍රමාණකරණලද තුන්යම්රාත්‍රීයෙක විදුලියක් පවත්නා එකම විනාඩියක් පමණ කාලය බුඩොත්පාදකාලයයි කියයුතුවේ.

මෙසේ බුඩොත්පාදය ඉතා සවල්පකාලිකවූසේද පසුඉගතින් අතුරන් අසංඥතල අරූපතල වර්ජිතකොට ඇත්තාවූ දෙවගතියද මනුෂ්‍යගතියද පාරමීඛම්‍යයන් පූරන්නාවූ මහාබොධි සත්වාදිහු නාග ගරුඩ භස්තිසිංහාදි ගතිගෙහි උපන්කලද රත්නතුය ලොකයෙහි ප්‍රකටව ඇතිකාලයද තෛයථිනිත ශ්‍රී සද්ධම්දෙශනාව මොනවට ශ්‍රවණයකළ හැකිබවද යොනි සොමනස්කාරයෙන් යුක්තව සුදුසු ප්‍රතිපත්තිගෙහි පිහිටීමද යන මෙතෙක් හෙතුසම්පන්නීන්ගේ සම්පූර්ණීභාව ඇතිකල්හිම සකල ලෞකික කුශලධම්යන්ගේ අභිවෘඩියට මූලහෙතුකුත උපනිශ්‍රයවූ ලොකුත්තරමාගී කුශල ඵලනිර්වාණ සංඛ්‍යාත එකාන්තසුඛයන්ගේ ඇතුල්වීම්ව මහාවාරයක් නෑ මුඛයක් වැනිවූ ලෞකික සරණගමන කුශලවිභඟය ලබන්නාහුය යමඑහෙතුන්ගේ අපරිපූර්ණභාවය ඇතිකල්හි නොලැබෙන්නේමය.

එසේහෙයින් වර්තමානකාලයෙහි ප්‍රඥාසම්පන්න සාධුසත්පුරුෂයන් විසින් මෙහි දක්වනලද දුකසේ ලැබියහුතු දුර්ලභකාරණයන් මෙනෙහිකොට දුර්ලභවූ බුඩොත්පාදයෙහි යළොකන දුර්ලභසම්පත්හි හෙතුන්ගේ එක්රැස්වීම පූජාපූජා පවිත්‍ර කුසලකර්මඵලයන්ය ලැබිය යුතුබව සලකා දුකසේ ලැබුවාවූ රත්නත්‍රය සරණපරායනව අජාසත් රජුමෙන් යමෙක් නතාපයාගේ හිසයිදලීයි කඩුවනෙණ ශ්‍රීවයෙහි තැබුවේනමුදු ජීවිතාන්තය මුළුල්ලෙහි සක්ඛිත්ති රජකුමරුවකු කුසින් දරාගණ සිරිනාමවෙක් හම්මේ ඒ කුමරු ආරක්ෂාකරන්නන් මෙද එපරිද්දෙන් මහාප්‍රාඥයන් සරණගිය රැක්කයුත්තේයි.

සරණගමනයාගේ දුර්ලභතාවය යි 21.

සරණ සමාදන්වන ක්‍රමය කෙසේදයන් ?

22 සරණ සමාදන්වන්නහු විසින් උතුරුසළුව එකාංශ කොට පෙරවගෙණ උත්කුටිකාශනයෙන්හිඳ ඇඳිලිබැඳගෙණ යටපොත ක්‍රමයෙන් පළමුවනාට තුණුරුවන් ගුණසලනා බුදුන් කමා කරවාගතයුතුක්‍රමය මෙසේයි. මින්මතු දක්වන සිංහල පාඨය සියළු දෙනා විසින් වාචාද්ගතකොට ගෙණ බුදුන් වැඳිමි සරණගැණිමි පන්සිල් අවසිල් දසසිල් සමාදන්වීමි දන්දීමි ආදි සියළු පුණ්‍යක්‍රියා වන්හිම සියළුදෙනාව ඇසෙන පරිද්දෙන් උස්වූහඬින් කියා ඒ ක්‍රියා පැවැත්වීමෙන් අසන්නවුන්ට පවා බුබුළඹණ ප්‍රීති ඉපදීමෙන් සරණ ගමන සංඛ්‍යාත දිසිජුකමී පුණ්‍යක්‍රියාව සුඛුණය හා සැපයුතුව යහිර වශයෙන් පිහිටයි.

"ඔකාස ඔකාස ඔකාස අවිඤ්ඤෙය්‍ය අවිඤ්ඤෙය්‍ය අපපමෙය්‍ය අපපමෙය්‍ය අනන්තගුණ සමුහයෙන් පරිපූර්ණවූ භාග්‍යවතුන් වහන්ස අරහං ආදිකොට භගවා අනන්තකාලඇති නවපෙදෙහි සහනීත ගුණගණාභරණයෙන් සම්ලංකෘතවූ සොභාගතිඇත්තාවූ තථාගතයන්වහන්ස පූර්වනිමාසානුස්සතිඤාණ දිව්‍යඇස් චක්ඛුරභිඥාන ආශ්‍රවක්ෂයකර ඤාණාදි ත්‍රිවිද්‍යාපසළාස් චරණධර්මයන් නිරවශෙෂයන් අවබෝධකර දැළුවූ සම්‍යක් සම්බුධයන්වහන්ස සත්ත්වලෝක සංස්කාර ලෝක ඔකාසලෝකසංඛ්‍යාත ත්‍රිවිධලෝකය නිරවශෙෂයෙන් දැනවදැළුවූ දිපදෙත්තමයාණන්වහන්ස ඉසිසරිය ධර්ම යසසිරිකාම ප්‍රයත්නයයි කියනලද අඩ්ඩවිධ භාග්‍යයෙන් සම්පූර්ණවූ භාග්‍යවතුන්වහන්ස දෙවපුත්‍රමාර කෙලශමාර ස්කන්ධමාර මෘත්‍යුමාර අභිසංස්කාරමාර සංඛ්‍යාත පස්මරුන්බිඳ ජයගත්තාවූ ජිනනාථෝත්තමයන්වහන්ස සංස්කාර විකාර ලක්ෂණ නිර්ණ ප්‍රඥප්ති සංඛ්‍යාත පසළුවිධඥාන මුණඩලය කරතලාමලක ක්‍රමයෙන් අනන්‍ය ප්‍රතිබෝධිනාව යථයම්භූඥානයෙන් ප්‍රතිවෙධකළාවූ සර්ව්ඥරාජෝත්තමයන්වහන්ස දුඃඛසමුදය නිරෝධමාර්ගීයන චතුරාර්ය සත්‍යය නිරවශෙෂයන් අවබෝධකළාවූ ශාස්ත්‍රලෝකඥාචාර්යයන් වහන්ස රූප රූප විලාස රූපඅවිඤ්ඤෙය්‍ය වචන වචන විලාස වචන අවිඤ්ඤෙය්‍ය ඉඩි ඉඩි විලාස ඉඩි අවිඤ්ඤෙය්‍ය සුඛුණ සුඛුණ විලාස සුඛුණ අවිඤ්ඤෙය්‍යයයි කියනලද සතරාකාර අවිඤ්ඤෙය්‍ය ධර්මයන් සමන්වාගතවූ දශබලධාරින්වහන්ස නීලපීත ලෝහිත අවදාත

මා: ජිඟට ප්‍රභාගච්ඡ සංඛ්‍යාත අවිවණී ඝණ බුඩරශ්මිමාලාවෙන් විරූ
ජිඹානවූ මුනීන්ද්‍රොත්තමයන්වහන්ස අසම අසමයන් අප්‍රතිභාගවූ අනා
ඛිවරයන්වහන්ස බුඩරත්නය ධම්මරත්නය සංඝරත්නය යන ත්‍රිවිධ
රත්නයට හා ගාරීරිකධාතු කෙණධාතු රෝමධාතු ලෝණීරොමධාතු
දන්තධාතු දඨාධාතු අකුධාතු නළාටධාතු ග්‍රීවාධාතු ආදී සකල
ශාරීරිකධාතුය පාරිභෝගික චෛත්‍යය සුවාසුදහසක් ධම්මඛන්ධ
පිටකත්‍රය ධම්මය සිරුළු බුඩප්‍රතිමා සංඛ්‍යාත උද්දිස්සක චෛත්‍යය
සත්සතිය ගෙවූ සප්තසථානය දම්සක් පැවැත්වූ ඉසිපතනාරාමය
තුන්වරක් යමාගිහ පෙළහරදැක්වූ තුන්තැනය දෙව්ලොව තෙමසක්
විජම්දම්දෙසූ පඬු ඇඹුල් සළුස්නය දෙව්ලොවින් බිමට බටසකස්
පුර දොරය ඝුවිසි අසංඛ්‍යයක් සතුන් නිවන්දැක්වූ සුවිසිතැනය කුසි
නාරාපුර පිරිනිවන් මඤ්චකය දෙව්ලොව සිළුම්ණිසෑය බඹලොව
සුමිණිසෑය ජීවමානව වැඩහුන් අටලොස් මහාවිහාරය සොළොස්
මහාසථානය යනාදි සකලචෛත්‍යයන්ටද අද දක්වා සුඛාවාස බඹ
ලෙව්හි ශ්‍රාවකයන් ජීවමානව වැඩසිටිනා විපසසි ආදි සත්බුදුවර
යන් හා ඒ බුදුවරයන්ගේ යථොක්ත බුදුකෘත්‍යකළාවූ සථානයන්ටද
මාගේ ජීවිතය පරිත්‍යාගකරම් අනෙනවාසිකබවට පැමිණියාවූ මම
පළමුව දෙවනුව තුන්වෙනුවත් කායප්‍රණාමය වාක්ප්‍රණාමය මනෝ
ප්‍රණාමය යන ත්‍රිවිධ ප්‍රණාමයෙන් මස්තකයහි ඇදිලිබැඳ පසඟ
පිහිටුවා වැඳනමස්කාරකරම් ත්‍රිවිධචාරයෙන්වූ සියළු වරදව ඛමා
වනමස්ක්වා මාගේ වන්දනාමය කුශලකර්මාදාභාවයන් ඉහාත්ම
යෙහිවන්නාවූ රොගාවත්‍රාස දුර්භික්ෂ දුෂ්ටග්‍රහ රාජචෝර උදකාග්නි
ශස්ත්‍රභය සපීහත ප්‍රේතපිශාචාදීන්ගෙන් වන්නාවූ සකලාන්ත
රාය සමෝපද්‍රවයන් හිරුදුටු අදුරුසේ විහත විධ්වංශනයකොට
පරලොවවන්නාවූ සතර අපායභය ජාතිභය ජරාභය ව්‍යාධිභය මර
ණභය ශොකභය පරිදේවභය දුක්ඛභය දෞමනසසභය උපායාසභය
රාගභය වෛෂභය මොහභය යයි කියනලද එසකාලොස් ඛිනිහාසින්
විනිර්මුක්තාවූ ශාන්තවූ ප්‍රණීතවූ නිර්වාණඅමෘතභූමියට පැමිණෙම්වා"
යන්නෙන් කර්මකරවා ඊට අනතුරුව සරණ සමාදන්වීම් ආදි
සියළු පුණ්‍යක්‍රියාවන්කරවුතුසි. යම් කිසි පුණ්‍යකර්මයක් කරණකාල
යෙහි උපදනා කාමාවචර කුශල චිත්තය යම්පමණ සොම්නස් වේද
නාවෙන් හා ඥාණයෙනුත් යුක්තවිනම් එපමණ මහත්ඵල ඵලවසි
ධාන්‍යබීජය මෝරන්නාවූ කාලයහි යහපත් පෘථිවිරසය හා
ජලයත් ලැබෙනාසේ මුහුකළේනම් ඒ බීජය නොවළ හා පැළ

වේ. එහෙයින් තුණුරුවන් ගුණනොදන් අඥාන මනුෂ්‍යයෝ ලොව, අර්ථනොදන්නා පාලිභාෂාවෙන් සරණගම නමාත්‍රයක් කියමා සරණගැන්වීමෙන් ඔහුට උපදනා දිට්ඨප්‍රකම්‍ය ඤාණවිප්‍රයුක්ත බැවින් මහත්ඵල නොඵළවන්නේයි.

නිසරණ සමාදානය "බුද්ධංසරණංගච්ඡාමි ධම්මංසරණංගච්ඡාමි සංඝං සරණංගච්ඡාමි දුතියම්පි පෙ තතියම්පි සංඝං සරණංගච්ඡාමි" යනුවෙන් සරණ සමාදන්වියයුතුයයි. විනය පාලියෙහි ආගේයි පාලිභාෂාව නොදනහු විසින් සිංහලභාෂාවෙන් හෝ අඤ්ඤදමිළාදි භාෂාවකින් හෝ සරණසමාදන්වියයුතුයි හේ මෙසේයි. "අහිසඩාදි නවපෙදෙහි සහාගිතා ගුණසමූහයෙන් සම්පුණිවූ සම්‍යක් සම්බුද්ධයන්වහන්සේ පිහිටකොට සෙවනභජන පතිරූපාසනයකරම් සතරඔගී ඵලඤිඤාණ පඤ්චාප්ති සංඛ්‍යාත දඟවිබවූ ශ්‍රී සඩමය පිහිටකොට සෙවනභජන පතිරූපාශනයකරම් අෂ්ටාර්‍යී පුද්ගල මහාසංඝරත්නය පිහිටකොට සෙවනභජන පතිරූපාසනය කරම් දෙවනුවත් තුන්වෙකුවත් එසේම බුඩාදි රත්නත්‍රය පිහිටකොට සෙවන භජන පතිරූපාසනයකරම්" යනුවෙන් මහ සමාදන්විය යුතුයි.

මේ පාලියාගත සරණගමනයයි. 22

අටුවාවෙහි ආ සරණගමනය කෙසේදයන් ?

---

23 අටුවාවෙහි ආ සරණගමනයවනාහි ආත්ම සන්නිශ්‍රිතතනසරණය තත්පරායනකා සරණය ශිෂ්‍යභාවූපගමන සරණය ප්‍රණිපාත සරණයයි සිව්දෙරුම්වේ ඒ සතරාකාරයෙන්ද අභිමතවූවන් විසින් සරණ සමාදන්වියයුතුයි. ඒ මෙසේයි.

"අජ්ජතග්ගෙපාණුපෙතං අහං අඤ්ඤානං බුඩසඤ්ඤාතෙම්. ධම්මසස නිඤ්ඤාතෙම් සංඝසඤ්ඤාතෙමි නිමංඩාරෙථ" යනුවෙන් පාලිභාෂාවෙන් හෝ සඩයිඋභාෂාවෙන් "අදපවත් මම ජීවිතාන්තයද දක්වා ආත්මගභාණයවතුන්වහන්සේට පාවාදෙමි ශ්‍රී සඩමරත්නයට පාවාදෙමි අෂ්ටාර්‍යී පුද්ගල මහාසංඝරත්නයට පාවාදෙමියි මෙසේ ඉවසා වදාරණසේක්වායි කියාහෝ "අජ්ජතග්ගෙපාණුපෙතං අහං බුඩපරායණො ධම්මපරායණො සංඝපරායණොති මංඩාරෙථ" යනුවෙන් පාලිභාෂාවෙන් හෝ අදපවත් මම ජීවිතාන්තයදක්වා බුදුන් පිහිටකොට ඇත්තෙමි ධර්මය පිහිටකොට ඇත්තෙමි. සංඝයා පිහිට

කොට ඇත්තෙමිහි. මෙසේ ඉවසා වදාරණසේක්වාසි සවකීය භාෂාවෙන් හෝ "අජ්ජතග්ගෙ පාණුපෙතං අහං බුද්ධස්ස අනන්තවාසිකො ධම්මස්ස අනන්තවාසිකො සංඝස්ස අනන්තවාසිකොනිමංධාරෙථ" යනුවෙන් පාලිභාෂාවෙන් හෝ අදපටන් ජීවිතාන්තයදක්වා මම බුදුන්ට ඇතවැසිවෙමි ධර්මයට අතවැසිවම් සංඝයාට අතවැසිවේමියි මෙසේ ඉවසා වදාරණසේක්වාසි සවකීය භාෂාවෙන් හෝ "අජ්ජතග්ගෙ පාණුපෙතං අහං අභිවාදන පච්චුට්ඨාන අඤ්ජලිකම්මසාමීචි කම්මං බුද්ධාදීනං යෙව තිණ්ණං වත්ථූනං කරොමීති මංධාරෙථ" යනුවෙන් පාලිභාෂාවෙන් හෝ අදපටන් ජීවිතාන්තය දක්වා මම නමස්කාරාභිවාදීමය දැක හුනස්නෙන් නැගිට පෙර ගමන් යාමය දෙහොත් මුදුන්දීමය ගරුබුහුමන්කිරීමය යනාදිය බුද්ධාදි, රත්නත්‍රයටම කරමියි ඉවසා වදාරණසේක්වාසි සවකීයභාෂාවෙන් හෝ කියා යමෙක් සරණගතවූයේද හෙතෙතම සරණගිච්ඡේතම්මවේ මේ සතරාකාරයන් අතුරෙන් යම් කිසි ආකාරයකිනුදු සරණගතවියයුත්තේයි. මෙසේ අර්ථකථාචාර්ය්‍ය සංඛ්‍යාත පන්සියගණක් මහාඝණාශ්‍රවයන් විසින් ප්‍රකාශකරණලද සරණගමනය දතයුත්තේහි.

මේ සතරතන්හිම "දුනියම්පි තතියම්පි" යනුවෙන් යොදා කුන්වරදක්වා සරණසමාදන්වියයුතුයි. වර්තමානකාලයෙහි "බුද්ධං සරණංගවජ්ඡාමි" යනාදීන් සමාදන්වන්නාවූ සරණගමනය තත්පරයි. යනතා සරණගමනයෙහි ඇතුළත්වන්නේහි මේසේ දක්වනලද පස් ආකාරයන් අතුරෙන් අභිමත ආකාරයකින් සරණසමාදන්වන උපාසක උපාසිකාවන් විසින් මෛත්‍රීප්‍රතිමාලය බොධිවෘක්ෂ ධර්මාසන භික්ෂුසංඝයා අතුරෙන් යම්කිසි පූජනීය ස්ථානයක් කරා එළඹ සටකිනියාගෙන් පළමුකොට පසඟ බිම ඔබා වැඳ බඩාඳුල්ලිව උත්කුට කෘතාඤ්ජලීව බුදුන් කමාකරවාගෙණ සරණගැන්මෙන්ම සතුණ සම්ප්‍රයුක්ත දිඹිපුකම් පුණ්‍යක්‍රියා සංඛ්‍යාත සරණශීලය පිහිටන්නේහි. එමෙන් තොකොට කවරගුණයක්හිසා සරණගතවම්දැයි තොදැන සතුතින්ගේ ප්‍රතිපත්ති දැක පුරුදුවූ ලදරුවන්ගේ ක්‍රියාවක් මෙන් භික්ෂූන්ගේ ශබ්දය අසා පාලිපාඨය කියාගත්පමණින් සම්පූර්ණ මහත්ඵල සරණගමනය නොපිහිටන්නේහි.

එක්වරක් පමණක් කීමෙන් සරණගතවන්නේ නමුදු ගරුගාරවය පිණිස "දුනියම්පි තතියම්පි" යනුවෙන් දෙවනුවත් තුන්වනුවත් සරණසමාදන්වීම පුරාතන ආචාර්‍යවරයන්ගේ චාරිත්‍ර ධර්මයක්වේ අප බුදුරජාණන්වහන්සේ බුද්ධත්වයට පැමිණ සත්සතිය

ඉක්මවා තවුස්සහල්ලුකනම් වෙළඳ දෙබෑයන් අතින් වීලදම් අඟහ ලා පිළිගෙණ එසමයෙහි බුඩධම් යන රත්නවයම විද්‍යමාන බැවින් ඔවුන් දෙදෙනම වාචික සරණයෙහි පිහිටුවාවදාළේය ඔවුන් දෙදෙ නා මේ ශාසනයෙහි පළමුකොට සරණගත උපාසකයෝවූහ මෑතභා ගයහි ආයුෂ්මත් යස සථවිරයන්ගේ මව්තොමෝ මේ ශාසනයෙහි පළමුකොට තෙවාචික සරණගත උපාසිකාවනම්වේ එතැන්පටන් ශාසනාභිවෘඩිනයදක්වා තෙවාචික සරණගමනය ලොකයෙහි පවත් නේයි.

සරණගමන සමාදානවිධිය යි. 23

උපාසකයාගේ ලක්ෂණ කවරේදයන් ?

24 උපාසකය යනු කවරෙක්දයත් ? මේ ශාසනයෙහි යම් පුරුෂයෙක් තෙමේ රත්නත්‍රය සරණ ගිය්ස්වේද හෙතෙම උපාසක නම යම් ස්ත්‍රීයක් තොමෝ රත්නත්‍රය සරණ ගතවිද ඕතොමෝ උපාසිකාවෝ මහානාමසූත්‍රයෙහි එම්බා මහා නාමනම් ශාක්‍යය යම්හෙයකින් උපාසකතෙමේ බුදුන් සරණ ගිය්ස්වේද ධර්මය සරණගියේවේද සංඝයා සරණගිය්ස්වේද මෙප මණකින් උපාසකනාම්වෙයි කුමක්හෙයින් උපාසකනම් වන් නේදයත් ? රත්නත්‍රය භජනයකරණහෙයින් උපාසකනම්වෙයි ඒ එසේම යි යමක්තෙමේ බුඩරත්නය සෙවනය කෙරේද ධර්මරත් නය සෙවනයකෙරේද සංඝරත්නය සෙවනයකෙරේද හෙතෙම උපාසකනම් වන්නේයි. එහෙයින් කිහ දීඝනිකායාදී කථාවෙහි-

"තත්‍ර කතමා උපාසකොනි යොකොචි නිසරණගතො ගහඩ්ඩ වුත්තඤ්ඤත්තං යතොඛො මහානාම උපාසකො බුඩං සරණං ගතොහොති ධම්මං සරණංගතොහොති සංඝංසරණංගතොහොති එත්තාවතාඛො මහානාම උපාසකොහොතීති කස්මා උපාසකොති රතනත්තයං උපාසනතොයොනි බුඩං උපාසතීති උපාසකො තථා ධම්මං සංඝං" යි. යව දුක්වූනයින් කල්පකොටි සතසහස්‍රයෙ කිහුදු නොලබිය හැකිවූ දුර්ලභවූ රත්නත්‍රය ලොව පහළ නුවූකල්හි සරණගමනයද නැත්තේය සරණගමනය අවිද්‍යමාන කල්හි රත්නත්‍රය භජනයකරන්නාවූ උපාසක උපාසිකාවෝද නැත්තාහ රත්නත්‍රය සරණගත උපාසකයන් නැත්තාවුකල්හි

ඕඝීඵලාධිගමයෙන් නිවන්පුරවදනා ආයුෂ්මයෝද නැන්තාහ යම් කෘලකවනාගි බුදුවරයෝ ලොවපහළවෙද්ද එකල්හිම සරණ ගමන සංඛ්‍යාත විශිෂ්ට කුශලධර්මය ලොවපහළවන්නේය සරණ ගමන සංඛ්‍යාත විශිෂ්ට කුශලධර්මය විද්‍යමානකල්හිම උපාසක උපාසිකා යන ධර්මරාජයන්වහන්සේගේ රාජලක්ෂ්ණ මුද්‍රාවෙන් මුද්‍රණයකරණලද උතුවිනාමය පහළවේමැයි ඒ උපාසක උපාසිකාවෝ ඡාතිජරා මරණාදිගයින් පහවූ අසඞ්ඛ්‍යභූමියට ඇතුළත්වන්නාහුයයි දතයුතුයි. මේසේ උපාසක උපාසිකා යන රාජමුද්‍රානාමය ලැබුසථානානන්තරික පුද්ගලයෝතුමූ මතු සංසාරයෙහි සැරිසරායායුතු දිගිකාලනාගාර මාර්ගයනි දුකසේ ගමන්කොට නිර්වාණසම්පත්තිය පැමිණෙනතුරු මාර්ගඵලකරණ යව සුදුසුවූ උතුම් සිතුම්සිරුවතක් වැනිවූ සරණගමන කුශලය නිමිලවශයෙන් රක්ෂාකරල්විනම් ඔවුන් කාමසුගතියෙහි සෙසු දිව්‍යමනුෂ්‍යයන් පස්ආකාරයකින් අභිභවනය කොට මහඟශාක්‍ය මහාත්‍රහාව සම්පතනාව ඉපිද මහත් ඓශ්වර්‍යයෙහි සම්පත් අනුභවකරන්නාහුවෙති එසෙයින් නිරන්තරයෙන්ම සරණ කිළදුවියයුතුවූ රත්නත්‍රයට අගෞරව අනාදරවශයෙන් පවත්වන ඉරියව්වෙන් දුරුව මහත්සාහයෙන් සරණගිලය රක්ෂාකරයුත් පන්සිල් මාර්ගයෙහි යන්නාවූකල්හිද රත්නත්‍රයට අයිතිවූ පුජනීය සථානයක් සම්මුඛවිනම් ඒ ඒ සථානයෙහිදීම ගෞරවකටයුතුයි ආරාම චෛත්‍යයන්ගේ ප්‍රාකාර ඇතුළට වදනාකල්හිද ප්‍රකාර නැන්නාවූ චෛත්‍යාරාමයන්ගේ භාත්පස අනුභව චෛත්‍යයෙන් හෝ අනන්තර විහාරයෙන් හෝ මධ්‍යම පුරුෂයෙකුගේ ලෙඩිවූ ප්‍රහාරදෙකක් පමණ නැන චෛත්‍යාරාමයන්ගේ උපචාර සීමාවයයි සලකා ඒතුළට හෝ ධර්මය පවත්වන්නාවූ ගම්තැනකට හෝ සංඝයා වැඩහිදිනා සම්මතනානකට හෝ වහන් සපත්තු පාදුකා මිරිවැඩි පයලා හෝ ඇත් අස්රථ යාන වාහනාදියෙන් හෝ ඉස්වසා පෙරවගෙණ හෝ කුඩ සේසත් දරාගණ හෝ යුධාවුධයෙන් සැරසී හෝ කිළුටු වස්ත්‍ර හැඳපැලඳ හෝ අනිකුදු අගාරවයකින් ඇතුල්වීමෙන් හෝ භික්ෂු සංඝයා වසන ආරාමතුළ භික්ෂු සංඝයා වැඩහිදිනා අඳ පුටු කළාල ඇතිරිලි බුම්තුරුණුආදිය අපිරිසිදු පයින් ඇක්කෑවීමෙන් හෝ භික්ෂුසංඝයා දැක මාගිය නොදීමෙන් හෝ ආවාර ගෞරව නොපැත්වීමෙන් හෝ යටකී අගාරව පැවැත්වීමෙන් හෝ තමන් නොදැනම සරණකිළුවුවන්හෝයි.

පුරාතන බුදුරජාන්පාදයෙහි තුණුරුවන් ගුණදන්නා පණ්ඩිත ජනයාගේ රත්නත්‍රය ගෞරවය ආශ්චර්‍යයි නොමැ අබුදුරජාන්පාද කාලයෙහි තිරිසන්යොනියෙහි උපන් මහාබෝධිසත්වයෝ පවා

ක්ෂීරතාපසයන්ගේ නවුවේ පිරිකරවූ කාශාව වස්ත්‍රයට ගෞරව සිත් උපදව සමකිය ජීවිතාලය පවා හැරදැමුමේය ඒ කෙසේදැයි? අපගේ ශ්‍රී මහාබෝධිසත්වයන්වහන්සේ ඡද්දන්ත හස්තිරාජව උපන් සමයෙහි තමන්වහන්සේගේ දළසිදිනා පිණිස පැමිණි සොණුත්තරනම් වැදිකෙමේ පොළවයට උමඟක්කැන කාශාව වස්ත්‍රාධාරීව දුනු හිතල රැගෙණගොස් උමඟෙහි සැඟවීඉද ඡද්දන්ත හස්තිරාජයාණන්ට හිසැරයක් විදපිකල්හි මනුෂ්‍යගන්ධය ආඝ්‍රාණය කොට පොළවයට උමඟෙහි සැඟවිලුන් මිදිපුරුෂයා දැක මේ වැදි මතමේ පාපිවූ අධමයෙක්වූයේද මොහු පෙරවගෙණ සිටිනා වස්ත්‍රය බුදුපසේ බුදුමහරහතුන්වහන්සේලාගේ කෙලෙස් නැසීමට උපකාරවූ අඟින් ධජයවන්නේය එඟඟින් මේ අධම මනුෂ්‍යයා වධකොට යුත්තේයයි සිතා ඔහුගේ මනොරථය පුරණ අදහසින් තමන් වහන්සේගේ සවණක්රැස් නික්මෙන්නාවූ දළ සඟලකපා දන්දී බුදුබව ප්‍රාර්ථනාකොට ඒ වැද්දාගේ ජීවිතදානයදී සුවඳස් බරණැස් නුවරව පිටත්කෙළේහි.

තවද අප මහාබෝසතාණන්වහන්සේ එක්කලෙක බම්මුණු මහසල්කුලයෙක ඉපිද වෙදත්‍රය පරතරව පැමිණ හිමිගෙහි කළ කිරි හිමාලය වනයටවැද සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව උග්‍රවූ තපස්කරණුයේ එක්දවසක් නහණපිණ්ඩිස නවුස්පිරිකරඋනා ඉව්රෙහි නබා ගහානම් ගඟවබැස ජලස්නානයකෙළේහි. එක්තරා ගුරුළු රාජයෙක්ද තමාගේ ආහාරයවූනයින් සොයමින් අවුත් බරණැස්නුවර ලඟ පැමිණ මාණවක වෙසයක් මවාගෙණ නුවරතුළට වැද මනුෂ්‍යයන්ගේ නාට්‍යමණ්ඩලයකට අවුත් නාට්‍යබලමින් සිටියේහි. එකල එක්තරා නාගරාජයෙක්ද මනුෂ්‍යයන්ගේ නාට්‍යමණ්ඩලය බලනු කැමැත්තේ මාණවක වෙසයක් මවාගෙණ එම නාට්‍යසභාවට අවුත් පළමුවෙන් නාට්‍යමණ්ඩලයෙහි නාට්‍යබලමින් ඉදිරිමැහි සිටියාවූ ගුරුළුරාජයාගේ දසරැවට අතගැසීය එකෙණහිම සවහාව ධම්තාඛ්‍යයෙන් ගුරුළුරාජයාට තමාගේ ආහාරයබව හැඟී පසුපස්සේ එහුබැඳ ගත්තේය නාගරාජතෙම්ද බළලෙකු විසින් එහුබදනාලද මියෙකු මෙන් මරණ හයින් භයපත්ව දිවන්නට වන නාගරාජතෙම් ගඟාතලී ගංඉවුරට පැමිණ සැඟවියහුතු අන්තිසි රක්ෂායක්නායක් නොදැක තාපසයාගේ නවුස්පිරිකරයට වැද දරණගසා සැඟවිනන්නේය ගරුඩරාජතෙම් මෙසේසිතීය ඉදින් මම තාපසයන්වහන්සේගෙන් අවසර නොඉල්වා නවුස් පිරිකර විසුරුවාහැර පියා නාගරාජයා අල්වාගනිමි

ඒ තාපසයන්ට අනෙකවර්ව අනාදරයක් කළානම්මෙයි එසේනම් ඔබ මම තාපසයන්ට සැලකර අවසරරැගණ නාගරාජයා අල්වාගණිම්හි සිතා තාපසතන්කරු ඵළඹ සඛාමිනි මාගේ ආහාරවූ නාගරාජයක් නුඹවහන්සේගේ තවුස් පිරිකරයට සැහවීනත මට ඒ තාවුස් පිරිකරගොඩක් නාගරාජයා අල්වාගැණිම්ට අවසර දුනවැනැයි යාඳුසෙලේයි, ඉක්බිති තාපසතෙමේ මෙසේකීන එඩා ගරැඩරාජයා මෙණනි මෙපි සාධු සත්පුරුෂ ගුණධර්මයෙහි පිහිටියේය කුසල් අනුසැල් මියයි දන්නේය. යහපත් සම්පක් කල්පනා ඇත්තේය යැත්වූනි වාතවෘතහි ඇත්තේය ශීලාදී කියි ගුණධර්මයත් නැතනාවූ කිසිගුණ ධර්මයක් නොදන්නාවූ අවිඤඤණක ගුඩාෂටක රූපකලාප සමූහ යක්වූ මේ තවුස් පිරිකරවනාහි සත්පුරුෂගුණවතුන් පරිභොගකා රිත්නාවූ පරිස්කාරමාත්‍රයයි සලකා අතිශයින් ගරුබුහුමන්කළේයි. එබදු යහපත් අදහස් ඇතනාවූ මෙපි ඒ තවුස් පිරිනාර පරිභොග කරන්නාවූ ශීලවනතාදී ගුණෙරහි ගෞරවකිරීම කියනුම කවරේදැයි කීහා මෙතාපසගේ ආහාරයවූ ඒ නාගරාජයා මට පාවාදුනම්නැවැයි කීහ. එබස්ඇසූ ගරැඩ රාජතෙමේ තාපසයාණන්ගෙන් වෙතය ප්‍රශ්නයක්ඇසුවොකටහැකිව නාගරාජයා තාපසයන්ට පාවාදී අහසටනැගී ගුරුළුහවනය බලානික්ම නිසේයයි යන මේ කථා ප්‍රවෘත්තිය ජාතක අටුවාගයහි ආගත්තේ.

මෙසේ පුරාතනගයහි සාධු සත්පුරුෂවූ ශාසනයෙන් පිටත් නිවූ බාහිරකයෝපවා ශ්‍රවණතාපසාදීන් පරිභොගකරන්නාවූ කාශාය වස්ත්‍රගයහිපවා අතිසයින් ගෞරවකළාහුනම් බුදුරජාණන්වහන්සේගේ මෙන ශාසනගයහි පැවිදිවූ සිල්වත් ගුණවත් සුපශුල භික්ෂූසංඝ යා විෂයෙහි සඳහැයන්වහන්සේගේ උපාසක උපාසිකා යන රාජ්‍ය සැදැහැතගය ලැබිවන්නේ ගෞරවාදර බුහුමන්කිරීම කියනුමකවරේද ?

තවද පුරාතනයෙහි අපවිත්‍රවූ මිළමිත්‍රගයන් වැකිනිඹාවූ කාස ලනොඩ දමනලද අහිත්ඵලයට ධිවජයක්වැනිවූ චීවරයවපවා ගරු බුහුමන්කළ නියාව අපදානපාළිගයහි දක්වනලදමැයි.

"පංසුකූලිකවානං කාසාවං ඡඩ්ඩිතංමිළහමඤ්ඡිතං
සිරසාමිං අඤ්ජලිංකත්වා වන්දිතබ්බං ඉසිධ්ජං.....
අබ්භාතීතාවයං බුද්ධා වන්තාමා නා අනාගතා
ධජෙනානෙනා සුජ්ඣිත්වා තාසමා එංතනාමයාහියා".....

මෙහි භාවය මිනිසුන් ගමනාගමනයකරණ මාගීයෙහි හැර දමනලද අපවිත්‍රභයන් වැහුනාවූ අභිත්ධවජයයි කී තැනලද චීවරය දැක මස්තකයෙහි ඇදිලිබැඳ නමස්කාර කටයුතුය කුමක්හෙයින්ද? ගංගා සමුද්‍රාදිභයෙහි වාඵකාවන්ට අධිකවූ අතීතයෙහි බුදුවූ සම් පූර්ණ බුදුකෙනකුන්වෙද්ද අනාගතයෙහි බුදුවියයුතු යම් එම ණ බුදුකෙනකුන්වෙද්ද වර්තමානකාලයෙහි යම් බුදුකෙනෙකුන් වෙද්ද ඒ සියළු බුදුවරයෝ මේ අභිත්ඵලයට ධවජයක්වැනිවූ චීවරය කරණකොටගෙණ කෙලෙසුන් දිනූභයන් පිරිසිදුවූවෝය එහෙයින් ඒ මාගීයෙහි හැරදමනලද අපවිත්‍රභයෙන් වැකීගිය චීවරයපවා නමස්කාර කටයුත්තේය යනු භාවයයි.

මෙහි එතානි චීවරය කුමක්හෙයින් අභිත්ඵලයට ධවජයකැයි කියනලද්දේදයත්? බුධ ප්‍රත්‍යෙක බුධ අග්‍රශ්‍රාවකයන්වහන්සේලා සියළුදෙනාම මේ චීවරය කරණකොටගෙණම අනිත්ඵලය ලැබූභෙයක් ලාභය යමක් තෙමේ නිබ්බානශබ්දයෙන් අනිත්ඵලය ලැබූයේද කෙශරී මහතලය ශාලී සබඹිරය භාජනයෙහි මනාසිඳී රඳුසිටින්නාක් මෙන් අනිත්ඵලයලැබූ ශ්‍රාවකසඵතෙම් ඉදින් පැවිදි උපසම්පදා නොලැබූසේක්නම් ඍසුසාරදඝසක් මයාදුන් උසඋතුනාවූ මහාමෙරුපර්වත රාජයාගේ මතුබර ඉවසිලිවට මහපෘථිවියහැර අනික්වයතුවක් පොහොසත්නොවන්නාක්මෙන් අභිත්ඵලයාගේ බරඉසිලීමට කසට රැදුනාශාව වයත්‍යම හැර ලාමකවූ තෘෂ්ණාතැනි සවාමියා විසින් රක්නාලද මනාභයක් නිලපින රත්තාවණී වස්ත්‍ර රත්රිදී මුතුමැණික් ආභරණ මල්යහද විලවුන් ආදිභයන් සැරසුනාවූ ගිහිවෙශය ඒ උතුම්වූ අභිත්ඵලය උපුලන්නට පොහොසත් නොවන්නේය ඉදින් රහත්ඵලයට පැමිණියායීතෙම් සත්දවසක්තුළ පැවිදිභාවිනම් පිරිනිවන්පාණෝය එසේ එහෙයින් චීවරය අභිත්ඵලයට ධවජයක් වැනි බැවින් සරණගත උපාසකයා විසින් සරණ කිළුටුනොවන පිණිස චීවරයපවා නමස්කාර කටයුතුනම් ඒ අභිත්ධවජය දරන්නාවූ අභිත්ධවජයේ සැමිවූ බුදුපමස් බුදුමහරහතන්වහන්සේ මගෙරව නමස්කාර කටයුතුබව කියනුම කවරේද? බිම්බිසාර මහා රජය පසේනදි කොසොල් මහරජය අජාසත්මහරජය අනේපිඬු මහසිටුමැණියන විශාඛා මහාඋපාසිකාවෝය. යනාදි පුරාතන උත්තම ඇයි බුදුන් වැඩඉන්නා විහාරාරාමයන්ට ප්‍රවිෂ්ඨවන්නාවූකල්හි පාද ඇයත් යානුතුඅගීය ඇත්දලතණ අස්වාහණ රථඇළිකුතම් වහන් මිටිවැඩි ආදිභයන්නාස් ආරෝහයන් පිටත්නිව යානවාහණාදියෙන් බැස සක්විතිර ජාතුකරා යන චණ්ඩාලපුත්‍රයන්මෙන් මහත් ගරු

සාර්වභෞමත්වයෙන් දෙතොන්මුහුන්දී බුදුන්දිහාවම නැමීනැමී මහාස් නුදුරු මහාලංකාන අභිනිහදය දෙමහලෙන් ඕදිහිදි වැඳ පුදා නික්මගන කල්හිද වැඳපැදකුණුකොට දෙමහාත්මුහුන්දී දශීනපථය ඉක්මෙන තුරු පිටුතොපා පසුපස්සටගොස් බුදුන් මනාමහපණනතැන කැමති ආකාරයෙන් යන්නාහුය මාඨිච්පි ආදියෙහි සංඝාදුටුවේනම් රථ යාන වාහණාදියෙන් බැහ අන්පසින් දුරුවම ගියාවපසින් මනාඇක්ම පසහ පිහිටුවා වැඳ මාගීය ඉඩහැර මහත් ගරුහාරව සින්උපදවා අපවායන කුසලවෙතනාව මුදුන්පත්කොටගණ මහත් සොම්න සින් වැඳ සමුගණන්නෝයයි. පෙල අටුවාහි ආයේය මෙසේ ශිල වන්ත භික්ෂුසංඝයා මාගීයෙහි දුටුකල්හි ශ්‍රද්ධා පුනීගම් සිත් උපදවා ප්‍රිය වඤ්ඡුසින් බලන්නාහු ජාති සහස්‍රයෙක්හි වඤ්ඡුරූපයෙන් මනා පෙළී කප්ලක්ෂයක් මුළුල්ලෙහි දිව්‍ය මනුෂ්‍යසම්බන්ධ සුගතියෙහිම අනුභවකරන්නාහුය එහෙයින් වදළහ. අටුවායෙහි "සීලවන්තෙන භික්ඛුපසන්නචිත්තෙනහා පිය චක්ඛුනි සම්පස්සිතබ්බා තං මූලකෙනපිහි පුඤ්ඤන අනෙකානිජාති සහසහස්සානි චක්ඛුරෝගොනහොති සහසහස්ස කප්පමත්තං දෙවෙසුච මනුස්සෙසුච සබ්බසම්පත්තිලාභිහොති" යි.

උපාසකයාගේ ලක්ෂණ හා රත්නත්‍රය ප්‍රශාදයෙහි කුශලඵලය.

රත්නත්‍රයෙහිවරදවා පිළිපැදීමෙහි අකුශලඵලය කෙසේදයන්?

25 බිම්බිසාර මහරජතෙමේ පූර්වබුදුවරයන්ගේ සස්නෙහි සංසාරාමයට වහන්පයලා ඇතුල්වූ අඟුලන මියාගේ විපාකවශයෙන් තමන්ගේ පුත්‍රවූ අජාසත් රජතෙමේ ඇඹැට්ටයා මෙහෙයා සඩකිය පියරජුන්ගේ යටිපතුල්කරයෙන් පළවා එළුගල්වා කිඹිරගුරුපිට සක්මන්කරවීමෙන් කාලක්‍රියාකළබවද කසුප් බුදුන් දවස එක්තරා උපාසකයෙක් ඔහදිය මලවැහිරෙන්නාවූ ශරීරයෙන් සහසහ ඇඳ පුටු ආදියෙහි වැදහෙව සහසහ ඇඳපුටු කිඵටුකළාවූ අකුශලකම් බලයෙන් ගයා ශීර්ෂයට නුදුරුවූ මනුෂ්‍යයන්ගේ මලමූත්‍ර දමන සථානයෙක්හි සකලශරීරයෙහි හිදිකටු සිටුවාළුවාන්මෙන් සියුම් මුවහත් ඇති මරුම්යෙන් ගැවසී ඇත් ශරීරයක් ඇතිව සුවිරොමනම් යක්ෂව උපන්බවද එම කසුප් බුදුන්ගේ සමයෙහි එක්තරා සංඝාරාමයක්

අසල තෙක්ත් කම්මාන්තයෙරම්හි සිටියාවූ එක්තරා උපාසකයෙක් තෙ හින් තෙංඛෙනැති අවුත් සංඝාරාමයෙහි හිඳුණුවංසයා උඳෙසා මහා කොට අතුරාතුබූ පසතුරුණුපිට සංඝයාකෙරෙහි අගෞරව සිතින් සයනාසනලාභවූ අකුශලකර්මබලයෙන් ඒ මනුෂ්‍යත්වයෙන් චුතව සුවි රාම යක්ෂයාගේ වාසස්ථානයට නුපදුරුවූ එම ගයා ශීර්ෂයෙහිම එක් තරා අපවිත්‍ර යක්ෂයෙක්හි කිඹුලකුණේ පිටසමක්වැනි උදළුතල වැනි තෙකාරපාතුවලින් ගැවසීගත් සමක්ඇතොවූ බරාරාමනම් යක්ෂයෙක්ව උපන්නේය. මේ යක්ෂයා දෙදෙන මිනිසුන් පසුපස යෙහි එහුබැඳ සුවිරාම යක්ෂයාතෙමේ ඉන්තැවකුණෙන් හිදිකටුවැනි රාමයන් විදීමෙන් බරාරාම යක්ෂයාතෙමේ රළු එරුසවූ තමාගේ පිට මිනිසුන්ගේ ශරීරයෙහි ඉලිමෙන්ද මරමින් ජීවත්වූ බවද දීඝනිකායා ඨී සූත්‍ර නීපාතඅටුවා ශක්‍රසංයුක්තාදියෙහි ආගේසි

නවද අප භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ ජීවමානව වැඩ වසන සමයෙහි එතද ග්‍රාග්‍රාග්‍රානන්තරලාබ්‍රිවාවූ මේ ශාසනයෙහි සතර වැනි මහාශ්‍රාවකවූ උපාලි සථවිරයන්වහන්සේ වනාහි අතීතයෙහි රාජකුමාරයෙක්ව ඉපිද එක්තරා පසේබුදුමහතෙනකුන්ට අගෞරව අනාදරයෙන් ජාතිමාන උපදවා මබාරුවෙන් අපහසකළ අකුශල කර්මවශයෙන් පශ්චිම භවයෙහි ලෝකවාසීන් විසින් දාශකර්මයෙන් මෙහෙයනු ලබන නීවවූ ඇම්බැටකුලයෙහි ඉපිද චතුප්‍රතිසම්භිද සමඟ අර්හත්ඵලය සාක්ෂාත්කොට පූජනීවාසානුස්මෘති ඥානයෙන් අතීතභවලානුවේ තමන්ගේ පූර්වචරිතය දැන මතු පත්දහසක් භව රුදු මේ ශාසනයෙහි සරණගත උපාසක උපාසිකාවන්ගේ සරණ ගමනය ආරක්ෂාකරගන්නා පිණිස ස්මෘති සම්ප්‍රජන්‍යය උපදවා ගැනීමට මහතුහුනවූ මේ අතීත චරිතය මෙණෙහැරදක්වා වදාළේය.

එමහතින් කීහ අපදානපාලියෙහි—

"සයම්භුනං විනමනිවා සත්තවිත්තං සමාහිතං
පෙතනකම්මනහං අජ්ජජාතොම්හි නීචයොනියං
මාවොඛණං විරාධෙථ, ඛණාතීතාහිසොචරෙ
සදත්ථොවාය සම්භ්‍යාථ, ඛණාතෙවා පටිපාදිතෙ
එකච්චානඤ්ච වමනං, එකච්චානං විරෙචනං
විසංගළාඟළංඑමහං, එකච්චානඤ්ච ඔසධං
වමනංපටිපනානං, ඵලඨානංවිරෙචනං
ඔසධං ඵලලාභිනං, පුඤ්ඤඤ්ඤෙකඛතංගවෙසිනං

සාසනෙනවිරුඬානං විසංහළාහළංයථා
ආසීවිසෝ දිඨවිසා එවං ඛිත්තොපතිතංනරං
සකිං පීතං හළාහළං උපරුන්ධති ජීවිතං
සාසනෙ විරජ්ඣිත්වාන කපපඨකාවිමිහි ඛ්ජ්ඣති
ඛත්තියාඅවිහිංසාඣ මෙත්තානාඣචිත්තතාඣව
සමදවකං සොධාරෙති, තස්මාඉත අවිරුඬියං" ති

මෙහි භාවඣ එඛා උපාසක වරිනි මම පූජිජාගිඣඤ සන්හුන් සිත් ඇතතාවූ මොනවට පිහිටුවඛලද ප්‍රතිපත්ති ඇතතාවූ සවඣම්හු ඤත ඣන්ම චතුරාඣීඝතාඣවබොධඣ කළාවූ එක්තරා පසේබුදුකෙනෙ ඛුන්ට අවමන්කොට ඒ අකුශලකම්බලඣෙන් මේ ආත්මඉෙහිඣවත්වූ ඇම්බැටඛුලයෙහි පිළිසිඳගතිමි උපාසකවරිනි තෙපි බුඬොත්පාදසඣණයඉහා වරදවවි ඒ එඉස්මැහි බුඬොත්පාදසඣණඣ වරදවාඛුස්තේවිවාවූ සත්වඣයෝතුමූ පසුව ශොකකරන්නාහුවෙති එහෙයින් සවාඣිසිඩියෙහි උත්සාහවඩවි තෙපිවනාහි බුඬොත්පාදසඣණඣ සරණගතවීඉම්න්හා දැනගිලාදිඣෙන් සම්පූණීකරණ්ඩුපිණිස උත්සාහකවි ඉහවත් ගරුගාරවඉෙන් දිවාරාත්‍රිදෙක්හි සම්පූණීකරවි තථාගතඣන්වහන්සේගේ ශ්‍රී සඩම්මාවවාදඣ ඇතම් සත්වඣන්ට වමතබෙඉහදක් වැන්න ඇතම් සත්වඣන්ට විඉරක බෙඉහදක්වැන්න ඇතම් සත්වඣන්ට හළාහළ විෂඣක්වැන්න ඇතම් සත්වඣන්ට ජරාඉමරණ නසන්නාවූ අමෘතඖෂධඣක්වැන්න මහ්ණකඉස් වන්නාහුදඣත් ? මාණීඣපුද්ගලඣන්ට ඉහෝ මනා ප්‍රතිපත්තියට පිළිපන්නවුන්ට කෙලඉවමනඣකරන්නාවූ ඔෂඛඣක්වන්ණන්ඣ ඵලඣට පුද්ගලඣන්ට විඉරක බෙඉහදන්වන්නේඣ ඣහපත්ඵල ලබනුකැමතිවූ පින්කෙත් සොඣන්නවුන්ට අමෘතඔෂඛඣක්වන්නේනී. සුඛතාවවාදඣට විරුඬිවූ අඥානඝනියන් වහා ජීවිතඤඣයට පැමිණවියහැකිවූ හළාහළ විෂඣක්වන්ඣ එපරිද්දෙන්ම දුටුපමණින් විෂවෙගඣ ධාවනඣ කරණ සුළුවූ ආශීර්විෂ නාගරාජඣෙකුඉමින් ඒ සුගතොවාදඣට විරුඬවූ ඝනියා දවා භඤ්ඣකරන්නේනී එක්වරක් පානඣකරණලද්දවූ හළාහළ විෂඣ ජීවිතන්ද්‍රිඣ එක්වරක්ම විනාශකරන්නේඣ මේ ඣාඣනඣෙහි වරදවා පිළිපන් පුද්ගලතෙමේ ඒ අකුශලකම්ඵලඣවඣෙන් කල්පකොටි ඝතඣඝස්සඣක් මුළුල්ලෙහිම දවන්නේනී සඤානනි සංඛ්‍යාත ඉවසීමෙන් හා අවිහිංසාවෙන්ද මෛත්‍රී චිත්තඣෙන්ද දෙඵඣන්සහිතවූ ලොකඣ ඒ බුදුපසේ බුදුමහරහන්හු ආරක්ෂාකරන්නාහුඣ එහෙයින් ඒ බුදුපසේ බුදුමහරහතුන්වහන්සෙරෙහි වරදවා පිළිඉනාපැද්දගුත්තේනී.

රත්නඤඉෙහි වරදවා පිළිපැදීමෙහි ආදීනවඣි. 16

සරණ සමාදන්වන ක්‍රමය කෙසේදයන් ?

26 මෙහිවනාහි උපාසක උපාසිකා සංඛ්‍යාත සරණගතවූවන්ම කුමක් නිසාන් හික්මවනලද්දාහුදයන්? බුදුවරුන්වනාහි සියළු දිව්‍ය බ්‍රහ්මාදීන්ට හිතවැඩපිණිස බුඩකම ලබන්නාහු නොවේද්ද "අත්‍ථාය හිතාය සුඛාය දෙවමනුස්සානං බුඩොලොකෙ උප පජ්ජති" යනාදීන් සියළු සතුන්ට හිතවැඩපිණිස බුදුවරයෝ ලොවුපදනාහුයහි ආගම ධර්මයහි ආඥේ නමුදු තෙ තමන්ගේ හිතාභිවෘඩිය කැමතිව තමන් වහන්සේකරුපැමිණියාවූ ප්‍රාඥසත්වයන් සඳහාම ශ්‍රී සඩර්මය දෙශනා කෙළ්ය ශ්‍රී සඩර්මය අවබොධ නොකටහැකිවූ නුමුකළ කුසල් ඇතනාවූ මොහෙයන්මුළාවූ සත්වයන් සඳහා ධර්මය දෙශනානොකළේය. එමහ සින් තථාගතයන්වහන්සේ විනයන්ය කවයුතුවූ ශාරිපුත්‍ර මහාකා ශ්‍යප උත්පලවර්ණී ඛෙමා විශාඛා අනාථපිණ්ඩි ආදීඇතම් මනුෂ්‍යයන්ද ඇතම් දිව්‍යබ්‍රහ්මාදිහුද විනයනය කරණුපිණිසම ධර්මදේශනාකර වදාළේයි. එපරිද්දෙන් අනන්තාපරිමාණ සත්වයන්ගෙ අතුරෙන් මුකළ කුසල්ඇතනාවූ දිව්‍ය බ්‍රහ්මයන්ම උන්වහන්සේගේ ධර්මය අසා සතර මඟ සතරඵලයවපැමිණ උතුම්වූ නිර්වාණසැපය අනුභවකළෝයවිඳුව මානවකා මාගණ්ඩි සුරණ කාශ්‍යපාදි මනුෂ්‍යයන් හා බක බ්‍රහ්ම වස වත්තී ඕරාදී දෙවියන්ද විනයනය නොකෙළේයි. ඒ සත්වයන්වනාහි බුදුන්ගේ ලෝපහළවීමෙන් ලැබියහැකිවූ ලෞකික ලොකොත්තර සැපය නොලැබුවාහුය ඊට උපමා කවරේදයන් ? දහසක් රශ්මිමා ලාවෙන් සකල ලොකධාතුව ආලොකකිරීමෙහි පොහොසත්වූ සූර්‍ය දිව්‍යරාජතෙමේ ශුගදුරුමුදුනෙන් උදාවූයේද සූර්‍යාලොකය කැමැ තිවූ සූර්‍යාලොකයෙන් ප්‍රයොජන ලබනුකැමති චක්ඛුරෙන්ද්‍රිය ඇත් නාවූ සත්වයෝම ඒ සූර්‍යාලොක ඵලය විඳින්නාහුය ඒ සූර්‍යාලොකය නොකැමැතිවූ වවුල් බකමූහුණු ආදී අනෙක ප්‍රකාර සත්වයෝ ඒ සූර්‍යාලොකයෙන් ප්‍රයොජන නොලබන්නාහුවෙති එපරිද්දෙන්ම "දෙවමනුස්සානං" යනුවෙන් සියළු දෙවිමිනිසුන්ට හිතවැඩපිණිස යහි කීවද්ද සියළු දෙවිමිනිසුන් සඳහාම ධර්මදෙශනා නොකරණ සේක්මය සියළු දෙවිමින්ස්හු විනයනයද නොකටහැක්කේය ඊට උදාහරණ. මෙසේයි අපගේ භාග්‍යවන් බුදුරජාණන්වහන්සේ එක්දවසක් සැවැත්නුවර පිඬුසිඟා වඩිනුයේ මාගීයෙහි කෙශීනම් අශ්වාචාර්‍ය මයෙක් සම්මුඛව මෙසේ විවාළේය එබා කෙණිය තෙපි අශ්වයන් හික්ම වන්නාහු කෙසේ හික්මවන්නේදැයි විචාරා වදාළේයි. එබසට ඒ

අශ්වාවාරෙතමේ යඞ්ගමින්වහන්ස මම වනාහි සියුම්වූ උපායෙන් භික්මවියයුතු අශ්වයෝ සියුම් උපායෙන් භික්මවන්නෙමි රළු එරුණවූ උපායෙන් භික්මවියයුතු අශ්වයෝ රළුඑරුණ උපායෙන් භික්මවන්නෙමි කලෙක සියුම්වූද කලෙක රළුඑරුණවූද උපායෙන් භික්මවියයුතු අශ්වයෝ කලෙක සියුම්වූද කලෙක රළුඑරුණවූද උපායෙන් භික්මවන්නෙමියි භාග්‍යවතුන්වහන්සේට සැලකෙළේය.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ එඹා කෙශිය තෙපි විසින් කියනලද තුන්ප්‍රකාරයෙන්ම නොභික්මවියහැකි අශ්වයන්ව කුවක් කරන්නේදැයි විචාරා වදාළකල්හි සඞ්ගමින්වහන්ස තුන්ප්‍රකාරයන්ම නොභික්මවියහැකි අශ්වයෝ ජීවිතය සහිතවම නැබෑමෙන් කිසි අර්ථයක් නොවන බැවින් ඔවුන්මරා මස්අනුභවකරම්යි සැලකෙළේයි නැවතත් ඒ අශ්වාවාර්‍යතෙමේ තථාගතයන්වහන්සේට මෙසේ සැල කෙළේයි. සඞ්ගමින් භාග්‍යවතුන්වහන්ස නුඹවහන්සේ සියළුලොක සත්වයා භික්මවීමෙහි ඉතා දක්ෂ සේකැයි ලෝකයෙහි ප්‍රසිද්ධය නුඹවහන්සේ නවරාකාරයකින් ලොකයා භික්මවන්නේදැයි විචාළේයි.

ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ මෙසේ වදාළ සේක් එඹා කෙශිය මම වනාහි සියුම්වූ උපායෙන් භික්මවියයුතු සත්වයෝ සියුම් උපායෙන් භික්මවන්නෙමි රළුඑරුණ උපායෙන් භික්මවියයුතු සත්වයෝ රළුඑරුණ උපායෙන් භික්මවන්නෙමි කලෙක සියුම්වූද කලෙක රළු පරුසවූද උපායෙන් භික්මවියයුතු සත්වයෝ කලෙක සියුම්වූද කලෙක රළුඑරුසවූද උපායෙන් භික්මවන්නෙමියි වදාළේයි.

ඉක්බිති අශ්වාවාර්‍යතෙමේ සඞ්ගමින් යම්සේ කියන ත්‍රිවිධාකාරයෙන් නොභික්මවියහැකි සත්වයන් ඇතැයි විචාළේය ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ වදාරණසේ එඹා කෙශිය එබඳු සත්වයෝ එකාන්තයෙන්ම සැපයෙන් තොරවූ මනුෂ්‍යාත්මයෙන් පැරදුනාවූ නිෂ්ප්‍රයෝජන සත්වයන් බැවින් මම ඔවුන් මරාදමම්යි වදාළේයි. ඉක්බිති අශ්වාවාර්‍යතෙමේ සඞ්ගමින් භාග්‍යවතුන්වූ නුඹවහන්සේ සත්වයන්ගේ ජීවිතෙන්ද්‍රිය සිඳීම නිඝ්ඨිත පාණාතිපාත අකුශලකර්මයැයි වදාරන්නේ නොමැවිද දැන්වනාහි නොභික්මවියහැකි සත්වයන් තමන්වහන්සේම මරවයි වදාළවචනය මෙසේ අයෙදන්නේදැයි විචාළේයි ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ වදාරණසේ එඹා කෙශියමෙහි මැරීම එබඳු චේතනාවෙන් ජීවිතෙන්ද්‍රිය මහළුවක් නොවන්නේය සතර අපාය වදාරවසාත්බා ත්‍රිවිධඋපලබ්ධිය ගතහැවූ තැනැත්තාගේද

ඔය පෙන්වා දීමෙහි පොහොසත්වූ මාගේ අවවාදය නොඅසන්නාවූ සඟපත් ප්‍රතිපත්තිය මිළිඉහපදින්නාවූ ගැඹුරුජලාශයක හෙළනලද. මිහත්වූ ගලක් නොතැවැත්වියහැකිව පත්ලටම බැසගන්නාක්මෙන් අපාය ගමනටම නියතවූ අඤ්ඤ සත්ත්වයන්ට ධම්මාවවාදානුශාසනා නොඅසාකට එබදු සත්වයන් අපෙක්ෂා නොකොට මධ්‍යස්ථවීම ඔවුන්ට මරාදැම්මනම්වෙයි. මේ ලොකයෙහි සොරුන් වධකයන් ආදී දුෂ්ට සත්වයන් මරාදමන්නාවූ රටවරක්නා රජදරුවෝතුමූ ඒ සොරුන් ආදීන්ගේජීවිතක්ෂය සිදු මරා දැමීමෙන් එකම ජීවිතයක් එක්කලෙක එක්සැකෙනි පඤ්චකයක්ම එක්භවයක්ම නසන්නේවෙයි අවවාදානුශාසනා නොකිරීමෙන් මාගේ බැරිමවනාහි අනන්තාපරිමාණ දීර්ඝ සංසාරයෙහි නොමයක් කල්පකෝටි සතසහස්සයෙහි උපමා විෂයානික්‍රාන්තවූ සතර අපාය භය සංසාරභය විදිමෙන් මෙතෙකැයි ප්‍රමාණ නොකළැකි මරණපැමිණීම්වල නොතුවන්නේයැයි දෙශනාකළමැනැවැ. එනෙසින් දෙවිමිනිසුන් සඳහායැයි පාළි අටුවා කථාදියෙහි ආවාවූ වචනය චිනයනය කවයුතුවූ දෙවිමිනිසුන් සඳහාමයැයි අදිහිතයුතුයි.

නවද සර්ව බුදුවරයෝම නොව පුරාතන අබුඩොත්පාදයෙහි ලොව උපන් මහා ප්‍රාඥයෝද විනයනයකව යුතු ප්‍රාඥයන්ම විනයනය කළාහුමැ හේ කෙසේ දතයුතුදයත් ? අපගේ ශ්‍රීමහාබොධිසත්ව තෙමේ එක්සමයෙක්හි බමුණු මහශාල්භුලයෙහි ඉපිදවිය පැමිණ වෙදත්‍රය ඔහුගේ පාරප්‍රාප්තාව හිඟිගෙයි කළකිරී සෘෂි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව හිමාලය වනයෙහි තපස්කරණුයේ එක්දවසක්වනයෙහි ඇවිද එක්ගරා පස්පියුමෙන් ගැවසිගත් විලනවබැස ජල ස්නානයනකාට ඉවිරවනැගසිටිනුයේ වාතානුසාරයෙන් යව සුළඟට අා පද්ම සුගන්ධිය ආඝ්‍රාණයකෙළේය. ඉක්බිති මේ ශාසනයෙහි උත්ථලවණ්ණතිවූ ගම්භීරඤාණතාදෝ එසමයෙහි දිව්‍යාත්මභාවයෙහි ඉපිද ඒ විල අරක්ගෙණ වසන්නී දෘෂ්‍යමාන ශරීරයෙන් අවුත් එඹා තාපසයා තොපි අනුන්සතනක සුගන්ධය පැහැරගන්නාවූ ගන්ධබ්බෙහකයෙකැයි චෝදනාකළේය. ඉක්බිති තාපසතෙමේ ඒ වචනය අසා දැන් මේ දෙවිදූතතෙමේ ගඬිඅඬනකැයි කළාවූ දෙෂාරොපනය අන්කිසි මෙක් මෙහි අවිද්‍යමාන බැවින් මාහකරහිම ආරොපනයකකළේයැයි සිතා පින්වත්නී තොපගේ මල්සුවඳ සොරකම්කළ සෙරු කව මෙරක්ද ? ගඬිඅඬනකැයි දෙෂාරොපන කළාවූ නහාප කවරෙක් දැයි විචාළේය. ඉක්බිති දෙවිදූ තියැණියේ තාපසයෙනි මම වනාහි

ඉක්බිති දෙව්දූ කියනුයේ තාපසයෙනි මම වනාහි මේ පස් පියුම්විලට අරක්ගත් දෙව්දූවෙමි. එපමි මාගේ විලටබැස ජලස්නා න්යකොට මාගේ පියුම්මල් සුවඳ වසඳවාවෙන් ආඝ්‍රාණයකළ බැවින් එපමි. ගන්ධඵලනකයෙක්වියයි කීයේයි. තාපසතෙමේ දෙවධිතා හුගේ වචනය අසා මෙයේ සිතුහ මේ විලටබනාහි ආ ආ මනුෂ්‍යයෝ ජලස්නානයකොට යටසුලඟට චාතානුසාරයෙන් ගමන්නාවූ පියුම් සුවඳ ආඝ්‍රාණයකරන්නාහුය එතකුදුවූවත් දුරදී පියුම් සුවඳ ආඝ්‍රා ණයකළාවූ මා ගන්ධඵලනකයයි සොරකමට අල්වා ගැණීම යුතුනාක් නොවේයයි ඒ අයුතු දෙෂාරොපනය වළක්වදුපිණිස මේ ගාථාව කීහුය ඒ කෙසේදයත් ?

"නහරාමිනං කුසුමාමි-ආරාසිංඝාමිවාරිජං
අථමෙ නනුවණ්ණින-ගන්ධඵලනොනි වුච්චති"යි.

එබා දෙවධිතාව මම තාපසගේ විලෙහි පිපිඛියාවූ පද්මය පැහැර නොගත්තෙමි අතින් පැහැරගෙණ සුවඳ ආඝ්‍රාණයද නොකෙළෙමි එතකුදුවූවත් චාතානුසාරයෙන් ආවාවූ සුවඳ දුරසිට ආඝ්‍රා ණයකෙළෙම් කුමක්හෙයින් මට සුගන්ධ චොරයෙකැයි කියනලද්දේයි විමසූයි ඉක්බිති දෙවතාදූ කියනුයේ එබා තාපසයෙනි පුරාතන මහාප්‍රාඥයෝ වනාහි ශික්මවියයුතු නුවනැත්තන්ම ශික්ම වියයුතු කාරණයක් පැමිණිකල්හිම මනාකොට ශික්මවන්නාහුය නොශික්මවිය හැකි නුවණැමද සත්‍යයන් අස්ථානයෙහි නොශික්ම වන්නාහුයයි කියා මේ ගාථාවෙයින් අවවාදකෙළේයි.

"ආකිණ්ණලුද්දපුරිසො-ධාතිචොළංව මඤ්ඤතෙ
තයිදංමෙවචනං නත්ථි-තඤ්චරහාමීවත්තනං
අනඝනස්ස පොසස්ස-නිච්චං සුඛගවෙසිනො
වාළගහණත්ත පාපස්ස-අබ්භාමත්තංව ඛායති"යි

මේහි භාවය නිදුකැණෙනි නොයෙක් අකුශලකර්මයන් හැව සීගත් බැවින් රළුපරුෂවූ පැවතුම් ඇතතාවූ පුරුෂයෙකුගේ කෙල සෙම් සොටු මලමුත්‍රයන් වැකුනාවූ කිරි මවකුගේ ඉනකඩක්මෙන් නොයෙක් අකුශලකර්මනමැති අපවිත්‍රයෙන් වැසෙනලද්දේයි එහෙයින් ඒ අකුශලකර්මයන් හැවසීගත් රළුපරුෂ පුරුෂයාකෙරෙහි මාගේ අවවාදානුශාසනාවෙන්නැත්තේය සමීපපාපිවූ තාපසයාම අවවාදකළමැවන්නාහුය ප්‍රිය ශිලිවන්නාහුය එහෙයින් සුවල්පමාත්‍රවූද

අකුසලකර්මයක් නොකරන්නාවූ ඒ ශ්‍රමණයාම නික්මීමට මම සුදුස්සෙක්වෙමි නිෂ්පාපිවූ නිරන්තරයෙන්ම ත්‍රිවිධසැපයම සොයන්නාවූ තෙපිවැනි සාධු සත්පුරුෂයෙකුටම අස්වලාමි අහක්පමණ සවල්පි මාත්‍රවූද අකුශලය මහත්වලාපවලයක්මේන් වැටහෙන්නේය එහෙයින් දුන් නෙපි කුමක්හෙයින් මෙබඳු සවභාව ඇතතාවූ අදෘශය අකුශලයයි වාවහාරකරන්නට නුසුදුස්සක් කෙරේදැයි කියේය ඉම සේ පුරාතනයෙහි මහාබෝසත් ආදි උත්තමයෝ අවවාදනුමවූ සාධු සත්පුරුෂයන්ටම අවවාදානුශාසනා කළාහුයැයි දතයුතුයි එහෙයින් මතීවාත්තකාලයෙහි භාග්‍යවතුන්වහන්සේ විසින් දෙවාවදරණලද උපාසක උපාසිකායන උතුම් බුදුරජුලැඳුම්හි ඇතතාවූ. සරණගත පුද්ගලයෝම බුධානුශාසනාව පිළිගණ රත්නත්‍රයෙහි පැහැද දෙව් මිනිස් සැපහා කෙළවර නොනතු නිර්වාණ අමාමහ නිවන්සැප ලබන්නා හුවෙති මෙසේ සරණගත උපාසක උපාසිකාවන්ගේ රත්නත්‍රය කෙරෙහි ප්‍රසන්නවීමෙහිද වරදවා පිළිපැදීමෙහිද ආනිසංස ආදීනව විභාගය සැකෙවින් දතයුතුයි.

සරණසමාදාන ක්‍රම නිදේශයයි 26.

සරණ ගමනය කිළිටුවන ක්‍රමය කෙසේදයන් ?

---

27 ලොවි සරණගමනය ලොව්තුරා සරණගමනය යන දෙවැදෑරුම් සරණගමනයන් අතුරෙන් ලොවී සරණගමනය වනාහි තුණුරුවන් ගුණනොදක්නා ආකාරයෙන් ප්‍රතිඝෝදනයකරන්නාවූ මොහ සංඛ්‍යාත අඥාන තාවයද බුදුන් සම්බුදුවේදෑ නොවේමදෑ ධර්මය ස්වාඛ්‍යාතවේදෑ නොවේදෑ සංඝයා සුප්‍රතිපන්නවේදෑ නොවේදෑයි සැකකිරීම් සංඛ්‍යාතවූ විචිකිච්ඡා සංඛ්‍යාත සංසයද අපායභය සංසාරභය නසා ත්‍රිවිධ සැපඵලවීමෙහි ශක්තිය රත්නත්‍රයෙහි විද්‍යමාන වේදෑ නොවේදෑමෙහායි හුදෙක් මනොචාරමයෙහි උපදනා අකුශල චිත්තාවිෂ්ටය සඞ්ඛ්‍යාවූ මිථ්‍යාඥාණයද රත්නත්‍රය කෙරෙහි අගෞරව කිරීමයයි කියනලද අනාදරයද රත්නත්‍රයකෙරෙහි බුහුමන්නොකිරීම් සංඛ්‍යාතවූ අගාරවයද යනාදි අකුශලධර්මයන් මහතුකොටගණ සරණ කිළිටුවන්නේයි, මහාප්‍රාඥික මහාවිෂ්ඵාරනොවන්නේයි. මාගී සප්‍ත පුද්ගලයන්ගේ ඒපාපධර්මයන් මාගීඵලයන් දුනිනකළබැවින් ඵලාකුතර සරණගමනයෙහි එබඳු කෙළෙසීමෙක් නැත්තේයි එහෙයින් කිහ දීඝනිකායාටී කථාවත්‍ථු=සාමඤඤඵලසූත්‍ර අට්ඨවණ්ණනාවෙහි

"තත්‍රිදං ලෞකිකස්‍ය සරණගමනස්‍ය තීස්‍රවත්‍ථූස්‍රු අඤ්ඤාණ සංසය මිච්ඡා ඤාණාදීහි සංකිලිස්සනි නමේහා ප්‍රහීනත්තා හොති. නමේහා විප්පහාරං ලෝකුත්තරස්සපි සංකිලෙසෝ" යනුයි මේසේ සරණගමනය කිළිටුවනාක්‍රමය දතයුතුයි.

සරණගමනය කිළිටුවනආකාරයයි 27.

සරණගමනයාගේ භෙදය කෙසේදයන් ?

29 ඒ ලොවී ලොවිතුරා සරණගමනයන් අතුරෙන් ලෞකික සරණගමනයාගේ බිඳීම සාවද්‍ය අනවද්‍යවශයෙන් දෙවැදෑරුම්වන්නේය ඒ ප්‍රකාර භෙදයන් අතුරෙන් සාවද්‍යභෙදයවනාහි සරණ කිළිටුවන ආකාර දැක්වූක්‍රමයන් ගත්තත්‍රයවනාහි අපායභය සංසාර භය දුරුකොට නිර්වාණ සැපඑළවීමෙහි පොහොසත් නොවන්නේයයි මනාචාරයෙහි චිත්තවිප්‍රකාරයක් ඉපිද ඊට අනතුරුව රත්නත්‍රයෙන් පිටත්හිවූ අන්‍යශාස්තෘන්කෙරෙහි ආත්මසත්තියාත්මාදි සතරාකාරයෙන් එක්ආකාරයකින් සරණගැණීම්වශයෙන් සාවද්‍යවූ සරණගමන භෙදයවන්නේයි ඒ භෙදය අනිෂ්ටවිපාක දෙන්නේයි එහින් අනවද්‍ය භෙදය කාලක්‍රියාවෙන් වන්නේයි ලෝකුත්තර සරණගමනය මාගීඵලයාටම ලැබියයුතු බැවින් මාගීඵලයාගේ දෘෂ්ටිවිචිකිත්සාදි සරණගමනාපකිලේශයන් නිරවශෙෂයෙන් ප්‍රහීනකරණලද හෙයින් ලෝකුත්තර සරණගමනයෙහි භෙදයෙක්නම් නැත්තේමැයි. එහෙයින්කිහ දීඝනිකායාට්ඨ කථාවෙහි.

"ලෞකිකස්සාව සරණගමනස්ස දුච්චිඤ්ඤා භෙදෙ සාවජ්ජා අනවජ්ජෝච තත්‍ථ සාවජ්ජා අඤ්ඤසත්‍ථාරුද්දිසු අත්තසන්නි යාතනාදීහි හොති යොව අනිඨ ඵලාහොනි අනවජ්ජා නාම කිරි යාය හොනි සා අවිපාකත්තා අඵලෝ ලෝකුත්තරස්සපන තොවත්‍ථි භෙදෝ"යි මේ අට්ඨකථාපාඨයෙහි "අවිපාකත්තා අඵලා" යන මේ භාවය අන්‍යතීර්ථකාදීන් විෂයෙහි ආත්මසත්තියාත්මාදි වශයෙන් මිය දිවුගැණීමෙන් අනිෂ්ට විපාක ලැබෙන්නාක්මෙන් කාලක්‍රියාවෙන් වන්නාවූ සරණගමන භෙදය කුමක්මහයිද අනිෂ්ටවිපාක නොවන්නේදයන් ? චුතිසිත්තවනාහි අව්‍යාකෘත කාමාවචර මහාවිපාකයක් බැඳීන් අනිෂ්ටවිපාක නොදෙන්නේයයි දතයුතුයි ලෝකුත්තර සරණගමනය වනාහි සරණගමනාපකිලේශයන් නැතිහෙයින් කෙලෙසිඹක් හෝ භෙදයෙක් හෝ නැත්තේයයි දතයුතුයි.

තවද ලොව් සරණගමනය කාලක්‍රියාවෙන් බිඳෙන්නාක් මෙන් ලොකුත්තර සරණගමනය කාලක්‍රියාවෙන් බිඳෙන්නේදැයි ප්‍රශ්නකරයුතුයි. සෝවාන් සකෘදාගාමී අනාගාමී යන ආර්‍යයන්ගේ සකාශයි පරම්පරාව භවයෙන් භවයට පෙරළියන්නේද මාර්ගඵලයන් නසා නැවත නූපදනා බැවින් රත්නත්‍රයෙන් අන්‍යවූ දක්ෂිණාර්හයක් නොවෙයි යන බැවින් ලොකුත්තර සරණගමනයෙහි භෙදයක් නැත්තේමැයි එසේයි කීයේමැයි අට්ඨකථාවෙහි "භවන්තරපිහි අරියසාවකෝ අඤ්ඤං සත්ථාරං න උද්දිසති" යි මෙහිවනාහි මෙසේ ලොව් සරණගමනයාගේ දෙවැදෑරුම්භෙදය හා ලොව්තුරා සරණගමනයාගේ අභෙදයද වෙසෙසා අවබොධ කටයුත්තේයි.

සරණගමන භෙදය යි. 28.

සරණගත උපාසකයා විසින් නොකටයුතු අධර්මවෙලඳුම් පස කුවරයන් ?

—•—

29 මෙසේ රත්නත්‍රය සරණගතවීමත් උපාසක උපාසිකා යන විශිෂ්ට ධර්මරාජ මුද්‍රාලක්ෂ්ණයෙන් මුද්‍රණයකරණලද නම් ඇතනාවූ සෞගතයන් විසින් රැක්කයුතුවූ ගෘහස්ථශීලයවනාහි පඤ්චශීලය ආජීවාෂ්ටමක ශීලය දශශීලය අෂ්ටාඞ්ගුපෝෂථ ශීලය යනාදීන් අනෙකප්‍රකාරවේවැයි ඒ ශීලයෝද සුදුසු පරිදෙදන් යථාක්‍රම යෙන් මතු විස්තාර කරණ්ලැබේ.

සරණශීලය පවත් සියළු ශීලයන්ම රක්නා ගෘහස්ථ උපාසක උපාසිකාවන් විසින් නොකටයුතු අධර්ම වෙලඳුම් පසෙක් ඇත්තේයි. ඒ පස්වෙලඳුම්නම් ශස්ත්‍ර වෙලඳුමය සත්ත්වවෙලඳුමය මස්වෙලඳුමය මද්‍යවෙලඳුමය විසවෙලඳුමය යන මොවුහු පස්වෙලඳුම්නමේවේ. ඔවුන් අතුරෙන් ශස්ත්‍රවෙලඳුමය යනු කඩු දුනු මහල්ල අඩයටි ආදි සත්ත්වඝාතාවපිණිස ව්‍යවහාරකරන්නාවූ ආයුධාදිය තමන් විසින් සෑදූ හෝ අනුන්ලවා සාදවාහෝ යම්කිසි ආකාරයකින් වෙළඳුම්කිරීමනමේවේ සත්ත්වවෙලඳුමය යනු යුඩහුම්යෙන් පැරද තමන්අතට පත්වූ මිනිසුන් හෝ මෘගයෙහි රැකසිට අල්වාගන්නා මිනිසුන් හෝ අනික් අනික් උපායකින් අල්වාගන්නා මිනිසුන්හෝ ඔවුන්ගේ අපරාධීන ජීවිතයට බාධාවන පරිදි අනුන්ට විකිණීමෙන් කරන්නාවූ වහල්වෙළඳුමය එතඹුදුවූවත් මීලඟුදල්දී මිනිසුන් දාස බැළමෙහෙපිණිස ගොදැණීම හෝ උගසටබැඳ මිළඟුදල්ගැණීම හෝ සත්ත්වවෙළඳුම නොවන

බැවින් කර මරා නීනවශයෙන් යුඩාදියෙන් පැරද අල්වාගන්නාලද මිනිසුන්ගේ අපරාධනඛවට බාධාවන නියාමයෙන් විකිණීම මෙනී සත්‍යවෙළඳුමයයි දතයුතුයි. එහෙයින් අටුවාමයගි "සත්තවණිජ්ජා අකරණීයා අහුජීවස්ස භාවකරණතා" යනු කිඹ මිස්වෙළඳුවය යනු එළු, බැටළු තිරච්ඡ පළුළු උරු මුව ඟෝන කුකුල් පරවි වීකුරුළු ගේකුරුළු ආදි ඔස් කනපිණිස ව්‍යවහාරකරන්නාවූ සතුන්ඇති කොට ඟෝ අල්වා ඟෝ මස්පිණිස විකිණීමයි මද්‍යවෙළඳුවය යනු පස්වැදෑරුම් සුරාවහා පස්වැදෑරුම් මේරයද අබින් කන්සා ආදි මත් වන ද්‍රව්‍යද සාදා විකිණීම ඟෝ අනුන් විසින් සාදනලද සුරා ද්‍රව්‍ය මුදලට ගෙණ නැවත විකුට ලාභගැණීම ඟෝ මද්‍යවෙළඳුමනම්වේ විෂවෙළඳුමය යනු මනුෂ්‍යමාරණයට ඟෝ ඔත්ෂ්‍ය සිව්පාදින් මැරීම පිණිස ඟෝ ව්‍යවහාරකරන්නාවූ විෂවගී තමා විසින් සාදා විකිණීම ඟෝ අනුන් විසින් සාදනලද විෂවගී මුදලටගෙණ විකුට ලාභගැණීම ඟෝ විෂවෙළඳුමනම්වේ ශස්ත්‍රවෙළඳුමෙහි මනුෂ්‍ය තිරශ්චීන සත්ත්‍ව තනයටමුත් මිනිසුන්ගේ ඟොව්කම් වඩුකම් යකඩකම් ආදිය පිණිස සාදන්නාවූ කැති උදළු වැ පොරෝ ආදිය විකිණීමද මද්‍ය විෂවෙළඳුමෙහි බෙහෙත්පිණිස භාවිතාකරන්නාවූ මද්‍යවගී විෂවගීදිය වෙළඳුම් කිරීමද අධර්ම වෙළඳුම්පසට අයත් නොවනබව දතයුතුයි. මෙසේ මේ පස්වැදෑරුම් අධර්මවෙළඳුම සරණගත උපාසක උපාසිකාවන් විසින් නොකටයුතුයි. මෙබඳු වෙළඳුම්න් සපයනලද ධනයෙන් තමාගෝ අඹුදරුවන් ඟෝ පොෂ්‍යයකිරීම් අධර්ම ජීවිකා නම එබඳු ධනයෙන් කරන්නාවූ දානමානාදි පින්කම්ද මහාප්‍රතික මහාවිෂ්ඨාර නොවන්නේමැයි.

එයින් වදාළහ අඟුත්තර පඤ්චක නිපාතයෙහි "පඤ්චිමා භික්ඛවෙ වාණිජ්ජා උපාසකෙන අකරණීයා කතමෙ පඤ්ච සත්ථවාණිජ්ජා සත්තවාණිජ්ජා මංස වාණිජ්ජා මජ්ජවාණිජ්ජා විසවාණිජ්ජා ඉමෙ ඛො භික්ඛවෙ පඤ්චවාණිජ්ජා උපාසකෙන අකරණීයා"යි මේ වනාහි උපාසක උපාසිකාවන් විසින් නොකටයුතු පස්වෙළඳුමනම්වේ.

උපාසකයන් විසින් නොකටයුතු අධර්මපස්වෙළඳුම්යි 29.

උපාසකභාගේ උපාසකභාවය විපතිනවන්නේ කෙසේදයන් ?

---

30 යම්කිසි සරණගත උපාසකයෙක් තෙමේ මතු දක්වනු ලබන පඤ්චශීලය හා ආජීවාෂ්ටමක ශීලයද යන චාරිත්‍ර ශීලයන් සම්පූර්ණකරන්නේවිනම් ඒ උපාසකයාගේ උපාසකධර්මය විපරිත

වන්නේයැයි දතයුතුයි. තවද උපාසකචණ්ඩාලය උපාසකපිලිය උපාසකපතිකිඨයයි කියනාලද තුන්ප්‍රකාරයෙහි යුක්තවීමද උපාසකයාගේ උපාසකභාවය විපරිත භාවයට පැමිණීමනම්වේ ඒ උපාසක චණ්ඩාලාදි භාවයට හෙතුවූ පඤ්චප්‍රකාර ධම්මයෝ කවරහයත්? මේ ශාසනයෙහි සරණගතවූ උපාසකතෙමේ පස්ආකාරයකින් උපාසක චණ්ඩාල නම්ද වෙයි උපාසක මලනම්දවෙයි උපාසක පතිකිඨ නම්දවෙයි නොවත් රළු පරුෂවූද කිළිටුවුද ලාමකවූද උපාසකයෙක් මවයි මේ කවර පස්ආකාරයකින්දයත්? යම් උපාසකයෙක් මෙතුමේ රත්නත්‍රයෙහි ඇදහිමක් නැත්තේවේද දුෂ්‍යවූ සිල්ඇත්තේවේද අඥාන මනුෂ්‍යයන් විසින් පණවනලද කොතුහල මංගල්‍යයන් අද හන්නේ වේද කොතුහල මහල්‍යයක්ම ප්‍රාර්ථනාකෙරේද කම්ය නොඅදහන්නේවේද ශාසනයෙන් පිටත්හිවූ අන්‍යතීර්ථියයන් කෙරෙහි දැහිණාහි පුද්ගලයන් සෙවිනේවේද දානමානාදි පින්කම් කරණකල්හි පළමුකොට අන්‍යතීර්ථිකාදින් කෙරෙහි දානමානාදිය කෙරේද මේ පස්ආකාරයෙන් උපාසක චඩාලනම්දවෙයි. උපාසකමල නම්දවෙයි උපාසක පතිකිඨනම්දවෙයි දතයුතු.

එසින් වදාළහ "පඤ්චහි භික්ඛවේ ධම්මෙහි සමන්නාගතෝ උපාසකෝ උපාසක චඩාලොව හොති උපාසකමලඤ්ච උපාසක පතිකිට්ඨොව කතමෙහි පඤ්චහි අස්සද්ධොහොති දුස්සීලොහොති කොතුහලමඟලිකොහොති මංගලං පවෙචති නොකම්මං ඉතො වෙබහිද්ධා දක්ඛිණෙය්‍යං පරිගවෙසති තත්ථව පුබ්බකාරං කරොති" යි මේ දෙශනාපාඨයෙහි කොතුහල මඟලය යනු ප්‍රථමකල්පිකවූ ඇතම් අඥාන මනුෂ්‍යයන් විසින් යම් යම් දේ මගුලැයි සලකා ලොකයෙහි පුරුදුකළාවූ දිඨමඟල සුතමඟල මුතමඟලයෝයි ඔවුන් අතුරෙන් දිඨමඟලනම් උදෑසන නැගිට පූර්ණඝටකයක් හෝ ලක්ෂණ සම්පන්න වෘෂභයෙකුහෝ කිරිදෙනක් හෝ දැකීම් ආදියද අනිකුදු අහිවතවූ යහපත්දේ දැකීමද මඟල්‍යයක්වෙයි හිස්කළයක් හෝ අඟවිකළ මනුෂ්‍යයෙක් හෝ මහල්ලෙක් හෝ මෘතශරීරයක් හෝ රොගාතුරයෙක් හෝ නීචජාතික මනුෂ්‍යයෙක් හෝ අනික් අශුභවස්තුවක් නොදැකීම අවදිගුලැයි දෘෂ්ටිගැණීම දිඨමඟලනම් වන්නේයි සුතමඟලය යනු උදෑසන්හි නින්දෙන් පිබිද සිරිවඩිනය ලැබ්වා ධනවඩිනයවේවා ගුහයක්ලැබ්වා යහපතක්වේවා යනාදි යහපත් වචන ඇසීම මඟල්‍යයක්වෙයි එසේම උදෑසන්හි අසවලා කාලකණ්ණියාකමළේය අසවලා රෝගාතුරවූයේය යනාදී අප්‍රිය අශුභ වචනයන්

ඇසීම අවමඟල්‍යයයි ගැණීම සුතමඟලනම්වේ මුතමඟලය යනු උදෑ සන්හි මනාසුවඳක් ආඝ්‍රාණයකිරීමද යහපත් අහිනව වස්ත්‍රාදියහැඳ පැලඳීමද යහපත් සුවඳමල් පැලඳීමද යහපත් අසුන්හි හිඳීමය යන පත් පස්ගෝරසාදිය ඇල්වීම හෝ අනුභවකිරීමය යනාදිය උතුම් මඟල්‍යයක්මවයි. එසේම අයහපත් වස්ත්‍රාදිය හැඳපැලඳීමද අයහපත් ගඬාදිය ආඝ්‍රාණය කිරීමාදිය අවමඟල්‍යයයි ගැණීමවේයි මෙසේ දක්වනලද දිට්ඨමඟල සුතමඟල මුතමඟල තුණ සත්‍යයයි ඇදහිම සරණකිරීම්වශයෙන් නොහොත් ඒපරිනවන්නාවූ උපාසක චණ්ඩාල උපාසකමල උපාසක පනිකිඨ බවට පමුණුවන්නාවූ මිථ්‍යා ද්‍රෂ්ටියයි දතයුතුයි.

මෙම සූත්‍රයෙහි ''පූබ්බකාරං කරොති'' යන පදයෙහි අර්ථ මෙසේ දතයුතුයි. රත්නත්‍රය සරණගතවූ යම් උපාසකයෙක් තෙමේ රත්නත්‍රයෙහි ශ්‍රද්ධාවම්දමවේද ශාසනයෙන් පිටත්හි අන්‍යතීර්ථිකයන් කෙරෙහි ශ්‍රද්ධාව බලවත්මවේද මහතෙමේ දන්දීමාදිය කරණුයේ පළමුකොට තීර්ථිකාදින් වඩාහිදුවාද පළමුකොට මහත් ගෞරවයෙන් තීර්ථිකාදින්ට දන්දේද රත්නත්‍රයට පසුව ගෞරව කෙරේද බුබපූජාව හා සංඝයාට දන්දීම පසුව කෙරේද මෙමෙස්කරන්නේ නමුදු රත්නත්‍රය සරණයාම අවශ්‍යයක් නැනැයි යන අදහසින් රත්නත්‍රයද අන්නොහැරියේද නිර්ථිකයන් කෙරෙහිද ආත්ම සන්නියෝතනාදි සතරාකාරයෙන් යම් ආකාරයකින් සරණගතාගියේවේද එසේ ආත්මසන්නියෝතනාදිවශයෙන් තමාගේ ආත්මඥතිපේක්ෂාදින්ට හෝ අන්‍ය දේවතාදින්ට ඇතා පාවාදෙනතාක් සරණබිදුමත් නම් නොවන්නේවැයි. උපාසක උපාසිකා යන උතුම් නාමය ඔහුට අයත්වන්නේ නමුදු උපාසක චණ්ඩාලය උපාසකමලය උපාසකපනි කිඨයයි යන නම් ලැබිය යුතුවේ එබැවින් ඒ ලාමකවූ උපාසකයාගේ ලක්ෂණ දක්වීම පිණිස ''පුබ්බකාරංකරොති'' යනු වදාළේයි. ඊට උපමා මවරයන් ? යම් කිසි රොගාතුරයෙක් තෙමේ තමන්ට ප්‍රතිඝ්‍යාධාරවූ චිකිත්සා කර්මයෙහි දක්ෂවූ මෛද්‍යවාඝීයාගෙන් හා ප්‍රත්‍යක්ෂ ගුණ ඇතතාවූ ඖෂධයෙන්ද නාප්තියව තොපැමිණ අන්හිසි මෛද්‍යවාඝීයෙක් සොයා පළමු මෛද්‍යවාඝීයාද අන්නොහැර පසුව සොයාගත් මෛද්‍යවාඝීයාගේ බණහෙද පළමුකොට අනුභවකළේමවේද එපරිද්දෙන්ම රත්නත්‍රය සරණගතවූ යම් උපාසකයෙක්තෙමේ සම්පූර්ණියෙන් මිථ්‍යාදෘෂ්ටිය පිළිනොගෙණ රත්නත්‍රයත් ඒකාදශයකිවත් අදහා නිර්ථිකාදීවකා

දින් සම්ප්‍රකාරයෙන් අදහා ඕවුන්ට පළමුකොට ගෞරව සත්කාර දිය පවත්වාද ඒ උපාසකත්වයේ උපාසක චණ්ඩාලාදිනම් ලබන්නේ යයි දතයුතුයි. ඉදින් යම්දවසක ඒ උපාසක චණ්ඩාලත්වයේ රත්නත්‍රය සරණගතවීම නිෂ්ප්‍රයෝජනයයි සලකා තීර්ථක ආජීවකාදින්ට හෝ ශිව විෂ්ණු ආදි දෙවියන්ට හෝ ආත්මසත්නියාදිනාදියෙහිට සරණගියේවිද එකල්හි මහා සාවද්‍යභෙදයෙන් තුණුරුවන් සරණ බිඳී මිථ්‍යාදෘෂ්ටිකයෙක්වේවිය ඒ සරණගමනය බිඳිම හා සමග උපාසක උපාසිකා යන උතුම් ධර්මරාජයාණන්වහන්සේගේ රාජමුද්‍රානාමය විකාශවී මහත් අනර්ථව්‍යසනයට පැමිණෙන්නේමැයි ඊට උපමා කවරයත්? පෘථිවිශ්වරවූ රජකු විසින් තනතුරු සමග රාජසම්කවිටු ගෞරව නාමාදිය දීමෙන් තමාගේ අමාත්‍යධුරයෙහි යොදනලද යම් පුරුෂයෙක් තෙමේ මෑතභාගයෙහි රජහුගේ සතුරන්ට පක්ෂව මහරජහට විරුද්ධව ක්‍රියාකරන්නේ විනම් රජ්ජුගේ රාජකෘත්‍යය හැරදමා සතුරන්ගේම කෘත්‍යකරන්නේ විනම් මහරජ විසින් ඒ සතුරුපක්ෂය භජනය කරන්නාවූ දුෂ්ටාමාත්‍යයා තනතුරෙන් පහකර පූර්වයෙහි දෙනලද ගෞරව නාමයද ආපසු රැගෙන සිරගෙහිලිසා ඒ දුෂ්ටාමාත්‍යයාගේ සම්පත්රාශියත් රජුන් විසින් පැහැරගන්නේහෝවයි රටින් නෙරපන්නේ හෝ වෙයි එසල්හි ඒ දුෂ්ටාමාත්‍යයා සියළු යශශෛශ්වර්‍ය්‍ය පිරිහී මහත් දුකට අනය ව්‍යසනයට පැමිණෙන්නේහ්යි එවැරිද්දන්ම රත්නත්‍රය සරණගත උපාසකයෙක් තෙමේ මෙත භාග්‍යයෙහි රත්නත්‍රයට ප්‍රතිපක්ෂව තීර්ථකාදින් කෙරෙහි පැහැද ආත්ම සත්ත්වජීවාදි සතරාකාරයෙන් එක්ආකාරයකින් සරණගතවූයේනම් එකෙණෙහිම භාග්‍යවතුන්වහන්සේ විසින් දෙනලද උපාසක යන උතුම් රාජමුද්‍රානාමයත් විනාශවී මරණින්මතු සතර අපායෙහි ඉපිද අනේ වා දහස්කල් පැසෙන්නෙහයි දතයුතුයි. මෙසේ උපාසකයාගේ උපාසක චණ්ඩාලාදි හීනභාවයට පැමිණීම හා "පුබ්බකාරංකරොති" යන දෙශනාපදයාගේ අර්ථයද දතයුතුවී.

උපාසකභාවය විපත්ති වන ක්‍රමයයි. 30.

උපාසකයාගේ පරිපූර්ණත්වය කෙසේදයත් ?

—— 0 ——

31 සම දක්වනලද ශීලයෙහි පරිපූර්ණකාරීව අඛණ්ඩ ජීවිකා වෙන් වෙන්ව දූහැමින් සෙමෙන් දිවිපැවැත්වීම් උපාසකයාගේ පරිපූර්ණත්වය වන්නේයි. තවද උපාසකරත්නය උපාසක පදවීය උපා

සහ පුණ්ඩරීකය යන උපාසකයන්ගේ තුන්වැදෑරුම් පරිපූර්ණ බවද යටකී පස්ආකාරයට ප්‍රතිපක්ෂවූ පස්ආකාරයකින් සිඳ ඔන්නේයි, ඒ මනසේදැයි? බුඩධම් සංඝ යන රත්නත්‍රයකෙරේ කම් කම් විපාකයෙහිද ඇදහිමයකි කියනලද ශ්‍රඩාවෙන් යෙදීමය පවතිලය ආජීවාෂ්ටමක ශීලය අෂ්ටාඟශීලය යනාදී ගෘහස්ථ සාධාරණශීලයෙන් පරිපූර්ණවීමය කොතුහල මහලයන් නොඇදහා කම්ය හා කම්විපාකය ඇදහිමය ශාසනයෙන් පිටත්හි තීර්ථික ආජීවකාදීන් කෙරෙහි දැඩි ශ්‍රඩාවක් නොසෙවීම හා දැන මාන්නාදිය කරණ කල්හි බුඩධම් සංඝ යන රත්නත්‍රය විෂයෙහිම පළමුකොට පිදීමය යන පස්වැදෑරුම් බණ්ඩයන් සම්පූර්ණවීමෙන් උපාසකයාගේ සම්පූර්ණ බවයයි කියනලද උපාසකරතනය උපාසක පදුමය උපාසක පුණ්ඩරීකය යන තුන්ආකාරය ලැබෙන්නේයයි දතයුතු මේ තුන්ආකාරයන් අතුරෙන් සිව්වැනිවූ රහිජනන අදියෙන් උපාසක රතනයයි කියාද සරණගමනාදී ශීලසුඛාඛයෙන් සියඑදනාව ප්‍රිය උපදවන අයුරුයෙන් උපාසකපදුමයයි කියාද ශීලාදිගුණ සුඛාඛයෙන් හා යහපත් කීර්තියෙන් යුක්තවැටෙන් උපාසක පුණ්ඩරීකයයි කියාද අදහස තියුන්නේහ. එයින් වදාළහ පවකහුතතර පාළියෙහි –

"පඤ්චිමානිභික්ඛවේ ඛණ්ඩානි සමන්නාගතෝ උපාසකෝ උපාසකරතනන්දුව හොති උපාසක පදුමන්දුව උපාසකපුණ්ඩරීකෝව කතමානි පඤ්චවත් සඳ්ධාඛණ්ඩානි සීලඛණ්ඩානි නඛෝතුහලඛණ්ඩානි කම්මඵලපච්චවේ ඛණ්ඩානි නඤ්ඤතා බුඩධා දක්ඛිණෙය්‍යං ගවේසති බුඩධ පුඣඣකාරං කරොති,, සී.....

මේ දෙශනාපාලියෙහිද "පුඣඣකාරං කරොති,, යන පදයෙහි භාවාර්ථය මෙසේ දතයුතු යමෙක් මතමේ බුඩධම් සංඝයන රත්නත්‍රයෙහි ශ්‍රඩාවෙන් යෙදී නිසරණනම උපාසකවේද මෙතෙමේ රත්නත්‍රයට රුනවශයෙන්හ සංඛ්‍යාත පාපධර්මයෙන් පහවූබැවින් සරණගතයුත්තේය ඒ රත්නත්‍රයම අග්‍රදක්ෂිණාර්හවන්නේය ඒ රත්නත්‍රයම සරණගතවීමෙන් හා ඒ රත්නත්‍රය පිදීමෙන්ම ජාතිකාන්තාරාදීන් තරණයකොට උතුම්වූ නිර්වාණසම්පත්තිය ලැබීමට මහපුවරක් මන්ත්‍රයයි දැන්වූ ශ්‍රඩාවෙන් යෙදී අමෘතප්‍රකාරයෙහි රත්නත්‍රය ගුණදැන සරණගතවීමෙන් උපදනාවූ ශ්‍රඩා සඳහා ප්‍රධානයොවැනි කායවචමනෝසුචරිත ත්‍රිකයවත් රැකරන්නාවූ පළමුවෙනිවූ රත්නත්‍රය විෂයයෙහි දන්දීම්ආදිය පවත්වා

එබඳු උපාසකජනයෙහි දන්දෙන්නාහු නිරිසන්ගත සත්ත්වයන් දක්වා දන්දීම බුඩාදීන් විසින් ප්‍රශංසාකරණලද යහපත් සුචරිත ක්‍රියාවකැයි සලකා තීර්ථික ආජීවකාදීන්ටපවා ඔවුන්ගේ එප්‍රකාර මිථ්‍යාදෘෂ්ටිය පිළිගැනෙණ හුදුදැනාඩ්‍යාශයෙන් දන්දෙන්නන් වීනම් ඔවුන්ගේ ශීලාදිගුණයන්ගේ ප්‍රමාණයට සුදුසුපරිද්දෙන් දැනානිසංස ලැබෙන්නේයයි දතයුතුයි.

එක්දවසක් පෙස්නදි කොසොල් රජතෙමේ භාග්‍යවත්හු කරා එළඹ වැඳනමස්කාරකොට සවාමීනි පෘථග්ජනයාගේ සිත ඇතැම්කලෙක තීර්ථකා ජීවකාදීන්ගකරෙහිත් පහදින්නේය ඔවුන්වද දන්දෙන්නේය එතකුදුවුවත් කවරෙකුට දෙන්නාවූ දැනය මහත්ඵල මහානිසංස වන්නේදැයි විවාළ ප්‍රශ්නය අරභයා භාග්‍යවතුන්වහන්සේ "සිලවතොඛෝ මහාරාජ දින්නං මහප්ඵලං නෝ තථා දුස්සීලෙ" යනු වදාළේයි එහි භාවය මහරජ ඒකාන්තයෙන් සිල්වත් පුද්ගලයන්හට දෙනලද දැනය මහත්ඵල මහානිසංසවත් නේය සිල්නැතනවුන් විෂයෙහි දෙනලද දැනය එසේ මහත්ඵල මහානිසංස නොවන්නේමය යනු භාවයි.

මෙසේ ගුණවත් සිල්වතුන් විෂයෙහි දෙනලද දැනයමෙන් දුසිලයන් විෂයෙහි දෙනලද දැනය මහත්ඵල මහානිසංස නොවන්නා පමණමුත් අනුසස්නැතැනි කියා හෝ පව්සිඩ වනබවක් හෝ තථාගතයන්වහුන්හට විසින් නොවදරණලද්දේයි. භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ රජගහනුවර වැඩවසන සමයෙහි අනෙපිඬු මහසිටුහු විසින් දෙව්රම්වෙහෙරකරවා භාග්‍යවතුන්වහන්සේව ආරාධනාකොට වැඩෙවා දෙව්රම්වෙහෙර පිළිගන්වා එහි වැඩවසනු සමයෙහි සැවැත්නුවරවැසි තීර්ථකා ජීවකාදීන්ට ප්‍රතිලාභසත්කාරනැතිව සා පිපාස විනාදනයකර ගන්නා පමණවත් ආහරයක් නොලැබ සියළු තීර්ථක ආජීවනාදිහු දෙව්රම්වෙහෙරටගොස් භික්ෂූන්වලඳ ඉතිරිවූ බාද්‍යභොජ්‍යයන් ඉල්ලූවෝය ඉක්බිති ආයුෂ්මත් ආනන්ද සථවිරයන්වහන්සේ එපවත් භාග්‍යවත්හට සැලකළේයි භාග්‍යවතුන්වහන්සේද බාද්‍යභොජ්‍යයන් දෙවයි ආයුෂ්මත් ආනන්දසථවිරයන්ට වදාළබව පාචිත්තියපාලියෙහි "තෙනහානන්ද භික්ඛූනංපුබ්බදෙගිහි" යන පාඨයෙන් පෙනෙණ්හි භාවය ආනන්දය එසේවීනම් නොනොත් ඉතිරිවතිමබ්නම් ඇබිත්තන් ආදින්ට පූදෙවයි වදාළේය යනුයි. අදදක්වා භික්ෂූන්වලඳ ඉතිරිවූ බාද්‍ය භොජ්‍යාදිය භික්ෂූන්ට ප්‍රයෝජන නොවන බැවින් ඇබිත්තන්වදිම් එනැන්පටන් පුරුදුව පවත්නේයයි දතයුතුයි.

විසින්ම ඉවසියයුතුයයි කියා මාතෘ පිතෘහු උපෙක්ෂකවෙති දූදරුවෝ වනාහි මව්පියන්ගේ බස්නොඉවිස ඔවුන්ගේ ඉච්ඡානුරූප පරිද්දෙන් හැසිරෙන්නාහුය ඒ මව්පියන්ගේ බසට කීකරුනොවූ දූදරුවෝ වනාහි පාපමිත්‍ර සෙවනයෙන් නුසුදුසු අවි ආයුධාදියෙන් කෙළිසෙල් ලම්කොට ඛඩ්ග යුධ ශකාලාහාලාද්‍යවශයාස් නොබෝකලකින්ම අන් පාණදිය සිඳබිඳහෙළ මහා කැවකැබිලිති ආදියෙන් පහරලැබ හෝ ලේවගුරුවානණ හඩම්ින් කඳුළු වගුරුවම්න් නැවත මව්පියන්කරා දිව අවුත් මෙබඳු මෙබඳු ශරීර හෙදන තාඩන පීළනාදිය වූහයි මව් පියන්ට කියන්නාහුය ඉක්බිති මව්පියෝ කියන්නාහු එඹාදරුවෙනි අපි තොපට පළමුකොටම ඔවුන් සමඟ මිත්‍රව ඔවුන් පසුපස්සේ නොයායුතුයයි කීතුමුත් තෙපි මව්පියන්ගේබස නොඉවිස අකීකරුව මහාස් මේසා මහත්දුකට පත්වූහ. පළමුකොටම මෙබඳු අනතරායන් දැක නොයායුතුයයි කීකල්හි අපගේබස් නොඉවිසමහාස් දැන්වැරද කියකල්හි අපෙන් පිඬිට ලබනුපිණිස ආවාහුද පිහිට වියයුතුකාලය ඉක්මහියේයැයි කියන්නාහුමෙනි එපරිද්දෙන්ම ලොවපහළවූ අන නතාපරිමාණවූ සර්ව බුදුවරයන්නැමති පිතෘහු පඤ්චස්කන්ධනාම රූපධර්මාත්‍රයක්වූ පඤ්චකාමගුණයෙහි ඇලී වාසයකරන්නාවූ පුත්‍ර දුහිතෘන්ට බදුවූ මේ ලොකවාසී සත්ත්වප්‍රජාවදුක මෙසේ අනුශාසනා කර වදාළාහුය පින්වත්නි තෙපි පඤ්චස්කන්ධයයිද පඤ්චකාමගුණ යෙහිද කොඇලෙව් මුළානොවව් නොපි ඇලීවසන්නාවූ පඤ්චකාම ගුණ පඤ්චස්කන්ධ නාමරූපාදි ධර්මපුඤ්ජයවනාහි අතීතා නාගත වර්ත මාන සංඛ්‍යාත කාලත්‍රයම නොදක්නාවූ නොදන්නාවූ අනිශයින් අඳුනවූ අවිද්‍යානැමති පියාද යහපත නපුර හිත මඩ්‍යම උත්කෘෂ්ටාදි කිසි විභාගයක් නොදැන ලද ලද අරමුණහි ඇලෙන්නාවූ සමුදය සත්‍යයනැමති මවද යනහවමූල දෙදෙන හෙතුඵලාවබෝධ පුණ්‍යාභිසංස්කාර අපුණ්‍යාභිසංස්කාර නානාක්ෂණික කර්මනැමති බීජයන්වැටීමෙන් භවගත්තාවූ අඳුනපුත්‍රයෙකුව බදුවූ පඤ්චස්කන්ධ නාමරූපධර්ම පුඤ්ජය ඇළුම් නොකටයුත්තේය නිත්‍ය ශුභ සුඛ ආත්ම සංඛ්‍යාත සාරයෙන් විරහිතය තම තමාගේ ධර්මස්වභාව ශක්තියෙන් පවත්නාවූ එකානන්ත දුඃඛ සත්‍යයක්මැයි දක්වන්නුපිණිස "කතමාච භික්ඛවෙ සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධා දුක්ඛා සෙය්‍යථිදං රූපුපාදානක්ඛන්ධා වෙදනුපාදානක්ඛන්ධෝ සඤ්ඤුපාදානක්ඛන්ධෝ සංඛාරූපාදානක්ඛන්ධෝ විඤ්ඤාණුපාදානක්ඛන්ධෝ ඉමෙවුච්චන්ති භික්ඛවෙ සංඛිත්තෙන පඤ්චුපාදානක්ඛන්ධාපි දුක්ඛා ඉදං වුච්චති භික්ඛවෙ දුක්ඛං අරියසච්චං," යනුවෙන් දුක්ඛාර්යසත්‍යවූ මේ තොපගේ පස්කඳ නොපගේ

ජාතිදුකය ජරාදුකය ව්‍යාධිදුකය මරණදුකය සහිරඅපායදුකය
යනාදී ගණනපථාති ක්‍රාන්ත භය කරණකොටගණ නිරන්තරමය
න්ම ඉපදුන්නාවූ දුක්රාසියනැසී ප්‍රඥාශෝකොට වදුළාහුය මෙසේ
අනුශාසනාමකොට ඒ අඥානපුත්‍රයන්ට එබඳ අඥානයන් හා, මිත්‍රමනා
වේමයි පියා විසින් වළක්වත්නාස්මෙන් අඥාන පුත්‍රයෙකුට බදුවූ නි
තර දුක්පීඩා එළවිසහැකිවූ පඤ්චස්කන්ධියෙහි නොඇලෙව ඒ පඤ්ච
ස්කන්ධිය ලැබීමට හෙතුවූ පුණ්‍යාභිසංස්කාර අපුණ්‍යාභිසංස්කාර සං
ඛ්‍යාතවූ චේතනා නිශ්‍රිතවූ කුශලාකුශලකර්මයන් රැස්නොකරව චේතනා
නිශ්‍රිතවූ කුශලා කුශලකර්මයෙහි කළකිරීමෙන් ශ්‍රද්ධාවෙව් ඒ නිර්විද
ඥානයෙන් යුක්තවූ සිත්ඇතිව පඤ්චස්කන්ධියන් මිදෙනුපිණිස මිථ්‍යා
දෘෂ්ටාප නිශ්‍රයවූ දුසිලභාවනා සංඛ්‍යාත කුසලධර්මයන් වැඩීමෙහි
ජීවිතාලය හැර උත්සාහවඩවයි යනාදීන් අවවාදකරණු පිණිස "යාව
සඞ්ඛතබ්බසංඛාරෙ අලංනිබ්බින්දිතුං අලංවිරජ්ජිතුං අලංවිමුච්චිතුං" යි
දෙශනාකරණලදී, මහමෙණහි ඇතිව නැතිවන අර්ථයෙන් අනිත්‍යවූ
එක්හිස්භවයෙන් ඇතුළත්වූ සියළු නාමරූප ධර්ම ප්‍රභේදසංඛ්‍යාතවූ
සංස්කාර ධර්මය කළකිරීමට සුදුසුවන්නේමය මොහොඇලීමට සුදුසුවන්
නේමය මිදීමට සුදුසුවන්නේමයයි මෙසේ අවවාද අනුශාසනාකරන්
නාවූ බුදුපියාණන්වහන්සේ විවනය අසා දක්ෂවූ ප්‍රඥාසම්පන්නවූ පුත්‍රදුහි
තෘන්ට බදුවූ සාධුසත්පුරුෂ පරම්පරාගතාමෙන් පුරී පුරී බුදුවරයන්
ගේ අවවාදය අසා, ත්‍රිවිධ බොධිඥානතුමරන් අභිඥතබොධියක් ප්‍රාප්ති
නාකොට සංසාරවාසනා ඉක්ම්මිදී ශාන්තවූ නිවන්පුරවන්නාහුය ප්‍රඥාව
න්ත පියාණන්වහන්සේගේ අවවාදය නොඇසූ අදක්ෂවූ අඥානපුත්‍රදුහිතෘන්ට
බදුවූ අඥානසත්ත්වයෝවනාහි අනන්තාපරිමාණ සර්වඥබුදුවරයන්වහන්සේ
ධර්මොවාදය පිළිනොගෙණ පඤ්චස්කන්ධ පඤ්චකාම ගුණාදි ලෞකික
ධර්මයෙහි ඇලීරමනයකිරීමෙන් මේ සංසාරසාගරයෙහි නිවැරදිනව අන
න්තාපරිමාණකාලයක් මුළුල්ලෙහි දුක්විඳිනාහුය එකල්හි පියාණන්
වහන්සේගේ වචනය නොඅසනනාවූ දුහුදුහිතෘන්ට නොපමණ කැලඹිපරි
දෙදන් දවස්හරුවෙයි මිඩහසටවූ පියාණන්වහන්සේ ධර්මොවාදයට කීකරුනොවී
පඤ්චකාමගුණයෙහි මුළාවූ තෘෂ්ණාවට අනුවගියාවූ අනන්තාපරිමාණ
සත්ත්වයාවට ළඟාවපහළවූ අනන්තාපරිමාණවූ තථාගත බුදුවරයෝවනාහි
"යොභික්ඛවෙ තථාගතෙන එවං ආචික්ඛියමානෙ දෙසියමානෙ පඤ්ඤපියමානෙ පට්ඨපියමානෙ විවරියමානෙ විභජ්‍යමානෙ උත්තානීකරණීය මානෙ නජානාති නපස්සති තමහං භික්ඛවෙ බාලං පුථුජ්ජනං අන්ධාඅවක්ඛුකං අජානන්තං අපස්සන්තංකිනාහි කරොමි" යනුවෙන් අනුශාසනාකළාහුය මේහිවනාහි එක්බුදුමෙනෙ

කුන් විසින් දෙශනාකළාවූ ධම්ය අනික් බුදුවරයන් විසින් දෙශනා කළාවූ ධම්යට සදෘශවන්නේමය කුමක්හෙයිනයත් ? සියළු බුදුවරයන්ගේම ධම්ය එකම විමුක්තිරසය එළවිමපිණිස එක්වන් චතුරාර්ය සත්යයම වදාළබැවිනැයි දතයුතුයි ෴

තවද එසින් අන්යවූ යම් කිසිවෙකු විසින් බුදුවරයන්ගේ අදහස් දැන යම් ධම්යක් රචනාකෙළේද ඒ ධම්ය රාගදෝෂ මොහයන්ගේ ප්රහාණයට කාරණාවෙත්නම් ඒ සියල්ලද බුදුන්ගේම ධම්යයි සැලකියයුතුයි. ඒ අර්ථය කුමකින් අවබොධකරන්නේදයත්? සුළුමව්වූ මහාප්රජාපතී ගොතම්යවහන්සේට ධම්දෙශනාකරණුයේ එබා ප්රජාපති ගොතම්ය යම් ධම්යක්තෙමේ රාගදෝෂමොහයන්ගේ ප්රහාණයට හෙතුවේද ඒ සියළුධම්ය තථාගතවූ මාගේ ධම්යමැයි වදාළ බැවින් ලොකයෙහි සියළු පණ්ඩිතයන් විසින්ම රාගාදී කෙලෙස්නැසීමටකාරණවූ යම්ධම්යක් ප්රකාශනරණුලද්දේනම් ඒ සියල්ලම බුදුවචනයමවෙයි දතයුතුයි෴යවකී දෙශනාපාඨයේ හාවය මෙසේයි මහණෙනි තථාගතවූ මාවසින් මෙසේ ප්රකාශකරණුලබන්නේද දෙශනාකරණුලබන්නේද ඔවවතුලබන්නේද එළවතුලබන්නේද ප්රකට කරණුලබන්නේද බෙදා වදරණුලබන්නේද විසාතබනලද්දක් විවෘතකරන්නාක්මෙන් ප්රතිච්ඡන්නවූ අර්ථයන් විවෘතකරණුලබන්නේද යම් මනුෂ්යයෙක්තෙමේ මෙසේසත්ආකාරයකින් ප්රකාශකරණලද ධම්ය නොදන්නේවීනම් නොදක්නේවීනම් මහණෙනි අඥානවූ අන්ධබාල පෘථග්ජනවූ ප්රඥානැමති ඇස්නැත්තාවූ අනිත්යය අනිත්යයයි කියාද දුඃඛය දුකැයි කියාද අනාත්මය අනාත්මයයි කියාද නොදන්නාවූ නොදක්නාවූ ඒ අඥානඝණයාගව තථාගතවූ මම කුමක්කරම්දැයි යනුයි මෙසේ තථාගතවූ බුදුවරයෝ උපෙක්ෂාවූ බැවින් සවකීය අදහස්පරිද්දෙන් පඤ්චයකන්ධයෙහිද පඤ්චකාමගුණයෙහිද මුළාවූ සත්වයෝ ඒ පස්කඳ ඇසුරුකොටගෙණ ලැබියයුතුවූ ජාති ගය ජරාභය ව්යාධිභය මරණභය සතර අපාය භයාදිය පැමිණිකල්හි එසින් මිදෙනුපිණිස රක්ෂාසථානයක් හෝ පිහිටවිය යුත්තෙක් හෝ නොදුක මහත්වූ අනය ව්යශනයට පැමිණ හඬාවැලප කඳුලුවගුරුවන්නාහු දරුවන්වැදියයුතු අවසථාවෙහිම වින්නඹුවන්ද දියේගිල්ලුකල්හිම ඔරු අහුල් පාරුද අතපය සිඳිබිඳි ගල් වැගිරෙණකලම වෛද්යවාඩ්යයන්ද සොයන්නාක්මෙන් පිහිට නොලැබ පුවී පුවිවූ අතීතකාලයෙහි ලැබුනාවූ මනා අවවාද වචන නාසා සංසාරවෘත්ත නැමති මහොඝයෙහි නිමග්නව නිර්විද්ද ඥානය නො

ලැබ සසරින් මිදිය නොහැක්කාහුවෙති මෙසේ සංසාරයෙහි ප්‍රවාදව සිටියේද මහත් දුක්වේදනාඇතිකල්හිම සංවෙගලැබ බුදුන් ජීවමාන්ව වැඩවසනසමයෙනි දෙශනාකරවදුලාවූ ධම්ය අසා සංසාර මහාභයයෙන් එතරවන්නකැමති ආත්මාර්ථකාමී සත්පුරුෂයෝතුමු දෙමුහුන සූත්‍රයෙහි වදුලාවූ පස්වැදෑරුම් දෙවදූතයන් දැක නිර්විද්‍ය ඥානයලැබ සංසාරයෙහි දුක්ආදී නව මෙනෙහිකරන්නාහුවෙති එහෙයින්වදුළහ.

"ගහායවාඑකං චුණණං, පරාජෙත්වා තථාගතා,
අනෙකා සසාවකෙහි, නිබ්බායිංසු අනාසවා,
තථාපවවක බුඩාච, එතතකානමබභනතරං,
අපවිඩො ඔහාසි චං, ධි නා ලජජාසි රෙවත
ලහිත්වාවෙ පවතෙතාසි, ඉදනිඛණ සම්පදං,
එවරූපං සු සමයං කුදසසුලවජ්ජි එවං
අත්තානං මොදයිත්වාන, ස්‍රුඤ්ජථ බුධසාසනං සි.

යනුවෙන් තමා විසින්ම තමන්ගේ ආත්මයට ආමන්ත්‍රණය කොට අවවාදකරයුත්තේසි එම්බල පින්වත ගඟානම් මහානදියෙහි වැලි පරදවනතරම් ගණන පථානික්‍රාන්තවූ තථාගත බුදුවරයෝතුමු අසංඛ්‍යගණන් ශ්‍රාවකයන් හා සමග ආශ්‍රවයන් නසා කෙලෙස පරිනිර්වාණයෙන්ධ පරිනිර්වාණයෙන් ත්‍රිවිධ සැනසුනාහුය අසංඛ්‍යගණන් පසේබුදුවරයෝද එසේම නිවී සැනසුනාහුය එබා සත්පුරුෂය මෙසා මහත්ගණන පථානික්‍රාන්ත බුඩප්‍රත්‍යෙක බුඩආර්‍ය්‍ය ශ්‍රාවකයන්ගේ සහා අභ්‍යන්තරයට නොපිහිසිකළුක ඇතුළත්නොවිය ඒ සියළු බුදුපසේබුදුමහරහතුන්වහන්සේලා විසින් තාගැරදමනලද්දේය එබා පුරුෂය නොපට නින්දාවේවා එකානනායෙන් නොපිලපදිනාකවයුතුය දැන් වතාහි දුර්ලභවූ බුඩොත්පාදයලැබ රත්නත්‍රය ලොකයෙහි බබලන්නේය නවවැනිවූ බුඩොත්පාදක්ෂණ සම්පත්තියලැබ කුසලධම්යෙහි පම්වීනම් නැවත කවරකලෙක මෙබදු ක්ෂණසම්පත්තියක් ලබන්නේද මෙබදුධම්යෙන් තමන් විසින්ම තමන්ගේ ආත්මභාවයට මොදනාකොට සරණගමනාදිල විශුඩි ආදිවූ බුඩානුශාසනාධම්යෙහි නිරන්තරයෙන් උත්සාහවඩවයි මෙසේ දිවාරාත්‍රියෙක්හි තමන් විසින්ම තමන්ව මොදනාකොට කුසලධම්යෙහි අප්‍රමාදව විසිඅයුත්තේසි.

ප්‍රකීර්ණක කථා නිර්මදශයයි 38.

ගෘහස්ථ සාධාරණ ශීලනිර්දේශය.

—0—

39 මෙසේ ප්‍රත්‍යවෙක්ෂාකොට සරණශීලයෙහි පිහිටි ගෘහ සථයන් විසින් රැකියයුතු ශීලයන්ගේ විභාගය මෙතැන්පටන් දක්වනු ලැබේ "උපාසක උපාසිකානං නිච්චසීලවසෙන පඤ්චසික්ඛාපදානි සතිපා උසසාථහදස උපොසථඞගවසෙන අට්ඨ ඉදංගහට්ඨිලං" යන විශුද්ධිමාගී වචනානුසාරයෙන් සරණගත උපාසක උපාසිකාවන් විසින් නිත්‍යශීලවශයෙන් පඤ්චසික්ෂාපදයෝද උත්සාහ ඇතිකල දසශික්ෂා පදයෝද උපොසථාඟවශයෙන් අෂ්ටශික්ෂාපදයෝද රක්ෂාකිරීම ගෘහ සථශීලනම්වැනි සංක්ෂෙපයෙන් කියේනමුදු විසතාරවශයෙන් ආජීවාෂ්ට මක ශීලය බ්‍රහ්මචරිය පඤ්චශීලය නවඞගුපොසථශීලය එකාහික්තික අථකශීලය ආදීන් අනෙකප්‍රකාරවෙති එයින් පළමුකොට කිපවක දෙන උපොසථශීලය යනතුණ සමීසාධාරණවශයෙන්ද සෙසුශීලයන් විනෙයජනයන්ගේ අදහස්පරිද්දෙන් අසාධාරණවශයෙන්ද තේරුම් ගතයුතුයි.

අෂ්ටාඟ උපොසථශීලයෙහි අන්තිම ශික්ෂාපදත්‍රයහා දසශීල යෙහි අන්තිම පඤ්චශික්ෂාපදයද විශෙෂ කුසලධර්මයන් පුරණුකැමති සත්පුරුෂයන්ගේ චාරිත්‍ර බැවින් චාරිත්‍රශීලනම්වේ ඉතුරු ශික්ෂාපද හා පඤ්චශීල ආජීවාෂ්ටමකශීලයෝතුමූ දුශ්චරිත දුරාජීවයන්ගෙන් වැළකීම්වශයෙන් රක්ෂාකටයුතුබැවින් චාරිත්‍රශීලනම්වේ නිරන්තර යෙන් රක්ෂාකටයුතුබැවින් නිත්‍යශීලනමුදුවේ ලොකයෙහි පවත්නා සියළු දුශ්චරිතයන්ගෙන් වැළකියයුතු ශීලයන් බැවින් ලොකවජ්ජ ශීලනමුදුවේ සම්මුති උපපත්ති විශුද්ධි දෙවියන් විසින් රැක්කයුතු බැවින් දෙවධර්මනමුදුවේ හිරිඔතප්පදෙන කරණකොටගෙණ දුශ්චරිත යන්ගෙන් වැළකී ලොකධර්මයන්ගේ සිරිසම්පත්හේදය නොකොට ලොකය ආරක්ෂාකටයුතු බැවින් ලොකපාල ධර්මනමුදුවේ පඤ්චසීල ආජීවාෂ්ටමකශීලයෝතුමූ දුශ්චරිතපක්ෂය ප්‍රහාණයකටයුතු බැවින් එක්ශීලයෙක්හි අනික්ශීලය ඇතුළත්වීම්වශයෙන් අන්‍යොන්‍ය සම්බන්ධවේ කෙසේ ඇතුළත්වන්නේදයත්? පඤ්චශීලය සමාදන්වන කල්හි ආජීවාෂ්ටමකශීලයෙහි ආවාචු පිසුණාවාචා ඵරුසාවාචා සම්ඵප්පලාපා යන ශික්ෂාපදත්‍රය වාක්දුශ්චරිතවශයෙන් සමානබැවින් පඤ්චශීලයෙහි මුසාවාද ශික්ෂාපදයහිම ඇතුළත්වන්නේසි ආජීවාෂ්ටමකශීලය සමාදන්වනකල්හි පඤ්චශීලයෙහි ආවාචු සුරාමෙරය ශික්ෂාපදය ආජීවාෂ්ටමකශීලයාගේ කායම්ප්‍රයාචාර ශික්ෂාපදයෙහි

ඇතුළත්වන්නේය යි අභිධර්මාර්ථ විභාවිනීටීකාදියෙහි ආබැවින් පඤ්චශීල ආජීවාෂ්ටමක ශීලයෝ දෙදෙන ඔව්හුවුන් කෙරෙහි ඇතුළත්වන්නාග්‍රයයි දතයුතුයි විශෙෂවශයෙන් වනාහි ජීවිකාවෘත්තියෙන් තොරව සත්ත්‍වඝාතනාදී දුශ්චරිතයන් රැස්කරණකල්හි ශීලමාත්‍රයක්ම බිඳුන්නේයි ජීවිකාවෘත්තිය පිණිස සත්ත්‍වඝාතනාදි සප්තවිධ දුශ්චරිතයන් කරණකල්හි ආජීවශීලය හා සමග පඤ්චශීලයත් බිඳුන්නේයි. මේ මෙහි විශෙෂයි එක්ශීලයෙක්හි අනික්ශීලය ඇතුළත්වන්නේය යනු කායකර්ම වාක්කර්මවශයෙන් සෘජුභූතයින් කායකර්ම භාවය වාක්කර්මභාවය යන මේ දෙකින්ම සම්පූර්ණවනබව හා බිඳුනබවද සමානයයි අර්ථතඃසුත්තේයි මුසාවාදවිරත්‍යාදි යම් ශික්ෂාපදයක් ඉක්මවූකල්හි පිසුණවාචාවිරති ආදී අනික් ශික්ෂාපදයන්ද බිඳුන්නේයයි අර්ථ නොගතසූත්‍රයි මෙසේ දක්වන ශීලයන් අතුරෙන් පඤ්චශීලය දශශීලය අෂ්ටශීලය යන ශීලත්‍රය සියළු ප්‍රදෙශයෙහිම බොහෝදෙනාඅතර බොහෝසෙයින් ව්‍යවහාරයට පැමිණ පවත්වාගණ එන බැවින් ඒ ශීලයන්ගේ සමාදානවිධි ආදිය සියළුදෙනාඅතර ප්‍රකටව පවත්නාහුය එබැවින් අප්‍රකට ශීලයන්ගේ විශෙෂමාත්‍රයක්ම මෙහි දක්වනුලැබේ.

උපෝසථ දිනයවනාහි එක්මාසයක්තුළ පුරවිසේනිය ලත් දවසය පුර අවවක්ලත්දවසය පුර තුදුස්වක්ලත්දවසය පුර පස ළොස්වක්ලත් දවසයයි පුරපක්ෂයෙහි පොහෝදවස් සතරෙක එපරි දෙදන්ම අවපක්ෂයෙහිද පොහෝදවස් සතරෙකැයි එක්මසක්තුළ ප්‍රකෘති පොහෝදවස් අටෙක්වේ "උපවසන්තිනි මාසස්ස අට්ඨංගෙර උපොසථානි අධිට්ඨහන්ති" යනු අඟුත්තරනිකාය රාජසූත්‍රඅට්ඨංග බැවින් උපවාසය යනු මසකට අවශ්‍ය ප්‍රකෘති පොහෝදවස්හි අෂ්ටාඟ උපෝසථශීලය අධිෂ්ඨානකිරීමහෝ සමාදන්වීමය යනු භාවයි.

පටිජාගරණ උපොසථය යනු "පටිජාගරොනහිති පටිජාගරණ උපොසථකම්මං නාමකරොනතිතං කරොතනතා එකසම්මං අට්ඨංගසෙ වතුනනං උපොසථ දිවසානං පච්චුග්ගමන ත්‍රුග්ගහනවසෙන කරොහති" යනු එම අට්ඨවාසී "පක්ඛුපොසථ දිවසානං පුරිමපච්ඡිම දිවසවසෙන පමක්ඛපමක්ඛ මතරසි පාටිපද සත්තමී තවමී සංඛාතා වත්තාරොවත්තාරා දිවසානි අපරෙ" යනු ධම්මසංගණී අට්ඨකථා එක එක පක්ෂයෙක්හි පෙරගමන් පසුගමන්වශයෙන් උපෝසථ අටෙක් වෙති එනම් පස ළොස්වක් අෂ්ටාඟ දෙපොය හා. තෙළෙස්වක් පැළ

ඒය ගත දෙදවස්ද අවවක් පොහොයට් පෙරපසු සතවක් නවවක් ගත දෙදවස්ද ගත පොහෝදිනයෝ එක්මයක්තුළ දෙළහයක් වෙති.

තවද ධම්මිකසූත්‍ර අටුවාවේ "එත්පනවස්සූපනායිකාය පුරිමහාගය ආසාළ්හිමාසෙ අතිත්තා වසෙස්ස තයොමාසා කත්තිකපුණ්ණමාසෙති ඉමෙපචමාසා පාටිහාරිය පක්ඛාතිවුච්චති ආසාළ්හි කත්තික ඵග්ගුණ මාසා තයොඵවාති අපරෙ" යනු ආඛ්‍යාත වස්විසිමට පුළුහාගයෙහි ඇසළමසය ඇතුල් වස්තුන්මසය ඉල්මසය යන මේ පච මාසය ප්‍රාතිහාර්‍ය පක්ෂයයි කියනුලැබේ අභයගිරිවාසීහු ඇසළමසය ඉල්මසය මැදින් දින මසය යන තුන්මස ප්‍රාතිහාර්‍ය පක්ෂයයිගෙයි ගැසින් යමක් කැමතිවිනම් ඒ පිළිගතයුතුයි. අඩුවැඩිවීම්වශයෙන් පවිසිදුවන්නේයයි සැයනොවියයුතුයි අඟුත්තරනිකාය පඤ්චක නිපාත රාජසූත්‍ර අටුවායෙහි අනඤඤථෙරවාදයක ආකාරයකින් ප්‍රාතිහාර්‍ය උපොසථය දක්වා තිබේ මෙසේදයත් ? "පාටිහාරිය පක්ඛඤවාති එත්පාටිහාරිය පක්ඛානාම අතිත්තාවසෙස්සතෙමාසං නිබඬ උපොසථෝ තම්පි අසඞ්ඛ්‍යෙය්‍යානන්තස්ස චිත්තනංපවරාණානං අනන්තර එකමාසං නිබඬඋපොසථෝ තම්පි අසඞ්ඛ්‍යෙය්‍යානන්තස්ස පඨමපවාරණතා පඨාය එකො අඩ්ඪමාසෙ පාටිහාරිය පක්ඛානාම" යනුවෙන් ප්‍රාතිහාර්‍යපක්ෂය යනු වස්තුන්මසතුළ නිබඳපවහවස්විසිමද ඒ මහා කවහැක්කාහට මහාපවාරණය දුතිය පවාරණය යන පවාරණ දෙකට අතරකාලයතුළ නිබඳ පවහවස්විසිමද ඒද නොහැක්කාහට් ප්‍රථමපවාරණය පටන් අඩමසක් නිබඳපවහවස්විසිමදැයි මෙසේ ප්‍රාතිහාර්‍ය උපොසථ තුනෙක් නියමකරණලදී මෙසේ නිතිගහි සිවසන්නාවූ උපාසක උපාසිකාවන් විසින් එක්මාසයක්තුළදින පොහොයඅටක් හා දින පොහොය දෙළසක්ද වසතුන්මසය එක්මස ක්ය අඩමසක්ය යන ප්‍රභෙද ඇතාවූ ප්‍රාතිහාර්‍ය උපොසථතුනෙක්දැයි යන උපොසථයන් අතුරෙන් යම්කිසි අභිමත උපොසථයක් හෝ සියළු උපොසථයන්හෝ නොවරදවා පවහවස් රක්නාවුන්ට සුඛනිමිත්තීය එකාන්තයෙන් අනතුරු අත්බැව්හි ලැබෙන්නේයයි දතයුතුයි. මසකට අටවාරයක් පවහවස්විසිම අන්තිම පරිවේජදයයි ඒ අන්තිම පරිවේජදයෙන් ලැබෙන්නාවූ පොහෝදවස් අටපවාපවහවස් තාරක්නාමතුෂ්‍යයාගේ මිනිසත්බව නිෂ්ඵලවත් නේයි. මසකට අටවරක් පවහවස්විසිම මනුෂ්‍යයෝ පමිණක් නොව සුජම්පතීනම් දෙවදිලොවට නායකවූ ශක්‍රදිව්‍යරාජයාපවා දෙසකළ පණගැලපිය යුතුය දිව්‍යප්සරාවන් හැරදම, මහාත්සාහ

මෙන් පෙහෙවස් රක්නාබව අනුත්තරනිකායනිස නිපාත අට්ඨකථායෙහි "සමක්ඛාපිකිර වුත්තපපකාරස්ස උපොසථස්ස ගුණංජානිත්වා, ඉදව ලෝක සම්පත්තිමයාපහාය සයං මාසස්ස අඨ්ඨවසු උපොසථං උපවසති"යනාදින් දක්වාතිබේ. දෙදෙව්ලොවට නායකවූ සුජම්පතිනම් ශක්‍රඉඳවඳුමයෝපවා කියනලද ප්‍රකාරඇති උපෝසථශීලයාගේ ආනිසංස දැන ශක්‍රසම්පත්හැර පියා තුමූහුදකලාව මසකට අටවරක් පෙහෙවස්රකෂාකරන්නේයයි දතයුතුයි.

තවද අනික්ප්‍රකාර සථවිරවාදයක්වූ ප්‍රාතිකායෝ පක්ෂ උපොසථ යක් විමාණවසතු ප්‍රකරණ උභතර විමාණවසතු අට්ඨකථායෙහි ආගෙස්හි ඒ මෙසේයි "පාටිහාරිකපක්ඛඤ්චාති වාතුද්දසි පඤ්චදසි අඞ්ගිනං යථාක්කමං ආදිමතා අන්තාමතාවාති පමෙසන නිකඛමනවසෙන උපොසථසිලසස පාටිහාරිය තබ්බපතිබඤ්ච තෙරසම් පාටිපද සත්තම්මිනවම්මිවානි අහෝසි" යනුයි මෙහි භාවය. තුදුස්වක් පසළොස්වක් අටවක් යන පොහෝදිනයන්ට පිළිවෙළින් ආදි අන්තාදත්හි ඇතුල්වීම් නික්මීම්වශයෙන් උපොසථශීල සදෙනක්වෙති අෂ්ටාංග උපෝසථයට ඇතුල්වන්නාවූ සතවකය නික්මෙන්නාවූ නවවිකය චාතුද්දසීපොහොයට ඇතුල්වන්නාවූ තෙළෙස්වක් පමණක්මුත් නික්මීමක් නැත්තේය පණ්ණරසී පොහොයට නික්මෙන්නාවූ අවපැලවියවී පුරපැළවියට ඇතුල්වීමෙක් නැත්තේය. මේ අටදවස පාටිහාරිය උපොසථනම්වේ. මෙසේ මහකට ලැබන්නාවූ සඝාකාර පොහෝදිනයෙහි හා අඨාකාර පොහොදිනයෙහිද පෙහෙවස් රැක පුරුනන උතතරාව ආදිවූ සත්හු සුගතීලෝක පරායනවූහයි දතයුතුහයි ශීලය රකෂාකිරීමෙන් කවර ප්‍රයෝජනයක් ඇත්තේදයන් ? අතීතා නාගත වර්තමාන යන කාලත්‍රයයනිව සතරමහ සතරඵලය ලැබුවාවූද ලබන්නාවූද සියළු ආර්යයෝ ශීලනැමැති හුම්මයෙන් පිහිටා සිටමහණ සමාධි නැමැති කඩුව ශ්‍රද්ධා නැමැති හස්තයෙන් ඇඟණ මකමලස් නැමැති සතුරන්සාධා ජයගෙණ නිර්වාණසැපයට පැමිණියාහුය අනික් පොළවක් පිහිටීමට නැත්තේයයි දතයුතු.

තවද ත්‍රිපිටකයන් විසින් ලොභතෘෂ්ණා අභිධ්‍යාවශයෙන් රක්නා මහාපාල උපොසථය නිදහස්වීම උපොසථය යන උපෝසථයන් හැර ආර්ය උපෝසථයන් ආර්ය ශ්‍රාවකයන් විසින් උත්සාහයෙන් රකෂාකවයුත්තේයයි ඒ ආර්ය උපොසථයෙහි ආහි බ්‍රහ්මූ උපොසථය ධම්මූ උපොසථය සංඝූ උපොසථය සිලූ උපොසථය දෙවතූ උපොසථය අත්තාහ උපොසථයයි සවැදෑරුම්වේ. ඒ සඝාකාර උපෝසථයන් අතුරෙන්

තථාගතයන්වහන්සේගේ අනන්ත අප්‍රමේය්‍ය ගුණරාශිය සිහිකිරීම බුද්ධානුස්සති නම්වේ "බුද්ධෝ වුච්චති සම්මා සම්බුද්ධෝ තස්ස ගුණානුස්සරණවසෙන උපොසථෝ බුද්ධූපොසථෝතාදි" යනුගිකගුත්තර අට්ඨ බැමින් බුදුන්ගේ ලෞකික ලෝකොත්තර ගුණරාශිය මෙසෙනහිකිරීමෙන් විසීම බුද්ධූපොසථනම්වේ ධර්මගුණානුස්සරණයෙන් විසීම ධම්මූපොසථයයි දතයුතුයි "ධම්මූපොසථන්ති සහ තදාභිකං නව ලෝකුත්තර ධම්මං ආරබ්භ පවත්තනා අයං උපොසථෝ ධම්මූපොසථෝනිවුච්චතීතා,, යනුද එම අට්ඨවාසි අෂ්ටාඝ්‍රීපුද්ගල සංඝරත්නගුණය අරමුණුකොට විසීම සංඝූපොසථනම්වේ "සංඝූපොසථන්ති අඤ්ඤං අරියපුග්ගලානං ගුණෙ ආරබ්භ උපවුත්ථභාවා සංඝූපොසථෝතිවුච්චතීතා,, යනුද එම අට්ඨවාපාඨයයි ගෘහසථයන් විසින් රැක්කයුතු ශීලගුණය ගෘහසථයන් විසින්ද භික්ෂූන් විසින් රැක්කයුතු ශීලගුණය භික්ෂූන් විසින්ද මෙසෙනහිකරමින් විසීම සීලූපොසථනම්වේ "සීලූපොසථන්ති අත්තනෝ සීලානුස්සරණ වසෙන උපවුත්ථා උපොසථෝ සීලූපොසථෝනාම" යනුද එම අට්ඨවාසි දෙව් බඹුන් ශාස්ත්‍රීයථාන යෙහි තබා දෙවිබඹුන්ගේ ශ්‍රද්ධා ශීලාදිගුණයන්ට බදුවූ නමාගේ ශ්‍රද්ධා ශීලාදිගුණයන් මෙසෙනහිකරමින් විසීම දෙවතූපොසථනම්වේ "දෙවතූපොසථන්ති දෙවතා සක්කිඤ්චනෙඤ්ඤපඤ්ඤා අත්තනෝ ගුණෙ අනුස්සරන්තස්ස උපවුත්ථ උපොසථෝ දෙවතූ පොසථෝනාම" යනුද එම අට්ඨවාසි ප්‍රාණඝාතයෙන් වැළකීම් ආදිවූ අෂ්ටාඟ උපොසථශීලය රක්ෂා කිරීම අෂ්ටාඟික උපොසථනම්වේ "එතඤ්හි අඨඞ්ගිකමාහු උපොසථන්ති එවංපාණාතිපාතාදිනි අසමාචරණතා උපවුත්ථං උපොසථං අඨඞ්ගෙහි සමන්නාගතත්තා අට්ඨඞ්ගිකන්තිවදන්ති,, යනුද එම අට්ඨවාසි මේ සඨාකාර උපොසථයන් අතුරෙන් ප්‍රථම්පඤ්චකය ගෘහසථවූද ද්‍රව්‍යජීතවූද ආර්‍යයන් විසින් නිරතුරු රක්ෂාකටයුතු උපෝසථයෝ නම්වෙත් සමවනිවූ අඨඟ උපොසථශීලයවනාහි ආර්‍යවූ සෝවාන් සකෘදගාමී ආර්‍යපුද්ගලයෝ සම්භරමදමනෙක් අබුදරුවන් පොෂ්‍යය කරමින් ගිහිගෙයි වසන්නාහු නිරතුරු විකාලභොජන අබ්‍රහ්මචරියා දෙකින් මනාවළකින්මය ඒ ගිහිගෙයි සිටිනා සෝවාන් සකෘදගාමී ආර්‍යශ්‍රාවකයෝවත් යමකි පොරණෝදිනයන්හිම කාලපරිච්ඡේදය කොට අෂ්ටාඟශීලය රක්ෂාකරන්නාහුවෙනසි දතයුතුයි කාමරාගය නිරවශෙෂයන් ප්‍රහාණයකළාවූ අනාගාමී ගෘහසථයෝවනාහි නිරන්තරයෙන් ශීලමයහි පරිපූරකාරීවෙති රහත්ඵලය ප්‍රත්‍යක්ෂකළාවූ රහතුන්වහන්සේ එදවස්හිම පැවිදිබුවුමයේනම් පිරිනිවන් පෑම සවභාව චාරිත්‍රයවේගි දතයුතුයි.

උපොසථ නිර්දේශයයි 39.

ගහඨ බ්‍රහ්මචරිය පඤ්චශීලය.

—o—

40 ප්‍රකෘති පඤ්චශීලය ලෝකයෙහි අතිශයින් ප්‍රකට බැවින් ගෘහඨ බ්‍රහ්මචරිය පඤ්චශීලය මෙතැන්පටන් දක්වනුලැබ් හේතු සේයත් ? ප්‍රකෘති පඤ්චශීලයෙහි "කාමෙසුමිච්ඡාචාරා වෙරමණි" ශික්ෂාපදයතැර ඒ වෙනුවට "අබ්‍රහ්මචරියා වෙරමණි,, යහා ශික්ෂාපදය බහා සමාදාන්වියයුතු ශීලය ගහඨ බ්‍රහ්මචරිය පඤ්චශීලනාම්වී මේ පඤ්චශීලයවනාහි අබ්‍රහ්මචර්‍යාත්පාදයෙහි උදයභද්‍රජාතකාදියෙහිද බ්‍රහ්මචර්‍යාත්පාදයෙහි ධම්මිකසූත්‍ර උභතසූත්‍ර නකුල සූත්‍රාදියෙහිද ආයේසි.

එක්සමයෙක්හි අප භාග්‍යවන් සම්‍යක් සම්බුදුරජාණන්වහන්සේ සැවැත්නුවර දෙව්රම්වෙහෙර වැඩවාසයකළසේක්සි. එසමයෙහි එම සැවැත්නුවර ධාර්මිකනම්වූ පන්සියයක් උපාසකයෝවූහ. ඒ එකකු උපාසකයෙක්හට පන්සියයක් පන්සියයක් පිරිවර උපාසකයෝදවූහ ඒ සියළු උපාසකයන්ට ආචාර්‍යවූ අධිපති මහාධාර්මිකනම් උපාසකයාහට දුහිතෘන්සත්දෙනෙකුහා පුත්‍රයන් සත්දෙනෙක්ද වූහ ඒ එකෙකු පුත්‍රධිතෘවක්හට එකෙකු සලාකයාගුවෙක්ද එකෙකු සලාකබතෙක්ද එකෙකු පක්ෂබතෙක්ද එකෙකු නවසඳ බතෙක්ද එකෙකු වයසාවාසිකයෙක්දවූහ ඒ සියල්ලෝම අනුජාත පුත්‍රයෝවූහ මෙසේ තුදුස් දෙදෑනවන්ගේ හා භාග්‍යාවගේද උපාසකයාගේද යන සොළොස්දෙනාගේම මෙන මවනම සොළොස් යාගු මවක මසොළොස් සලාකබතෙකැයි යනාදීන් නිරන්තරයෙන් පවත්නාහ මෙසේ ඒ මහාධාර්මිකනම් උපාසකයා හා අග්‍රිදරු වෝද සිල්වත්වූහ යහපත්ධම් ඇත්තාහ දෘෂ්ටසංවිභාගයෙහි නිරතවූ වාහුස මෙසේ දානශීල භාවනාදි කුසලධර්මයෙහි ඇළුනාවූ ඒ ධාර්මිකනම් උපාසකතෙමේ පිරිවර පන්සියයක් උපාසකයන්හා සමග එක්දවසක් භාග්‍යවතුන්වහන්සේ වැඩවසන මදවිරමටණෙහි භාග්‍යවතුන්වහන්සේට වැඳ එකත්පසකහිද "පුච්ඡාමිතං ගොතම තුරිපඤ්ඤං යථාතථෝ සාවකොසාධුමහාති,, යනාදි ගාථාවෙන් මේ ශාසනයෙහි අගාරිකවූද අනගාරිකවූද ප්‍රතිපදාව විවාළසේක් ඉක්බිති සුගත තථාගතතෙමේ ශ්‍රේෂ්ඨවූ අනගාරික ප්‍රතිපදාව පළමුකොට දක්වා විදුරා ඊට අනතුරුව අගාරික ප්‍රතිපදාව මේමතු පහළවූ ගාථා සතක්න්ගෙණහැර දක්වා දේසනාවළේසි මූල් මෙකෙස්දයන් ?

1 "ගහඨවත්තං පන මෙවා වදඤ්ඤූ
යථාකමරා සාවජ්ජා සාධුහොති
නෙගමෙසා ලබ්හා සපරිහාරෙන
එසෙසතුං මයාකෙවලෝ භික්ඛුධම්මෝ,,

2 "පාණං නහාමෙන නව ඝාතයෙය්‍ය
නාඤ්ඤුජඤ්ඤු හනතං පරෙසං
සබ්බෙසු භූතෙසු නිධාය දණ්ඩං
යෙ ථාවරා යෙව තසන්ති ලොකෙ,,

3 "තතො අදින්නං පරිවජ්ජයෙය්‍ය
කිඤ්චි කිඤ්චි ඝාවතෙකා බුද්ධිමන්නා
නහාරයෙ හරතං නානුජඤ්ඤු
සබ්බං අදින්නං පරිවජ්ජයෙය්‍ය,,

4 "අබ්‍රහ්මචරියං පරිවජ්ජයෙය්‍ය
අඟාරකාසූපමං ජලිතංව විඤ්ඤූ
අසම්භුනාමෙනතා පනබ්‍රහ්මචරියං
පරසසදාරං නාතික්කමෙය්‍ය,,

5 "සහග්ඝතොවා පරිසගහතාවා
එකසසවචකා තමුසා හරණ්‍ය
නහාණයෙ හණතං නානුජඤ්ඤු
සබ්බාඅභූතං පරිවජ්ජයෙය්‍ය"

6 "මජ්ජඤ්ච පානං නසමාචරෙය්‍ය
ධම්මං ඉමං රොචයෙ යො ගහෙසථ
නපායයෙ පිවතං නානුජඤ්ඤු
උම්මාදනං තං ඉතිනං ඤත්වා,,

7 "ඒදිසිපාපානි කරොනතෙහි බාලා
කරොනතිවසෙඤ්ඤුපි ජනෙ පමත්තෙ
එතං අපුඤ්ඤායතනං විවජ්ජයෙ
උම්මාදනං මොහනං බාලකන්තං,, සී.

මෙහි භාවය මේ මෙයි එබා උපාසකවරිනි මාවිසින් හුදකලා පවත්නාවූ අමිශ්‍රවූ සම්භාවාර පරිපූර්ණවූ යම් භික්ෂුධර්මයක් දෙශනාකා රණලද්දේවිද මේ භික්ෂුධර්මය කෙන්වත් ආදිවසතුන්ගේ පරිග්‍රහ යෙන් සපරිහාරවූ නොවන් ගම්බිම් රන්රිදී ආදි උපභොග පරිභොග සම්පත් ඇත්තාවූ ගෘහස්ථයා විසින් නොලැබියයුතුවිද නොරැක්ක හැකිවිද එබැවින් ඒ ගෘහස්ථයාහට භික්ෂුධර්මය පුනිශෙධ

කොව් (භෙවත් වළක්වා) ගෘහසථධර්‍ම මාත්‍රයක් නොපව දේශනාකරවීහයි ප්‍රතිඥාකාව ත්‍රිකොටි පරිශුඛ පාණාතිපාතා වේරමණි ආදි පඤ්චශික්ෂාපදය දේශනාකර වදාළේසි. මේ ලොකයෙහි තෘෂ්ණා පිපාසයෙන් පිපාසිතවූද තෘෂ්ණා නිරොධයෙන් තැන්පත්වූද යම්තාක්සත්ත්වයෝවූවාහුද ඒ සියළු සතුන් විෂයෙහි කාය වාක් දණ්ඩන සංඛ්‍යාතවූ වධය බහාතබා තමන් විසිනුත් ප්‍රාණවධ නොකටයුත්තේය විධානකිරීම්වශයෙන් අනුන්ලවාත් නොකරළිය යුත්තේය. ප්‍රාණවධකරන්නාවූ මෙමරමාහටත් පිළිගැණීම් සතුටුවීම් ආදිවශයෙනුත් අනුමොදන්වියයුත්තේය මෙසේ ත්‍රිකොටි පාරිශුඛ පාණාතිපාතා විරති ශික්ෂාපදය පදරා ඊට අනතුරුව අදින්නාදාන යෙන් වැළකියයුත්තේය අනුන් විසින් කයින් වචනයෙන් නොදෙනලද්දාවූ සුවල්පවූ හෝ බොහෝවූ හෝ යම්කිසි තෘණපණ්ඩියක් පමණ වැනුවකුදු අන්සතුයෙහි දන්නාලද්දාවූ ගෘහසථ ශ්‍රාවකයා විසින් ග්‍රාමයෙහි හෝ ආරණ්‍යයෙහි හෝ තිබි තමන් විසිනුත් පැහැර නොගතයුත්තේය විධානකිරීම්වශයෙන් අනුන්ලවාත් පැහැර නොගැන්වියයුත්තේය සොරබඩු මිලදීගැණීම් ආදි වශයෙන් මෙරමාහට අනුදැනීමත් නොකටයුත්තේය මෙසේ ත්‍රිකොටි පාරිශුඛිවශයෙන් අනුන් සතුවසතුව පැහැරගැණීමෙන් සවිපූකාරයෙන් වැළකියයුත්තේසි පණ්ඩිතවූ අගාරික ශ්‍රාවකතෙමේ ගිහිගණ දිලියෙන්නාවූ අහුරැව ලකට බුදු උපන්නාවූ නින්දිත මෙමථුනචර්‍යාවෙන් වැළකියයුත්තේය ඒ්තුම්වූ ශ්‍රේෂ්ඨ චර්‍යාවරක්නට උත්සාහනැතතාවූ අගාරිකවූ ශ්‍රාවකයාවිසින් පරඛුවන් නොඉක්මවියයුත්තේසි සසුනාගාරාදි විනිශචය සභාවකට ගියේහෝ පිරිස්වැදව ගියේහෝ ශාසිදීමාදියෙහි එමකාහුට එමකක් බොරු නොකියයුත්තේය අනුන්ලවා විධානකිරීම් වශයෙනුත් බොරුනොකියවියයුත්තේය බොරුකියන්නාවූ මෙරමාහට සතුටුවීම්වශයෙන් හෝඅනුමෝදන් නොවියයුත්තේය මෙසේ සවිපූකාරයෙන්ම අහුනය නොවහාත් අසත්‍යය දුරුකටයුත්තේය ගෘහසථවූ යම්ශ්‍රාවකයෙක් මෙමම් සුරාමේරය සංඛ්‍යාතවූ පස්වැදුරුම් සුරාය පස්වැදුරුම් මෙමරය අබිත් කන්සා ආදීමද්‍යවගීයයන මොවුන් අතුමෙරන් යම්දුවණෙක් මෙවනයෙන් නොකටයුත්තේය අනුන්ටද පානය නොකරවියයුත්තේය. රහසෙමර පෙවීයි මිලමුදල්දීම් ආදිවශයෙන් අනුදැනීමත් නොකටයුත්තේය මේ සුරාපානයාගේ අනිශයින් සවලදුවූ විපාකය නරකාදි සතරඅපායේ ඉපිද දුක්අනුභවමකාට යම් කිසි කුශලකම් සහායකින් මිනිස්ලොව උපන්කල්හි උමතුබවට පැමිණීමයයි දැන මේ සුරාපාන.ඊන් ත්‍රිකොටිමෙන්ම (තුන්ඉකළවරින්ම) වැළ

කියයුත්තේය මේ ලොකයෙහි අඩබාලවූ මිනිසුන්යයෝ සුරා මදයෙන් තුමතොවගණ ප්‍රාණවධාදි සියළු පව්මකරන්නාහුය අන්‍යයන්වත් මත්පැන්පොවා අන්‍යමයින් ප්‍රමාදකරවන්නාහුය පරලොව උපතු බව කරන්නාවූද මවුලොව සිඳිමුළාව කරන්නාවූද අඩබාලයන්ගේ සිත්අලවන්නාවූ මේ සුරාපානය සියළු අකුසලයන්ගේ උත්පත්ති ස්ථානයයි දැන සුරාපානමයත් හාත්පසින් වැළකියයුත්තේහි. මෙසේ මේ ගහඩ බ්‍රහ්මචරිය පඤ්චශීලය උත්සාහවත් කෘතඥ ශ්‍රාවකයාගේ නිත්‍යශීලයබව මෙම ධම්මිකසූත්‍ර අට්ඨාමේ ආ "එතහා වතා අගාරිය සාවකස්ස නිච්චසීලං දමෙසබ්බා ඉදානි උපොසථඞ්ගානි දමෙසමෙතහා" යනාදි පාඨමයත් අවබොධ කටයුත්තේහි.

මේ ගහඩ බ්‍රහ්මචරිය පඤ්චශීලය අබුමඩාත්පාදකාලයෙහි කෙ සේරක්ෂාකෙළේදයත්? යටගිය දවස සුරුන්ධිනම් නුවර තිසිනම් රජ්ජු රුකෙනෙක් රාජ්‍යයකරණසමයෙහි ඒ රජහට එකද දූපුත් කෙ නොකුත් නැතහාය එකල රජ්ජුරුවෝ දරුවන් ප්‍රාර්ථනාකරවයි අත් තෘප්තියට නිමාගකළාහ එකල අපමහබෝසතාණෝ බඹලොවින් සැවඅවුත් රජ්ජුරුවන්ගේ අගමෙහෙසුන් බිසවුන්කුස උපන්නාහ ඒ කුමාරයන්ට නම්තබන්නාහු බොහෝදනාගේ සිත්සතුටුකරවමින් උපන්හෙයින් උදය භද්‍ර කුමාරයෝයයි නම්තුබහ. කුමාරයන් පියවර නගා කෙළ ඇවිදිනා අවස්ථාවෙහි අනික් බ්‍රහ්මයෙකුත් බඹලොවින් සැව අවුත් එම රජ්ජුරුවන්ගේ එක්තරා බිසෝකෙනෙකුන්ගේ බඩ කුමාරිකාවක්ව උපන්නාහ ඒ කුමාරිකාවුන්ට උදය භද්‍රා කුමාරිකා වෝයයි නම්තුබහ. උදය භද්‍ර කුමාරයෝවනාහි වැඩිවිය පැමිණි කල්හි ශිල්පශාස්ත්‍රයෙහි නිපුණවූවාහ ජාතියෙන්ම බ්‍රහ්මචාරිවූහ සවිඤ්ඤාණකසත්ත්වයන්ට මෛත්‍රීන සෙවනය නොමදන්නාහ ජාතිගුණයෙන්ම මනුලශවශග විත්තශයක් තුපදහන්ය එකල රජ්ජුරුවෝ පුතනුවන් රාජ්‍යයෙහි අභිෂේකකෙරෙවි නාටක ස්ත්‍රීන් පිරිවරවමින්සි පුතනුවන්ලහ? අස්නක්යැවුන මහබෝසතාණෝ කියන්නාහු මව රාජ්‍යයෙන් කම්නැත මනුලශශයහි මාගේසිත ඇත්තේනැතැයි කියා ප්‍රතික්ෂේපකළාහ. දෙමව්පියෝ නැවත නැවතත් කියායැවූහ. එකල මහබෝසතාණෝ ජාඹුනද සවර්ණමය ස්ත්‍රී රුවක්කරවා මේබදු ස්ත්‍රී රුවක් ලදහාත් රාජ්‍යය පිළිගණිමියි දෙව්පියන්ලහට රන්රුව යැවූහ ඔවුහු ඒ රන්රුව මුළු දඹදිව ඇවිදුවා පරීක්ෂාක රවා එබඳු ස්ත්‍රියක නොලැබ උදය භද්‍රාවන් සරහා ඒ රන් රුවලග සිටුවූහ ඕතොමෝ ඒ රන්රුව ඉක්මයිවිනීය එකල ඔවුන්

දෙදෙනාම මහාකැමැති පරිද්දෙන් කුඩාවැනියන්ගේ දුවු කුමාරිකා වන් නැඟනියන් උදයභද්‍රානම් කුමාරිකාවන් අගමෙහෙසුන්කොට බොධිසත්වයන් රාජ්‍යාභිෂේක කළාහ ඒ දෙදෙන ධර්මවාරිව වාසය කරන්නාහ කල්යාමෙන් දෙමව්පියන්ගේ ඇවෑමෙන් බොධිසත්වයෝ රාජ්‍යය කරන්නාහු දෙදෙනාම එකම ශ්‍රීඝනන්ගබඩාවෙහි වසන්නාහු ලාභසිනින් ඔව්නොවූන් මුහුණුපොතක්කුත් දුටුවන්බිඳ නොබැහැඟ එතැනුදුවූවන් අප දෙදෙනා අතුරෙන් යම් කෙනෙක්ක් පළමු කොට මේලේවිනම් ඔහුතමන් උපන්තැනින් අවුත් මේ අයදිල්ලතන උපනිමිසි කියන්වැඩ කතිනාවක්කළාහ ඉක්බිත්තෙන් බොධිසත්වයෝ රාජ්‍යයට පැමිණි ගව්රුදුසත්සියක්හුගේ ඇවෑමෙන් කළුරියකළාහ අනික් රජ්ජුරුවෙකුතෙක් නැතතාහ උදය තම මහාමාත්‍යයෝ රාජ්‍යය අනුශාසනාවන්නාහ බොධිසත්වයෝද තව්තිසාභවනයෙහි ශක්‍රදිව්‍යරාජත්ව ඉපිද ඵලභුක්තියෙදන් සතියක් කල් උදයභද්‍රාවන් සිහිනෙනාකළාහ මෙසේ මනුෂ්‍යගණනාවෙන් සත්සියයක් හවුරුදු ගියකල්හි සිහිනෙකාට උදයභද්‍රානම් රජබිසව දැහැවෙන් විමසා සිංහනාදකරවා ධර්මදේශනාකොට කතිකාවෙන් මිදිළුම්සි සිතුහ එකල්හි මනුෂ්‍යයන්ට දසදහසක් හවුරුද්දට ආයුඇතිකල්වන්නේය රජබිසෝ මහා මෝද එදවස් රාත්‍රියෙහි මනාකොට වසනලද මදුරකවුළුඇති වටිලනලද රතවල්ඇති සන්ඇල්පාවයහි උතුම්වූ මතුමාල්තලයෙහි ශ්‍රී යහන්ගබඩාවෙහි උදකළාව නිශ්වලව තමන්ගේ ශීලය ආවර්ජනා කරමින් උන්නාහ. එකල ශක්‍රභවනයෙහි රත්නසු පුරණලද රත්තළියක් ඇරගෙණ අවුදින් ශ්‍රීයහන්ගබඩාවට පහළව එතන්පසුබසිට බිසවුන් හා කථාකරන්නාහු මේ ජාතකයෙහි පූර්වගාථාවෙන් මෙසේ කියන්නෙමනාවූ වස්තුයක් ඇන්දවූ ඇත්සොඩ කටබදුවට මිටසිළුවූ උරැයුග්ගයක් ඇතතාවූ පැහැපුප්‍රශාදඇතින් හා මණ්ඩලත්‍රාඝකින්ද මහබියවූ කිනහරාගනාවන් ඇස් හා සමාන ඇස්ඇතතා වූ පාදනතා යෙහි පවත් කෙශානතායදක්වා සියළු අභ්‍රත්‍යහයෙන් කියි ඌනතාවක් නැතිව මහබියවූ උතුම් ප්‍රාශාද තලයෙහි උදකළාව උන්නාවූ උත්තමාඟිය මතාපට මම යාඥුකරම් අද එක රාත්‍රියක් අලංකතවූ මේ ශ්‍රීයහන් ගබඩාවෙහි නී හා මාහා එක යහන වැද සෙය්‍යාකරම් යයි කීහ. ඉක්බිති උදය භද්‍රානම් රජබිසෝතොමෝ කියන්නී එබල මේ දෙමළුන් පැහැණ සුරැකිනම් නුවර අතුරෙහි දියඇගල්

ආදියෙන් හා මහත්වූ දෙරටු අවලෙලනඳ ගැවසීගත්තේය ආයුධයන් නාලද අත්ඇති දසදහසක් මයාධයන් විසින් රකවල් ගන්නාලද්දේය එසේ මහයින් මේ සියළුම නුවරට හා ඇතුළෙහි කරණලද මාගේ නිවාසපුරයටද යන මේ දෙකටම කිසිකෙනෙකුන් වැද්දමනාහැක් මක්ය.

තවද එබිලපුරුෂයා ළදරුවිවයි මහළුවිවයි ශක්තිසම්පන්න මයාධයෙකුවේදැයි අතිකුත් යම්කිසි මහත්වූ පඬුරක් ඇරගෙණ එන්නක්නුගේ ඊමෙක්නම් නැත්තේය, එසේවූ මේ සථානයට අවුදින් මා හා සඑග කැමතිවන්නාවූ තොපි කවරෙක්හිද කෙසේනම් ආයේදැයි විචාළාහ එවිට ශක්‍රමදමවහුගෝ කියන්නාහු එබා සෙයාදුර මම එක් මදවතාවෙක්මි. දිව්‍යානුභාවයෙන් මේ සථානයටආමි තොපවනාකි අද කාමාසවාදයෙන් සතුටුවෙව තොපට මම රන්මසු පුරණලද මේ රන්හළිය පඬුරුමෙකාට මදමිකීහ. එබස්ඇසූ බිසෝතාමෝ කියන්නාහු එබා දිව්‍යරජ්ජුරුවනි මම මාගේ උදයභද්‍ර රජ්ජුරුවන් හැර අනික් මදවිසයකුවේවයි ශක්‍රමයකුවේවයි ප්‍රාර්ථනා නොමකරමි. එසේහයින් මේතන මනාසිට පළායව තොපගේ රන්මසු පඬුරන් මවප්‍රයෝජනයෙක් නැත මතුවෙතනාව මනාලේවයි කීහ. ශක්‍රමයාද බිසවුන්ගේ සිංහනාදයක්වැනිවූ බස්අසා මහාසිට පළාගියාක්මෙන් එතනම අනතර්ධානවසිට මදවෙනිදවස් එම වේලාවට රන්මසු පුරණලද රිදීතළියක් ඇරගෙණ දෘශ්‍යමානවසිට බිසවුන්හා කථාකරන්නාහු එබිල භද්‍රාව කාමභෝගිනිවූ සත්වෙකෙනෙක් ගමක් කරණකොටගෙණ කායදුශ්චරිතාදියෙහි හැසිරෙද්ද එසේවූ සත්වයාගේ යම් ඇල්මකින් මේ කාවරනියෙහි කරණලද ඇල්ම උතුම්වන්නේද එසේවූ කාමරති මදන්නවුන්හගන් තොපි මනාමකාට මදනලදද මම ඒ ලබන්නූ කැමැත්තෙමිද ඒ නිසා තොපලඟට එන්නාවූ මම හිස්අතින් නොආයෙමි ඊයේදවස රන්මසු පුරණලද රන්තළියක් ගෙණාෙයමි අද රන්මසු පුරණලද රිදීතළියක් ගෙණාෙයමි ඒ දැන් තොපවමදම් අද එකරාත්‍රියක් මාහා සමග සෙසයාවකරවසිකීහ එබස්අසා බිසවිසිනන්නාහු මේ තෙම කථාකරන්නට ලැබන්නේවීනම් නැවත නැවත එන්නේමය. එසේහයින් මේ දැන් මොහු හා සමග බැණනොනැගෙහිසිටා මුහවත් නොබැණම උන්නාහ ශක්‍රමයා උන්බැණනොනැගෙණ නියාවදැන එදවසුන් එන මේ අනතර්ධානවසිට තුන්වෙනිදවසුන් එම මේලාවට මූලාභාතළියක කහවණු පුරාඇරගෙණ අවුත්සිට සෙයාදුර අදමාහා කාමරතියෙන් සැතපෙව මේ කහවණුපිරූ මූලාභාතළිය තොපවමදම්කීහ. එබස්අසා බිසවිසි කියන්නාහු එබිල

පින්වත් පුරුෂයා තෝ අඤ්ඤතරෙනිය සත්ත්වයෝනම් යක්ෂයෙක සකලශරීර
යෙන් වසතුවෙන් ගිවිහිඟාගන්නාහු යම් වසතුවක් ගෙණාගේවීනම්
එවස්තු වසතුව දවසින් දවස වඩවඩාගෙණවුත් වණිනාසෙකෙරෙම්න්
ගිවියා පොළඹවන්නේය තෝවනාගි දවසින්දවස අඩු අඩුවෙගෙර
මින්, තාගේ සහායවටත් විරුඩකරන්නෙනිය පළමු දවස් රත්තුප
පිරූ රන්නළියක් ගෙණාගෙනිය දෙවෙනිදවස් රිදීනලියක් ගෙණා
ගෙනිය තුන්වනදවස් කාඟවණ්ණපිරූ ලාභතළියක් ගෙණාගෙනිය
ඊට කාරණා කිමිදැයි විවාළඟ එකල බෝධිසත්ත්වයෝ කියන්නාහු
එබල සොදුර ඔබ වනාහි වෙළඳුමෙහි ඉතා දක්ෂයෙහි අතීය තොත
සේ ඉදින් තෙපි ආයුෂයෙන්ද ශරීරවණ්ණයෙන්ද දවසින්දවස වඩුන්
නම් මමත් තොපට පඩුරු වඩවඩාගෙණෙන්නෙමි තෙපිවනාහි දව
සින්දවස හානියවපැමිණියෙව එසේහෙයින් මම තොපට පඩුරුත්
අඩු අඩුකොටගණිම් කියන්නාහු එබල සොදුර මනුෂ්‍යලොකයෙහි
සත්ත්වයන්ගේ ආයුෂයා ශරීරවණ්ඩ පෙරහනෙක්හි වක්කළ දියතෙක්
මෙන් දවසින් දවස අඩු අඩුවන්නේය තොපගේවනාහි පළමුදවස්
ආළවිමල් පැවැත්තාවූ ආයුෂද ඊයේදවසට නොපැමිණ මහාචිරියක්
ගෙණ සුන්කළාක්මෙන් එදවස්ම අතුරුදන්විය. ඊයේදවස් පැවති
ආයුෂය අදදවසට නොපැමිණ ඊයේම නිරුඩවිය එසේහෙයින් තොප
පෙරවිදවස්ඇර අද දැන් මා බල බලා සිටියදීම තොපගේ ශරීර
වණ්ණය නපුරුවන්නේය එසේහෙයින් මෙතැන්පටන් රාත්‍රිදිනයත්
ඉකුත්වීමෙන් නොමබෝදවසකින් තොපි ජරාවට පැමිණෙව සොදුර
තොපි ඊට පළමුව තොපගේ රත්වන්ශරීරය ජරාවෙත් නොකෙළෙ
සනතාක් ශ්‍රේෂ්ඨවූ ශ්‍රමණබ්‍රාහ්මණ පුරා වඩවඩා මතුත්තනි වණ්
වන්වන පරිදි කරවයිකීහ. ඉක්බිති බිසව්තොමෝ කියන්නාහු එබල
දෙවතාව යම්සේ මනුෂ්‍යයෝ ජරාවට පැමිණෙත්නම් දෙවියෝ එසේ
ජරාවට නොපැමිණෙත්මැය ඔවුන්ගේ ශරීරයෙහි විලිපිළිනැත එසේ
මහඝීන්මෙහත්වූ ආනුභාවඇති දෙවතාවනි තොපඅතින් විවාරම්
ඒ දෙවියන්ගේ ශරීරය කවරප්‍රකාරයක් ඇත්දැයි විවාළඟ එබව
ප්‍රකාශකොට ශක්‍රදෙවේන්ද්‍රයෝ එබල සොදුර මනුෂ්‍යයන් රූපයෙහි
වණ්ණයෙන්ද වස්ත්‍රාභරණාදියෙන්ද යන මේ සියල්ලෙන් යම්සේ පිරිහී
ජරාවට පැමිණෙන්ද දෙවියෝ එසේ නොවෙති ඔවුන්ගේ ගාත්‍රාදියෙහි
විලිපිළිනැත සිලිටුවූ ගණරන්පටක් හා සමාන ශරීරවර්ණ ඇත්තේය
දිවසක්පාසා දිගුණ දිගුණා මඑශ්වර්‍යද වැඩෙන්නේය යම්සේ තොපි
රිමහන්නාවූ සවභාවඇත්තේමවිද එසේමහසින් තොපි ජරාවට
නොපැමිණෙන්නාක් ගිහිගෙන් නික්ම මහණවෙව එසේකල්හි තොපි

මේ සෑම සත්ත්වයෙක්ම මනුෂ්‍යලෝකයෙන් චුතව චාතුම්මහාරාජික දිව්‍යලෝකයෙහි උපදිනවාලන්නේ විදුහිකීහ බ්‍රාහ්මණයිනි දිව්‍යලෝකයෙක් යම් වණ්ණනාවක් අසා ඊර්ෂ්‍යාවන්නාවූ මාරයා දිව්‍යරජ්ජුරුවෙනි ක්ෂත්‍රියාදී මහාශාලකුල ජාතිභවදෑහි මනුෂ්‍යජනයාගේ මතයේ කුණකට ගසින් හා කාමභෝගී භාග්‍යවත් භාග්‍යවතාණන් වහන්සේ දැනී මනුෂ්‍යලෝකයෙන් දිව්‍යලෝකයටමයද්ද ඒ තමා දිව්‍යලෝකයට යන මං නුවනැතින් විසින් කියනලදහ ඒ මාරීයත්අතුරන් සවරමා ශ්‍රාවකයක පිණිවි සත්ත්වතයේ මනාබා පරලෝවයන්නනන්දුසි විවාළහ දිව්‍යලෝකයට යහ මාරීයකියන්නාවූ ශක්‍රදේවේන්ද්‍රයෝ මෙසේ කියහත් එබල සෝදුර උදයභද්‍රාව යම් සත්ත්වයෙකුනක් කායවාඩ්මනෝ යන චාරත්‍රය සකස්කොට පිහිටුවා අකුසල් මනාකොට කුසලධර්ම යන් සමාදන්ව මෙහණ පවත්නන් බබාහෝ ආහාරපානවගීයත් දන සංවිභාග ශ්‍රද්ධාවෙන්මයදී ශ්‍රමණ බ්‍රාහ්මණාදින්ට දන්දෙන්නේවිද සතරසංග්‍රහවස්තුවෙන් ජනරජනය කෙරේද යන මෙමතක් ගුණධර්මයනි පිහිටිමය් පරලොවට මනාබා යන්නේයයි කීහ බිසවිතොමෝ එබස්අසා උන්ට සතුටුව සතුනිකරන්නාහු යම්සේ මැනිමෙකමනක් පියාණිමෙකමනක් තමාමත් වැදුදරුමෙකමනකුන්ට වැඩකැමිනිව අවවාදකෙරේද එපරිද්දෙන් තොපිත් මට වැඩකැමිනිවම අනුශාසනාකළහ මම එබදු අවවාදකරන්නාවූ විපුලවූ ශරීර ශොභාඇති මනාවූවුන සමාදානඇති තෙපි තමා කවරුදුයි විවාරම් මට කියවයි කීහ.

ඉක්බිති මහාධිසත්ත්වයෝ කියන්නාහු එබිල සුන්දර දර්ශනඇති භද්‍රව මම වනාහි මේ මා උපන්ජාතියට පළමුජාතිමයහි තොපට වල්ලභවූ උදයභද්‍ර රජ්ජුරුවෝනම වෙමි ඒ මම නී සවම්පමයන් මියමගාස් තව්තිසාභවනයහි ශක්‍රදේවත්වය උපනිමි එතනින් තොප සවම්පයව් එන්නාවූ මම මකලඝ ස්සමචිත්තයෙන් ආමයම් නොවම් තොප විමසා පියා පළමුකනිකාවක් කළමෝවිද ඒ කතිකාමවන් මිදී තොපට මම අසවල්තැන උපනිමි කියාපියා යන පිණිස ආමි දුන් ඉත් මිදිනිමි එසේහයින් මම දෙවලොවට යෙමිකීහ. එසඳ බිසවි කඳුළුබිඳුරා වගුරුවමින් සවාමිනි නුඹවහන්සේ උදය භද්‍ර රජ්ජුරුවෝද? නුඹවහන්සේගෙන් මවන්ව මා විසියහන්මන් නැත ඔම් සේ පර නුඹවහන්සේ මාහා එක්ව වාසයකළල්වීනම් දැනුදු එපරිද්දෙන්ම එක්වවසනා නියාවෙන් මට උගන්වා කතිකාවදින් මිදී වැඩිය මැනවැයිකීහ. නැවත බිසවුන්ට අනුශාසනාකරන්නාවූ ශක්‍රදේවේන්ද්‍රයෝ මෙසේ කියත් එබිල සෝදුර උදයභද්‍රාව මේ ලොකයෙහි

සත්ත්වයන්ගේ ප්‍රථම චිත්තය පහළවීම යන මේ තුන්වයස ඔහුට ගළාබැ
සයන්නාවූ ගඟාවක්මෙන් නොනැවතී වහාම ඉක්ම ගෙවියන්නේය
උපන්නාවූ සත්ත්වයන්ට නොනැසී සිටීමක්නම් නැත බුදුන්ආදිකොට
ඇතනාවූ සියළු සත්ත්වයන්ගේ ජීවිතය අස්ථිරවන්නේය සියල්ලවුන්ම
රණ්ඩුන් මවසිළුටු ශරීරයෙක් ඇත්නම් එයින් නිරන්තරයෙන්ම
ජරාවට පැමිණෙන්නේයි ඒ කාරණයෙන් උදයභද්‍රවනි තෙපින්
මේ සියල්ලට පැමිණෙන්නී යිතා වහා නොපමාව දශකුශලකර්මපථයෙහි
හැසිරව තවද සොඳුරුයම් එකම සත්ත්වයෙක්හට මේ පෘථිවිමණ්ඩලය
හා සියළු යශසක් පැමිණියේවීනමුත් එහිතෘප්තියක් සෑහෙයි යන්
නක් නොසිතා පහළොවූ ඝනලෝභවිත්තයෙන් කළුරියකරන්නේය
එසේහෙයින් තෘෂ්ණාවෙහි තෘප්තිවූයක්නැතිනියාව දනුව තවද
මැන්යන් පුතනුවන්ද පුතනුවන් මැනියන්ද පියාණෝ පුතනු
වන්ද පුතනුවෝ පියාණන්ද බෑණෝ නැගනියන්ද නැගනියෝ
බෑණන්ද වල්ලභයා සත්‍රීද සත්‍රී වල්ලභයාද ස්වාමියා වසඟවූ වසඟවූ
සේවාමියාවදුයි මේ සියල්ලම මරණකාලයෙහි පළමුවශයෙන් බව්
නොවුන් නොබලා හැරයාමෙන් සිරිරක්නැතිබව දනුව තවද මේ
සංසාරයෙහි බලුකපුටුආදී තිරිසනුන්ගේද මනුෂ්‍යයන්ගේද සෙසු
සියළුසත්ත්වයන්ගේද යන මේ දුඃඛිත සුගතිදුක්ගිම සත්වයන්ගේ
ශොජනයද යශස්ද එක්වකරන්නාවූ වාසයද ජීවිතයද යනමේ
සියල්ලම අස්ථිරයයි දැන අප්‍රමාදව දශකුශලකර්මපථයෙහි
කියා මෙසේ මහබ්‍රහ්මණෝ අවවාදකළාහ බිසවිද බෝධිසත්ත්ව
න්ට කියන්නාහු දෙවතාවෙනි තොප කියේ ඉතා යහපත මේ සත්ව
යාගේ ජීවිතයනම් සත්‍රීමනාපවයි ඉතා සුවල්පකාලිකය දුකින් මිශ්‍රය
එසේහෙයින් මම කෂිරට සුරුකිනම් පුරයහැර හුදකළාව තපසට
යෙමි කීහ. බොධිසත්ත්වයෝ බිසවුන්ට අවවාදදී දිව්‍යමලාකඨවම නැඟී
ගියාහ. බිසවිද දෙවන දවස් උදෑන අමාත්‍යයන්ට රාජ්‍යයපාදී
තමන්ගේ එළඹුවර සිත්කළවූ උශනෙහි සාමි ප්‍රව්‍රජ්‍යාවෙන් පැවිදිව
ධ්‍යානයෙහි හැසිර ආයුසංස්කාරයාගේ කෙළවර තව්තිසාභවනයෙහි
බෝධිසත්ත්වයන්ටම පාදපරිචාරියාව උපන්නාහ. මෙසේ පුරාතන
යෙහි මහාබෝධිසත්ත්වාදී උත්තමයෝ අබ්භුතාත්පාදශතිපවා පූර්වචරි
තානුභාවයෙන් ත්‍රිලෝක ශාස්තෘභාවයෙහින් ගහඨ බ්‍රහ්මචරිය පසඟවයිලය
රක්ෂාකළ දැරිදි අවිච්ඡෙදකවයුතුයි

උදයභද්‍ර ජාතක නිර්දේශයයි 40.

නකුලසූත්‍ර උගහසූත්‍ර නිර්දේශය.

—o—

41 බුදුඩාත්පාදයෙහි ගහළු බ්‍රහ්මචරියපඤ්චශීලය රක්ෂාකළ පරිදිකිසේයත් ? සතරාමර සකලලෝක සඞ්ඝයන්ට එකම ධර්මරාජන්වූ අප්‍රතිහාර්‍යවත් සම්‍යක් සම්බුදුරජාණන්වහන්සේ එක්සමලෙස භග්ගනම් ජනපදයෙහි සුංසුමාරගිරිනම් නගරාසන්නයෙහිවූ මුවන්ට අභයදුන් බැවින් මෘගදායනම්වූ හෙසකලාවනයෙහි වැඩවාසය කර වදාළේසි එසමයෙහි වනාහි සුංසුමාරගිරි නුවරවාසිවූ නකුල පිතෘනම් ගෘහපතිතෙමේ ගිලන්ව අතිශයින් දුකටපත්වූයේය ඉක්බිති නකුලමාතෘනම් භාර්‍යාතොමෝ අතිශයින් ගිලන්වූ තමාගේ සවාමිපුත්‍රවූ ගෘහපතිපුත්‍රයාලඟටගොස් මේසේකීහ සවාමිපුත්‍රයාණනි නුඹවහන්සේ අපෙක්ෂාවෙන් යුක්තව මහවත් යම් යම් දෙයක් එකෙරහි ආශාවෙන් යුක්තව නහවක් කාලක්‍රියාකරව ගෘහපතිපුත්‍රය අපෙක්ෂා ඇත්තාහුගේ කාලක්‍රියාව දුක්වන්නිය අපෙක්ෂා නොවන් යුක්තවූවාහුගේ කාලක්‍රියාව භාග්‍යවත්හු විසින් ගරහනලද්දීය. සවාමිපුත්‍රවූ ගෘහපතිය නුඹවහන්සේට මෙබඳු අපෙක්ෂාවක් විය යුතුවන්නීය මාගේ ඇවැමෙන් නකුල මාතෘගෘහපතිනී තොමෝ දරුවන් පොෂ්‍යයකළ හැකිවන්නීද නොවන්නීද ඝරාවාසය එතර කළ හැකිවන්නීද නොවන්නීදැයි ? මෙබඳු අපෙක්ෂාවක් විය යුතුවන්නිය සවාමිපුත්‍රවූ ගෘහපතිය නුඹවහන්සේගේ ඇවැමෙන් දරුවන් පොෂ්‍යයකරන්නටද ඝරාවාසය එතරකරන්නටද මා අදහසයි නොසිතුව් මැනව සවාමිපුත්‍රවූ ගෘහපතිය මම වනාහි කපුකැටිමෙහිද වෙණි බඹිනමයයි නොමහාත් හිසමත් ගවසා ඇකාණඩාබැඳිමෙහිද දක්ෂමයම් නුඹවහන්සේගේ ඇවැමෙන් කපුකැටිමෙන් හා වෙණි බඹිනමයන්ද දරුවන් පොෂ්‍යයකරන්නටද ඝරාවාසය එතරකරන්නටද හැකිවෙමි එබැවින් සවාමිපුත්‍රය නුඹවහන්සේ අපෙක්ෂා වෙන් යුක්තව නහවක් කාලක්‍රියාකරව අපෙක්ෂාවෙන් යුක්තවූවාහුගේ කාලක්‍රියාව දුක්වන්නීය භාග්‍යවත්හු විසින් අපෙක්ෂාසහිත යාගේ කාලක්‍රියාව ගරහනලද්දීය. තවද ගෘහපතිපුත්‍රය නුඹවහන්සේට මෙබඳු අපෙක්ෂාවක් විය යුතු වන්නිය මාගේ ඇවැමෙන් නකුල මාතෘතොමෝ අනික් පුරුෂයෙකුගේ රාජාන්තේඋපස්ථායිකාවක් මෙබඳු අපෙක්ෂාවක් විය යුත්තීය සවාමිපුත්‍රය එසේ නොසිතුව මැනව නුඹවහන්සේ නොදන්නෙහිද ? නුඹවහන්සේ හා මම ද යම්කලෙක තථාගතයන්වහන්සේලඟින් ගෘහස්ථ බ්‍රහ්මචර්‍යා පඤ්චශීලය සමාදන්

වනලදුව සොළොස්හවුරුද්දක් ඉක්මනින්ම නොවේද ? එසේ හ සින් ගෘහපතිගේ පුත්‍රයා අපෙක්ෂාසහිතව නහමක් කළුරියකරව අප ක්ෂාඇත්තහුගේ කාලක්‍රියාව දුක්වන්නීය භාග්‍යවත්හු විසින් අප ක්ෂා ඇත්තහුගේ කාලක්‍රියාව ගරහනලද්දහ

තවද ගෘහපතිපුත්‍රයා බුඹුවහන්සේට මේබඳු අපෙක්ෂාවක් විය ශ්‍රුතුවන්නීය මාගේ ඇවැමෙන් නකුලමාතෘතොමෝ භාග්‍යවතුන්වහ න්සේදකිනුකැමතිවේදෝ නොවේදෝ භික්ෂුසංඝයා දකිනුකැමතිවේදෝ නොවේදෝගෝයි මේබඳු අපෙක්ෂාවක් විය‍ශ්‍රුතුවන්නීය සවාමිපුත්‍රය එසේ නොසිතුවමැනව බුඹුවහන්සේගේ ඇවැමෙන් මම් අතිශයින්ම භාග්‍යවතුන්වහන්සේ දකිනුකැමතිවෙමි අතිශයින්ම භික්ෂුසංඝයා දකිනුකැමැතිවෙමි එහෙයින් යවාමිපුත්‍රයාණෙනි බුඩුවහන්සේ අප ක්ෂාවෙන්යුක්තව නහමක් කාලක්‍රියාකරව අපෙක්ෂාවෙන් යුක්තවූ වාහුගේ කාලක්‍රියාව දුක්වන්නීය භාග්‍යවත්හු විසින් අපෙක්ෂාවෙන් යුක්තවූවාහුගේ කාලක්‍රියාව ගරහනලද්දීයයිකිහ.

තවද සවාමිපුත්‍රයාණන්වහන්ස බුඩුවහන්සේට මේබඳු අපෙක්ෂා වක් විය‍ශ්‍රුත්තය. නකුල මාතෘතොමෝ මාගේ ඇවැමෙන් සිලවයහි සංවර පරිපූරකාරීවන්නීවේද නොවන්නීවේදෝගෝයි අපෙක්ෂාවක් විය‍ශ්‍රුත්නීය සවාමිපුත්‍රය එසේ නොසිතුවමැනව සවාමිපුත්‍රයාණෙනි භාග්‍යවතුන්වහන්සේගේ ගෘහස්ථවූ සෙවතවසතුහැන්දූවූ සිල්රක් නාවූ යම්පමණ උපාසිකාශතශතක්වූවාහුනම් මම ඔවුන් අතුරන් එක්තරා උපාසිකාවක්වෙමි යම් සැකයක් හෝ විමතියක්හෝවිනම් මහසඝලාවනයෙහි වැඩවාසයකරන්නාවූ භාග්‍යවතුන්වහන්සේකරා එළඹ විවාරන්නෙම්වේද එහෙයින් සවාමිපුත්‍රයාණෙනි අපෙක්ෂාසහි තවූ කාලක්‍රියාව නහමක්කරව අපෙක්ෂාසහිතවූවාහුගේ කාලක්‍රියාව දුක්වන්නීය භාග්‍යවත්හු විසින් අපෙක්ෂා ඇත්තහුගේ කාලක්‍රියාව ගරහනලද්දීයයි යනාදිවූ නකුලමාතෘහුගේ අවවාද අනුශාසනාවන් අසා නකුල පිතෘ ගෘහපතිහුගේ ආබාධය නිරවශේෂයෙන් සුවපත්ව ළඟින් නැගිට නොබෝකලකින් ශරීරබල ලැබ සැරයටියකින් භාග්‍යවතුන්වහන්සේ වැඩවසන මහසඝලාවනයට එළඹ පසඟ පිහ ටුවා වැද එනත්පස්ව හුන්තේය ඉක්බිති භාග්‍යවතුන්වහන්සේ නකුලමාතෘහුගේ අවවාද අනුශාසනා ඇසීමෙන් ව්‍යාධිය සන්සුන් නීයාව අසා එබා ගෘහපතිය මාගේ ශාසනයෙහි සෙවතවසතු ඇන් දූවූ සිලවයනි පරිපූරකාරි උපාසිකාවන් අතුරෙන් මේ නකුල මාතෘ තොමෝ එක්තරා උපාසිකාවක්බවද සම්‍යක්ශාසනයෙහි වෙසතා

සම්‍යක් සම්බුද්ධත්වය පැතුවාහිද අෂ්ටසමාපත්තිලාභීවූ උපාසිකාවන් අතුරෙන් එක්තරා උපාසිකාවක්බවද මේ ශාසනයෙහි ශ්‍රද්ධාවන්වූ ගෘහස්ථ වස්ත්‍රනිවාසනයකරන්නාවූ උපාසිකාවන් අතුරෙන් එක්තරා උපාසිකාවක්බවද නකුලමාතෘපිතෘන්ගේ අනුකම්පාකරන්නාවූ අර්ථකාමීවූ අවවාදදායිවූ උපාසිකාවක්බවද පෙනෙවූයේ මහත්ලාභයකැයියන බවද දැක්වීමේ කැමැත්තාවූ මේ සූත්‍රදේශනාව නිදාන වශයෙන් ගත යුතුයේකි එසේත් වදාළ අඟුත්තරනිකාය ඡක්කනිපාතයෙහි

"එකං සමයං භගවා භග්ගෙසු විහරති සුංසුමාරගිරෙ භෙසකලාවනෙ මිගදායෙ තතෘපඛ්‍යාපන නිමිත්තෙන නකුලපිතා ගහපති ආබාධිකෝ හොති දුක්ඛිතෝ බාළ්හගිලානෝ අථඛෝ නකුලමාතා ගහපතානී නකුලපිතරං ගහපතිං එතදවොච මාඛෝ තවං ගහපති සාඛපඛෝ කාලඞ්කාසි දුක්ඛෝ ගහපති සාඛපඛස්ස කාලකිරියා ගරහිතාව භගවතා සාඛපඛස්ස කාලකිරියා සියාඛෝපන ඉත ගහපති එවමස්ස නකුලමාතා ගහපතානී මඤ්ඤමානා සක්කොති දූරඵක පොඵසතුං ඔරාවාසං සන්තරිතුංහි නඛෝ පඤ්ඤතං ගහපති එවංදවඩබ්බං කුසලාහං ගහපති කපාඨං කතුං මවණි ඔලිඛිතුං සක්කොමහං ගහපති තවඬ්ඩඛයන දූරඵක පොඵසතුං ඔරාවාසං සන්තරිතුං තස්මාහිහ තවං ගහපති මාසාඛපඛෝ කාලඞ්කාසි පෙ තවමේවඛෝ ගහපති ජානාසි අහඤ්ඤව ඨද ඉත සොළසවස්සානි ගහඨකං ඛ්‍රහ්මචරියං සමාදිහාහං පෙ යාවතාඛෝ ගහපති තස්ස භගවතා සාවිකා ගිහී ඔදාතවසනා සීලෙසු පරිපූරකාරිණියා අහංතාසං අඤ්ඤතරා" යනාදි නකුලසූත්‍රයන් විස්තර පාලිය හා අර්ථ දත යුතුයි. මෙසේ අඹුසැමියන් දෙදරුවන්ලැබ ගිහිගෙයි වාසයකළාවූ මේ නකුල මාතා පිතාහු බ්‍රහ්මචරිය පැවැත්වීලයෙහි පරිපූරකාරිව ඉසොළොස් හවුරුද්දක් එකගේතුළ තිසුවහුනමුදු වනීමා නකාලයෙහි ඉපෙගෝදවසපවා බ්‍රහ්මවෘත්‍රීව රක්ෂාකිරීමෙහි මඛ්‍යම උපාසක උපාසිකාමෙවූ උත්සාහමනාවඩත්මය අගෝ බුඩාගම පිරිහී ගියසැටි බලව

එව අඟුත්තරනිකායෙහි අඩ්ඨකනිපාතයෙහි තුන්වනවග පළවූ වන උගහසූත්‍රයෙන් හා මදමවති උගහසූත්‍රයෙන්ද අභිමත පාලි ප්‍රදේශයන් මෙසේ දක්වනුලැබේ.

"එකං සමයං භගවා මවසාලියං විහරති මහාවන කූටාගාර සාලායං පෙ සෙඨඛෝ අහංභන්තෙ දිඨධම්මා පත්තධම්මා විදිතධම්මා පරියොගාළ්හ ධම්මා තිණණවිචිකිච්ඡෝ විගතකථංකථෝ, මවසාරජ්ජප්පත්තෝහා අපරප්පච්චයා සත්ථුසාසනෙතත්තෙව බුඩ

සඞ්ඝඤ්ච ධම්මඤ්ච සංඝඤ්ච සරණං අගච්ඡිං බ්‍රහ්මචරියං පඤ්චවිධාභිඤ්ඤං සික්ඛාපදානි සමාදිසිං අයංමඛාමම භගින්නා දූතිකයා අච්ඡරිකයා අබ්භූතා ධම්මා සංවිජ්ජන්ති තස්සමය්හං භගින්නා වත්තබ්බා මාතුගාමිකයා පජාපතිකයා අම්හාකං අථවාහං භගින්නානඤ්ච තාපජාපතිකයානඤ්ච පඤ්ඤාමීං උපසංකමිස්සා තාපජාපතිකයා එතදවොචං මයාමඛා භගිනිකයා බ්‍රහ්මචරියං පඤ්චවිධානි සික්ඛාපදානි සමාදින්නානි යා ඉත්ථි ඉමඛවමහාමඛව භූඤ්ජිතු ප්‍රාණඤ්ච වකමරාතු සඛානිවා ඤාතිසාලානි ගවිජිතු මහානිවාපන පුරිසාධිපපාමඛයාවා කඤ්ඤ මවා දම්මිති මොමඛාරං මඛාපනාහං භගින්නා දූරං පරිවිවජ්ජනන්නා නාභිජානාමි චිත්තාඤ්ඤ අඤ්ඤථත්තං අයංමඛා මම භගින්නා තතිකයා අච්ඡරිකයා අබ්භූතා ධම්මා සංවිජ්ජන්ති'' යනාදිය පළමුවන උගඝසූත්‍රයි.

දෙවෙනි උගඝසූත්‍රය මෙමෙස්සි ''එකංඤමයං භගවා වජ්ජීසු විහරති හත්ථිනාමම තත්‍රඛා භගවා භික්ඛූ ආමන්තෙසි පෙ තඤ්ඤව බුඩඤ්ච ධම්මඤ්ච සංඝඤ්ච සරණං අගච්ඡිං බ්‍රහ්මචරියං පඤ්චවාණිව සික්ඛාපදානි සමාදිසිං අයංමඛාමම භගින්නා දූතිකයා අච්ඡරිකයා අබ්භූතා ධම්මා සංවිජ්ජන්ති තස්සමය්හං භගින්නා වත්තබ්බා මකාමාරිකයා පජාපතිකයා අම්හාකං අථවාහං භගින්නානඤ්ච තාපජාපතිකයානඤ්ච මතනු පඤ්කමීං උපසංකමිස්සා තාපජාපතිකයා එතදවොචං මයාමඛා භගිනිකයා බ්‍රහ්මචරියං පඤ්චවානිසික්ඛාපදානි සමාදින්නානි යා ඉත්ථි ඉමඛවමහාමඛව භූඤ්ජිතු ප්‍රාණඤ්ච කමරාතු සඛානිවා ඤාතිසාලානි ගවිජිතු මහානිවාපන පුරිසාධිපපාමඛයාවා කඤ්ඤමවා දම්මිති එවංවුත්තත්ත භගින්නා ජඨපජාපතී මං එතදවොච ශුත්තඤාමසා මං අය්‍යපුත්තත්ත පුරිසස්ස මදතීති අථවාහංභගින්නා තංපරිසං පඤ්කාසා මපත්වා වාමමතහමඤ්ඤත්ත පජාපතිං භගින්නා දක්ඛිණතහමඤ්ඤත්ත සිංකාරංගමගත්වා තස්ස පුරිසස්ස ඔතාමජසිං මකාවාරංමඛාපනාහං භගින්නා දූරං පරිවිව ජ්ඤන්නා නාභිජානාමි විඤ්ඤාසා අඤ්ඤඤථත්තං අයංමඛාමමභගින්නා තතිකයා අච්ඡරිකයා අබ්භූතා ධම්මා සංවිජ්ජන්ති'' යනු මෙවෙනි උගඝසූත්‍රයි.

මේ සූත්‍රයන්ගේ සංඝඤ්ඤපහාචය මෙමෙස්සි, එක්කමලක භාගය චතුන්වහන්සේ විශාලාමහනුවර මහාවනමයහි කරණලද කූටාගාර ශාලාවෙහි වැඩවසනුමේ උගඝනාම් ඇතැම්තෙමේ බුදුන්හරාඑළඹි ධර්මදේශනාව අසා එම ආසනමයෙනිම හිඳ සෝවාන්ඵලය ප්‍රත්‍යඤ්ඤ

මෙකාට දක්නාලද නිමිත්තක්ඛම් ඇත්තේ පැමිණියාවූ සෝවාන්ඵල ඇත්තේ ප්‍රතිඥවබ කරණලද ආඝාතඛම්ඇත්තේත් එතරකරණලද සසාඛඥවිඛකාංක්ෂා ඇත්තේත් පහවූ විචිකිච්ඡාඇත්තේ නිර්භය සථාන යට පැමිණියේ මේ ශාස්තෘශාසනයෙහි අපර ප්‍රත්‍යය ඇත්තේවූයෙම් සවාමිනි මම ඒ බුදුන්ගේ අභිමුඛයෙහිම බුඩඛම් සංඝසංඛ්‍යාත රත්නත්‍රය සරණපරායනවීම් බ්‍රහ්මචය්‍යාවෙන් යුක්තවූ (බ්‍රහ්මචය්‍යාව පස්වහුකාව ඇතකාවූ හෝ) පඤ්චශීලපදය මහාමහාත් ඝෘහසථ බ්‍රහ්මචරිය පඤ්චශීලය සමාදන්වූයෙම් සවාමිනි මේ දෙවෙනි ආශ්චය්‍ය අද්භූතඛම්ය මාගේ අභ්‍යන්තරයෙහි විද්‍යමානවෙයි සවාමිනි ඒ පඤ්චශීලපදය සමාදන්වූ මට ලදුරිවය පිහිටි භාය්‍යාවෝ සතරදෙ මහාන්දිහ ඉක්බිති මම ඒ අඹුවන්කරා එළඹ ඇලාව මෙසේකීයෙම් නැණතිවරුනි මා විසින් බ්‍රහ්මචරිය පඤ්චශීලය සමාදන්වනලද්ද තෙපි මෙතරත් යමක් කැමතිනම් මේ ගෙහිම භිඳ සමපත් අනුභවකරව කුසලඛම්යන්ද රැස්කරව සඛකීය නැයන්කරා යනු කැමතිනම් එසේත්යව යමෙක්හට පුරුෂාභිප්‍රායක් ඇත්තිනම් තෙපි කැමති පුරුෂයක්හට පාවාදන්මෙන්සි කීයෙම් සවාමිනි ලදුරිවිය පිහිටි අඹුවන් අත්හරණාවූ මම මාගේ චිත්තයෙහි අනිත් සවභාවකට පැමිණිබවක් නොදනිමි සවාමිනි මේ තුන්වන ආශ්චය්‍ය අද්භූත ඛම්ය මාගේ අභ්‍යන්තරයෙහි විද්‍යමානවන්නේය ගනාදිය පළමුවන උගහසූත්‍රයාගේ අභිප්‍රායයි.

මදෙවෙනි උගහසූත්‍රයෙහි භාවය මෙසේයි එක්සමයෙක්හි භාග්‍ය වතුන්වහන්සේ වැදුරට ඇන්ගම වැඩවාසඅතකලේනි එකල්හිද පෙර මෙන්ම ඇත්තම්වැසි උගහනම් ගැහැවිතෙමේ බුදුන්කරා එළඹ බණ අසා හුනස්නෙහිම්ඳ සෝවාන්ඵල ප්‍රාප්තව රත්නත්‍රය සරණගෙස් ගෘහසථ බ්‍රහ්මචරිය පඤ්චශීලය සමාදන්වූයේය ඒ ගෘහපතියාහටද ලදුරිවියපිහිටි අඹුවෝ සතරදෙනෙක්වූහ ඉක්බිති ගැහැවිතෙමේ භගවතාණන් ඒ ලදුරිවිය පිහිටි අඹුවන්ට කථාකොට සොදුරු මාවිසින් ඛඩසරවසින්යුත් පඤ්චශීලය සමාදන්වනලද්දේය තෙපි ඉදින් කැමැතතාහුනම් මෙහිම වැස සම්පත් අනුභවකරව කුසල්දහමුත් රැස්කර ව සඛකීය නැයන්කරා යනු කැමැතතාහුනම් එසේත්යව යමෙකුට පුරුෂාභිප්‍රායක් ඇතිවීනම් ඇකැවැති පුරුෂයකුටපාවාදෙන්නෙම්සි කීයෙම් මෙසේ කීකල්හි ඒ අඹුවන් සතරදෙනා අතුරෙන් වැඩිමහල් භාය්‍යා තොමෝ සවාමිපුත්‍රය අසවල් නම්ඇති පුරුෂයාහට මා පාවා දවත් කීය ඉක්බිති ඇ නී පුරුෂයාගෙන්වා වමනින් භාය්‍යාව අල්වා

දකුණතින් කෙඩිකාවගෙණ දැක්මණෑදකය මෙහළා ඒ පුරුෂයාහට පාවාදුන්නෙමි සවාමිනි මේ ලදුරිවූ භාය්‍යාවන් අත්හරණාවූ මාගේ සිත අනික් ප්‍රකාරයකට පැමිණිබවක් නොදනිමැ සවාමිනි මේ තුන් වන ආශ්චර්‍යය අද්භූත ධර්මය මාගේ සතන්හි විද්‍යමානවත්මෙන්ය යනාදිය හෙතිනාම උගහසුත්‍රයෙහි අභිප්‍රායයි මෙසේ මේසූත්‍රවර්‍යයන්ව බුදුන්ගේ අනිමුඛයෙහි පවා නිසරණසමඟ බ්‍රහ්මචර්‍යය පැදැවිශීලය සමාදන්වූබවපෙණේ මේ සූත්‍ර දෙසනාවන්හගේ ගහපති බ්‍රහ්මචර්‍යය නිත්‍යශීලය මේ ශාසනයෙහි ගරුකවයුතු ශීලයක්බවද සුදු වස්ත්‍ර හැඳ පෙරවගණ ගිහිගෙයි බඹසරවස රක්නා උපාසන උපාසිකා කොඩාසයක් බුදුන් ජීවමානකාලයෙහි පවත් පැවතාවූන් සියාම් බ්‍රහ්මාදිරවවල අදදක්වා එබදු උපාසිකාවන් ඇතිබවද පයිරිප්නි ප්‍රතිපත්ති ශාසනවයම පිරිනිහියාවූ සමරට අහාවිතාවම පැමිණිම ආශ්චර්‍යයක් නොවනබවද අවබොධකොට එබදු ශීලයන් රක්ෂා කරන්නට උත්සාහකවයුතුයි.

නකුලසුත්‍ර උගහසුත්‍ර නිර්දෙශයයි 41.

බ්‍රහ්මචර්‍ය පඤ්චශීලයයි.

42 එකාන්තික ශ්‍රේෂ්ඨශීලය කෙසේදයන් ? මේ ශාසනයෙහි භික්ෂූණීන් ධර්මානුකූලව පාණාතිපාතා විරතිය අදින්නාදානාවිරතිය අබ්‍රහ්මචරියා විරතිය මුසාවාදවිරතිය සුරාමේරය මජ්ජපමා දට්ඨානා විරතිය විකාල භොජනාවිරතිය යන ශික්ෂාපද ෂට්කය සමාදන්වීම් වශයෙන් රක්නාලද ශීලය දෙවර්ෂයක් නොකඩකොටරැකර්ට අනතුරු පිණිස සාමණෙරිගාවයට පැමිණ සුදුසුකම්වීමට කාලයක්වැස උපසම්පන්න භික්ෂූණී භාවයට පැමිණියයුතුයි. මේ ශික්ෂාපද ෂට්කය මනාසේ රක්නාකරමින් නොවැළැකියහැකිවිහිළු මල්ගඳවිලවුන් දැරීම් නානාවිරාග එසනු රන්රිදී මුතුමැණික් අබරණ දැරීම්ආදියද රන්රිදී මිලමුදල් ව්‍යවහාරකිරීම් උසසුන්මහ අසුන් පරිභෝගකිරීම් ආදියද පවසමින් දෙවර්ෂයක් ගතකරණ මාතුගාම භූතගම් ශික්ෂමානාගත නොනොත් හික්මෙන්නියයි ව්‍යවහාරකරහි යුම්ක්ෂණයින් මේසේ අනුදුනවදාළේදයන්? මාතුගාමභාවය ප්‍රකෘතියෙන් අලංකාරලෝලතාදි පඤ්චලාලාප්‍රියකින් ලොල්වන බැවිනි එබදු ප්‍රකෘතියක් ඇත්තාවූ මාතුගාම භූතගම් දෙවර්ෂයක් මුළුල්ලෙහි යම්තාක්තා ශික්ෂාපද ෂට්කයහි නොනික්මවා අධිශීල සාඛ්‍යාතවූ උපසම්පදා ශීලයෙහි පිහිටවනු ලබන්නීවීනම් රැක්ෂ ප්‍රතිපදාවෙන් වෙහෙසට පැමිණ වහාම

ශාසනයෙන් බැහැරයන්නීමෙයි එබැවින් ශාසනයට ඇතුළත්වනු පිණිස එතනාවුමාගමනතෙමේ පළමුවෙකාට එකහක්තික අවිකඝීලයෙහි පිහිටුවන්නේසි ඒ ශීලය සමාදන්කරවන්නාවූකල්හි "අහංභන්තෙ තිසරණෙන සහ එකහත්තික ඡකඩසීලං ධම්මං යාචාමි අනුගහණාතු මං සීලං දෙථමෙහන්තෙ" යනුවෙන් තුන්වළක් සිල්ඉල්වවා පූජිකාර්‍යයන් නිමවා සිල්දියුතුයි ඒ සිල්දීමද "පාණාතිපාතාවෙරමණිං සමාදියාමි අදින්නාදානාවෙරමණිං සමාදියාමි අබ්‍රහ්මචරියාවෙරමණිං සමාදියාමි මුසාවාදාවෙරමණිං සමාදියාමි සුරාමෙරය මජ්ජපමාදට්ඨානාවෙරමණිං සමාදියාමි, විකාලභොජනාවෙරමණිං සමාදියාමි නච්චගීතවාදිතවිසූකදස්සනමාලාගන්ධවිලේපනධාරණමණ්ඩනවිභූසනට්ඨානාවෙරමණිං සමාදියාමි, උච්චාසයනමහාසයනාවෙරමණිං සමාදියාමි, ජාතරූපරජතපටිග්ගහණාවෙරමණිං සමාදියාමි" යනුවෙන් ආචාර්‍යභන්තෙම සමාදන්ව දෙවතීයක් නොකඩව මේ ශීලය රක්ෂාකොට ඉක්බිති සාමණේරීභාවයට හා භික්ෂුණීභාවයට පැමිණියයුත්තීය සැටවයස් පිරිපැවිදිවනුකැමතිව ආ මාගමක් හවවූවත් මේ එකහක්තික අවිකඝීලය පළමුවෙකාට සමාදන්කරවා දෙවතීයක් භික්මවා සිව් ශික්ෂාපදානාවෙන් සාමණේරී පැවිදි උපසම්පදා භික්ෂුණීගාවයට ඇතුළත්කරගතයුතුයි ඉදින් දෙවතීයක් මේ ශීලය නොඅක්බිත්වූ සාමණේරියක් උපසම්පදාමාලකයට පමුණුවා යම් සඨවිර භික්ෂුණී මොහොතකුත් විසින් උපාධ්‍යායව අනුපසම්පන්නභාවයෙන් නැගුටුවනලද්දීනම් ඒ සඨවිර භික්ෂුණීන්ට පවිති ඇවතක්වේ එහින් වදාළහ භික්ෂුණී විභඞ්ගයෙහි ගර්භිනීවර්ණනයෙහි

"යාපන භික්ඛුනි සවෙවසාහි ඡසුධම්මෙසු අසික්ඛිත සික්ඛං සික්ඛමානං වුඨාපෙයය පාචිත්තියං" යනුයි සමන්තපාසාදිකා අට්ඨකථායෙහිද කියනලදුයේමැයි "මාතුගාමෙමානාම ලොලොලොගාහි සවෙවසාහි ඡසුධම්මෙසු අසික්ඛිතා සීලානි පූරයිංසූතනා කිලඤ්ඤි සික්ඛිංසු පනඤ්චජ, නකිල මිස්සති නිපච්චිස්සතීති දූපෙති "පාණාතිපාතා වෙරමණිං සවෙවසාහි අවිනිඤ්ඤාවම්ම සමාදානං සමාදියාමීති" යංතං පාණාතිපාතාවෙරමණීත් පඤ්ඤත්තං සික්ඛාපදංතං පාණාතිපාතා වෙරමණි සික්ඛාපදං සවෙවසාහි අවිනිඤ්ඤාමිතබ්බං සමාදානං කත්වා සමාදියාමීති අත්ථෝ එසනයෙ සබ්බත්ථ ඉමා ඡසික්ඛාපදියා සඤ්ඤසාසුපි පබ්බජිතාය දූතබ්බාසුවෙව න එතාසු අසික්ඛිතා උපසම්පාදෙතබ්බා" සී සැටවයස් පිරී වඤ්චාවඩව ආවාවූ මාගමුත්පවා පළමුවෙකාට ශික්ෂාපදානාවයෙහි හික්මවා පසුව පැවිදිකටයුතුයි ඊට උදාහරණ කථාවක් මෙසේයි—මහ එකසල්දයන් ?

මේ භද්‍රකල්පයට එකාතු කපින් විත්තෙහි වරකල්පයෙහි ලෝපහළුවූ මහාකාරුණිකවූ විපස්සිනම් සම්‍යක් සම්බුදුරජාණන් වහන්සේ ජීවමානව වැඩවාසයකර පදුරණසමයෙහි එක්දවසක් මහ රහත්ගණයා විසින් පිරිවරණුලැබූ ඒ විපස්සිනම් සම්‍යක් සම්බුදු රජ්ජුතෙමේ කලලකර්දම සන්නිභවූ විපියෙහි වඩාහාවිවූවූ එක්සරු ශ්‍රද්ධාවීර්‍යසමාධි සම්ප්‍රයුක්තකුල චිත්තාවක්ෂණාෂ්ටෝ බුදුන් ප්‍රමුඛවූ මහ සංඝයා මාගේ ශරීරය මහයක්ෂකාට වැඩවදුරණසේක්වා කියා කාල ල්මඩමත්තෙහි තමන්ගේ ශරීරය මහයක්ෂකාට වැඩවදුරණසේක් වීසීකියා කාලල්මඩමත්තෙහි තමන්ගේ ශරීරය චතුරාපා මහාවාසුත ඉක්බිති ඒ කුලධීතෘ තොමෝ එම් කුසලකර්මය නැවත නැවත සිහි කෙරෙමින් සතුටුව දානාදි මෙසු පින්කමුදුමකාට එයින් සැව තුසිත පුරයෙහි ඉපිද එතැන්පටන් එකානුකපක් මුළුල්ලේ සතරඅපායට නොපැමිණ දිව්‍යමනුෂ්‍ය දෙගතිමයෙහිම ඉපිද අප්‍රමාණ ශ්‍රී සම්පත් වලදා අපගේ ගෞතම බුදුශාසනයෙහි සැවැත්නුවර මහසැපත් ඇත්තාවූ බමුණු මහසල්කුලයෙහි ඉපිද දෙගුරුන් එයින් "මුක්තා" සිනම් කර ණලද්දීය ඒ මුක්තාතෙම් කුමාරිකාතොමෝ මහත් ශ්‍රී සෞභාග්‍යයෙන් වැඩි කිපි මරාණබාධයක්නොවී ගෘහස්ථ බ්‍රහ්මචර්‍යාව රක්ෂාකර මින් එකසිය විසිනවරුදුක් ගිහිගෙහිවැස මහාප්‍රජාපති ගෞතමීන් වහන්සේ කරා එළඹ ප්‍රව්‍රජ්‍යාවට සාඥකළකල්හි විනයවධිවිපරි මද්දන් පළමුකොට එකහත්‍යාදික අෂ්ටශීලය සමාදන්කරවා ශික්ෂා නහාවයට පමුණුවා ඒදශී නාකෙවහන්දී සුදුසු සෙනසුනකට යැවි ඝේය. ඒ මුක්තානම් ශික්ෂාවිනා තොමෝ ගාථනාකරණුයේ දෙව් රමවිමනර ඉඳුසිළුයේ වැඩහුන් තථාගතයන්වහන්සේගේ මහා කරුණා සමාපත්තියේ ඥානතෙජසින් දුලට අසුවී තමන්වහන්සේගේ ශ්‍රී ශරීරය දක්වන්නාක්මෙන් ඛුද්දරශ්මිමාලාවක් විහිදුවා මුක්තා නම් ශික්ෂමානාවහට සතරපදගාථාවකින් ධම්මදේශනාකළාහ ඒ ගාථාවගේ මකළුවර මුක්තානම් ශික්ෂමානා තොමෝ සෝවාන් සකෘදා ගාමි අනාගාමි අර්හත් යන සතරමඟ සතරඵලයට පැමිණියේයි මේ කථා ප්‍රවෘත්තිය තථෙරිගාථා අට්ඨකථායෙහිද අපදාන පාලියෙහිද ආගෙස්සී එතකුදුවූවුන් තථෙරිගාථා අට්ඨකථායෙහි මුක්තාභික්ෂුණී යන නමින්ද අපදානපාලියෙහි චංකෝභික්ෂුණී යන නමින්ද ආගෙස්සි කියනලදු සේවැටී තථෙරිගාථා අට්ඨකථායෙහි "මහාපජාපති ගොතමියා සහනිමකා පබ්බජිතා, සිඤ්ඛානාහුත්වා" යනාදියයි.

එකගත්තිංස අපරිකාශිල නිර්දේශයයි 42.

ආර්‍ය්‍ය අෂ්ටාඟ උපෝෂථශීලය.

—o—

43 ආර්‍ය්‍ය අෂ්ටාඟ උපෝෂථශීලය කෙසේදයත්? වසතුන්මසට පෙරපසු දෙමස හා වස්තුන්මස ද සමඟ පස්මාසය හෝ වසතුන්මාසය හෝ අන්‍යතම චීවරමාසය හෝ චීවරමාසයාගේ අතිම්මාසය හෝ ප්‍රකෘති පොහෝදවස හෝ පරිවේෂ්ද කොටගෙණ මෙමස් මේ පස්මසය තුන්මසය එක්මසය අඩමසය එක්දවසය යන පඤ්චපරිවේෂ්දයන් අතුරෙන් කැමතිකාලපරිවේෂ්දයක් නියමකොටගෙණ සමාදන්වීය යුතුනිලය ආර්‍ය්‍ය අෂ්ටාඟ උපෝෂථශීලනම්වේවි ශීලය සමාදන් වත් නහුවිසින් පෙරවිදවස හිඟිමගේකටයුතු විධානකොට පොහොදවසට යැපියයුතු ආහාරකෘත්‍යය සම්පාදනයකරතබා පොහොදවස උදැසන අතපය මුවදෙවා පවිත්‍රව සුදුවස්ත්‍රහැඳ සුදුචතක් එකාංශකොට පොරවා ශික්ෂාපදඅට තමන් දන්නේවිනම් එකක්පාසා අධිෂ්ඨානකර ගතයුතුයි. ශික්ෂාපද අට තමා නොදන්නේවිනම් අසල විහාරස්ථානයකට හෝ චෛත්‍යබොධිවෘක්ෂයක්කරා හෝ අටසිල්පද දන්නා භික්ෂු උපාසකාදි ආචාර්‍ය්‍යයකුකරා හෝ ගොස් උත්කුටිකයෙන්හිඳ ඇදිලිබැඳගණ "ඔකාස අහංභන්තෙ තිසරණේන සහ අට්ඨඞ්ගසීලං ධම්මං යාචාමි අනුග්ගහංකත්වා සීලංදෙථමෙභන්තෙ අනුකම්පං උපාදාය" යනාදිවාක්‍යයෙන් තුන්යළක් යාඤ්ඤාකොටපි ආචාර්‍ය්‍යයන් විසින් දෙනනියාමයෙන් ශික්ෂාපදඅට සමාදන්වීයයුතුයි. ඉවාඅත්තාකල හෝ ආචාරීන්ගෙන් සමාදන්වනකල හෝ ශික්ෂාපදයක්පාසා මෙමස් ප්‍රත්‍යවෙක්ෂාකටයුතුනි.

මහරහතුන්වහන්සේ ජීවිතාන්තයදක්වා පාණාතිපාතය හැර පාණාතිපාතයෙන් වැළැක්කාහුය බහා තබනලද දඬුමුගුරුඇතුනාහ පණිවාමයෙහි ලජ්ජාඇතුනාහ සබ්බයන්තකරෙහි දයාවට පැමිණියාහ සියළු ප්‍රාණ්හූතයන්කෙරෙහි හිතානුකම්පා ඇතිව වාසයකළාහුය මම්ද මේ දවාල හා රාත්‍රියත් පාණාතිපාතය හැර පාණාතිපාතයෙන් වැළකී වාසයකරමි යනාදීන් සලකා මේ පළමුවන අඟයෙන් මහරහතුන්ට අනුව ක්‍රියාකරමි මාගේ උපොසථයත් වසනලද්දේවෙයි යනු මේන් පළමුවන ශික්ෂාපදය ඉවාඅතයුතුයි.

ඒට අනතුරුව මහරහතුන්වහන්සේ ජීවිතාන්තයදක්වා අනුන්විසින් කායවාක්මනසකින් නොසලනලද වසතුව පැහැරගැණීම හැරඅදිනනාදානයෙන් වැළකුනාහුය සලනලද්දක්ම ගන්නා සුළුවූග

දෙනලද්දක්හැකිවම කැමතිවූහ සොරනුවූ පවිත්‍රවූ ආත්මභයන් යුක්තව වාසඝකළාහුය මමද මේ රාත්‍රිය හා දවාලත් අදිනනාදුනයෙන් වැළකී වාසයකරමිසි යනාදින් සලකා මේ දෙවන අඟයන් මහරහතුන්ට අනුව ක්‍රියාකරම් මාඟේ උපොසථයත් වසනලද්දේවෙයි යනුවෙන් සලකා දෙවන ශික්ෂාපදය ඉටාගතයුතුයි.

මහ රහතුන්වහන්සේ ජීවිතාන්තයදක්වා මෛථුන සෙවනය හැර බ්‍රහ්මචාරීව ග්‍රාම්‍යධර්මයෙන් වෙන්ව මයංඑය සමාපත්තියෙන් හා ලාමක ධර්මයෙන්ද වැළකුනාහ මමත් මේ රැය හා දවාලත් ඒ ලාමක හැසිරීම් සංඛ්‍යාත මෛථුනයෙන් වළකිමි මේ තුන්වන අඟයනුදු මම මහරහතුන්ට අනුව ක්‍රියාකරම් මාඟේ උපොසථයත් වසනලද්දේවෙයි යනුවෙන් තුන්වන ශික්ෂාපදය ඉටාගතයුතුයි.

මහරහතුන්වහන්සේ ජීවිතාන්තයදක්වා මුසාවාදයහැර මුසාවාබිණිමෙන් වැළකුනාහ සත්‍යවාදීයහ සත්‍යසඳින් සත්‍යය ගළපන සුළුවූන සත්‍යවචන කියන්නාහ කාරණාසහිතවූම වචන කියන්නාහ ලොකයා බොරුවෙන් නොරවටන්නාහ මමද මේ රැය හා දවලත් මුසාවාදය හැර මුසවා කිමෙන් වළකිමි මම වනාහි මේ සතරවන අඟයනුත් මහරහතුන්ට අනුව ක්‍රියාකරම් මාඟේ උපොසථයත් වසනලද්දේවෙයි යනුවෙන් සතරවන ශික්ෂාපදය ඉටාගතයුතුයි.

මහරහතුන්වහන්සේ ජීවිතාන්තයදක්වා සුරාමෙරයහැර මද ප්‍රමාදයට හේතුවූ රහමෙරපීමෙන් වැළකුනාහ මමද අද මේ රැය හා දවලත් ඒ මද ප්‍රමාදයට කාරණාවූ සුරාමෙරය පානයෙන් වළක්මි මම වනාහි මේ පස්වන අඟයනුත් මහරහතුන්ට අනුව ක්‍රියාකරම් මාඟේ උපොසථයත් වසනලද්දේවෙයි. යනුවෙන් පස්වෙනි ශික්ෂාපදය ඉටාගතයුතුයි

මහරහතුන්වහන්සේ ජීවිතාන්තයදක්වා එක්වේල වළඳන සුළුවූන රාත්‍රි භොජනයෙන් වැළකුනාහ විකාලභොජනයෙන් වැළකුනාහ මමද අද මේ රැය හා දවලත් ඒ විකාලභොජනයෙන් වළකිමි රාත්‍රිභොජනයෙන් වළකිමි මම වනාහි මේ සවන අඟයනුත් මහරහතුන්ට අනුව ක්‍රියාකරම් මාඟේ උපොසථයත් වසනලද්දේවෙයි යනුවෙන් සවන ශික්ෂාපදය ඉටාගතයුතු.

මහරහතුන්වහන්සේ ජීවිතාන්තයදක්වා නවනු ගණුවයනු විසුළුදස්න මල්දෙවිලවුන් ඇ දුරිම් සැරසිම් අලංකාරාදිඅයන්ද වැළකුනාහ මවද අද මේ රැය හා දවලන් ඒ නවනුගණුවයනු විසුළු දස්නමල්දෙ විලවුන් ඇ දුරිම් සැරසිම් අලංකාරාදිඅයෙන් වළකිම් මව එනාහි මේ සත්වන අහඅයනුත් රහතුන්ව අනුව ක්‍රියාසරම් මාඅගේ උපොසථයත් වසනලද්දේවයි යනුවෙන් සත්වන ශික්ෂාපදය ඉටාගතයුතුයි.

රහතුන්වහන්සේ ජීවිතාන්තයදක්වා උසසුන් මහඋසුන් හැර අහවත් මිථ්‍යාදිරියනින් උස්වූ පාඇනි ඇඳපුටුආදිය හා ඇතොජව පලස් බුමුතුරුණු ආදි මහානාසී අසුන්ආදිය හැර උසසුන් මහඋසුන් පරිභොගඅයන් වැළකුනාහ මවද අද මේ රැය හා දවලන් ඒ උසසුන් මහඋසුන් හැර උසසුන් මහඋසුන් පරිභොගඅයෙන් වළකිම් පාමිපි ඇඳක අහෝ තණඇතිරියක අහෝ සසඅහාවකරම් මම එනාහි මේ අටවනි අහඅයනුදු රහතුන්ව අනුව ක්‍රියාකරම් මාඅගේ උපොසථ යත් වසනලද්දේවයි යනුවෙන් අවවනි ශික්ෂාපදය ඉටාගත යුතුයි.

මෙසේ එක එක ශික්ෂාපදයක්පාසා වෙන වෙනම නුවණින් සලකා "පාණාතිපාතා වෙරමණි, අදින්නාදානා වෙරමණි, අබ්‍රහ්ම චරියා වෙරමණි, මුසාවාදා වෙරමණි, සුරාමේරය මජ්ජපමාදට්ඨානා වෙරමණි, විකාලභොජනා වෙරමණි, නච්චගීතවාදිතවිසූකදස්සන මාලා ගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණි, උච්චාසයන මහාසයනා වෙරමණි සිකඛාපදං සමාදියාමි" යනුවෙන් ශික්ෂාපද දන්නේවිනම් තමන් විසින් අහෝ නොදන්නේවිනම් ආචාර්යයන් ගෙන් අහෝ වාන්සහදයෙකුම සමාදන්විය යුතුයි. මෙසේ සමාදන්වූ සිල්ඇති වූ උපාසක උපාසිකාවන් විසින් මුලින් පිරිසිදුගතහානා ලැතුළු අහවන් පස්මසයතුන්මසය මසය අඩමසය දවසය යන කාල නියාලයක්තුළ මහරහතුන්වහන්සේ සෙවනක්මෙන් ක්‍රියාකටයුතු යයි සිතා අඹුදරුවන් ආදි ඝරාවාසයෙහි කුදුමහත් කටයුතු අහෝ වෙළඳුම් අහෝකිවිආදි කටයුතු අහෝ නොසිතා නොබලා කායවාග් චේතනාවෙන් නවන් කය වචනයවා නෝ වචනයෙන් ඉල්වා අහෝ ඔපයාහන්නාලද ආහර භිලන්පස ආදිය අහෝ පරිභොග නොකොට සියළුක්‍රියා වෙහි රහතුන්ව සමානව ක්‍රියාකටයුතුයි. ඒ කාලයතුළ තමන්ගේ චරිතයට සුදුසු යම් කිසි කම්ඨානයක් භාවිතාකටයුතුයි. ඉදින් කායගතාසති කම්ඨානය් භාවනාව වඩනුකැමතිනම් මේ ශරීර යෙහි පිහිටි කෙසෙහෝ ලෝමාදි වණීසංඝටාන දිසා ඔකාසාදිවශයෙන් පිළිකූ

ලැබී ඝනාදීන් මැනිස්සකොටස්ගිම මනසයව කීනසින් සමන්නාගත මීන් භාවනාකටයුතුයි බුද්ධානුසතිභාවනාව විඩහුකැමිනම භාග්‍යවතුන්වහන්සේ මේ මේ කාරණයෙන් අගීන්සේක මේ මේ කාරණයෙන් සම්‍යක් සම්බුදුසේකැයි යගාදීන් එසකකී ගුණය සිත් සියක්ක්‍රමයකින් දහස් දහස්ක්‍රමයෙකින් මෙනෙහිකරමින් භාවනාකට යුතුයි සියළුභාවනාවෝම මෙසේ අනිවාශයෙන්මුත් පාලියාදිවශයෙන් පමණක් අනිමනාදුන සිල භාවනාවක් මනාවනබව අවබෝධකටයුතුයි.

මෙසේ භාවිනාව සමග රක්නාලද ආයති උපොසථශීලය මහත් ඵලවන්නේය මහානිසංසවන්නේය මහාජුතිකවන්නේය මහා විස්ථාරවන්නේයි කෙසේ මහත්ඵල මහානිසංස මහාජුතික මහාවිස්ථාරවන්නේදයත්? යම්සේ බොහෝවූ සප්තරත්නයන් සම්පුණිවූ අහ, මගධ, කාශි, කොසල, වජ්ජි, මල්ල, චෙතිය, වහ, කුරු, සෝල, මත්ස්‍ය, සූරසෙන, අස්සක, අවන්ති, ගන්ධාර, කම්බෝජ, යන මහාමණ්ඩල ස්වහාජනපදයන්ට අධිපතිවූ යම් රාජ්‍යසම්පත්තියක් ඇත්නම්වේද අෂ්ටාඟයෙන්යුක්තවූ යම් උපොසථශීලයක් රක්ෂාකරන්නේවේද ඒ උපොසථ ශීලයාගේ මහාමණ්ඩලස්වන කළාවෙන් කළාවටත් මහාමණ්ඩල මහාජනපදයන්ට අධිපතිවූ රාජ්‍යසම්පත්තිය මනාඅග නේය ඊට කාරණාකිවයුත්? දිව්‍යරාජ්‍යසම්පත්තියට උපමා කොට බලනකල්හි මනුෂ්‍යරාජ්‍යසම්පත්තිය ඉතා දුප්පත්වන්නේය හැම්ට යට චාතුමහාරාජික දෙවිලොව හැමටවඩා අල්පෙශාක්‍යවූ දෙවිසක්හට මිනිස්ලොව සක්විතිරජක්පවා ඉතා දුප්පත්වෙයි. මේ ලෝකයෙහි යම් ස්ත්‍රියෙක් හෝ පුරුෂයෙක් හෝ අෂ්ටාඟ උපොසථශීලය රක්ෂාකරමින් මෙහිතෙම මරණින්මත්තෙහි දිව්‍යමයවූ පන්සියයක්හවිරුද්දට ආයුෂඇතිකාවූ චාතුමහාරාජික දිව්‍යලෝකයෙහිද දිව්‍යමයවූ දහසක් හවිරුද්දට ආයුෂඇතිකාවූ තව්තිසා දිව්‍යලෝකයෙහිද දිව්‍යමයවූ දෙදහසක් හවිරුද්දට ආයුෂඇතිකාවූ යාම දිව්‍යලෝකයෙහිද දිව්‍යමයවූ සාරදහසක් හවිරුද්දට ආයුෂඇතිකාවූ තුසිත දිව්‍යලෝකයෙහිද දිව්‍යමයවූ අටදහසක් හවිරුද්දට ආයුෂ ඇත්තාවූ නිම්මාණරති දිව්‍යලෝකයෙහිද දිව්‍යමයවූ සොළොස්දහසක් හවිරුද්දට ආයුෂඇතිකාවූ පරනිර්මිත වසවර්ති දිව්‍යලෝකයෙහිද උපදවා ඒ අෂ්ටාඟශීලානිසංස අනුමෝදනාවූ දිවසිරිසැපත්විඳුවන්නේයි මනුෂ්‍යලෝකයෙහි සොළොස්දහසක් හවිරුදු පරිනිර්මිතව වසවර්ති දෙවිලොවට එක්දවසක් වන්නේයි. එසින් වදාළහ විශාඛා මහාඋපාසිකාවත්ට අඟුත්තරනිකායෙහි තිකනිපාත විසාඛුපොසථසූත්‍රයෙහි

1 "පාණං නහානෙ නවිදිනන මාදියෙ
මුසා නහාණෙ නව ඔජ්ජපාසියා
අබ්‍රහමචරියා විරමෙයය මේථුනා
රත්‍යිං න භුඤ්ජෙය්‍ය විකාලභොජනං.

2 මාලංනධාරෙ නව ගන්ධමාචරෙ
මණ්ඩව ත්‍යමාසං වසෙයථ සන්ථතෙ
එතංහි අඨඟිකමාහු උපාසථං
බුඬන දුක්ඛන්ත ගුණං පකාසිතං.

3 චතුද්දස සුරියෙව උභොසුදස්සනා
ඔභාසයං අනුපරියන්ති යාවතා
තමොනුදා තපන අන්තලික්ඛගා
නභෙ පභාසන්ති දිසාවිරොචනා.

4 එතස්මිං යංවිජ්ජති අන්තරෙ ධනං
මුත්තාමණී වෙළුරියඤ්ච ගද්දකං
සිඩ්ඩ සුවණ්ණං අථවාපි කඤ්චනං
යංජාතරූපං හටකන්ති වුච්චති.

5 අඨඞ්ගුපෙතස්ස උපොසථස්ස
කලම්පිතෙනාපි භවන්තිදිසාලසිං
චන්දූපභා තාරගණාව සබ්බා
තසමාහි නාරීව නරොව සීලවා.

6 අඨඞ්ගුපෙතං උපවදසුපොසථං
පුඤ්ඤානිකත්වාන සුබුද්‍රයාන්
අනින්දිතාසග්ගමුපෙන්ති ඨානන්ති" සී.

යනුවෙන් එදැල සූත්‍රාන්තයෙහි භාවයනම් ප්‍රාණවධ නොකට යුත්තේය අනුන් විසින් කඩින් මහා වචනයෙන් මහා නුදුන්වයතුව පැහැරනොගතයුත්තේය බොරුනොකියයුත්තේය රහමර නොපිය යුත්තේය සමේථුන සංඛ්‍යාතවූ අබ්‍රහ්මචරියන් වැළකියයුත්තේය රාත්‍රී විකාලභොජනය නොවැළඳියයුත්තේය නටනු ගණු වයනු විසුළු දස්න මල් ගඳවිලවුන් ආ දැරීම්ආදියෙන් වැළකියයුත්තේය ම්ව්පා ඇඳක මහා බිම තණඇතිරියෙක මහා මහාවියයුත්තේය මේ ගිහියා පදඅට දුක් කෙළවරකරණ ගුණඇතිමහසින් අෂ්ටාඞ්ගික උපොසථ යයි තථාගතවූ බුදුරජහු විසින් ප්‍රකාශකරණලද්දේය.

යහපත් දැකුම්ඇතතාවූ චඤ්චූයාදී දෙදෙනා දසදිගුන් හා බබළන්නා වූ මහාමෙරුපර්වතය සියාරා යම්තාක් ගමන්කරන්නාහුවේද ආනන්තරීක්ෂයෙහි ගමන්කරන්නාවූ ඒ චඤ්චූයාදීහු යම්පමණ සථානයක අදුරුනසන්නාහුද දසදිශාවන් ආලොකකරමින් ආකාශයෙහි බබලන්නාහුද ඒතාක් මේ ලොකධාතුවෙහි මුඛතාමාණික්‍ය මෙවැදුයෙහි ශිඛීතාවක කාචනාදි නොයෙක් ප්‍රභාදඇතතාවූ සවණී රජතාදී යම්පමණ යහපත් ධනයක් වේද චන්ද්‍රාලොක තාරකා ලොකාදි යම්පමණ ආලොකඝාතක්වේද ඒ සියල්ල අෂ්ටාඟ උපෝසථ ශීලඥාණ මහාමෙරුස්වභාවයෙන් කළාවවත් නොඅගනේය එහෙයින් මේ ලොකයෙහි සිල්වත් ගුණවත් මහණබමුණන් විසින් නිතුනොකවයුතුවූ සිල්වත් ගුණවත්වූ උපාසක උපාසිකාවෝ සැප ඵලකාරණවූ ඝනසලක්‍රියාවන්හෙයින් මරණින්මතු සුගතිලොකපරාය නවන්නාහුයයි දතයුතුයි.

අෂ්ටාඟ උපෝසථශීල නිර්දෙශය යි 43.

ශීලානි සංඝ නිර්දෙශය.

44 මෙතැන්පටන් ශීලානිසංඝ දැක්වීමට උදාහරණවසනුන් දක්වනුලැබ්බේ කෙසේදයත්? මේ මහාභද්‍රකල්පයෙහි තුන් වෙනිව ලේපහළවූ මෛත්‍රලොකනකනාථ අසරණ සරණවූ කාශ්‍යප සම්‍යක් සම්බුදුරජාණන්වහන්සේගේ ශාසනය උද්දීප්තව බබලන්නාවූ කල්හි එක්තරාගමක මහාරුක්ෂපන්සියයක් තැබිව ගම්පහරමින් මංපහරමින් නොයෙක් දුශ්චරිත දුරා ජීවයන්හෙන් දිවිපවත්වන්නාහුය එක්කලෙක ඒ මහාරහු ගම්පැහැරීමට ආකල්හි ගම්වාසි මනුෂ්‍යයෝ කඩුදුනුආදි ආයුධයන් අත්ඇතිව ඒ පන්සියයක් මහාරුක් පසුපස්සේ එහබැඳගියාහු එක්තරා වනලැහැබකටගොස් සැඟවීමට තැන් මහාඅන්නාහු සුදුසු රක්ෂාසථානයක් නොදැක එක්තරා සිල්වත් ගුණවත් ආරණ්‍යවාසි සථවිරයන්වහන්සේනමක් දැක උන්වහන්සේකරාගොස් පසඟපිනිවුවා වැඳ සවාමීන්වහන්ස අද අපට මනුෂ්‍යයන්හෙන් ගැළවීගතනොහැක්කම්හ දුඛිවහන්සේ අපට පිහිටවුවමැනවැයි යාඥාකළාහුය ඉක්බිති මතරුන්වහන්සේ කියන්නාහු පින්වත් උපාසකහෙනි මෙබඳු ආපදාවක් පැමිණි කල්හි සීලයහැර අනික් රක්ෂා සථානයක්නම් නැත්මෙන්ය මේබඳු ආපදාවන්ට ශීලයහැර අනික් පිහිටක්නම් නැත්මෙන්ය මෙපිඇම්මෙදනම් සිල්සමාදන්වෙන්වාසි කීහ ඉක්බිති ඒ මහාරුක්පන්සියයක් මෙතෙම

එසකෙණෙහි පන්සිල් සමාදන්ව ඒ තමන්ගේ හිලතුණය ආවජ්ජනා කරමින් උන්නානුත ඉක්බිති හව්වාසි මහත්සෙනාවෝ අවිආයුධගත් අන්ඇතිව වහාම දිවඅවුත් සොරුන් පන්සියක්දෙනාම වටකොට එසකකුටත් ගානාදී ජීවිතක්ෂයට පමුණුවාදැහැ. ඒ පන්සියයක් සොරහු එසකෙණෙහිම සමාදන්ව ආදිජිනාකරමින්හුන් සිලානුභාවයෙන් එසින් චුතව දිව්‍යලෝකයෙහි පන්සියයක් දිව්‍යවිමානයෙහි දිව්‍යපුත්‍රයන්ව උපන්නානුත සොරදෙවපුත්‍රයෝ ඇමව නායකවූ දිව්‍යරාජන්ව උපන්නේසි ඒ දිව්‍යරාජතෙම පන්සියයක් දිව්‍යපුත්‍රයන් අතුමරන් අනිසසින් විශිෂ්ටවූ සම්පත්ඇතුව උපන්නේසි එතැන්පටන් අපගේ ගෞතම දිපදුත්තමසම්බුදුහාමුදුරුවෝ ලොවපහළුන කාලයදක්වා අවුරුදු දහසකින් අඟලක් විහිනා පොළව සත්ගවුවක් වැඩෙනතුරු මනුෂ්‍යලෝකයෙහි හා චතුර්මහාරාජිකාදී අනුලෝම ප්‍රතිලෝමවශයෙන් සදිව්‍යලෝකයෙහිම දිවසිරිවලඳ ගෞතම බුදුන් සත් සමයෙහි සදව්මලාවින් සැවඅවුත් මිනිස්ලොව මනවුල්කුලගව ල් පන්සියයක කෙවුල්ව ඉපිද කුවෙයත් වැඩි කෙවුල්කමියෙන් ජීවත්වන්නාහු කපිලවස්තුනුවරෙහි අරහත්පත්තියෙහි සංවෙගලැබ පැවිදිව විදසුන්දැඩි රහත්ඵලයට පැමිණියානුත එසිත් කීහ. සූත්‍රනි පාතාපාලි සූත්‍රඅට්ඨාකථාවෙහි "තත කාලාකතා කාමාවචර දේවලෝකෙ නිබ්බත්තිංසු තතෝ ජේඨක චොරෝ ජේඨක දේවපුත්තෝ අමහාසි ඉතරෙ තංයෙවෙව පරිවාරෙසි". එහි භාවය ඒ මරණාසන්නකාලයෙහි පවසිලය සමාදන්ව රකුණාකළාවූ සොරුන් පන්සියය කඵරියෙකාව කාමාවචර දිව්‍යලෝකයෙහි උපන්නානුත ඔවුන්ගේ දෙවුසොර තෙමේ ජේඨකට දිව්‍යරාජන්ව උපන්නේය යෙසු සාරසිය අනුනව දෙන ඔහුට පිරිවරව උපන්නාහයි දතයුතුයි.

දේවානිදේවවූ ශක්‍රානි සක්‍රවූ බ්‍රහමානිබ්‍රහමවූ සෙතලොක්‍යාවා යත්වූ අපහානාය්‍යතුන්වහන්සේ ජීවමානව වැඩවාසයකරණසමයෙහි සත්සියයක් මවළඳජනයා මවළඳුවපිණිස නැවිනැගිහා සමුදුරයෙහි සත්නාහු සත්දවසක් නිරන්තරයෙන් ධාවනයෙකාව හිසිපිහිටක් නැත්තාවූ මහාසාගර මධ්‍යයට පැමිණියාහු ඉතා දරුණු වාතයක් හමා, මහත් රැලනහින්නට පටන්ගත්හ මෙසේ මහත්රැලවේගයට අසුවූනැව මහාසමුදුරයෙහි හිලාබස්නට පටන්ගත්කල්හි සත්සියයක් මවළඳජනයා මහත්හයින් තුන්තව අඩමින් වැළපෙමින් තම තමන් ගේ ඉෂ්ටිදේවතාවන්ව මවන මවනම යාඥාකරන්ව පටන්ගත්හ එකල්හි ඒ සත්සියයන් මවළඳුන් අතුරෙහි නිරන්තරයෙන් පඤ්ච

ශීලය රන්නාවූ කෙනෙකුනා ඥානයෙන්යුක්තවූ මෙහෙත් සියළු සත්ව යෝම කෙනෙය යහකීය දයාදෙකාව ඇත්තාහයි යන අදහස් ඇත්තාවූ එක්තරා සම්‍යක්දෘෂ්ටිගත් උපාසකයෙක් තෙමේ කිසිගයක් වක්තයක්නොවී මේ ක්ෂණයෙහි සත්වයන්ගේ ධර්මතාවශයෙන් විනාශ විෂයභාව ධර්මයයි. මේබදු අවස්ථාවෙහි සාමාන්‍යදෙව්වයක් පිදීමෙ නුත් අවශ්‍යයක් නැතැයි හුවණින් සලකා තමාගේ පඤ්චශීලගුණයම ආවර්ජනාකරමින් කෙලෙසන් හාවනාකරන්නාවූ මයාධිෂයකුමෙන් කිසි හයක්නොවී නිශ්චලව උන්නෙය ඉක්බිති අවශෙෂ බ්‍රාහ්මණ මහුෂ්‍යයෝ මේබදු මහත්ව්‍යපත්තියක් පැමිණිකල්හි තොබා ඉන්නේ කුමක්නියාදැයි විචාරණ්ලැබියේ මෙසේ කීමය.

එබා සත්පුරුෂයනි මම වනාහි නැවතගිනාදවස ආයුෂ් සංඛ්‍යා මාගේහෙට වැඩමවා මහත් ශ්‍රද්ධාවෙන් දන්දී පඤ්චශීලය සමාදන්ව නැවට නැගී ආයෙමි මම ඒ ශීලය ආවර්ජනාකරමින් හැදිමි සියළු සත්වයෝම මරණය සවභාවෙකොට ඇත්තාහ මට හයවීමට කාරණයක්නැතැයිකීහ. ඉක්බිති සත්සියයක් මෙළඳජනයාද පින් වත්නි එසේවීනම් තොප විසින් සමාදන්ව රක්ෂාකරණ ලද පඤ්ච ශීලය අපවද දෙවයි ඉල්වූවාහු සත්සියයක් මිනිස්සුන්ට එකවිට සිල්සමාදන්කරවිය නොහැකි බැවින් සත්සියයක් මිනිස්සුයෝ සත්කොට සතට බෙදා පළමුවන සියක්දෙනාට පතුල් තෙමෙ නතරම් දිගේයිට පන්සිල් සමාදන්කරවූසේය දෙවනි සියයට දණක්පමණ දිගේයිට සිල්සමාදන්කරවූසේය තුන්වන සියයට උකු ලක්පමණ දිගේයිට සිල්සමාදන්කරවූසේය සතරවන සියයට පෙක ණිය තෙමෙනතරම් දිගේයිට සිල්සමාදන්කරවූසේය පස්වන සියයට තැනම්තනක් පමණ දිගේයිට සිල්සමාදන්කරවූසේය සවන සියයට කරවටක් පමණ දිගේයිට සිල්සමාදන්කරවූසේය සත්වන සියයට මුඛයට දිග ඇතුල්වනපමණකාලයෙක් සිල්සමාදන්කරවූ සේය ඊට අනාතුරුව සියළුනැවදියගට බිලාබැසගෙන් ඒ සත්සියයක් මෙළඳ දුන්ගේ ජීවිතශාන්තිය තොවනතාක් තම තමන් විසින් එකෙණෙහම ගන්නාලද පඤ්චශීලයහැර අනික් රක්ෂාස්ථානයක් නැතැයි සලකා කිසිහයක් වකිතයක්නොවී තම තමන්ගේ ශීලගුණයම ආවර්ජනා කළාහුය ඉක්බිති ඒ සත්සියයක් මෙළෙන්දෝම දිගේගිලී කාලක්‍රියා කොට ආසන්නයෙහි මහත් ශ්‍රද්ධාවෙන් සමාදන්වූ පඤ්චශීලානි සංසයන් සරණ්කොටගෙණ තව්තිසාදෙව්ලොව දිව්‍යපුත්‍රයෝව

ඉපිද සත්සියයක් සඳණිමය විමාණයන්හි පිහිටියාහුය ප්‍රධාන දිව්‍යපුත්‍රයාගේ විමාණය සියක්යොදුන් පමණවිය සෙසු එකෙක් අඩු සත්සියයක්යොදනාට දෙමළොස් යොදුන් පමණ සඳණිමය විමාණ එකක් අඩු සත්සියයක් ඒ මහාවිමාණය පිරිවරාගෙණ කර්ණිකාවක්මෙන් පහළවූහ අවශෙෂඑකෙක් අඩුසත්සියයක් දිව්‍ය පුත්‍රයෝ ප්‍රධාන දිව්‍යරාජයාහට පිරිවරවූහ. මේ දෙවනිකාය "සත්තලපන දෙවනිකාය" නමින් ප්‍රසිඩවිය එයින් කිහ සංයුත්තනිකාය සගාථවග්ග දෙවතා සංයුත් අවුවාගයහි "තානිපි සත්තාජංඝසතානි තථාකාලංකත්වා ආසන්නකාලෙ ගහිත සීලංනිස්සාය තාවතිංසභවන නිබ්බත්තිංසු තතසං ඝටාවණසහනව විමාණානි නිබ්බත්තිංසු සඛබසංමෙජ්ඣ ආචරියස්ස යොජන සතිකං සුවණණවිමාණං නිබ්බත්තිංසු අච්ඡසඝානි තස්ස පරිවාරානිහුත්වා සඛබහටසිමං වාදස යොජනිකං අහොසි" යි

තවද මෙම ශ්‍රී ලංකාවිපයෙහි මියුගුණොවේ වැසි එක්තරා දෙමළ දෙරටුපාලයෙක් තතමේ උදුසනම බිලිකරක් කෙමත්ආදී උපකරණරැගෙණගොස් මසුන්මරා තුන්කොටසක්කර එක්කොට සක් විහුට සහල්ගන්නේය එක්කොටසක් විහුටදිගණියි එක්කොට සක්පිසයි මේ ක්‍රමයෙන් පණස්හවිරුද්දක් මුළුල්ලේ පණිවා කම් කොට ජීවත්ව මැතහාගයෙන් මහණවයසව පැමිණ තොතැගිවිත සෙය්‍යාවට පැමිණියේයි එකෙණහි සෑගිරිවෙහෙරව සි චුල්ලපිණ්ඩ පාතිකතිස්ස සථවිරයන්වහන්සේ ඉමාහු මරණමචකයේ වැදහොව ඉන්නාබව දිවසින්දැක මේ මනුෂ්‍යතතමේ මා තොගැතතොක් තතා මැරේවායි අධිෂ්ඨානකොට වහාම අහසින්බසාගොස් ඔහුගේ දෙරකඩ වැඩසිටියේයි ඉක්බිති ඔහුතන් හාය්‍යාතතාතම්මා ගිම්‍යාතණනි තෙරුන් වහන්සේ වැඩියේයයි කිහ මම පණස්හවිරුද්දක් මුළුල්ලෙහි එක් දවසකුදු මහතෙරුන්කරා තොයිමයම් මාතන් කවරගුණයක්නිසා තෙරුන්වහන්සේ වැඩිතන්ද ඔහුවහන්නට කියවසි බිරින්දව කියාසැවිය ඉක්බිති දෙරටුපාල හාය්‍යාතතාතම්මා සවාමිනි අනික් තැනකට වැඩියතැනවයිකිහ. ඉක්බිති තෙරුන්වහන්සේ උපා සකයාගේ ශරීර ප්‍රවෘත්ති ඇසීයදුයි විචාළසේක සවාමිනි ඉතා දුබල යයි කිහ. තෙරුන්වහන්සේ තමට වැඩ සිහිටුපදවා සිල්ගණුවසිකිහ එසේය සවාමිනි දෙවයි ඉල්වූසේය තෙරුන්වහන්සේ තියරණදී පසඳවශිලය ගණුවසි කිහ. තෙරුන්වහන්සේ පවශිලයයි කියනුහා සමග ඔහුගේ දිවපණතැතිව වැටුනන්ය ඉක්බිති තෙරුන්වහන්සේ මෙපමණක් සැමන්යයි කියා නික්මගියේයි දෙමළ දෙරටුපාලතෙමේ

කළුරියෙකාට චාතුමහාරාජික දිව්‍යලෝකයෙහි උපන්නේය ඒ උපත්කෙණෙහිම මා විසින් කවරකර්මයක්කොට මේසා මහත්සම්පත්තියක් ලබනලද්දේදැයි ආවර්ජනාකරණුයේ තෙරුන්වහන්සේ උපනිශ්‍රයකොට ලැබුබවදැන මදුවලොවින් අවුත් තෙරුන්වැඳ සක්මන් කෙළවර සිටියේයි මෙසේතම කවරෙක්දැයි විවාළකල්හි සඟිනි මම මදමළ මදුරටුපාලයෙමියිකීහ. කොහිඋපන්නේදැයි විවාරණුයේ සඟිනි චාතුමහාරාජික දිව්‍යලෝකයෙහියයි කීහ. ඉදින් ආශ්චර්යවහන්සේ මට පඤ්චශීලය දුන්සේක්වීනම් මතු දිව්‍යලෝකයෙහි උපදනේමවිදැයි කීහ තෙරුන්වහන්සේකියනුයේ මම කුමක්කරම්ද තොපි පඤ්චශීලයගැණිවට පෙරාහොසත්නුවූවෙයේවිදැයි කීහ ඒ දිව්‍ය පුත්‍රතෙමේ මහතෙරුන්වැඳ දිව්‍යලෝකයටම නැගීන්සේයි මේ කථා ප්‍රවෘත්තිය නිකඉතුත්තර අටුවාවෙහි කම්මිදාසසූත්‍රයට උදුකරණුවශයෙන් ආසේයි.

අතීතකාලයෙහි මගධරට රජගහනුවර එක්තරා මගධනම් රජෙක් රාජ්‍යයකරණුයේ ඒනගරාසන්නයෙහිවූ මවලනම් ගම මහාකුලයෙහි මහාබොධිසත්වයෝ උපන්නේයි නාමකරණදිනයෙහි මසකුමාරයයි නම්තැබුහ ඒ කුමාරතෙමේ වැඩිවිය පැමිණිකල්හි මසමාණවකයයි ප්‍රසිද්ධවිය ඉක්බිති මව්පියන් විසින් සමානකුලයකින් සුදුසු ඒවාහයක්කොටදී පුත්‍රධීතෘන්හා සමග වැඩහුනේ දැතපත්මයක්විය නිත්‍යපඤ්චශීලය රක්ෂාකරන්නේයි ඒ මවලනම් ග්‍රාමයෙහි කුලනිසක් ඇත්තේවෙයි ඒ නිස්කුලයෙහි මනුෂ්‍යයෝ එක්දවසක් ගාම මධ්‍යමයෙහිසිට හාවකර්මයකරෙති බොධිසත්වවූ මසතෙම මානවකතෙම තමා සිටිනැන පසින් පස්අවුත්සා සමතලකොට ඒ ප්‍රදේශය රම්‍යකොට සිටියේයි නැවත අනික් මනුෂ්‍යයෙක්ද අවුත් ඒ සථානයෙහිම සිටියේයි ඉක්බිති බොධිසත්වයෝ අනික්තැනක් සිත්කළුකොට ඒ සථානයෙහි සිටියේ එතනටද අනික්මනුෂ්‍යයෙක් අවුත් සිටියේය බොධිසත්වයෝ එතැනිනුත් ඉවත්ව අනික් භූමිභාගයක් සකස්කරගත්තේය. මේ ක්‍රමයෙන් සියළුමනුෂ්‍යයන්ටම එසැනැත්තැන් සකස්කොටදුන්නේයි මෑතභාගයෙහි බොධිසත්වයෝ ඒ සථානයෙහි මඩපයක්කොට ඒ සථානයත් මනුෂ්‍යයන්ගේ හිඳීමට අවකාශදී මෑතභාගයෙහි හම්වැසි තිස්දෙනාද බොධිසත්වයන්ට සමාන අදහස් ඇත්තාහු ඒ තිස්දෙනාත් පඤ්චශීලයෙහි පිහිටුවා එතැන්පටන් ඒ තිස්දෙනාත් සමග පින්කරමින් හැසුරුනේනි ඒ තිස්දෙනාද බොධිසත්වයන් හා සමග පින්කරන්නාහු උදුසන්හි නැගිට වැපොරෝ මෙ

මහාල්ගත් අත්අ.තතාහු සතරමංසකීආදිඅයහි මොහොළිහ් ගල්පෙ
රළාමාගීයන්ගේ කටුඅකාඅහාල් උදුරන්නාහුය මාගීඅයහි රථ යානා
වන්ගේ අක්ෂඅයන් ගැඹෙන්නාවූ වෘක්ෂ උදුරන්නාහුය විසමතැන්
සමකරන්නාහුය ඒදඩුඅතුරන්නාහුය පොකුණුකණින්නාහුය සාලා
වන්කරන්නාහුය දන්දෙන්නාහු ා සිල්රක්නාහුය මෙමෙස් මබාඅහෝ
මසකින් සියළුම ගම්වාසීහු මබාඩිඅභිඤ්ඤයන්ගේ අවවාදඅයහි පිහිටා
සිල්රක්නාහුය ඉක්බිති ඒගම අයබදුගන්නා ගම්මුදලිතෙමේ මෙමෙස්
සිතීඅ පෙර මේ මනුෂ්යඅයෝ රහඅමර මබාන්නාවූඅකල්හිද ප්‍රාණවධාදි
දුඃචරිත කරන්නාවූකල්හිද සැළිකඅවණ්ණු ආදිවශඅයන්ද දඩ බලි
වශඅයන්ද ධනයලබම් දැන්වනාහි මඅමාණවක මතෙමේ සිල්රඤ්ඤාඅ
රවම්සිකියා ඔවුන්ටඅණිවාදී පවිකරන්නටනොදෙයි දැන් ඔබ
න්ට කදිම පන්සිලක් රක්කවම්සිතා කිපිඅයේ රජුකරාඅහාස් මදව
යන්වහන්ස මබාඅහෝ මසාරහු ගම්පැහැරිම් ආදිඅ මනඅමරණින් හැසි
මරන්නාඅයි සැලඅකඅළුඅ රජුද ඔහුගේ බිස්ගිවිඅ යවඅතපු ඔවුන්
අල්වාඅගඅමණවයි කීඅ ඉක්බිති ඒ දුෂ්ටවූ ගම්මුදලිඅතඅමිඅගාස් ඒ
සියළු උපාසකඅයන් අල්වා පිටිඅතාළඅගයාබැඳගෙණවුන් මහරජ
මොවිහු මසාරහුඅයි කීඅය්‍ය අඤ්ඤාවූ රජුද ඔවුන්ගේ අපරාධඅමක්
දැයි පරීක්ෂාඅනාඅකාට ඇතුන්ලා මැඩලවයි නියෝගකලාඅ. ඉක්
බිති ඒ සියළු මනුෂ්යඅයෝ රජඅගේමදුලේ හොවා ඇතුන්අගණඇරපූඅ
මබාඩිඅභිඤ්ඤයෝ ඒ සියළු මිනිසුන්ට අවවාදකළාඅ පින්වත්නි මතපි
ඇමදෙනම් තම තමන්ගේ ශීලඅය ආවජ්ජනාකරව් යැල්ලාම් කී
ගම්මුදල්ලියාඅ රජහුඅ ඇතාඅ මතාපඅතාපඅගේ ශරීරඅ යන මේ
සතරදෙනාඅකඅරති ඒකාකාරඅයන් චවනස් නොඅකාට මෙමන්ත්‍ර
කරව්අයි අවවාදදුන්අ ඒ සියළු මනුෂ්යඅයන්ද මඅහාඅණවකඅයාඅගේ
අවවාදපරිද්දෙන් ඒ සතරදෙනාඅකඅරහිම එක්වන් මෙඅත්‍රී
වැඩුඅ. ඉක්බිති ඇත්අගාව්අවෝ ඒ මනුෂ්යඅයන් මඩනාපිණිඅ ඇතු
මඅඅගඅහ ඒ ඇතුඅවඅගඅඇතු ලබන්නේද මිනිසුන්ලඅට නොඑන්
නඅය මහඟඅින් කුඤ්ඤවනාදකරපලාඅයයි ඉක්බිති ඔවුන්ගේ ඔවුන්ගේ
ඇතුන්අගණවූත් මේඅකඅයුව්අහු ඔවුහුද එඅස්අ කුචනාදඅනොට පලා
ගියාහුඅ රජඅතුමේ මේ මිනිසුන් අත ඇතුවිසින් නොමැඩියඅහැකි
යම්කිසි ආරක්ෂා ඔෂධ මණිඅමන්ත්‍රාදියක් ඇත්අතේද්දැයි ඇසුඅවයි කී
යා එඅස්අනඅයා කිසිඔෂඅධඅයකුත් නොදුන මදවඅයනි මොවුන්අත
කිසිඅඔෂඅධඅයකුත් නැතැඅයිකීඅ එඅස්වූඅතම් යම්කිසි ආනුභාව සම්
පන්නඅමන්ත්‍රඅයක් පිරිවඅහන්අනේද්දැයි විවාරවයි රාජපුරුෂඅන්ටකීඅ
රාජපුරුෂඅයා ලඟටඅගඅඇස් නොයි යම් කිසිඅමන්ත්‍රඅයක් පිරිවඅහන්න හු

දැයි ඔවාළාහුය මබාධිසත්ත්වයෝ පින්වත්නි අපේ පිරිවහතමින්ත්‍රයන් ඇතැයිකිහ රාජපුරුෂයෝ රජහට එපවත් සැලකළාහුය ඉක්බිති රජතෙමේ ඒ සියළු මිනසුන් රජුලහට කැඳවා තොප පිරිවහත මන්ත්‍රයකියමයි කීවාහුය ඉක්බිති මබාධිසත්ත්වයන්වහන්සේ කියනුමයි මදතුයන්වහන්ස අපේ අන්ක් මන්ත්‍රයක් නැත්තේය අපේ සෘග මෙහිවූ නිසක්පමණ ජනයෝ පණිවාමයෙන් වැළඳිවාසයකරම්හ අන් සතු වසතුව පැහැරගැණිමය පරදරමසවනයකිරිමය බොරුකිවිය රහවෙරපීමය යන මෙසින් වැළකී වාසයකරම්හ මෛත්‍රී භාවනා වෙන් යුක්තව වාසගකරම්හ දන්දෙම්හ විසමවූ මාගිහයන් සෘතර ම්හ. පොකුණුකණුම්හ සාලාවන්කරම්හ මේ අපගේ මන්ත්‍රයත් පිරි වැහිමත් වැඩිමත්වන්හේයි කිහ.

ඉක්බිති රජුද ඔවුන්හෙරෙහි ප්‍රසන්නව කේලාම්කී ගම්මුදලි යාගේ සියළුගෙහි ඇතතාවූ ධනසම්පත්තියත් ඔවුන්ට පැහැරගෙණදී ඒ නම්මුදලියාගේ හිසමුඩුනොට මහබොධිසත්ත්වයන්ට දුසඇක්හකොට පාවාදුන්හ ඒ ඇතුහ, මවලනමේ ගමද ඔවුන්වම දායාදහකොට දුන් හේය. ඔවුන් එතැන්පටින් කාමනිපරිද්දෙන් පින්කරන්නාහු සත රමංසත්ත්වයෙහි මහත් සාලාවක් කරම්හයි වඩුවෙතු ගෙන්වා කම්මා නතය පවත්ගත්හ මාගමුන්හෙරෙහි පහවූ ඇල්මඇති බැහින් මාග මුන් එහි පුණ්‍යභාගය අනුමෝදන්නොකරවූහ එසමයෙහි බොධි සත්ත්වයන්ගේ ඥෙහි සුධම්මය ඵ්‍රාය නඤය සුජාතායයි භාග්‍යවාදෝ සතරදෙනෙක්වූහ ඇලා අතුරන් සුධම්මාවෝ වඩුවා සමග මන්ත්‍ර ණයහකොට සොහොගුර මේ ශාලාකර්මයට මා ප්‍රධානකරවයි කියා අන්ලස්දුන්නීය වඩුතෙමේත් යහපතැයි ගිවිස පළමුකොට කර්ණි කාවපිණිස වෘක්ෂයක් කපා ඒයලා සැසවිද කැණිමඩල නිමවා වසත යකින්වෙළා සුරුකිව තැබුවිය ඉක්බිති සාලාවේ සියළුකර්මාන්ත නිමවා කැණිමඩල නන්වනදවස්හි අගහෝ සම්මිනි එක් කම්මාන්තයක් සිහිනාකෙරෙළුම්සියයිහ ඒ කුමක්දැයි විචාළකල්හි කැණිමඩලක් වුවමනායයිකිහ. ඉක්බිති මහමාණවක තෙමේ ඒ දුස්කරතොවැටි ගෙණ එමිත් කීකල්හි පින්වත දන්කැපු වෘක්ෂයක්න් කැණිමඩල නොකටහැක්හේය පළමුවෙන්ම ඒයලා සැසවිදතුබුකැණි මඩලක් ම ඒයයුතුයයි කිහ. දැන් කුමක්කටයුතුදැයි විචාළකල්හි ශම්කිසිවේ කුගේ ගෙයක පළමු නිමවා විකිණීමට තැබූ කැණිමඩලක් ඇද්දැයි පරීක්ෂාකරවයි කිහ ඉක්බිති නිමියාවූ කැණිමඩලක් කාගේ ගෙයක

ඇත්තේදැයි සොයායනකල්හි සුධම්මාවගේ ගෙහි ඉතා යහපත් කැණීම ඩලක් ඇතැයි අසා මුදලවදෙවයි ඉල්වූකල්හි මිලයට නොවිකුණම්හ ඉදින් මට ඒ ශාලාවේ පින්අනුමෝදන්කරවන්නන්නම් කැණීමඩල දම්කිහ ඉක්බිති මඝමාණවකතෙමේ මම මේ ශාලාවේ පිණ මාගමුන්ට නොදම්සිකිහ එකල වඩු ඇදුරුතෙමේ මඝමාණවකයන්ට මෙසේ කිවාහුය පින්වත්නි කුඹවගන්නේස් කුවක්කියන්නෙහිද බ්‍රහ්ම ලොකය හැර මාගමුන් නැති සථානයක්නම් නැත්තේය එහෙයින් මාගමුන්ගත් නොරවිය නොහැක්කේය කැණීමඩල ගණුවයි කිහ මෙසේ ගත්කල්හි අපගේ කම්නනාය නිෂ්ඵාවට යන්නේයයිකිහ. ඉක්බිති මඝමාණවකතෙමේ ගහපතැයි ගිවිස කැණීමඩලගණ සාලාව නිම්වා එලකාඟන දුටුබන්කු අතුව පැන්සැළි තබ්බවා නිබඳ කැඳබත් ආදියෙන් එහි ආ ආවුන්ට සංග්‍රහකරන්නට පටන් ගත්හ. සාලාව ප්‍රාකාරයෙන් වටකොට ඳරවූ ගයාදෑ පවිරතුළ සුදු වැලි අතුව පවිරන්පිටත තාළපත්තියක් ඉදුවූවාහුය චිත්‍රානම් භා යයිනොමෝද එසිම් උයනක්කරවූයේය ඒ උයනහි අසවල් පුෂ්පූ පහ එඑපහ වෘක්ෂයක් නැතැයි නොකියහැකිවිය ලොවඇතානවූ සියළු පුෂ්ප ඵලවෘක්ෂයන් රොපනගකළාහුය නඳුනම් තුන්වන භාගයිවද ඒ සථානයෙහි පොකුණක් කැණවූයේය ඇඹුල ඉපුල ආදිවූ පස්පියුමෙන් ගැවසීගත්තේය.

සුජාතානම් සතරවනභාගයිහි නොමෝ කිසිවක්නොකෙ ළේය. බෝධිසත්වයෝවනාහි මාතෘ උපසථානය පිතෘ උපසථානය කුලදෙටුවන් පිදීමය සත්‍යවචනකිරීමය අඵරුසවචනකිරීමය අපිසුන වචනකිරීමය මසුරුමල හැරපියා දන්දීමය යන සප්තප්‍රකාරවූ පුරා ජිතධාරාගේ මකළුවර තවතිසාභවනගයහි ශක්‍රදිව්‍යරාජන්ව උපන් නේය ඔහුගේ ඒ යහළුවෝද එහිම උපන්නාහ ඒ සමයෙහි තවතිසා භවනගයෙහි අසුරගයෝ වාසයකළාහුය සක්දෙවිරජ තෙමේ මේ අන්‍ය සාධාරණ රාජ්‍යගයන් කවර ප්‍රයෝජනදැයි සිතා අසුරයන්ට දිව්‍යමයවූ මද්‍යපානය පොවා මත්වූකල්හි පාදගයන් අල්වා මහ මෙර පත්ලට ගෙළාඑසේය. ඔවුන් අසුරභවනයටම ගියාහුය අසුරභවනයනම් මහාමෙරුපර්වතය යට භාගයෙහි තවතිසා දෙව් ලොවපමණවිය තවතිසා දෙවිලොව දෙවියන්ගේ පරුසතුමදරා කල්පවෘක්ෂයමෙන් අසුරභවනගයෙහිද චිත්‍රපාටලිනම් කල්පවෘක්ෂයක් විය ඒ වෘක්ෂයද කල්පයායි වෘක්ෂයමව් ඒ චිත්‍රපාටලි වෘක්ෂය පිපිනිය කල්හිම මේ අපගේ දෙවිලොව නොවන්නන්යහි දූනගණිති දිව්‍ය

ලොකමයෙහි වෙනානි පරසතුමිදුරා වෘක්ෂය පිපෙන්නේය ඉක්බිත් තෙන් අසුරයෝ ජරපත්වූ ශක්‍රතෙමේ අපව මද්‍යපානය පොවාමින් මකාට අපි මහාසමුද්‍රය පිටමහලා අපගේ දිව්‍යපුරය පැහැරගත්තේය ඒ අපි ඔවුන් සමග යුඩකොට අපගේ දිව්‍යනගරය පැහැරගණුම්හයි සිතා වැඩකට නගින්නාවූ නුහුඹුවන්මෙන් මහාමේරුපර්වතයට නගින්නව මවන්ගත්හ සක්දෙවිඳුතෙම් අසුරයෝ යුඩයට ආහයි අසා මහමුහුදපිට නැඟී යුඩකොට අසුරයන් එසින් පරදවතලදුමයේ මයළ සිඟක්ගව්උසැති මවෙජයන්තරථමයන් දකුණු සමුද්‍රවැකාක මයන් දිවන්නට වන්හ ඉක්බිති ඔහුගේ රථය මුහුදපිටින් වේග මයන් දිවන්නේ සිඹලිවනයට පැමිණියේ ඔහුගේ ගවන්මාගී මයහි සිඹලිවනය තල්වනඝක්මෙන් සිදි සිදි කැඩි කැඩි මුහුදුපිට වැටෙන්නට පවන්නත්හ ගුරුළුපෝතකයෝ මුහුදුපිට පෙරළමින් මහත් ශබ්දයෙන් ගඩන්නටවන්හ ශක්‍රදෙවඳුනතෙම් මාතලිය විචාරයි යහළු මාතලිය ඉහා බැගැපත් ශබ්දයක් ඇසෙන්නේය ඒ කවර ශබ්දයක්දැයි විචාළේයි දෙවමයනි භුඹවහන්සේගේ රථවේග මයන් සුණුවිසුණුවූ සිඹලිවනමයහි හිඹුල්රුක්වැටෙනකල්හි ගුරුළු පෝතකයෝ මරණභයින් තැතිගණ එකහඬින් ගඩන්නාහුයැකිය බොධිසත්වූ සක්දෙවිඳු කියහුමයේ යහළුමාතලිය අපනිසා මේ ගුරුළු පෝතකයෝ කලාන්තනෙනාකට යුත්හාය අපි වනාහි මෙශ්වර්‍යය නිසා ප්‍රාණඩඹනාකරම්හ මෙවුන්ට වැඩපිණිස අපගේ ජීවිත පරිත්‍යාගයකොට අසුරයන්ට ජයදම්හ රථය නවතුවයි කිහ එඛා මාතලිය හිඹුල්වෘක්ෂමයහි එල්බන්නාවූ ගුරුළුපෝතකයන්ගේ කැදලි බලා අපගේරථඇණිය ගැටී ගුරුළුපෝතකයෝ යම් ආකාරයකින් විනාශනොවෙද්ද එපරිද්දෙන් රථය පදුව ඉදින් අපි අසුරයන්ට අපගේ ප්‍රාණයන් හැරීමෙන් මේ ගුරුළු පැවවුන්ට සැපයක්වේනම් එපරිදෙන් අපගේ ජීවිතයන් අසුරයන්ට පාවාදෙමුය මේ ගුරුළුපැවවුන්ගේ සුලාවකයන් විනාශනොකරව අපගේ දුක මේ ගුරුළුපැටවුන් මත්තෙහි මනාදඹව රථය නවත්වවයි කිහ. මාතලිතෙමේසක් දෙවිඳුගේ බස්අසා රථය නවත්වා අනික්මාගීයකින් දෙවිලෝබලාගි යේය අසුරයෝවනාහි සක්දෙවිඳුගේ රථය නවත්වනබව දැක එකාන් තමයන් අනික් අනික් සක්වළිහුදු මබාහොවූ ශක්‍රයෝ ආවාහුය එසීන් බලලැබ රථය නැවැත්වූයේවනැයි සිතා මරණභයින් තැතිගණ පලාගොස් අසුරභවනයවම වන්නාහුය ශක්‍රදෙවඳුතෙමේද දිව්‍යපුරයවැද දෙදෙවිලොව දෙවියන් විසින් පිරිවරණලදුමයේ දිව්‍යනගර

මඩ්‍යමයෙහි සිටියේය. එතෙමේනිම්න පෘථිවිය දෙබෑකොටකරණ යොදුන් දහයක් උසැති මෙවිජයන්ත ප්‍රාසාදය පහළවූයේය අසුර විජය කෙළවර පහළවූ බැවින් මෙවිජයන්තයයි නම් කෙළේය. ඉක්බිති ශක්‍රදේවේන්ද්‍රතෙමේ අසුරයන්ට නොඑනපිණිස පස්තැනක රකවල්ලැවූයේය එමහයින් කියනලදී "අන්තරාදිනානං අසුරකුම්භිරානං, පඤ්ච විධාපිතා අහිරක්ඛා, උරගකාරාවිපරියසසවහාරී, මදනයුතාවතුරෙ චම්හන්තා" යි. දිව්‍යනගරයද අසුරනගරයද යන මේ දෙතුවර අතර අන්තරාධ්‍යනම්මෙසි කුමක්හෙයින්දයත් ? සතුරන් විසින් යුධ කොට නොගතහැකි බැවිනැසි දනයුතු යම් කෙලක අසුරයෝ බලවත්වෙද්ද එකල්හි දෙවියෝ පලාගොස් දෙවනගරයට වැද දොරවැසුකල අසුරයන් ලඝුභාවණින් ආවාහුද කිසිවක්කොටගත නොහැක්කාහුය යම්කලක දෙවියෝ බලවත්වෙද්ද එකල අසුරයෝ පලාගොස් අසුරපුරයට වැද දොරවැසුකල ශක්‍රයන් ලඝුභාවණින් ආවාහුද කිසිවක්කොටගත නොහැක්කාහුය එසේහයින් මේ දෙතුවරම අයොධ්‍යපුරනම්වෙති. මේ දෙතුවරව අතරතුර පස්තැනක ශක්‍රදේවේන්ද්‍රයා විසින් රකවල්තබනලද්දාහුය උරග සංඛ්‍යාත නාගයෝවනාහි දිගැති බලඇත්තෝය එබැවින් නාගයන් මහාමේරු පර්වතයාගේ පළමුවන ආලින්දනම්වූ පිල්කඩෙහි රකවල්කළාහුය කෙරාවිනම්වූ පාතාලභෝජනය අනුභවකරණ බැවින් සුපර්ණයෝ දෙවෙනි ආලින්දනම්වූ පිල්කඩෙහි රකවල්කළාහුය පයසසහාරිනම්වූ කුම්භණ්ඩයෝ තෙවන් දැනව රක්ෂසයෝ තුන්වන ආලින්දනම්වූ පිල්කඩෙහි රකවල්කළාහුය විසම හැසිරීම් ඇතනාවූ මදනයුතනම්වූ යක්ෂයෝ අවිඥයින් යුධ කරණකොඩබැවින් සතරවන ආලින්දනම්වූ පිල්කඩෙහි රකවල් කළාහුය සතරවරම් මහරජදරුවෝ පස්වන ආලින්දනම්වූ පිල්කඩෙහි රකවල්කළාහ එහෙයින් යම්කලක අසුරයෝ කිපියාහු කාලෙන් සින්ඇතනාහු දිව්‍යපුරයට එද්ද එකල්හි දළමුවන ආලින්දයෙහි රකවල්ශත් උරගයෝ ඒ සතුරන් මැඩපවත්වා සිටිනි මෙසේ පස්තැනක රකවල්තබා ශක්‍රදේවේන්ද්‍රතෙමේ දිව්‍ය ශ්‍රී සම්පත් අනුභවකරණකල්හි සුධම්මානම් පළමුවන භායීව කාලක්‍රියා කොටගොස් ඒ ශක්‍රයාහටම පාදපරිචාරිකාව උපන්නීය බමිශාලාවට කැණිඹුලදුන් කුශලකම්විපාකවශයෙන් ඇට පන්සියයක් යොදුන් පමණවූ සුධම්මානම් දිව්‍යසභාව පහළවිය. ඒ සභාවෙහි දිව්‍යමයවූ තුන්යට යොදුන් පමණ සවණිපයඞ්කයෙහි හුන්නාවූ ශක්‍රදේවේන්ද්‍ර

තෙමේ දෙවිමිනිසුන්ට කවුරුතු අනුශාසනාකරන්නේසි චිත්‍රානම් දෙවෙනිභාග්‍යාවද කාලඤ්ඤියාකොට ඔහුවම පාද පරිවාරිකාව උපන් නීයඇට උයනාක්කළ කුසලකම්බලයෙන් චිත්‍රලතානම් උයන පහළුවේය නඤ්ඤනම් තුන්වනභාග්‍යාවද කාලඤ්ඤියාකොට ඔහුවම පාද පරිවාරිකාව උපන්නීය ඇට පොකුණක් කැණවූ කුශලකම්බලයෙන් නඤ්ඤනම් මහාපුසකරණිය පහළවිය සුජාතානම් සතුරවත භාග්‍යාව වනාහි කුසලකම්යක් නොකළබැවින් එයින් චුතවගොස් එක්තරා ආරණ්‍යයෙක්හි කඳුරැලියෙක කෙකින්නක්ව උපන්නීය ශක්‍රදෙවෙ ඳුතෙමේ සුජාතාව නොදක්නේ කොහි උපන්නිදෝහෝසි විමසා බලනුයේ කෙකින්නක්ව උපන්නියාව දුන වහාම එහිගොස් ඒ කෙ කින්න අත්දඹුවත්තෙහි හිඳුවාගෙණ දෙව්ලොවටගොස් ඇට සිත් කළුවූ දිව්‍යපුරයද සුධම්මාතම් දිව්‍යසභාවද චිත්‍රලතානම් උයනද නන්දනම් පුස්කරණියද දක්වා මේ සත්‍රිහු කුසල්කොට මව පාද පරිවාරිකාව උපන්නෝය තීවනාහි කුසල්නොකොට භිරිසන්යෙනි යෙහි උපන්නිය මෙතැන්පටන් සිල්රකුෂාකරවයි අවවාදකොට පඤ්චශීලයහි පිහිටුවා පළමුවිසු කඳුරැලියෙහි ගෙණැර සිටුවා දෙව්ලොව්හිමයි ඇද එතැන්පටන් සිල්රකින්නිය ශක්‍රදෙවෙඳු තෙමේ කීපදවසක්හුගේ ඇවැමෙන් මැ සිල්රක්නට පොහොසත් වේවැයි විමසම්හයි සිතාඅවුත් ඒ කෙකින්න හොදුරුසායන මාගිය ඉදිරියෙහි මත්ස්‍යරූපශයකින් උඩුකුරුවහොත්තේය ඒ කෙ කිනිද මළමසකැයිසිතා තුඩින්ගණ ගිලින්නට උත්සාහකරණ කල්හි මත්ස්‍යතෙමේ පපදය සෙලවුවාය ඉක්බිති මත්ස්‍යයා ජීවත් වන්නේයයි සිතා අත්හැරියේසි ශක්‍රතෙමේ ගහපත ගහපත නී සිල් රක්නට පොහොසත්වන්නීයයි කියා දෙව්ලෝනැඟි ගියේසි. ඒ කෙකින්න ආයුපමණින් පත්සිල්රැක එයින් චුතව පඤ්චශීලය රක්ෂාකළ පිණින් බරණැස්නුවර කුඹල්ගෙයකු උපන්නීය ශක්‍රදෙ වේන්ද්‍රතෙමේ සුජාතාව කොතන්හි උපන්නීදෝහෝසි පරීක්ෂාකරණු යේ කුඹල්ගෙහි උපන්නියාව දුන රන්කැකිරන් පුරණලද ඇළක් පැදගෙණ මහළු පුරුෂරූපයකින් ගොස් ගම්මැද සිටගෙණ රන්කැ කිරිනණිවිද රන්කැකිරිගසිවිදුසී උස්වූහඬින් හඬනැසිය මනුෂ්‍යයෙ අවුත් අවුත් දෙවසි පියාගණනියි ඉල්ලූකල්හි මම මේ රන්කැකිරි වනාහි සිල්රක්ෂාකරන්නවුන්වමෙදෙමි මතාපි සිල්රක්ෂාකරවිදුසි විවාළේසි. මනුෂ්‍යයෝ කියන්නාහු අපි සිල්නම් කුමකැයි මතාදුනු මිහ මිලාගෙණදෙවයි කීහ සක්මහළුතෙමේ මට මුදලෙන් කම්නැත සිල්රක්නාවුන්වම දෙමිගිහිහ

ඉක්බිති මනුෂ්‍යයෝ මේ කවටම්හල්ලා කවරෙක්දැයි කියා පලා ගියාහුය සුජාතාගේ කුඩිල්ලදූරි මෙපවත්අසා මටම එළවනලද්දේව නැයි සිතා ගොස් පියාණන්වහන්ස රන්කැකිරි මවමෙදවසි ඉල්ලිය මැනියෙනි තී සිල්රක්නිදැයි විචාළාහු එසේය මම සිල්රැකුමාකරම්හයි කීකල්හි අම් ගැළ තොපලෙදසාම ගෙණඑනලදැයි කියා ගැළත්ඇමග වන්කැකිරිරැස ඇගේ ගෙයිමදුරවුවලහ සිටුවා ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ දිව්‍යමලාකයවම හිමෙයි මිනිස්ලොවේ ජීවිතාන්තයදක්වා සිල්රැකුමා කොට එහින් සැව වෙපවිහති නම් අසුරරජුහට දිනාව උපන්නීය සිලානිසංසය මහතුමකාටගෙණ විශිෂ්ට රූඇතිවිය. ඈ වැඩිවියපැමිණිකල්හි මාගේ දියනිතොමෝ ඇට රිසිවූ සවාමියෙකුනෝරා පාවාගණිවායි කියා එක්දිනක් අසුරභවනයෙහි මබරවියවිකාරවා අසුරයන් රැස් කරවූන ශක්‍රදෙවෙන්ද්‍රතෙමේ සුජාතාවමකොහි උපන්නීමෙහෙයි විමසාහුයේ එහිලපන් නියාදැන ඇදැන් ඇගේ රැවිවූපරිද්දෙන් සවාමියෙකුපාවාගන්නීය එකාන්තාශයන් ඇ මා පාවාගණියයි සිතා මහළු අසුරවේසයක් මවාගෙණ ඒ අසුරභවන්ගේ සහා මණ්ඩපයට පිවිස්යි සුජාතාව සරහා ඒ සහාවට මඟණුවුන් තොපගේ රිසිවූපරිද්දෙන් හිමි මයක් පාවාගණුවයිකීහ. සුජාතාතොමෝ ඒ අසුරයන්ගේ සහාවෙහි උන් අසුරයන් අතුරෙන් පූජිජාතිකස්ථානගවගයෙන් අසුරවෙස්ගත් ශක්‍රයාම මව සවාමියයි අත අල්වාගත්හෙයින ශක්‍රදෙවෙන්ද්‍රතෙම් ඇ ශක්‍රභවනයට මගණමගාස් අඩුතුන්කෙළක් දිව්‍යසන්නිත්ථ අගතැන් පත්කොට අභිමඟකනාලාභ මෙසේ ශක්‍රයා හා සුජාතාවත් ජීවිතාන්තයදක්වා මනාමයක් මෙශ්වයනීවිද ඒ දෙව්ලොවින් වුතවගියාහුය එසින්කිහ ජාතක අට්ඨකථා එක නිපාත කුලාවක ජාතකයෙහි "සාපිනංසාව ජීවංපරිහුඤ්ජිබා සිලංරක්ඛිබා තතොච්‍රුතාවෙ පවිත්‍රා අසුරින්දස්ස දිතාහුත්වා නිබ්බානි සිලානිසංසයන අභිරූපා සුවණ්ණ වණ්ණා අසාධාරණවණ්ණ සරීර සණ්ඨානතා අහොසි" යනු කියනලදී.

මෙත්‍රලොක්‍ය ප්‍රදීපායමානවූ සුගත තථාගත සම්මා රාජාන් තමයන්වහන්සේ සැවැත්නුවර දෙවිරම්මවෙහෙර වැඩවාසයකරණුයේ සෙතව්‍යනම් නුවර එක්තරා බමුණෙක්හට ධනාඪ්‍ය ලක්ෂණ සම්පන්නවූ පුත්‍රයෙක්ලැබ ඔහුට නම තබන්නාහු ජත්‍රයයි නමතැබූහ ඒ ජත්‍රමාණවක තෙමේ සුදුසු වයසට පැමිණිකල්හි උග්ගඩනම් නුවර පොහබරසාතිනම් දිසාපාමොක් ආචාරීන්ලහ අෂ්ටාරස විද්‍යා එන්හා සිව්සැටකලාවන් ඉගෙණ සම්පූර්ණ මව්පියන් වසන සෙතව්‍ය

නුවරට පෙරළා අවුත් ගුරුපඩුරැදීමට කහවණු දහසක් වුවමනා යැයි කීහ එදවස්හිම කහවණුදහස තපයාදුන් බැවින් එසෙමණිම උක්කඨනුවරට යන්නට පිටත්වූහ ඉක්බිති මව්පියන් විසින් පුත අද කල් ඉස්මගියේය සෙට උදැසන්හිම නැගිව යවයිකීහ. ඉක්බිති ජත්‍රමාණවකතෙමේ එදවස රැයඇතයෙකාට පසුවද උදැසන්හිදැමියි නැවැත්නාහ එනුවර සොරහු මේ කථාප්‍රවෘත්තිය අසාගණසිට ජත්‍ර මාණවකතෙමේ කහවණු දහස ගෙණගෙනට උදැසන්හි උක්කඨනුවර බලායන්නේය ඒ යානමාගීයෙහි රැකසිට ජත්‍රමාණවකයාණන් කහවණුදහස පැහැරගණුමිහයි මන්ත්‍රණයෙකාටගෙණ බලා සෙවනිදැස් උදැසන්හි ජත්‍රමාණකයා යන මාගීයෙහි සැහැවී උන්නාහුය එදවස් අඵ යම්මවලහි ලොකධාතූහු බලාවදුරන්නාවූ සම්මැසන්වහන්සේගේ අනාවරණඥානතෙමෙහි දැලට ජත්‍රමාණවකයා අසුවී ජත්‍රානම් මාණවකයාගේ සවගීලොකාන්පත්තිය හා මබාහෝ සත්වයන්ගේ මාගීඵලාධිගමයට උපනිශ්‍රය වනබවද දැකවදුරා ජත්‍රානම් මාණවකයා යන්නාවූ පෙරමග නමන්වහන්සේ උදෙනළුවෙකුස් මාගීයෙන් ඉවත්ව වෘක්ෂමූලයෙක වැඩහුන්හේය මාණවකතෙමේ උදැසන්හි කහවණු දහස පොදියක්බැඳගෙණ පොකිරයානිනම් දිසාපාමොක් ආචාරීන් වසන උක්කඨනුවර බලා යනුයේ සවණක්රසින් බබලමින් වැඩහුන් බුදුන්දැක උන්වහන්සේ නොවැද නොයෑහැකිව මාගීඵයන් ඉවත්ව බුදුන්කරාගොස් පයගපිහිටුවා වැඳ එතන්පස්ව හුන්කල්හී යන්නාවූ ගමන් මතාරතුරු සියල්ල විචාරා නිසරණගන්වා බුදුන්දහම් සංඝයා යන රත්නත්‍රයේ ගුණසවභාවලක්ෂණවශයෙන් සම්පූර්ණකොට දෙශනාකළේහි. ජත්‍රමාණවක තෙමේ රත්නත්‍රය ගුණසමූහය සිහිකරමින් ඉතා ප්‍රීතිසොම්නසින් යුක්තවූ සිතින් රත්නත්‍රය ගුණසැකෙවින් සංග්‍රහකොට තමන්ගේ ප්‍රතිභාණශක්තියෙන් ගාථාත්‍රයක් පද බැඳගෙණ ඒ ගාථාත්‍රයගයමින් මගට පිළිපන්හේය ඒ ගාථාත්‍රය මෙසේයි.

"යොවදතංපවරාමනුජේසු, සක්‍යමුනීභගවාකතකිච්චෝ
පාරගතොබලවීරසමංගී, තංසුගතං සරණත්ථමුපෙමි

රාගවිරාගමකෙජිමසංඛං, ධම්මමසංඛතමප්පටිකූලං
මධුරමිමංපගුණංසුවිභත්තං, ධම්මවරිමං සරණත්ථමුපෙමි

යත්ථවදින්නඵලත්ථඵලමාහු, චතූසුසුවිසු පුරිසයුගෙසු
අට්ඨවපුග්ගලධම්මදසාමත, සංඝමිමංසරණත්ථමුපෙමි"

යනමේ හාථාත්‍රය ගයැමින් යනකල්හි මාඝීදෙවි සැහවීලුන් මසාරුන් අතුමරන් එක්තරා සොරෙකු විසින් ඊයකින් විදිනුලැබූ ඒ ශත්‍රුමාණවකාතෙමේ සරණගිලගුණය ආදීනාකරමින් සිටියදීම කාලක්‍රියා කළබැවින් තව්තිසා දෙව්ලොව නිස්සයාදුන් දිගපුළුලැ තතාවූ කණකවිමාණයෙක්හි උපන්නේයි දහස්ගණන් දිව්‍යස්ත්‍රීන් විසින් පිරිවරණලදුව දිවසිරිවිලඳන්නව පවන්ගන්නේයි එයින් කිහ විමානවයකු අටුවාමයෙහි ශත්‍රුමාණවක විමානයෙහි ''මාණවෝ පනකාලංකත්වා තාවතිංසභවනතොසමයාජ්ඣෙන කණකවිමානෙ නිබ්බත්තී''යි.

අතීතයෙහි මේ මහාභද්‍රකල්පයෙහිම බරණැස්නුවර අපමහා බොධිසත්වයන්වහන්සේ සංසාරදෙඥය මහතුමකාටගණ ඉතා දුපපත්කුලයෙහ උපන්නන්හි ඒ මහාබොධිසත්වයන්ගේ මව්පියෝ ඉතා දුපපත් බැවින් තොයෙක් බැළඹමහෙකාට දුකසේ දිව්පවත් වන්නෝයි ඉන්බිති එහුවරවාසී ''සුවිපරිවාර'' නම් මහධනසිටාණ න්ගේගයි බැළඹමහෙකාට අපමහබෝසතාණෝ දිව්පවත්වනුයේ ඒ සිටාණෝද සිරිත්වශයෙන් තමන්ගේ බැළඹමහකාරන්නවුන්ට පෙහවස් රක්නට හැකිනම් මහතකරවයි කියන්නාහුය මහ බොසතාණන්ට එපවත්කියන්නව සිහිමුළාව බැළඹමනෙකරවයි නිදයා ගෙකාට බැළඹමහකරවන්නේය. ඉක්බිති පපාතෝදවස් පැමිණිකල් හි සිටාණන්ගේ නිදයාගපරිමදුන් ඒ මගහි සියළු මමහකරුවන් පටන් සියළුදෙනාම පෙහවස් සමාදන්වූහ බෝධිසත්වයන්ට පෙ හවස් සමාදන්මවයි නොකී බැව්න් උදුසන්හිම නැගිට තමන්ට නියමවූ මමහවරටගාස් කම්නතෙකාට ඉතා සවස්භාගයෙහි පෙ රළා ගෙඅාගේයි එකල්හි ඒගෙහි බත් පිසනදැසිහු එක්කෙනෙකුට පමණක් යෑපන ආහර සම්පාදනශෙකාට එළවුවාය මහාබෝධි සත්වයෝවනාහි සෙසුදවස බොහෝ මනුෂ්‍යයෝ අරගල පවත්වමින් මෙහි බත්අනුභවකරන්නෝය අද වනාහි මා පමණක් බත් අනු භවකරන්නේකිම්දැයි විචාරණලද්දේ අද මේ මගහි මෙමහකරුවන් ගේපටන් සියළු මදනාම පෙහවස් රක්නාහුයයි කීමාහුය ඉක්බිති මහබෝසතාණෝ සිතන්නාහු මම ඉතා කාලකන්නී මනුෂ්‍ය යෙක්වීමි මේ මගහි ඇමතනුෂ්‍යයෝම පෙහවස් රක්නාහු මා තනිවම බත්අනුභවකිරීම තොයෙදැයි දවසෙන් අසීයක් ඉක්ම ගියේය මා එයිනුත් අසවාහසීලය රක්ෂාකටයුතුදෝ හෝ නොවේදෝ හෝයි කල්පනාකොට සිටාණන්කරා ගොස් විචාළේයි. සිටාණෝ

කියනුයේ පින්වත මෙපි උදෑසන සිල්සමාදන්භුවු බැවින් දැන් සිල් සමාදන්වීනම් අෂ්ටඅංගෝපොසථයලැබෙන්නේයි කීහ. ඉක්බිති ඒ පුරුෂ ශ්‍රේෂ්ඨයාණන් අෂ්ටඅංගෝපොසථයවත් ලැබෙවයි කියා ස්වාමීන්වහන්සේගෙන් සිල්ඉල්වා සමාදන්වූහ මහබෝසතාණෝ ඒ සීලය ආවජ්ජනාකරමින් ආහර අනුභවනොකොට සයනය කරන්හෙත් දවසමුළුල්ලම ආහර නැති බැවින් මධ්‍යමයාමවාතයෙහි ඉතා දරුණුවූ ශබ්දකරන්නේ වාතය නැගිට කුසෙහි බලවත් රුජාපහරින්නට වන සිවාණෝද ලෙඟට අවුත් පින්වත මෙපි ආහර අනුභවනොකළබැවින් මේ දරුණුවාතය උත්සන්නවිය එහෙයින් ආහරඅනුභවකොට ජීවිතය රැකගණුවසිහිහ මහබෝසතාණෝද සස්වාමීනි දුකසේ සමාදන්වූ අෂ්ටඅංගෝපොසථය ජීවිතය පවට මාරුනොකරමිහයි කියා ආහරභනාවැලදුයේය ඉක්බිති අරුණ නඟිනවා හා සම්ග මරාගහබලවත්වී මරණාසන්නයට පැමිණිමස්ය එදවස ඉතා අළුයම බරණැස් රජකුරුවෝ මහත්වූ රාජඍර්ධියෙන් නගරයෙහිහැසිරෙණුදැක ඒ රාජඍර්ධිය ලාභසත්කාරය ඒ අග්ගමහාබෝධියත් චූතව බරණැස්රජතුමාගේ අග්ගමහසුන් බිසවුන් කුස පිළිසිඳගත්හ. ඉක්බිති දසවස් ඇවැමෙන් මව්කුසින් බිහිව ක්‍රමයෙන් වැඩෙතුමාගේ උදය කුමාරයයි නම්කොට මනාමයක් ශිල්පශාස්ත්‍රයෙහි නිපුණව රාජ්‍යයට පැමිණ උදය රජයයි ප්‍රසිද්ධවිය ඒ උදය රජතුමාට ජාතිසම්භාර ඥානය පහළවූබැවින් ඉතා යහපත්වූ අෂ්ටඅංගෝපොසථය රැකා මේසා මහත් රාජ්‍යඍර්ධියක් ලැබුයෙමිහයි දැන ප්‍රීතිවාක්‍ය පැවැත්වූහෙයිය එසින් කීහ ජාතක අට්ඨකනිපාත ගඩිහ මාලජාතකයෙහි "සොවව්හා උපවසිබ්බුපොසථං සමාදියිත්වා සුද්ධ නත්ථ අඟසමඟතියා කුවජ්ජිකා පවිසන්තිංගණ්හි" යි ය.

තවද ඔවි අසංඛාරණ ඥානාදි අපරිමිත ගුණගණාලංකෘත අප භාග්‍යවත් බුදුරජාණන්වහන්සේ එක්සමයෙක්හි කොසල ජනපදයට අග්‍රරාජධානිවූ සැවත්කෙළක් මනුෂ්‍යයන්ට වාසස්ථානවූ ශ්‍රාවස්තිපුර ප්‍රවරාසන්නවූ ජේතවනාම උද්‍යානයෙහි අනාථපිඬු මහසිටාණන් විසින් කරවා පිළිගන්වනලද ජේතවනාරාමයෙහි වැඩවාසය කරවදාරුණයේ එම නගරවැසි එක්තරා දුප්පත් පුරුෂයෙක් අනාථපිඬු මහසිටාණන්ගේගෙයි දැසකම්කොට ජීවත්වෙහි ඒ සිටාණෝවනාකී අපාගෝදවස් පැමිණිනිසාල්හි තමන්ගේ මහදර බැළුමෙහෙකරන්නාවූ සියළු දැසිදැසයන් පවත් හැමදෙනාටම බත බුලත වැඳහාදියදී අපෙහවස් රක්නාසේ නියමාගකරන්නේයි එක් අපාගෝදනක්

පැමිණිකල්හි අළුත අා ඒ දුසෙතෙමේ පොහෝදවස බව නොදුන උදු සතම කමීනතයවගොස් සවස්නතුරු කමීනතෙකාට සවස්වේලෙහි පෙරළා ගෙවාගයේයි එදවස වනාහි සෙසු දවස්හිමෙන් දුසිදුසාදිහු ආහර අනුභව නොකොට තුෂ්ණිම්භූතව හුන්බවදුක අද සෙසු දවස්හිමෙන් මේෙගහි දුසිදුසාදින්ගේ අහරපිළිබඳ අරගලක්හැත් නේයි කාරණාකිම්දැයි විචාළේහි ඉක්බිති ඒ ගෙහි මනුෂ්‍යයෝ පින්වත්නි තෙපිනොදනුද ? අද පොහෝදවසය මේ ගෙහි ඇම්දෙනම අෂ්ටාඞ්ගශීලය සමාදන්ව ඉන්නාබැවින් ආහර අනුභවකරන්නෙක් නැත්තේයයි කීවාහුය. ඉක්බිති ඒ දුපපත් පුරුෂතෙමේ සිතනුයේ මම වනාහි අතිශයින් පින්මද මන්දභාග්‍ය මනුෂ්‍යෙෂක්මි මේ ගෙහි සියළු මනුෂ්‍යෙයෝම අෂ්ටාඞ්ගශීලය රක්ෂාකරන්නාහුය මම වනාහි මේ අඩදිනය පෙහෙවස් රැක්කෙමිනම් යහපත්ෙදගෝහි කල්පනා කොට සිටාණන්කරාගොස් විචාළේහි සිටාණෝ කියන්නේ පින්වත දවසක් හෝ දවසකින් අඩියක් හෝ තමන්ට ශක්තිඇතහොත් උපෝසථශීලය රක්ෂාකටයුතුමයයි කීහ. ඉක්බිති ඒ පුරුෂතෙමේ අත්පා මුවඳුවා අෂ්ටාඞගශීලය සමාදන්ව ඒ ශීලගුණය ආවජිතා කරමින් හිඳිනුයේ මේ පුරුෂතෙමේ දවසමුළුල්ලම ආහර අනුභව නොකළබැවින් මධ්‍යමරාත්‍රියෙහි බලවත්වාතයක් කිපී පෙළෙන්නට පටන්ගත එකෙණහි ඒ ගෙහි මනුෂ්‍යයෝ ලඟවඅවුත් පින්වත්නි ආහර නොවැළඳූ බැවින් මේ වාතය උත්සන්නවිය එබැවින් ආහර අනුභවකොට ජීවත්ව නැවත සිත්සේ පෙහෙවස් සමාදන්වේවයි කීවාහුය ඒ දුපපත් පුරුෂතෙමේ මම ඉතා දුර්ලභව සමාදන්වූ ශීලය ආහරයක් නිසා බිඳ නොගණිමි මාගේ ජීවිතයට වඩා මාගේ අඩි උපොසථය උතුමයයි කියා ආහර අනුභව නොකළබැවින් එදා රෑ කාලක්‍රියාකොට හිමාලයවනයෙහි එක්තරා නුග වෘක්ෂයෙක මහානුභාවසම්පන්නවූ රුක්දෙවියෙක්ව උපන්නේහි එසින්කිහ දීඝනිකාය ජාලියසූත්‍ර අටුවාමයහි "සඩ්ඝං උපඩ්ඪදිවසං උපඩ්ඪූ පොසථං සමාදියිත්වා තදහෙව කාලංකත්වා ඉමංසම්පත්තිං පටිලභිංසූති" යි. මෙසේ සාමාන්‍යවශයෙන් සරණගිල පඤ්චශීල බ්‍රහ්මචරිය පඤ්චශීල අෂ්ටාඞ්ග උපෝසථශීලයන්ගේ අනුසස් අවබොධනිරීමපිණිස මේ කථාවස්තුන් මෙතෙක්කටයුතුයි.

අෂ්ටාඞ්ග උපෝසථශීල නිර්දේශයයි 44.

ආජීවඨමක ශීලානි සංඝ නිද්දේසය කවරෙක්ද?

—o—

45 ආජීවාෂ්ටමක ශීලයද අඛණ්ඩාදියෙන් අෂ්ටාඞ්ග උපෝසථ ශීලයට බොහෝසෙයින් සමාන බැවින් දැන් ඒශීලය දක්වනලැබේ. මේ කෙසේදයත් ? මේ ආජීවඨමක ශීලය අඞ්ගුත්තර අට්ඨකනිපාත විභඞ්ගාදියෙන් ගෙණ මෙහි සංග්‍රහකරණ්ලැබේ. ආජීවඨමක ශීලය සමාදන්වනු කැමති උපාසකයා ඇසින් වෙන්කොට පසුවඛ්ග ශීලය සමාදන්නුවවත් මේ ආජීවඨමක ශීලයෙන් පසුවඛ්ගශීලයද සංග්‍රහවන බැවින් විශෙෂානිසංස ඇතහාවූ මේ ආජීවඨමක ශීලයම සමාදන්ව රැක්කයුත්තේයි.

ඒ සමාදාන විධි ආදිය මෙසේයි යටකී නියාමයෙන් භික්ෂු උපාසකාදී ආචාර්‍යයෙකුකරා එළඹ ඉදිලිබැඳ උත්කුටිකාශනයෙන් හිඳ ගෙණ "අහංභන්තෙ තිසරණෙන සහ ආජීවඨමක සීලං ධම්මං යාචාමි අනුගණ්හන්තුමන්තා සීලංදෙථමෙභන්තෙ" යන වාක්‍යය තුන්යළක් මහා නමස්කාර පාඨයකියා තුන්යළක්ද තිසරණසමාදන්ව "පාණාතිපාතාවෙරමණී—අදින්නාදානා වෙරමණී—කාමෙසුමිච්ඡාචාරා වෙරමණී—මුසාවාදා වෙරමණී—පිසුණාවාචාවෙරමණී-ඵරුසාවාචා වෙරමණී—සම්ඵප්පලාපාවෙරමණී-මිච්ඡාජීවාවෙරමණී සික්ඛාපදං සමාදියාමි" යන ශික්ෂාපදඅට සමාදන්විය යුතුයි අවශානයෙහි "තිසරණෙන සහ ආජීවඨමක සීලං ධම්මං සාධුකං සුරක්ඛිතං කත්වා අපපමාදෙන සම්පාදෙථ" යනුවෙන් අනුශාසනාකොට නිමවාකළයුතුයි මේ ආජීවඨමක ශීලය පසුවඛ්ගශීලයමෙන් නිත්‍යශීලයක්මවන්නේයි මෙහි "පාණාතිපාතා" යනාදි පිළිවෙළින් සත්වැදෑරුම් ශික්ෂාපදය ප්‍රකට මැති අටවෙනි ශික්ෂාපදයෙහි අර්ථමෙසේයි "මිච්ඡාජීවා, පණ්ඩිතාදි සප්පාදුච්චරිතයන් ඉක්මවා සත්ඝාතන අදත්තාදානාදියෙන් කරන්නාවූ සාවද්‍යවූ මිථ්‍යාජීවිකාවෙන්; වෙරමණි, වැළකීමයයි කියනලදැ; සික්ඛාපදං, සිකපදය හෙවත් හික්මියයුතු කාරණය; සමාදියාමි, සමාදන් වෙමි හෙවත් මෙහනවට ගණිමි" යනුයි ගෘහස්ථයාගේ මිථ්‍යා ආජීවය නම්පණ්ඩිතාදි සප්පාදුච්චරිතයෙන් දිවිපැවැත්වීමයි භික්ෂූන්ගේ මිථ්‍යා ආජීවයනම් කුහනාලපනාදි සත්වැදෑරුම් ඝාතක වස්තූන්හෙන් දිවිපැවැත්වීමයයි දතයුතුයි මේ ආජීවඨමක ශීලයෙහි එකෙකි ශික්ෂාපදයක් රක්ෂාකිරීමෙහි අනුසස්හා ඉක්මවීමෙහි අගුණාදි මෙතැන්පටන් බුදුකපාය අට්ඨවාමෙන් ගෙණ සංග්‍රහකරණ්ලැබේ. ඔවුන් අතුරෙන් පණ්ඩිතාමයන් වැළකීමෙහි අනුසස්කවරයත් "පාණාතිපාතා වෙරමණි

යා අඞ්ගපච්චඞ්ග සම්පන්නතා" යනාදීන් පණිවායෙන් වැළකුනාවූ සඞ්ඝතෙම් අනතුරු අත්බැව්නි සදිව්‍යලොකයෙහි දිවසැපත් වලදා එයින් චුතව මිනිසත්බව ලැබූකල්හි අඞ්ග ප්‍රත්‍යඞ්ගයන් සම්පූර්ණ බවය මනුෂ්‍ය ශරීරයව සුදුසු ප්‍රමාණවූ ආරොහ පරිණාහ සම්පත්තියෙන් සම්පූර්ණබවය වහා යාම් ඊෂාදිය‍යෙහි දැක්වූ ජවසම්පත්තියෙන් සම්පූර්ණබවය දෙපතුල් මොනවට බිම සපගීකරණ බවයයි කියනලද සුප්‍රතිෂ්ඨිත පාදතලයෙන් යුක්තබවය සිත්කළුවණ්ණ ඇති බවය මිනිඳ පළුන්නා මිඟිරිමවන ඇඟිබවය නොබිදියන්නාකි පිරිස්ඇතිබවය නිර්ණීත බවය තමාගේ වස්තු සම්පත්ආදිය රාජචොරාදි සතුරු භයින් විනාශනොකවහැකිබවය ශ්‍රේරමාගේ උපක්‍රමයෙන් ජීවිතහානි නොකළැකිබවය අනන්ත පරිවාරසම්පත් ඇතිබවය මනාවූ ශරීරවණ්ණ ඇතිබවය ශාපත් ශරීර සවහන් ඇතිබවය නීරෝගිබවය නිශ්ශොකිබවය සිගළු ලෝවැස්සන්ට ප්‍රියමනාප බවය ප්‍රියමනාපයන් ශගත් මවින්නොවනබවය දිඝායුෂ්ක බවය යනාදිහු පණිවායෙන් වැළකීමෙහි විපාකශෝභාය දතයුතුයි.

"අදින්නාදානා වෙරමණියා ඔහඩනතා" යනාදීන් හිමියන් විසින් කයින් වචනයෙන් සුදුසුන්ගේ පැහැරගැණීමෙන් වැළකීමයයි කියනලද ශික්ෂාපදය රැකීමෙන් මෙයින් චුතව දෙව්ලොව ඉපිද දිව්‍යසම්පත්වලදී නැවත මනුෂ්‍යව උපන්කල්හි මහත් ධනයසම්පත් ඇතිබවය බොහෝවූ ධනධාන්‍ය ඇතබවය කෙළවරක් නැත්තාවූ සම්පත්ඇතිබවය නුපන් භවභෝගසම්පත් උපදනාබවය උපන් භවභෝගසම්පත් තහවුරුවනබවය කැමැති සම්පත් යුහුව ලැබීමය රාජචොර උදකාග්නි භයතු ඇත පස්හයින් වස්තු විනාශ නොවනබව හා තමාගේ සම්පත් අප්‍රියයන්ට උරුම නොවනබවය අනුන්ට නැහැනාවූ උතුම් වසතුලැබීමය ලොකයාහට අධිපතිබවය නැතැයි කන වචනාර්ථ නොදන්නාබවය සැපයේ වාසයකරණබවය යනාදී විපාකයෝ අදින්නාදානයන් වැළකීමෙහි විපාකානිසංස යෝයි.

කාමමිථ්‍යාචාර විරතියෙහි විපාකයෝනම් මේ කාමමිථ්‍යාචාර විරතියද අබ්‍රහ්මචරියා වෙරමණි ශික්ෂාපදයාගේ විශෙෂයක් බැවින් අබ්‍රහ්මචරියාවෙරමණි ශික්ෂාපදයෙන් සුදුසු ආනිසංසයන් කාමමිථ්‍යාචාර විරතියටද යොදාගතයුතුයි. විසතාරාර්ථ දුස්වීමෙන් සංක්ෂෙපාර්ථයද ඇතුළත්වන බැවින් අටුවාමගහි ආ ක්‍රමයෙන් අබ්‍රහ්මචරියා වෙරමණි ශික්ෂාපදයාගේ විපාකානිසංසයෝ මෙහි දක්වනුලැබේ.

"අබ්‍රහ්මචරියා වෙරමණියා විඤ්ඤූ පච්චත්තිකතා" යනාදීන් දෙවිදූන යෙත් වැළකීම් සඞ්ඛ්‍යාත ශ්‍රේෂ්ඨචර්‍යාව රක්‍ෂාකළාවූ සත්වෙනමේ ස්වර්ණලොකයෙහිඉපිද නොයෙක් දිවසිරි විඳ එයින් අවුත් මිනිසත් බව ලැබුකල්හි පහවූ සතුරන් ඇතිබවය සියළුදෙනාට ප්‍රිය බවය අහාරපානවස්ත්‍ර සයනාශනාදිය ලැබීමය සුවසේ නිදනබවය සුවසේ පිබිදින බවය අපායභයින් මිදීමය සත්‍රී නප්‍රාෂක පඬිත උහතෝ ව්‍යඤ්ජනකාදී භාවයෙන් පහවීමය වෙෂ නැතිබවය ඇස්හළුවෙති කරණලද යහපත් කමිඇති බවය නොබිඳුනාවූ හෙවත් පිරුණාවූ දසරුවඇතිබවය ගටට නොනැමුනාවූ මුහුණුඇතිබවය සත්‍රී පුරුෂ ලයා ඔව්නොවූන්ගෙරහි ප්‍රිය බවය පිරිවුන් ඉදුරන් ඇති බවය පිරිවුන් ලකුණුඇතිබවය සිව්පිරිස්හි විශාරද බවය උත්සාහසම්පන්න කොටම වසනුසම්පත් ලබන බවය සැපවිහරණ ඇතිබවය කිසිවකින් භය නොවනබවය ප්‍රිය මනාපයන්ගෙන් වෙන්නොවනබවය යන මේ ආදිහු අබ්‍රහ්මචරියා විරති ශික්‍ෂාපදයාගේ විපාකානිසංසයෝයයි දතයුතුයි.

රසකාමයෙහි වරදවා පිළිපැදීමක්වූ සුරාමේරය මජ්ජපමාදට්ඨානා විරතියද මෙහිම ඇතුළත්කොට දක්වියයුතු බැවින් "සුරාමේරය මජ්ජපමාදට්ඨානා වෙරමණියා අතීතා නාගත පච්චුප්පන්නන සු" යනාදින් පස්වැදෑරුම් සුරාය පස්වැදෑරුම් මෙරය යන දශප්‍රකාර සුරාමේරය වතීයක් හෝ අබින් කංසා ආදි මද්‍යවතීයක් හෝ මද ප්‍ර මාදය පිණිස සවනයකිරීමෙන් වැළකුනාවූ සත්වෙනමේ සවතීලොක යෙහි ඉපිද දිව්‍යශ්‍රී සම්පත්වලඳුඑයින් වුතව අවුත් මිනිසත්බව ලැබු කල්හි අතීතානාගත වර්තමානවූ කටයුතු කම්නනයෙහි ස්‍රුතුස්‍රුව්ව දූනගන්නා ස්‍රුවණඇතිබවය නිරතුරු එළඹ සිටිනා සිහිඇතිබවය උමතුනොවනබවය ප්‍රඥවන්තබවය අලසනොවන බවය මුළානොවනබවය පමණ දන්නාබවය අප්‍රමාදබවය නිර්භය බවය නොසැලුඩුබවය ඊර්ෂ්‍යා නොකරණබවය සත්‍යවචන ඇතිබවය ඔව්නොවුන් නොබිඳුවන සුළුවූ මෘදුමොළොක් නොසිත් එවන කියන බවය අලසනොවනබවය සකමළකි ගුණදන්නාබවය නොමුසුරුබවය න්‍යායගිවනත බවය සිල්වත්බවය ඇදනැති කායවාක් කම්ඇති බවය ක්‍රොධනැති බවය පාපභයගි ලජ්ජාඇතිබවය සතර අපාය භය ඇති බවය අවංක සම්‍යක්දෘෂ්ටිඇතිබවය උතුම්ගති ඇතිබවය සිහි ප්‍රඥ ඇති බවය පණ්ඩිත බවය ආර්‍ය කාන්තියෙනි දැකුබවය යනාදිහු රස මෙරපිළිමෙන් වැළකීමෙහි විපාකානිසංසයෝයි.

"මුසාවාදා වෙරමණියා විපජ්ජන්තිඤ්ඤතා" යනාදින් මුසාවාදයෙන් වැළකීම් සංඛ්‍යාත ශික්ෂාපදය රක්ෂාකළාවූ මනුෂ්‍යත්වයේ සුගති සැපවිඳ මිනිසත්බව ලැබුකල්හි විශෙෂයෙන් ප්‍රසන්නවූ ඉදුරන් ඇතිබවය චිනිච්ඳ ගන්නාවූ මධුරස්වරඇති බවය නුස්මනාමිටි සම ගුහ්‍යවණීමනාදත් ඇතිබවය ඉතා සුදුලන්නුවූ ඉතා කෘශත්නුවූ බවය ඉතා නුස්මනාමිටි බවය මොළකැටි ශරීර සපතී ඇති බවය උපුල් මල් සුවඳ හමන මුඛයක්ඇති බවය කීකරු පිරිවර ජනයා ඇතිබවය ඇදහියයුතු වචන ඇති බවය කොළුපුල් මල්පෙතිබදු මෘදු රක්තවණී ඇස් සහළක් හා දිවිඇති බවය සත්හුන් බවය නිරතුරු සතුටුසිත්ඇති බවය යන මේ ආදීහු මුසාවා බිණීමෙන් වැළකීමෙහි විපාකානිසංසයෝයි

පිසුණවාචාය ඵරුසවාචාය සම්ඵප්‍පලාපය මිථ්‍යාආජීවය යන සතරින් වැළකීමෙහි ආනිසංසයෝනම් අප මහබෝසතාණන් බොධි සම්භාරපුරන්නාහු මනුෂ්‍යව උපන් සතසහස්‍ර සංඛ්‍යාත ජාතියෙහි ඔක්ලාමිකීමෙන් වැළකීමෙන් මිනිස්ලොවින් සැවදෙව්ලොව ඉපිද දිව්‍යමය වණ්ණාදි දශකාරණයකින් සෙසු දෙව්යන් මැඩපවත්වා දිව්‍යශ්‍රීසම්පත් වලඳ නැවත මිනිස්ලොව උපන්කල්හි සතරමහාචිප සයහි ආඥුවක්‍රය පවත්නා සක්විති රජව උපන් නොයෙක්ජාති සයහි සමසාළිස් දනන්යන් ඇතිබවය අච්චරදනනයන් ඇතිබවය යන මහාපුරුෂලක්ෂණවය පහළවීමය නොබිඳියහෑකි පිරිස් ඇතිබවය අනන්තිමහවසයහි සත්ත්වතාඤ්ඤනය ලැබ පෙරමෙන් අභෙද්‍යවූ පරිය සම්පත්ලැබීමය යන විපාකානිසංසයෝ පිසුණුබස්කීමෙන් වැළකීමෙහි විපාකානිසංසයෝයයි දතයුතුයි

පරුසවාචා විරති ශික්ෂාපදයෙහි විපාකානිසංසයෝනම් මහබෝසතාණන්වහන්සේ නොයෙක්ජාති සතසහස්‍රයෙහි පරුසවචන යෙන් වැළකී මිනිසත් බැවින් චුතව දෙව්ලොවඉපිද ආයුවණීාදි දශකාරණයකින් සෙසු දෙවියන් මැඩපවත්වා දිවසිරි වලඳ නැවත මිනිස්ලොව උපන්කල්හි සක්විරජය ලැබීම හා රක්තවණී පෘථුල ජිව්හාවක් ඇතිබවය කුරවකනාද නිර්විශෙෂාඤ්ඤාඝ සමූපෙත බ්‍රහ්ම සවරඇතිවීමය යන මහාපුරුෂලක්ෂණවය ලැබ ලෝවැස්සන් විසින් ඇදහියයුතුවචන ඇහිවීමය අනන්තිමජාතියෙහි සම්භදපදයලැබ තුන් ලෝවැස්සන් විසින් ඇදහියයුතු වචනඇති වීමය යනාදි ආනිසංස යෝ ඵරුසාවාචා විරති ශික්ෂාපදයෙහි විපාකානිසංසයෝයි

සම්ඵප්‍රලාප විරති ශික්ෂාපදයෙහි ආනිසංසයෝනම් මහා බෝසතාණන්වහන්සේ නොයෙක් ජාති සතසහස්‍රයෙහි සම්ඵප්‍රලාප ම්යත් වැළකී මිනිසත් බැව්න් චුතව දෙව්ලොව ඉපිද ආයුවණ්‍ණාදි දශකාරණයකින් සෙසු දෙවියන් මැඩපවත්වා දිව්සිරිවලඳ නැවත මිනිස්ලොව උපන්කල්හි සක්විනිරජය ලැබීම හා සිංහයන්ව බදු හනු ඇතිබවය යන මහාපුරුෂලක්ෂණය ලැබීමය මෙරමා විසින් විනාශනොකළැකිබවය යන විපාකානිසංසයන් හා වරිමකාත්ම භාවයෙහි සම්පූර්ණපදයලැබ විශෂෂයෙන් දිව්‍ය බ්‍රහ්මාදි නිසිවෙකු විසින් විනාශ නොකළැකිබවයයි කියනලද විශෂෂානි සංසය ලබන්නේයි මේ සම්ඵප්‍රලාප විරතියෙහි ආනිසංසයෝයි.

මිථ්‍යාජීව විරති ශික්ෂාපදයාගේ විපාකානිසංසයෝනම් ශ්‍රීමහා බොධිසත්වයන්වහන්සේ ජාති සතසහස්‍රයෙහි මිථ්‍යාජීවයෙන් වැළකී දෙව්ලොව ඉපිද ආයුවණ්‍ණාදි දශකාරණයකින් සෙසුදෙවියන් මැඩ පවත්වා දිවසැපත්වලඳ නැවත මිනිසත්බව ලැබ උපන්කල්හි සක් විනිරජය ලැබීමය කියනින් කපනලද සක්ගඩියක්සේ හුස්නාම්පිට සමදැනයන් ඇතිබවය සුපරිශුඩ දනනයන් ඇතිබවය යන මහාපු රුෂලක්ෂණමය ලැබීමය යහපත් පරිස සම්පත් ලැබීමදැයි දිඝ නිකායාගත ලක්ඛණසූත්‍ර තදර්ථකථාවන්හි වදරණලද්දේයි මේ මිථ්‍යාජීව විරති ශික්ෂාපදයෙහි විපාකානිසංසයෝයි.

මේ දෙශනාවෙහි දෙව්ලොව උපනුපන්කල්හි ලැබියයුතුවූ දශකාරණ්‍ණයෝනම් ආයුවණ්‍ණාදි බල ආධිපත්‍ය යන පසහා දිව්‍ය මයවූ රූපශබ්ද ගන්ධාරස සපර්ශයන පස්කම්ගුණය යන දශ කාරණ යයි දනයුතුයි. මෙසේ දක්වනාලද පණිවාදි දුශ්චරිතයෙන් වැළකීම් සංඛ්‍යාත විරති ශීලයෙන් දෙව්ලොව උපදනාකල්හි සෙසුදෙවියන් දශකාරණ්‍යයකින් මැඩපවත්වනබවද මිනිස්ලොව උපදනාකල්හි සතරාකාර සාඩ්‍යානුභාවයෙන් හා සප්තරත්නයෙන්ද සෙසු මනුෂ්‍ය යන් ඉක්මවන්නාවූ සක්විති රජය ලබනබවද වරිමකජාතියෙහි සකලසත්ව ප්‍රජාව බුඩගුණයෙන් මැඩ පවත්වන්නාවූ සම්පූර්ණපදයට පැමිණීමයයි කියනල්ද විපාකානි සංසරාශියක් ලැබියයුතුබවද වදුළුබැවින් දිව්‍යමනුෂ්‍ය සමපත්ති සංඛ්‍යාත ලෞකික විපාක හා සමඟ බුඩ ප්‍රත්‍යෙකබුඩ ශ්‍රාවකබෝධි සංඛ්‍යාතත්‍රිවිධ බෝධියද මෙම නවට සිඩකළහැක්කේයයි දනයුතුයි.

ආජීවඨමක ශීලානිසංස නිර්දෙශයයි. 45

ආජීවඨමක ශීලභෙදයෙහි අනුශංස කෙසේයත් ?

46 ආජීවඨමක ශීලසංඛ්‍යාතවූ ඒ ශික්ෂාපදයන් අටදෙනාගේ ඉක්මවීමෙහි ආදීනව මෙනැන්පමන් දක්වනුලැබේ. මේ කෙසේයත්? පණිවාණයෙහි විශෙෂ ඵහාග දුනගණු කැමැතතවුත් විසින් අප විසින් සංග්‍රහකොට මුද්‍රණයකරවනලද "දශඅකුශලකම්විභාග" නම්වූ ධර්ම සංග්‍රහය බලා දුනනහයුතුයි. ඒ අකුශලකර්මය කරන්නාවුන් විසින් ලැබියයුතු ආදීනවයෝනම් මෙසේයි එසින් වදාළහ අඞ්ගුත්තර නිකාය අටඨකඞ්ගුත්තරයෙහි "පාණාතිපාතා භික්ඛවෙ ආසෙවිතා භාවිතා බහුලීකතො නිරයසංවත්තනීකා ... පෙ ... සංවත්තනිකාති" යනු බැවින් මහණෙනි නිරතුරු පුරුදුකරණලද පාණාති පාත අකුශලකර්මතෙමේ ඔසුපත් සමඟ අටමහානරකය නිරිසන් අපාය ප්‍රෙතලෝකය යනාදියෙහි ඒ පාපකාරී පුද්ගලයා උපදවයි ප්‍රාණඝාත අකුශලකර්මයාගේ ඉතා ලඝුවූ විපාකයනම් අපායදුනින් මිදිඅවුත් මනුෂ්‍යව උපන්නාහු මන්දායුසකබවය බොහෝවූ රොගාබාධඇතිබවය ඔව්කුස්හිම චක්ෂුශ්ශ්‍රෝත්‍රාදි ඉන්ද්‍රියයන් පිරිහීමය යනාදීහු මේ ප්‍රාණඝාතකර්මයේ විපාකාදීනවයයි.

අදත්තාදානයාගේ ආදීනවයෝනම් "අදින්නාදානං භික්ඛවෙ ... පෙ ... සංවත්තනිකොති" යනු බැවින් අදත්තාදානපාපකර්මයාගේ සියල්ලට වඩා සැහැල්ලු විපාකයෝනම් මනුෂ්‍යව උපන්නාහුගේ වසතුසම්පත් ගින්නෙන් දියෙන් නැස්මය රාජභය චොරභය පැමිණීමය යනාදිහුයි මේ අදින්නාදාන අකුශලකර්මයාගේ විපාකාදීනවයයි.

කාම්මිථ්‍යාචාරයෙහි විපාකාදීනවයෝනම් "කාමෙසුමිච්ඡාචාරා භික්ඛවෙ ආසෙවිතා ... පෙ ... සංවත්තනිකාති" යනු බැවින් පුරුදුකරණලද කාමමිථ්‍යාචාර අකුසලකර්මතෙමේ සිව්අවාහි උපදවා කටුගිඹුල්වෘක්ෂයට නැන්වීමාදියෙන් මහත්දුක්දී මිනිසන්බව ලැබුකල්හි අභ්‍යන්තර සතුරන්ගෙන් හා බාහිර සතුරන්ගෙන් හිංසා පීඩා විදීමය ස්ත්‍රී නපුංසක උභතොව්‍යඤ්ජනක පණ්ඩපඩක උසුයපඩ කව ඉපදීමය අෂ්ටාරසමහා කුෂ්ඨාදිරොගාදිය හවගැණීමය යනාදි විපාකාදීනවයෝ කාමමිථ්‍යාචාර කර්මයාගේ ආදීනවයයි.

"සුරාපානං භික්ඛවෙ ආසෙවිතං ... පෙ ..." යනු බැවින් පුරුදුකරණලද රහමෙරපානය සතරඅපාය දුක්පිණිස පවත්නේයි අපායදුක්වීද මිනිස්ලොව උපන්කල්හි උමතුරොග වස්මරරොග හටගැණීමය මගාළුබිහිරි ආදී ඉන්ද්‍රිය විකලවීයවීමය ප්‍රඥාවිකලවීය වීමය යනාදිය සුරාපානයාගේ ආදීනවයයි.

මේ සුරාපාන කම්යාගේ විශෂ විභාග දක්වනුලැබේ හේ කෙසේදයන්? මේ සුරාපාන අකුශලකම්යවනාහී ප්‍රතිසන්ධිය උපද වින්නාවූ ජනක ශක්තිය නැතිබැවින් සතරඅපායෙහි නූපදවන් නේයයි සමහරුන්ගේ වාදයක් ඇත්තේයි. ඒ වාදය කුමක්නිසා හටගත්තේදයන් ? "පටිසන්ධිජනකා යෙව කුසලා කුසලා කම්ම පථාති වුත්තා වුත්තාවසෙසා පටිසන්ධි ජනෂන අෂනකන්තතා කම්මපථානිනවුත්තා" යන ප්‍රති සම්භිදාමාගී අට්ඨවාපාඨයෙහි හෙවා ඒහිය මනාවැටහී සුරාපාන අකුශලකම්ය අපාය ප්‍රතිසන්ධිය නො දන්නේයයි විවාදකරන්නාහු මෙසේ "වුත්තාවසෙසා පටිසන්ධිජ නනෙ අෂනකන්තතා කම්මපථානිනවුත්තා" යනුවෙන් අකම්පථ දුශ්චරිතමාත්‍රයක් දැක්වූ එම අට්ඨවාපාඨයට අළුත් ලියන්නාවූ ප්‍රති සම්භිදාමාගී ගණ්ඨිපදකාරයෝවනාහී "වුත්තාවසෙසාති කම්මපථ තො අවසෙසා සුරාපානාදයෙ" යනුවෙන් සුරාපානය ආදියෙහි යොදා කිබැවින් සුරාපානකම්ෂහතුවෙන් අපායෙහි නූපදින්නේයයි විරුඩවාදීන්ගේ අභිප්‍රායයි කිවයුත්ත මේ අට්ඨවාපාඨයෙහි හා ගණ්ඨිපදපාඨයෙහිත් සඛන්ධාදිය මනාවැටහී මෙසේ ප්‍රකාශකර න්නේයයි හැඟේ. එබැවින් ඒ පාඨයන්ගේ සඛන්ධාදිය දක්වනුලැබේ කම්පථභූතවූ අකුසලකම්ෂයෝ අකම්පථවූ අකුසල කම්යන්ගෙන් වෙන්කොට දක්වනුපිණිස "පටිසන්ධි ජනකාෂයෙව කුසලා කුසලාක මම්පථානිවුත්තා" යනු කියනලදී එහි අභිප්‍රායනම් ප්‍රතිසන්ධිය උපදවා ලිමෙහි සමොසත්වූ සුරාපානවිරති ආදි කුසලකම්ෂයෝද සුරාපා න ව්‍යතික්‍රමාදි අකුසලකම්ෂයෝද කම්පථයයි දතයුත්තාහුය යනුයි ඊට අනතුරුව අකම්පථධම්ෂයෝනම් කවරහුදැයි යන වාදය සඳහා "වුත්තාවසෙසා පටිසන්ධිජනෂන අෂනකන්තතා කම්මපථානින වුත්තා" යන පාඨය කියනලදී එහි භාවය තමාගේ අභලක්ෂණ ෂයෙන් අපරිපූර්ණවූ අකුසලධම්ෂයෝතුමු අකම්පථධම්ෂයෝයයි දතයුත් තාහුය යනුයි ඊට අනතුරුවූ අකම්පථධම්ෂයෝතුමු ප්‍රතිසන්ධි විපාකය සම්ප්‍රකාරෂයෙන්ම නොදියහැක්කාහුද යන වාදය සඳහා "පටිසන්ධි ජනෂන අෂනකන්තතා" යන පාඨය කියනලදී එහි භාවය තමා ගේ අභලක්ෂණෂයෙන් සම්පූර්ණනොවූ දුශ්චරිතමාත්‍රයක්වූ අකම්පථධ ම්ෂයෝතුමු ප්‍රතිසන්ධි විපාකය අෂනකාන්තනිසවශෂයෙන් ඇතම්කාලෙක උපදවන්නාහුය යනු භාවයි ඒ අකම්පථ ධම්ෂයෝතුමු කවරහුදැයි. යන වාදය සඳහා "වුත්තාවසෙසාති කම්මපථෂතා අවසෙසා සුරා පානාදයෙ" යි ගණ්ඨිපදකාරයෝ කීහු ඒ ගණ්ඨිපද අර්ථවර්ණනා වෙහි භාවය සුරාපානාදි කම්ෂයෝ අකම්පථෂයෝය යනුයි, මේ අර්ථව

මේ කාලයෙහි දාන සිල උපොසථ භාවනා කම්යෙහි බොහෝ සෙයින් බෞද්ධයෝ යෙදෙනනුමුත් අනුන්කරණදේ බලමින් නො

ඔොත් මව්පියන් විසින් කරණගන ආ පුරුද්දවිශයෙන්හෝ අසල් වාසීන් විසින් කරණලද්ද දැකපුරුද්දෙන් හෝ කරණ පමණමුත් ආගමධර්මයදැන පුණ්‍යකර්ම මෙසේකළේමිනම් මහත්ඵල මහානිසංස වන්නේයයි දැන පින්කරන්නවුන් ඉතා දුලීහවෙති එබැවින් බොහෝදෙනා පින්කම්කිරීම කෙළිසෙල්ලම් වශයෙන් පවත්වණ සත්දවසේ බණ පිරිත්මඩු පෙළහරයාම් ආදිය මහත් පින්කම්මෙන් සල කනි බොහෝ බෞද්ධයෝ සුරාපානයකොට බණපිරිත් මඩුවලට යෙති මත්පැන් පානයකොට පෙළහරට යෙති මත්පැන් ආදිය රැගෙණ වන්දනාවේ යෙති එසේම එබදු ගමන්වලට තමතමන්ට හිත මිත්‍රවූ සත්‍රී පුරුෂයන් යෙන්නම් ඔවුන් නිසා තමන්ත් ගමනට සැරසෙය මෙසේ නෘත්‍ය ගීතවාද්‍යාදියහෝ නොයෙක් සත්‍රීපුරුෂයන් හෝ ගරුකත ආලඹණාධිපති ප්‍රත්‍යයකොට යනපමණමුත් තුණුරුවන් ගුණහෝ දානවස්තු ප්‍රතිග්‍රාහකාදීන්හෝ ආලඹණාධිපති ප්‍රත්‍යය කොටගෙණ යන්නවුන් ඉතා සුළුපටෙති ඇතම් මනුෂ්‍යයෝ ලාභ කීර්ති ප්‍රසංසාදිය සඳහා මහත් ධනව්‍යයදන්කොට පින්කම්කරන්නා හුවෙති සමහර මනුෂ්‍යයෝ ලාභයම සලකා නොයෙක් රටවලින් මිලමුදල් සම්මාදන්කොට රත්නත්‍රය හෙතුකොටගෙණ අපාය ගමනියවූ මහත් පව් රැස්කරගණිති ඉදින් මරණාසන්නකාලයෙහි යහපත් කුසල කර්ම නිමිත්තක් ලැබේවයි යන අදහසින් එකානත යෙන් නිවත් අරමුණුකොටගෙණ කරණලද්දවූ යහපත් දානවස්තු ප්‍රතිග්‍රාහකාදින්ගෙන් යුකතවූ කර්මනිමිත්තක් නැන්නේවිනම් ඔහු විසින් රැස්කරගන්නාලද කුසලකර්මයන්පවා නිසියේ ඉදිරියට අවුත් විපාක නොදෙන්නාහුයයි දතයුතුයි ඇතම් මනුෂ්‍යයෝ විහාර දැගැබ් පෙතිපිළිම දහම්පොත්පත් කරවා ඒ කුසලකර්ම පවා මතකනැතිකොට මරණාසන්නයෙහි කර්මනිමිති වශයෙන් නොගෙණ හිස් අතින් මිය පරලෝ යන්නාහුය කර්මඝටකතාඥානය පුරුදුකරන්නවුන් විසින් නිරන්තරයෙන් තමා විසින් රැස්කරගන්නාලද කුසල කර්මයන් පින්පොත් ආදියෙහි ලියා තබා විවෙක කාලයෙහි ඒ පින්පොත් කියවා මාවිසින් මෙබදු බෙබදු කුසල කර්මයන් රැස්කර ගන්නාලද්දේයයි නුවණින් සලකා සතුටුවීමෙන් ඒ කුසල කර්මයන් අළුත්වීමෙන් මරණාසන්නයෙහි නොවරදවා විපාකදීමට අභිමුඛ වන්නාහුය ඉතා සුළුපටු කුසල කර්මයක්පවා සිහිපත්වූ කල සොම්නස්වීමෙන් මහත්ඵල මහානිසංසද්මට පොහොසත්වන්නේයි.

මේ ශීලනිද්දේශය වනාහි ශීලවිභාගය නමැති කොටස් ප්‍රකාශකොට ලියනලද්දක්බැවින් මෙහි ඒ දානවිභාගය නොදක්වා ශීල

යම් විඤ්ඤාරකරණුලැබේ පඤ්චශීලය අෂ්ටාඟශීලය දශශීලය ආදි කොටඇත්තාවූ ශීලයන් රක්ෂාකරන්නවුන්ට පරලෝවිහි ලැබියයුතු විපාකය අපට අප්‍රත්‍යක්ෂවූ පරලොකය පිළිබඳ නුමුත් මේ ලොක යෙහිත් එනි විපාක ලබන්නේමැයි හේ කෙසේ ලබන්නේදයත්? ප්‍රාණවධ නොකරන්නාවූ යම් මනුෂ්‍යයෙක් සතුරන් විසින් මනුෂ්‍ය මාරණයක්කළේයයි නඩුසබයට අල්වාගෙණ ගියේද මොහු මනුෂ්‍ය යෙක් තබා තිරිසන්හිය සතෙකුදු නොමරණසුළු සිල්වත් මනුෂ්‍ය යෙකැයි රජුන් පවා මොහුට අභයදෙන්නේය අන්සතු වස්තුවක් පැහැරගත්තේයයි යමෙකු විසින් අල්වාගෙණගොස් රාජ සභා වට පැමිණෙවුවත් මේ පුරුෂතෙමේ අන්සතු වස්තුව පැහැර ගන්නෙකු නොවේයයි නිදහස්කර අත්හරින්නේය එසේම පරදර සේවනයෙන් වෙන්ව වසන්නාවූ මනුෂ්‍යයෙක් අසවල්තැන මොහු විසින් පරදර කම්යක්කළේයයි රාජසභාවට පැමිණෙවි කල්හිත් ඔහුගේ සභාව බලා ඔහුට දඬුවම්නොකරන්නේය මෙතෙම බොරු කියේයයි අල්වා රාජ සභාවට පැමිණෙවි කල්හිත් රජුන් විසින් පරීක්ෂාකොට ඔහු දඬුවමෙන් නිදහස්කරණුලබන්නේය එසේම මේ පුරුෂතෙමේ රහමෙර පානයකොට රාජ මාර්ගයෙහි කොලහල කළේයයි අල්වාගෙණගොස් රජුන්ට දැක්වූ කල්හිත් ඔහුගේ ගති පරීක්ෂාකොට රජුන් විසින් නිදහස්කර හරිණුලබන්නේයි.

මේසේ මේ පඤ්චශීලය රක්ෂාකරන්නාවූ උපාසකයාහට ඉහාත්ම යෙහිම අනුසස් පසක් ලැබෙන්නේනි පරලෝවිහි ලැබියයුතු විපාකය කියනුකිම? මේ අර්ථය අඞ්ගුත්තරනිකාය පඤ්චක නිපාතයෙහි උපා සක වග්ගයෙහි අටවැනි රාජ සූත්‍රයෙන් සංග්‍රහකරණලදී.

ත්වද මේ පඤ්චශීලයෙහි ශික්ෂාපද පසමහෝ සතරක්හෝ තු ණක්හෝ දෙකක්හෝ එකක්හෝ නොකඩව රක්ෂාකරන්නාවූ යම් මනුෂ්‍යයෙක්වනම් අසවල්තැනැත්තා මේමේ පව්වලුරුව වසන්නේ යයි දූනගත් රාජරාජ මහාමාත්‍යාදිහුද පණිත මනුෂ්‍යයෝද ඒ මනු ෂ්‍යයා සමඟ මිත්‍රසම්පවය පවත්වන්නාහුය එසේම නොයෙක් සභාවලදී අසවල් මනුෂ්‍යතෙමේ මේමේ පාපයෙන් වැළකී වසන් නේයයි සතුති ප්‍රසංසාකරන්නාහුය එපරිද්දෙන්ම රාජාණ්ඩුව විසින් ගම්මුදලි තනතුරු ආදිය දිමෙහිදී එබදු මිනිසුන්ව ඉතා කැමැත් තෙන්ම ගම්මුදලි තනතුරු ආදි ප්‍රධාන තනතුරුදී වැටුප් පවා දෙන්නාහුය මේ ආදි අනුසස් ඉහාත්මභාවයෙහි ලබන්නේයි එබදු

සිල්වත් මනුෂ්‍යයෙක් රාජාපරාධයකට අසුවීමෙන් දඬුවම්ලබන්නේ විනාශ ඒ දඬුවම පූර්ව ජාතියෙහි කළාවූ අකුශල කර්මශක්තියකින් හෝ ඉහාත්මයෙහි පාපමිත්‍ර සංසර්ගයෙන්හෝ ලබන්නේවෙයි.

අෂ්ටාංගශීල දසශීලයන් රක්ෂාකරන්නාහට ඉහාත්මයෙහි ලැබෙන්නාවූ විපාකයෝ මතු දක්වන ක්‍රමයෙන් දතයුත්තාහුයි. අභිසමාචාරිකවත්ත් ශික්ෂාපදය බොහෝසෙයින් සමාදන්වන්නාහට ඒ ශීලය නොරක්නාකාලයෙහිත් අබ්‍රහ්මචර්‍යා ශික්ෂාපදය හාත්පසින් නොරක්නාවුන්ටමෙන් මාගම්හු නිසාහෝ මාගම්හුට පුරුෂයන් නිසාහෝ පැමිණෙන්නාවූ නොයෙක් දුක් කම්කටුළු නැත්තේයි අබ්‍රහ්මචර්‍යාව නොරක්නා කල්හිද ප්‍රසන්නවූ සිත් ඇතිව වාසය කරන්නේයි විකාලභෝජන ශික්ෂාපදය බොහෝසේ රක්ෂාකරන්නවුන්ට ඒ ශික්ෂාපදය නොරක්නා කල්හිත් ඒ ශික්ෂාපදය හාත්පසින් නොරක්නාවුන්ටමෙන් ආහාරපාන කෘත්‍යාදියනිසා ඇතිවන්නාවූ පළිබොධ දුක් කම්කටුළු නැතිබැවින් සන්හුන් සිත් ඇතිව වාසයකරන්නේයි. නච්චගීතවාදිත විසූකදස්සන ශික්ෂාපදය බොහෝයේ රක්නාවුන්ට ඒ ශික්ෂාපදය නොරක්නා කල්හිත් නැටුම් ගැහුම් හිනා කීම් ආදිය පවත්නා කල්හි ඒවිසුළු ආදිය දකිනු කැමැත්තෙන් ඇතිවන්නාවූ දුක් කම්කටුළුවලින් නොරව සැපසේ වාසයකරන්නේයි. මාලාගන්ධ විලේපන ධාරණමණ්ඩන විභූසන ඨානශික්ෂාපදය රක්නා පුරුද්ද ඇත්තවුන්ට ඒ ශික්ෂා පදය නොරක්නා කාලයෙහිත් මල්ගඳවිලවුන් දුරිමට උපදනා දුස්සීල චෙතනා තෘෂ්ණාවෝ නූපදනාහෙයින් සැපසේ දවස් යවන්නා හුය උච්චාසයන මහාසයනා වේරමණී ශික්ෂාපදය රක්ෂාකරන්නවුන්ට ඒ ශික්ෂා පදය නොරක්නා කල්හිත් යහපත් මාහැඟි සුව පහස් ඇත්තාවූ මාහැඟි ආසනාදියෙහි සැතපයකරණු කැමැත්තයයි කියනලද දුස්සීල චෙතනා තෘෂ්ණාවෝ නූපදනාබැවින් ආසනයනිසා ඇත්තාවූ පළිබොධ දුක් කම්කටුළු ආදියෙන් නොරව භූමියෙහිහෝ තණ ඇතිරි ආදියෙහිහෝ සයනයකළහැකිබැවින් සයනාශනය නිසා පැමිණියයුතු ආදීනව නොලැබෙන්නේයි. ජාතරූප රජත පටිග්ගහණ ශික්ෂාපදය රක්නාවුන්ට ඒ ශික්ෂාපදය නොරක්නා කල්හිත් රන්රිදී ආදියකෙරෙහි ආලය කිරීම් සඞ්ඛ්‍යාත දුස්සීල චෙතනා තෘෂ්ණාවෝ නූපදනාබැවින් ඒ ශික්ෂා පදය නොරක්නාවුන්ට ඇත්තාවූ පළිබොධාදියෙන් දුරුව චිත්ත ඒවෙකයෙන් දවස් යවන්නේයි. මෙසේ අෂ්ටාංගශීල දශශීලයන් පොහෝදිනහෝ අවකාශකාලයෙහිහෝ රක්ෂාකරන්නවුන්ට ඒ

සිල්නොරක්නාවුන්ට ප්‍රකෘතියෙන් ඇත්තාවූ මෛථුනසෙවනයෙහි ආශාවය හොජනයෙහි ආශාවය නැටුම් ගැහුම් ගිකීම් වීසුළුදැකීම් මල්ගඳවිලවුන් ආදියෙහි ආශාවය උසසුන්මහ අසුන්තෙරෙහි ආශාවය රන් රිදී මසු කහවණු කෙරෙහි ආශාවය යන මහානර්ථකරවූ සංසාරය දික්කිරීමට හෙතුවූ තෘෂ්ණා ප්‍රධාන අකුශල ධර්ම රාශියක් තුනිවීමෙන් ඉහාත්මභාවයෙහිම කායචිත්තවිවෙක සැපය ලබන්නේයයි දතයුතුයි. මෙසේ ලබන්නාවූ කායචිත්ත විවෙක සැපයහා පණ්ඩිත ජනයාගෙන්හා රාජරාජ මහාමාත්‍යාදීන්ගෙන් ලබන්නාවූ සතුති ප්‍රසංසාදියද ඉහාත්මයෙහි වන්නාවූ නොයෙක් රෝගාබාධාදියෙන් දුරුව දෙවියන්ගෙන් ලැබෙන්නාවූ ආරක්ෂාවද සතුරන් පවා රන්වූ යවටකට මැස්සන් ලංනොවන්නාක්මෙන් පහව යාමද ඒ ශීල සමාදාන කාලයෙහි උපදනා මහා කුශලචිත්ත වීථියෙහි ප්‍රථම ජවන සම්ප්‍රයුක්ත කුසල චෙතනාවන්ගේ විපාක චෙත්තම් අතිශයින්. බලවත්වූ සප්තම ජවන චෙතනා සම්ප්‍රයුක්ත කුසලකම් බලයෙන් අනතුරු ආත්මභාවයෙහි සුගතී ප්‍රතිසන්ධියහා අනෙක ප්‍රකාර උපභොග පරිභොග සම්පත්ත්‍යාන්ද ලැබීමෙහි කුමන සැකයක්ද? එකාන්තයෙන්ම පරලොව සුගතියට පැමිණෙන්නේයි. මේ ශීලය රැකීමෙන් ලබන්නාවූ ආනිසංසයන්ට විපරීතවශයෙන් සිල් නොරක්නාවුන්ට ලැබියයුතු ආදීනවයෝද දතයුත්තාහුය එසින් වදාළහ සිලවමථෙර ගාථා පාලියෙහි.

"ඉධෙව නින්දං ලහති පෙච්ච පායෙව දුම්මනෝ
සබ්බත්ථ දුම්මනෝ බාලෝ සීලෙසු අසමා හිතෝ.

ඉධෙව කිත්තිං ලහති පෙච්ච සග්ගෙච සුම්මනෝ
සබ්බත්ථ සුම්මනා ධීරෝ සීලෙසු සුසමා හිතෝ"යි.

මෙහි භාවය පඤ්චශීල අෂ්ටාඞ්ගශීල දශශීලාදියෙහි නොපිහිටියාවූ හෙවත් සිල් නොරක්නාවූ රාග ද්වේෂ මොහ යන ත්‍රිවිධාග්නියෙන් නිතර ඇවිලෙමින් දන්නාවූ දුස්සීල පුද්ගලතෙමේ මේ ජාතියෙහිම පණ්ඩිත ශ්‍රමණබ්‍රාහ්මණයන්ගේ නින්දුවටහා රජුන්ගේ දඬුවම් විඳීමටද පැමිණෙන්නේයි. මරණින්මතු අනතුරු භවයෙහි නරකාදියෙහි ප්‍රේත අසුරකායයෙහි කියනලද සතර අපායේ ඉපිද නිරයපාලයන් විසින් කරණුලබන්නාවූ වධබන්ධනාදිය හෙතුකොටගෙණ නිරන්තරයෙන් දුඃඛවූ ඔතින්ස්‍රුකතව වාසයකරන්නේයි. එසේම යථොක්ත ශීලයෙහි පිහිටි ආර්‍යශ්‍රාවකතෙමේ ශීලයෙහි පිහිටීමෙන් ප්‍රත්‍යක්ෂ භවයෙහිත් අසවල් උපාසකතෙමේ ඉතා යහපත්ය යන කීර්ති

සොළොස් පඬිත ශ්‍රමණ බ්‍රාහ්මණ රාජරාජමාත්‍යාදීන්ගෙන් ලබමින් යශපත් සිතින්යුකතව දවස්යවා මරණින්මතු අනුලොම් ප්‍රතිලොම් වශයෙන් සත්මහල්පහයක යවමහලේපටන් උඩුමහල්තලය දක්වාද උඩුමහල්තලය පටන් යටමහල්තලය දක්වාද නැඟි බසිමින් සැපවිඳිනා රජකුමරුවෙකුමෙන් මනුෂ්‍ය චාතුම්මහාරාජික භාව තිංශ යාම තුෂිත නිම්මාණරති පරනිර්මිත වශවර්ති යන සපත කාම සඟයෙහි සැප විඳිනේයයි දනයුතුයි.

තවද ඇතැම් භවත්හු දශශීලය ශ්‍රවණ විසින් රැක්කයුතු ශීල යක් නොවේයයි මුඛාරූඪ වචනයක්ම කථාකරති විශුද්ධිමාර්ග ශීලනිද්දේශයෙහි "උපාසක උපාසිකානං නිච්චසීලවසෙන පඤ්ච සික්ඛාපදානි සාදිවා උසසාහෙ දස උපොසථඞ්ගවසෙන අට්ඨාති ඉදං ගහට්ඨසීලං නාම" යනු ආබැවින් උපාසක උපාසිකාවන් විසින් නිත්‍යශීල වශයෙන් පඤ්චශික්ෂා පදයන්හෝ උත්සාහ ඇති කල්හි දශශික්ෂාපදයන්හෝ උපොසථාඞ්ග වශයෙන් අෂ්ටාඞ්ගශීලයහෝ රක්ෂා කටයුතුබව පෙණේ එසේම පරමාර්ථ මඤ්ජූසානම් විශුද්ධිමාර්ග ටීකා වෙහිද ප්‍රසථාන ප්‍රකරණ ප්‍රශ්නවාර අටුවායෙහිද මෙම අර්ථය විසතාරගෙසින් ආයේයි "සීලං සමාදියිත්වාති පඤ්චඞ දසඞාදිවසෙන නිච්චසීලං ගණ්හිත්වා" යනුද "උපොසථ කම්මං කත්වාති පාණං නහණෙඤ්ඤ නව දිනනමාදියෙනි එවං වුත්තං උපොසථ දිවසෙසු අට්ඨඞ්ගව උපොසථකිරියං කත්වා" යනුද වදාළබැවින් පඤ්චශීල දශශීල දෙකම උත්සාහ මදවූ ගෘහස්ථයන්ගේහා උත් සාහවත්වූ ගෘහස්ථයන්ගේද නිත්‍යශීලයන්බව පෙණේ ඉතිවුත්තක අටුවායෙහිහා ඞංයුත්ටිකාවෙහිද පඤ්චශීලය නිත්‍යශීල වශයෙන්ද අෂ්ටාඞශීලය උපොසථශීල වශයෙන්ද දශශීලය නියම ශීල වශ යෙන්ද රැක්කයුතු බව "සීලමයන්ති නිච්චසීල උපොසථ නියමාදි වසෙන පඤ්ච අට්ඨ දසඞ සීලානි සමාදියනතසස" යන්නෙන් දක් වනලදී සීලමය පුණ්‍යක්‍රියාවඞ යනු නිත්‍යශීල උපොසථශීල නියම ශීල වශයෙන් පඤ්චාඞ අෂ්ටාඞ දශාඞ සිලයන් සමාදන්විය යුත්තා හුය එසේ සමාදන්වන්නහුගේ සීලඞ ශීලයෙන් නිපන් පුණ්‍යක්‍රියා යයි කියනුලැබේ. සඞ්ගාරවගී සංයුත්තකයෙහි ආ සඞ්ඝ සංයුත්තක යෙහි පයවෙනි සූත්‍ර ටීකායෙහි "නිච්චසීලවසෙන පඤ්චඞ නියම වසෙන දසඞ පිසදෙඞන කතිපයෙහි උපොසථ සීලවසෙන අට්ඨඞ පිනි දසෙසති" යනු කියනලදී නිත්‍යශීල වශයෙන් පඤ්චශික්ෂාපද කෙනෙකුගෙන් හා දිවසමාස පඤ්ච සංවත්සරයන් නියමකිරීම් වශ යෙන් නොහොත් මෙපමණ දවස් මෙපමණ පක්ෂ මෙපමණ මාස

මෙපමණ හව්රුදු නිරතුරු රක්ෂාකරම්හයි නියමකොටගෙණ දශ ශික්ෂාපදකෙනෙකුගෙන්ද සම්පූර්ණවන්නාහුය පිගබදය කරණකොට ගෙණ දෙදවසෙක තුන්දවසෙක යනාදීන් නියමනොකොට උපොසථ ශීල වශයෙන් අෂ්ටාංගයකින්ද සම්පූර්ණවූවාහුයයි දක්වන්නේයි.

අවශෙෂවූ විභඞ්ගඨකථා සංයුත්තඨකථා අඞ්ගුත්තරඨකථා ජාතකනිපාත මහාතුණ්ඩිල ජාතකඨකථා අසිතිනිපාත මහා හංස ජාතකඨකථා පරිසමහිදාමඟඨකථා බුබවංස පාලිඅඨකථා යනාදි පෙල අටුවාගෙහි මේ ශීලයන් මනුෂ්‍යයන් විසින් රක්ෂාක ටයුතුබව සාමාන්‍යයෙන් ආයේය. ඉන වුත්තාකඨකථා සංයුත්ටීකාවන්හි දසසීලය නියමශීල වශයෙන් ආයේයි. පඨමාඨකථා විශුඞ්මඟඨකථා පරමත්ථමඤ්ජුසා ටීකාවන්හි දසසීලය නිත්‍යශීල වශයෙන් ආයේයි. ශේද සාමණෙරයන්ට නිත්‍යශීල වශයෙන්ද ඇතම් ගෘහස්ථයන්ට නිත්‍යවශයෙන්හා ඇතම් ගෘහස්ථයන්ට නියම වශයෙන්ද ආයේයයි දතයුතුයි ඉතිවුත්තකඨකථා සංයුත්ටීකා විශුඞ්මාඛ්‍යාදියෙහි දශශීලය නිත්‍යශීලය නියමශීලයයි දෙයාකාරයකින් වදාළේද ඒඒ තැනට සුදුසු පරිද්දෙන් අර්ථගතයුත්තේයි. අපවිසින් මිට පූර්වයෙහි අති සංක්ෂිප්ත ක්‍රමයෙන් සඞ්ග්‍රහකොට මුද්‍රණයකරව නලද "ගෘහස්ථ ධර්මය" නම් ක්ෂුද්‍ර ප්‍රකරණයෙහි දශශීලයාගේ සාව ශෙෂ ක්‍රමය හෙවත් මෙයින් එක්තරා ක්‍රමයක්ම සඞ්ග්‍රහකොට ලිය නලදනුමුත් දශශීලයාගේ නිරවශෙෂ ක්‍රමය මේ ප්‍රකරණයෙන්ම දතයුතුයි.

පියුමතුරාතන් බුදුන් සමයෙහි වස් තුන්මස මුළුලෙලහි කසට රැඳු සළුදෙකක් හැඳ පෙරව දසසිල් රක්ෂාකොට වස් අන්තයෙහි මහා පවාරණ දවස්හි ගමට අවුත් සද්දවසක් මුළුලෙලහි මහදන්දී පියුම තුරාතන් බුදුන්ගේ ධර්මභාණ්ඩාගාරිකවූ සුමනසැමණේරයන්මෙන් මෙද බුදුකෙනෙකුට වලලහවෙමවාසි ප්‍රාර්ථනාකළාවූ මෙසමයෙහි ආනන්ද ස්ථවිරවූ සුමනනම් රාජකුමාරයාමෙන් දහසක් පුරුෂයන්හා සමග ඡ්‍යෂනම් බුදුන්ගේ හමුවෙහිදී කසට රැඳු වස්ත්‍ර හැඳ පෙරව දසසිල් රක්ෂාකළාවූ මෙසමයෙහි උරුවෙල කාශ්‍යප නදීකාශ්‍යප ගයාකාශ්‍ය පනම් මහා ශ්‍රාවකයෝවූ එසමයෙහි උපන් රාජකුමාරයන් තුන් දෙනාමෙන්ද කාලවශයෙන් නියමකොට දසසිල් රක්ෂාකළවුන් සඳහා ඉතිවුත්තකඨකථා සංයුත්ටීකාවන්හි දසසීලය නියමශීලයයි දක්වනලද්දේයි.

කසුප්බුදුන් සමයෙහි ඝටීකාරනම් කුම්භකාරයා හා රාජකුමාරි කාවන් සඳෙහුනාමෙන්ද අපබුදුන් සමයෙහි හත්ථකනම් උපාසකය හත්ථාලවකනම් උපාසකය යනාදීහු අනාගාමී ඵලප්‍රාප්තව මනුෂ්‍ය යන් අතුරෙහි ගෘහස්ථයන්මෙන් දවස්යවමින් ජීවිතානතාය දක්වා දසසිල් රක්ෂාකළබැව්න් ඔවුන් සඳහා ප්‍රස්ථානප්‍රකරණ අටුවා විශුද්ධි මාගී අටුවා මහාවිකාවන්හි දසසිලය නිත්‍ය ශීලයයි දක්වනලදි මෙ සමයෙහි ආනන්දස්ථවිරව උපන් සුමන රාජකුමාරයාණන්ගේ කථා ප්‍රවෘත්තිය අඟුත්තරටඨකථා නිදානවඟහ සංයුත්තනිකායටඨකථාවන්හිද උරුවේලකාශ්‍යපාදි තුන්බැයන්ගේ කථා ප්‍රවෘත්තිය ධම්මපදටඨ කථාවෙහිද ඝටීකාර කුම්භකාරයාගේ කථා ප්‍රවෘත්තිය මැදි පණස ඝටීකාර සූත්‍රපාලියේ හා භික්ඛුඩිමාගී මහාවිකාවෙහිද හත්ථක උපාසක යාගේ කථා ප්‍රවෘත්තිය තිකනිපාතර පාලියෙහි "අසිසිලං සිතඛවා නො" යනාදියෙහිලී අටුවායෙහිද ආඥේයි එම අටුවායෙහි "අසිසි ලනති දසවිධං සිලං තඤ්හි පඤ්චසීලං උපාදය අධිසිලන්ති වුච්චති" යන අර්ථ වණීනාවෙන් හත්ථක උපාසකයාගේ ශීලය දසසිලය බව දතයුතුයි හත්ථාලවක උපාසකයාගේ ප්‍රවෘත්තියහා එම උපාසක යාගේ ශ්‍රද්ධා ශීල හිරි ඔත්තප්ප බහුශ්‍රැත චාග ප්‍රඥ අලොභජිතා යන ආර්යවයී ධම් අවකින් සම්පුණීබව දෙශනාකර වදළාවූ "සිල වා භික්ඛවෙ හත්ථො ආලවකො" යනාදි අඨකථාර පාලියෙහි ශීල පදය වණීනාකරන්නාවූ අටුවායෙහි "සිලවානි පඤ්චසිල දස සීලෙන සිලවා" ඇත අර්ථ වණීනාවෙන් හැඟේ මේ දෙශනා අටුවා පාඨයන්ගෙන් හත්ථක උපාසකයා හා හත්ථාලවක උපාසකයාද ගිහිගුම්යෙහි දසසිල් රක්ෂාකළබව දතයුතුයි.

ඇතම් ගෘහස්ථ ප්‍රව්‍රජිත පණ්ඩිතයෝ සමහ්ට දසසිලය නොරැක් කහැකියයි කියති ඒ මතයද ආගම නොදැනීමෙන් ප්‍රකාශකරණ අනාතනොමතියක් බව හැඟේ සළායතන දේශයෙහි මාතුගාම සං යුත්තකයෙහි මාතුගාමයන්ගේ සුගති ගමනට හෙතුව ශ්‍රද්ධාවෙන් සම්පුණී බවය ලජ්ජාවෙන් සම්පුණී බවය ඔත්තාපපයෙන් සම්පුණී බවය සීලයෙන් සම්පුණී බවය ප්‍රඥාවෙන් සම්පුණී බවය යන පඤ්ච ධම්ය හා මාතුගාමයන්ගේ රූපබලය භොගබලය ඤාතිබලය පුත්‍ර බලය සිලබලය යන බල පඤ්චකයෙන් සම්පුණීබවය යන දෙතන් හිම ශීලය යනු පඤ්චශීලය දශශීලය යන දෙයාකාර සීලයයි අටුවා යෙහි අර්ථ වණීනාකර තිබේ "සීලසම්පත්ති සිලබලං පඤ්චසිල දස සීලානි අඛණ්ඩානි කත්වා රක්ඛනතස්ස සීලසම්පත්තියෙව සීලබලං නාමෙතානි" යනු සංයුත්තනිකායටඨකථා පාඨයි.

කසුප්බුදුන් දවස මෙසේමයෙහි ඛෙමාතම් භේහෙත්තොමෝ සම්
ණිතම් රජකුමාරිවද උතපලවණ්ණාතම් සථවිරිතොමෝ සමණගුත්තා
තම් රජකුමාරිවද පටාචාරතම් සථවිරිතොමෝ භික්ඛුණිතම් රජකු
මාරිවද කුණ්ඩලකෙසිතම් සථවිරිතොමෝ භික්ඛුදාසිතම් රජකුමාරි
වද කිසාගොතමී සථවිරිතොමෝ ධම්මාතම් රජකුමාරිවද ධම්මදින්නා
තම් සථවිරිතොමෝ සුධම්මාතම් රජකුමාරිවද ඒකාඛා උපාසිකාතො
මෝ සංඝදාසිතම් රජකුමාරිවද යනමේ රජකුමාරිකාවරු සත්දෙන
මනුෂ්‍යත්වයෙහි ඉපිද විසිදහසක් භවිරුදු ගෘහබන්ධනයෙහි නො
බැඳී ලදරුකාලයෙහි පටන් අඛණ්ඩ දැසිලය රකිමින් කෞමාර්
බ්‍රහ්මචර්‍යාව රක්ෂාකරමින් කසුප් බුදුන් ප්‍රමුඛවූ විසිදහසක් සංඝ
යාට සිව්පසයෙන් උපස්ථානකොට මහත් ඝුසල් රැස්කළතියාව
ථෙරිගාථා අට්ඨකථා අපදානට්ඨකථා අඟුත්තරට්ඨ කථාදියෙහි විස්තා
රවශයෙන් ආයේසි.

මෙව සිංහලව්පයෙහිද දෙවානම්පියතිස්ස මහ රජහුගේ මල් රජ
කුමරුන්ගේ භාර්‍යාවූ අනුලාදෙවීතොමෝ පන්සියයක් කුලස්ත්‍රීහුය
පන්සියයක් අමාත්‍ය භාර්‍යාවෝය යන දහසක් ස්ත්‍රීන්හා සමග
දසසිල් සමාදන්ව සසට රැඳූ වයහු හැද පෙරවගෙණ අනුරාධපුර
නගරයට නුදුරුතැනෙක ආශ්‍රමයෙක්හි වාසයනළ කථාප්‍රවෘත්තිය
පාරාජිකා අට්ඨවාගෙහි ආයේසි ඒඒ පාලි ප්‍රදේශයන් ග්‍රන්ථාරව භි
තියෙන් මෙහි ඇතුළත් නොකරණලදී. පාලිපාඨ ඉගෙණගණු කැ
මැත්තන්ට නිරායාසයෙන් සොයාගැණීමට පහසුවනපිණිස පොත්
නම් සඳහන්කරණලදී.

අභිධම්මී විහඞ්ග අට්ඨවාගෙහි පඤ්චශීල දශශීලයෝ උපාසකයන්
ගේහා උපාසිකාවන්ගේද සිලයෝයනි ප්‍රකාශකොට ඇත්තේහි හේ
කෙසේදයත්? "උපාසක සික්ඛානි උපාසකෙහි සික්ඛිතබ්බ සික්ඛාපදා
පඤ්චසිල දසසිල වසෙන වට්ටති" යනුහා "උපාසිකා සික්ඛානි උපා
සිකාහි සික්ඛිතබ්බ සික්ඛා සා පඤ්චසිල දසසිල වසෙන වට්ටති" ය
නුද ධ්‍යානවිභඞ්ග අට්ඨවාගෙහි ආයේසි.

තවද ඒ දශශීලාදිය රක්ෂාකරණ කල්හි ජීවිතාන්තය දක්වා
නොකඩව රක්ෂාකරණ ශීලය යමශීලව්‍රතයයිද දවස් පතා ආරාධිත
වශීදිය නියමකොට රක්ෂාකරණ ශීලය නියම ශීලව්‍රතයයිද අභිධා
නප්‍රදීපිකා ටීකාදියෙහි වර්ණනාකෙළේසි හේ මෙසේස.

"යංදෙහ සාධනා පෙකඛං නිච්චං කම්ම මයං යමෝ
ආගනත්තු සාධනං කම්ම මනිච්චං නියමෝ භවේ"

යනුහි—මෙහි භාවය යම් බ්‍රහ්මචර්‍යාවක් දිවිනිම්කොට ශරීරය

ඇතිනාක් රක්ෂාකෙරේද ඒ ශීලය යම්ශීලව්‍රත නම් යම් ව්‍රහ්මචර්‍යාවක්තොමෙව් දිවය පක්ෂාදීන් නියමකොට රක්ෂාකෙරේද ඒ ශීලය නි ඇම ශීල ව්‍රතනමවෙයි යනු අභිධානප්‍රදීපිකාසි

"යං පාණාතිපාතා වෙරමණී ආදිකං ව්‍රහ්මචරියකමම. නිච්චං සාවජ්ජමසස්සා දෙහසාධනාපෙක්ඛං සරීරේ නෙව සාධනමපෙක්ඛං අයං යමෙ නාම යං පනාහහත්තා සුත්තකපක්ඛාදිවසෙන අනිච්චං නියමිත කාලඵුප්පාසාදිකං අයං නියමෝ" යනු චතුරඞ්ගබල ටීකාසී මේ සව නියම ශීලය ශාසනික ග්‍රන්ථයෙහි ඒ නමින් නොමැතයේ නමුදු යටකී උදාහරණයන්ගෙන් පකරණානන්තර අධිකාර ලක්ෂණ යෙන් ලැබියයුතුනෙසින් අර්ථයෙන් ප්‍රකටව ශාසනයෙහිත් ඇත් තේමැති

දූශසීලය වනාහි නියම විෂයෙන් දිනකාල නියමයෙන් රක්ෂා කටයුතුනෙසින් රට රක්නා රජුන් විසින් රැකෙනයුතුවූ දශරාජ ධර්මයන් අතුරෙන් ශීලසඞ්ඛ්‍යාත රාජ ධර්මයෙහි පඤ්චශීල දශශීල යෝම ශීලනවැයි අශීති නිපාත මහා හංසජාතක අට්ඨවාසයෙහි "පඤ්ච සිල දසසිලාකිඤ්ඤං" යන්නෙන් පෙණේ. මේ ජාතක අට්ඨවා ඒවන මයන් පුරාතන රජදරුවෝ දිවස පක්ෂ මාසාදිය නියමකොට දස සීලයද කලින් කල රක්ෂාකළබව පෙණේ උපෝසථ ශීලය වනාහි පොහෝ දවසම නියමකොට රක්ෂාකරන්නාහුය එහෙයින්ම දශ රාජ ධර්මයන් අතුරෙහි "තපෝ" යන පදයෙන් පෙහෙවස් රක්ෂාකළ බව "උපොසථ කම්මං තපෝ" යන්නෙන් පෙණේ

මෙසේ වසන්තඍතු ආදියෙහි නියම විෂයෙන් දශශීලයද ඒ දශ ශීලය තොරක්නා කල්හි නිත්‍ය පඤ්චශීලය හා පොහෝ දිනයෙන් උපෝසථ ශීලයද රක්ෂාකිරීම පුරාතන රජුන්ගේ රාජධර්මයබව පෙණේ එහෙයින් පුර්වයෙහි ඔරණිස්නුවර රජකළ සංයමනම් රජ තෙමේ තමාකෙරෙහි දශරාජධර්ම නැමති කුශල ධර්මයන් පිහිටිබව මහාබොධිසත්ත්වයන් වූ ධෘතරාෂ්ට්‍රනම් හංසරාජයාහට ප්‍රකාශකොට කී බව අශීතිනිපාත මහා හංසජාතක පාලියෙහි භාග්‍යවත්හු විසින් ප්‍රකාශ කොට දෙශනාකොළ්සි හේ මෙසේසි

"දානං සීලං පරිච්චාගං, අජ්ජවං මද්දවං තපං
අක්කොධං අවිහිංසඤ්ච, ඛන්තිඤ්ච අවිරොධනං.

ඉච්චේවතෙ කුසලෙ ධම්මෙ, සිතෙ පසසාමි අත්තනි
තතෙතා මෙ ජායථෙ පිති, සොමනසඤ්චනප්පකං"

මේකී භාග්‍යය යහපත් ශ්‍රද්ධාවෙහතාව මුල්ව දසදුන විසුන් දන්

දීමය පන්සිල් දසසිල් රැකීමය දෙනලද දැනවැසුව තෘෂ්ණාවහැර දීමය සාප්‍රගාමය මෘදු මොළොක් බවය පෙනෙවස් රැකීමය සියළු සතුන්කෙරෙහි මෛත්‍රී වැඩීමය පරණට හිංසානොකිරීමය ඉවසීමය රටවාසින්හා විරුධනොවීමය යනමේ දශරාජධර්මයන් තමා කෙරෙහි විද්‍යමානබව දකිමි එහෙයින් මට අනල්පවූ ප්‍රීතියක්හා සොම්නසද උපදනේයි මේ ජාතකපාලියෙන්ද මෛත්‍රීභාවනයන් විසින් පඤ්චශීලය දශශීලය නිත්‍යවශයෙන් හා පොහෝදින අජ්ඨාඩග උපොසථශීලයද එකාන්තයෙන් රැකගතයුතුබවද යම් මනුෂ්‍යයෙක් මේ ශීලයන් නොරක්නේවීනම් හෙතෙම මනුෂ්‍ය ධර්මයෙන් තොරවූ නරධර්මයෙක් බවද පැහැදිලි වශයෙන් පෙණේ.

අපගේ ගෞතම සම්‍යක්සම්බුදු රජාණන්වහන්සේ සැවැත්නුවර දෙවරම වැඩවාසයකරණ සමයෙහි එක්තරා සිටුපුත්‍රයෙක්තෙමේ භික්ෂූන් කරා එළඹ සවාමීනි දුකින්මිදීමට කුමක් කටයුතුදැයි විචාරණුයේ ඒ භික්ෂූන්වහන්සේලා එහා උපාසකය දුකින් මිදෙනු කැමැත්තෙහිනම් ලහබත් පොහොසත් පසඟබත් වයසාවාසික සිවුරු ආදිය සිල්වත් ගුණවන් භික්ෂූ සංඝයාට පුදව විවර පිණ්ඩපාත සෙනාසන ගිලාණප්‍රත්‍යය යනා සිද්ධපසය පැදව ඇත්තාවූ ධනය තුන්කොටසක් කොට එක්තොටසකින් වෙළඳම් ආදි කටයුතුකරව එක්කොටසකින් අඹුදරුවන් පොෂ්‍යයකරව එක්කොටසක් ශාසනඋසහි විය දන්කරවයි භික්ෂූන්ගෙන්ලත් අවවාද පරිදි පිළිපැද නැවතත් ගොස් පෙරසේම විවාළේයි ඉක්බිති දෙවෙනිවාරයේහි සරණශීල පඤ්චශීලයන් රක්ෂාකරවයි අවවාදදුන් කල්හි ඒ ශීලගුණයෙහින් පිහිටා තුන්වෙනුවත් භික්ෂූන් විවාළේයි ස්වාමිනි දැන් ඉහින් කුමක් කටයුතුදැයි විචාරණුයේ දැසිල් රක්ෂාකරවයි අවවාදදුන් නේය ඉක්බිති ඒ අවවාද පරිදෙන් දසසිල් රක්ෂාකොට ඒ සිටුපුත්‍ර තෙමේ මහත් සෝසත් ලැබ නොබෝ කලකින් සිටුඟනතුරු ලත් බව ධම්මපදට්ඨකථා උග්ගාණ්ඩිත භික්ෂු වසතුවෙන් පෙණේ.

තවද භාග්‍යවතුන්වහන්සේ ධරමානකාලයෙහි ශිහිගෙයි වාසය කළාවූ බොහෝ මනුෂ්‍යයෝ පඤ්චශීලය නිත්‍යශීල වශයෙන්හා අෂ්ටාහශීලය පොහෝදිනයෙහිද දශශීලය විවෙක කාලවල දින නියම්වශයෙන්ද රක්ෂාකළ බව පෙණේ. එහෙයින් ශක්‍රදිව්‍යරාජ තෙමේ ඒ මනුෂ්‍යයන්හට ඇදිලිබැඳ නමස්කාරකොට මානලිනම් දිව්‍යපුත්‍රයාහට මේ ගාථාව කී බව සගාථාවග්ග සංයුත්තකයෙහි පස් ළැනිවූ සක්කසංයුත්ත සූත්‍රයෙහි පෙණේ ඒ මෙසේයි.

"යෙ ගහට්ඨා පුඤ්ඤකරා, සීලවන්තා උපාසකා
ධම්මේන දාරං පොසෙන්ති, තෙ නමස්සාමි මාතලී."

යනුයි මෙම සූත්‍ර අට්ඨවාසෙහි "සීලවන්තොනාම උපාසකත්තෙ පතිට්ඨාය පඤ්චහි දුස්සීල්‍යෙහි සීලෙනි සමන්නාගතා ධම්මේන දාරං පොසෙන්තීති උම්මග්ගෙ හිංසකාදීනි අනාචාර කසිවණිජාදීනි පහාය දාරං පොසෙන්තී" යන අට්ඨවාසෙහි සීලවන්තභාවය යනු පන්සිල් දුසැලිල් රක්ෂාකරමින් ගිහිගෙයි ගොවිතැන් වෙළඳාම් ගව පාලනාදියෙන් දූහැමින් සෙමින් අඹුදරුවන් පොෂ්‍යයකරන්නාවූ ගෙවල්බිඳීම් ආදිය නොකරන්නාවූ මනුෂ්‍යයන් බව පෙණේ. මේ ගෘහස්ථයන්ට දිවිහිමියන් තබා මාසෘක්වත් නිරන්තරයෙන් දස සිල් රක්ෂානොකටහැකි බව පෙණේ මේ ගෘහස්ථයෝ වනාහි නිත්‍ය පඤ්චශීලය රක්ෂාකරමින් ඒ අතරතුර දවසක් දෙකක් තුණක් සතරක් පසක් සයක් සතක්හෝ නියමකොට දැසිල් රක්ෂාකරණ ගෘහස්ථයන් බව නොහැඟෙන්නේකාවද? එසේහෙයින් මෙබඳු අඹු දරුවන් පොෂ්‍යයකරන්නාවූ ගෘහස්ථයන්ට දසසීලය නියම සීලය එන බව මේ අට්ඨවා පාඨයෙන්ම තේරුම්ගතයුතුයි.

"පඤ්චඞ්ග දසඞ්ග සීලං තාවසීලමෙව තංහි බුද්ධේ උප්පන්නෙ අනුප්පන්නෙනපි ලොකෙ පවත්තනගි උප්පන්නෙ බුද්ධෙ තස්මිං සීලෙ බුද්ධාපි සාවකාපි මහාජනං සමාදපෙන්ති අනුප්පන්නෙ බුද්ධෙ පච්චෙ කබුද්ධා ච තම්වවාදී ධම්මිකා සමණබ්‍රාහ්මණා ච විත්‍ථාවත්තී ච මහාරාජ මහාබොධිසත්තා ච සමාදපෙන්ති සාවම්පි පණ්ඩිතා සමණ බ්‍රාහ්මණා සමාදියන්ති" යනු සමන්තපාසාදිකා ග්‍රන්ථය අට්ඨවා පාඨයි.

මෙහි භාවය පඤ්චසීලයහා දසසීලයත් පළමුකොට සීලයම වෙයි ඒ සීලය වනාහි බුදුන් උපන් කල්හිත් නූපන් කල්හිත් ලොව පවත්නේය බුදුන් උපන් කල්හි ඒ ශීලයෙහි බුදුවරයෝද ශ්‍රාවක යෝද මහජනයා සමාදන්කරවන්නාහුය බුදුන් නූපන් කල්හි නොහොත් අබුබොත්පාදකාලයෙහි පසේබුදුවරයෝද කම්වාදී හෙවත් කම්යෙකහාඤ්ඤඇත්තාවූ ධාර්මික ශ්‍රමණබ්‍රාහ්මණයෝද චක්‍රවර්ති මහ රජවරුද මහාබොධිසත්වයෝද සමාදන්කරවත්මය පණ්ඩිත ශ්‍රමණබ්‍රාහ්මණයෝතුමූත් සමාදන්වෙති යනුහාවයි.

"දසපි වෙතානි සාමණෙරෙන භික්ඛුසන්තිකෙ සෝදිනනා නෙව සමාදිනනානි හොන්ති උපාසකෙන පන අසක්‍යනා සමාදියනෙනාපි සමාදිනනානි හොන්ති පරසන්තිකෙ සෝදියනෙනාපි එකජ්ඣං, සමාදිනනානිපි සමාදිනනානි හොන්ති පවෙණිකං සමාදිනනානිපි" යනු පරමාර්ථ ජෝතිකානම් සුත්‍රනිපාත අට්ඨවාසි.

මෙහි භාවය මේ දශශික්ෂා පදයෝ හෙරණ්ඩ ඔසිගේ භික්ෂුවක් සමී පයෙහි සමාදන්වනලද්දාහුම සමාදන්වවාහුවෙහි උපාසකයා විසින් වනාහි තමත් විසින් සමාදන්වත්නාහුද සමාදන්වනලද්දාහුවෙහි අනුන් සම්පයෙහි සමාදන්වත්නාහු; එකඩිට සමාදන්වත්නාහුද සමාදන්වනලද්දාහුවෙහි වෙනවෙනම සමාදන්වනලද්දාහුද සමා දන්වනලද්දාහුමවෙහි නොහොත් සාමණේර ප්‍රව්‍රජ්‍යාව ලබන කාල යෙහි උපසම්පදා භික්ෂුවක්හු විසින් දසවිධ ව්‍යඤ්ජන සම්පත්තියෙන් යුක්තව අනුනාසිකාක්ෂර වශයෙන්හා ඔකාරාක්ෂර වශයෙන්ද යන දෙපැකාරයෙන්ම දෙනලද්දාවූ සරණ ගමනය සාමණේරයාවිසිනුදු එසේම සමාදන්වනලද්දේනම් ඒ සරණය පිහිටීමෙන් දසසීලයහා සාමණේරයාට අයත් සම්පත්තියක් සංවරයෝම පිහිටනලද්දාහුය එසේදැවුවත් සිල්පද නොදන්නා ලදරුවෙක්වීනම් ශික්ෂාපද කිය වියයුත්තේය.

උපාසකයා විසින් ඒ දශශීලය තමා විසින් සමාදන්වනලද්දේද අනුන් ලහ සමාදන්වනලද්දේද "දසසික්ඛාපදානි සමාදියාමි" යනු වෙන් එකවිට සමාදන්වනලද්දේද එකෝක ශික්ෂාපදය වෙන්වශ යෙන් කියා සමාදන්වනලද්දේද සමාදන්වනලද්දේමවෙහි යනුහා වැයි.

"එවං හෙට්ඨිමකොටියා නිසරණගතෝ උපාසකොපි සෝතා පත්ති ඵල සච්ඡිකිරියාය පටිපන්නෝ නාම හොති තංඛණං දිට්ඨදත්ත මපි අසංඛ්‍යෙය්‍යං අප්පමෙය්‍යං, පඤ්චසීලේ පනට්ඨිතස්ස පන තතෝ උත්තරි, දසසීලේ තතෝ, තදහු පබ්බජිත සාමණේරස්ස තතෝ, උපසම්පන්න භික්ඛුනෝ තතෝ, උපසම්පන්නසෙසව වත්ත සම්පන්නස්ස තතෝ, ආරබ්භ විපස්සකස්ස තතෝ උත්තරි, උත්තම කොටියා පන ඉමෙහි සමඟි සෝතාපත්ති ඵල සච්ඡිකිරියාය පටිප න්නෝ නාම, එතස්ස දිට්ඨං තතෝ උත්තරි මහප්ඵල තරමේව" යනු වැදිපණස දක්ඛිණාවිභඞ්ග අටුවායි.

මෙහි භාවය මේ පුද්ගලික දානයෙහි වනාහි යටත් පිරිසෙසින් තිසරණගත උපාසකතෙමේත් සෝතාපත්ති ඵලය සාක්ෂාත්කිරීම පිණිස පිළිපන්නේනම්වේ ඒ තිසරණගතයාහට දෙනලද දානය අසංඛ්‍යෙය්‍ය අප්‍රමේය්‍ය අනුසස් ඇත්තේවෙයි පඤ්චශීලයෙහි පිහිටි ගෘහස්ථයාහට දෙනලද දානය ඊටත් වඩා මහත්ඵල වේයි දසසීල යෙහි පිහිටි ශීලවන්ත ගෘහස්ථයාහට දෙනලද දානය ඊටත් වඩා මහත්ඵලවෙයි එදවස් පැවිදිවූ තෙරණක්හට දෙනලද දානය ඊටත් වඩා මහත්ඵලවෙයි සාමාන්‍ය උපසපන් භික්ෂුවක්හට දෙනලද දාන ය ඊටත් වඩා මහත්ඵලවෙයි උපසම්පන්නවත් සමපූර්ණ භික්ෂු

වක්ඛ දෙනලද දානය ඊටත් වඩා මහත්ඵලවෙයි පවත්නා ලද බිදහිනා ඇත්තාවූ භික්ෂුවක්හට දෙනලද දානය ඊටත් වඩා මහත්ඵලවෙයි උත්තරාසඟට පරිවේෂ්ටිදෙන්නේ සෝවාන් ඵලය ප්‍රතාක්ෂකිරීමට පිළිපන්නාවූ ආයතිනමේ සියළු පෘථග්ජන ශ්‍රාවකසඟුන්ගෙන් උතුම් වෙයි මේ ආදීනවයට දෙනලද දානය යටකී සියළු ප්‍රතිග්‍රාහකයන් කෙරෙහි මහත්තොත් මහත්ඵල මහානිසංස ඇත්තේවෙති යනුහාවයි මේ අට්ඨවාපාඨයෙහි පඤ්චශීලය රක්ෂාකරණ ගෘහස්ථයා ඵදවස්පැවිදිවූ සාමණේරයාය යන දෙදෙනාහට මධ්‍යවර්තියිවූ දසසිල් රක්ෂාකරණ පුද්ගලයා කවරෙක්ද? මොහු උපාසකයෙක්ද? භික්ෂුවක්දැයි පරීක්ෂා කටයුතුය.

මෙසේ දක්වනලද ක්‍රමයෙන් ලොකයෙහි බොහෝසෙයින් පඤ්චශීලය නිත්‍යශීල වශයෙන්හා දසසීලය නියම ශීල වශයෙන්ද අෂ්ටාඞ්ගශීලය උපොසථ දිනය නියෑකොට රක්ෂාකරන්නාවූ ශීලය වශයෙන්ද බුඩොත්පාද අබුඩොත්පාද දෙක්හිම ව්‍යවහාරකළබව පෙණේ එසේම ඉඝකේ බහා සුදු දැසැති හැඳ පෙරවගත් උපාසක උපාසිකාවන්හා කසට රැඳු වස්ත්‍රයක්හැඳ එඬදු වස්ත්‍රයක් එකාංස නොව පොරවාගත් පරිබ්‍රාජක පරිබ්‍රාජිකාවරු මිසින්දැ සසීලය නිත්‍යශීලවශයෙන් රක්ෂාවවයුතුයි. අපව්සින් මින්පෙර දශශීලය නිත්‍යශීල වශයෙන් රැක්කයුතුයයි කියනලද්දේ ඔවුන් සදහාය වෙයෙසා අවබෝධ කටයුතුය.

සවහර ආවාසඞ්වරයෝ වනාහි පොහෝ දවසක් නොවන්නාවූ අවශෙෂ දවස්හි රක්ෂාකරණ අඤ්ඤාහ ශීලය උපොසථ ශීලයක් නොවන්නේයයිද සමහරු එබදුශීලය රක්ෂාකරන්නවුන්ට අනුසස් නැතැයිකියාද ප්‍රකාශකරන්නාහුය එසේදවුවත් ඒ මතය ඔවුන්ගේ වැරහිමි මාත්‍රයන්මුත් පෙළ අට්ඨාදියෙහි ආවාවූ අදහස් නොවෙති ඔවුන් මිසින් ඒට ගෙණහැරදක්වන්නාවූ උදාහරණයනාම් විශාඛ උපොසථ සූත්‍රාදියෙහි "චාතුද්දසිං පඤ්චදසිං යාවපක්ඛස්ස අට්ඨමිං" යනාදින් දක්වනලද බුඩතියඞ්ගයට විරුඬව රක්ෂාකරණහෙයිනැයි ප්‍රකාශකරති විශාඛිඋපාසථ සූත්‍රාදියෙහි තථාගතයන්වහන්සේ මිසින් පඤ්චයාගේ තුදුස්වක් පසළොස්වක් අවමක් දවස්හි පෙහෙවස් විසි යයුතුයයි වදාළේ බුඩ ප්‍රඥප්තියක්නොව ලොකයෙහි පැවති චාරිත්‍රයට අනුකූලවයි බුදුන් ලෝ පහළවෙන්නට මත්තෙන් තීර්ථකයන් මිසිනුදු කළඇදී ක්‍රියාවාදීවූ අබුඩොත්පාදයෙහි ලොව ඇතිවූ මහ බ්‍රාහ්මණාදීන්වහන්සේ ආදී ලාභාග්‍ර සත්වයන් විසිදුදු තුදුස්වක් පසළොස්වක් අවමක් දවස්හි පෙහෙවස් විසි චාරිත්‍ර වශයෙන්

පවත්වා නණ අවානුය බුඩඹියට පැමිණ වදලාසින් පසුත් නිර්දෙ
ෂවූ ඒ චාරිත්‍රයම ශාසනික උපාසක උපාසිකාවත් සඳහාද පණවා
වදලේසී එනකුදුවුවත් භික්ෂූන්ටමෙන් ප්‍රකෘති චාරිත්‍රයක්නොවේ. ම
හාජනකනම් රාජකුමාරය සංඛනම් බ්‍රාහ්මණය යනාදි අත්බැව්හි උ
පන් මනබෝසතාණෝ මහා සමුද්‍රයෙහි නැව් නැඟීනොස් නැවබිඳී
මහාසමුද්‍රයෙහි හුනු කල්හි අපාහෝදින නොවූ දවස්හිම මහා සමුද්‍ර
යෙහි පිහිනමින් අෂ්ටාඟශීලය සමාදන්ව රක්ෂාකළාහුය ඒ ශීලය
එක් දවසක්මනාට කීදවසක්ම අටසිල් රක්ෂාකළාහුය ඉදින් සමුද්‍ර
මණිමේඛලානම් දෙවිදු නොමෝ මහා සමුද්‍රයෙන් නොනත්තාහුවී
නම් මහාසමුද්‍රයෙහි දිවිනස්නාතුරුම අෂ්ටාඟශීලය රක්ෂාකරන්නාහු
මය පකිණ්ණක නිපාතයෙන් ආවාවූ පසළුවුපොසථ ජාතකයෙහි ජාති
මන්ත තාපසවූ මහබෝසතාණෝ ආදිවූ තිරස්චින සත්වයෝ සතර
දෙනාද සත පස්දෙන මානය උපන් කල මානයට දඩුවම් පිණිසද
රාග දෙස මොහ ලොභ මසිච්ඡාදි පාප ධර්මයන් උපනුපන් කෙණෙ
හි ඒඒ අකුශල ධර්මයන්ට දඩුවම් පිණිසද දින නියමය නොකොට
කෙලෙස් උපනුපන්කෙණෙහි ඒඒ කෙලෙසුන්ට දඩුවම් පිණිසද
උපෝසථ ශීලය රක්ෂාකළ නියාව එම ජාතක දෙශනාවෙහි ආයේ
සි නාදිය රජබිසෝතොමෝද පෙහෙවස් සමාදන්වසිටෙණ එක
එක දවස සතරදිගවාසිවූ ශ්‍රමණබ්‍රාහ්මණයන් රජවාසලට වැඩම
කරවා දානවසනු පිදුනියාව අඞ්ගුත්තර එකනිපාත අටුවායෙහි කා
ශ්‍යපවසනු වණිනාවෙහිද නිදානවගීයෙහි කාශ්‍යප සංයුත් අටුවායෙ
හිද ආයේයි. එහෙයින් මසකට සයවාරයක්හෝ අටවාරඅටක්හෝ පෙ
නෙවස් එසීම ලොකවාරිත්‍රයට අනුව දෙශනාකළේයයි දතයුතුයි.

මහාබෝධිසත්වවූ මහාජනක කුමාරය සංඛනම් බ්‍රාහ්මණය ජාති
මන්ත තාපසාදි පස්දෙනය නාදිය රජබිසවය යනාදි උත්තම
සත්වයන් විසින් රක්ෂාකරණලද අෂ්ටාඟශීලය දුෂ්ටධාර්මික සාම්ප
රායික අනර්ථඛ්‍ය ඵලවුබැවින් දින නියමයක් නැතුව යථාවකාශ
වශයෙන් රක්ෂාකරණලද අෂ්ටාඟශීලයහා පොහෝ දවස් නියම
යෙන් රක්ෂාකරණලද ශීලයද යන දෙකම විපාකදීමෙහි කිසි විශෙ
ෂයක් නැතිබව ඉගෙණගතයුතුයි.

නවද සපරියන්ත ශීලය හෙවත් පිරිසිදීමක් හෙවත් මකළඹරක්
ඇත්තාවූ ශීලය අපරියන්තශීලය හෙවත් පිරිසිදීමක් හෙවත් කෙළ
වරක් නැත්තාවූ ශීලයයිකියා දෙයාකාරවූ ශීලයක් ප්‍රතිසංයුක්ත මාගී
යෙහි ආයේයි ඔවුන් අතුරෙන් සපරියන්ත ශීලය වනාහි ශ්‍රාවකාපද
යන්හේ පිරිසිදීමක් ඇත්තාවූශීලය කාලවශයෙන් පිරිසිදීමක්

ඇත්තාවූ ගිලයයි දෙවැදෑරුම්වන්නේයි "එත්ථ වෙ පරියන්නා සික්ඛා පදපරියන්තොව කාලපරියන්තොව" යනු ප්‍රතිසම්භිදාවාගී අටුවාසී එහි ශික්ෂාපද පර්‍යන්ත ශීලය යනු ගිහිගෙයි වසන්නාවූ උපාසක උපාසිකාවන් විසින් තමතමන්ගේ ශක්ති පරිදෙන් මම ප්‍රාණඝාතයෙන් වළකිමි සිතාහෝ ප්‍රාණඝාත අදින්නාදාන දෙකින් වළකිමි සිතාහෝ ප්‍රාණඝාතඅදින්නාදාන කාමේ්‍යාචාර යන තුණින් වළකිමි සිතාහෝ ප්‍රාණඝාත අදින්නාදාන කාමේ්‍යාචාර මුසාවාද යන සතරින් වළකිමිසිතාහෝ ප්‍රාණඝාතාදි පස්පවින්ම වළකිමි සිතාහෝ අෂ්ටාඞ්ගශීලය රක්ෂාකෙරෙමි සිතාහෝ දශශීලය රක්ෂාකරම් සිතාහෝ රක්ෂාකරණලද ශීලය ශික්ෂාපද පර්‍යන්ත ශීලයනම්වේ එසේම ශික්ෂමාණ සාමණේර සාමණේරින් විසින් නිරන්තරයෙන් රක්ෂාකරන්නාවූ දශශීලයද ශික්ෂාපද පර්‍යන්ත ශීලනම්වේ එසින් කීහ ප්‍රතිසම්භිදාවාගී අටුවායෙහිම "කතමෙ සික්ඛාපද පරියන්තා උපාසකොපාසිකානං යථා සම්මදනව සෙන එකංවා වෙවා තීණිවා චත්තාරිවා පඤ්චවා අටඨවා දසවා සික්ඛාපදානි ගොතමි සික්ඛමාන සාමණේර සාමණේරිනං දස සික්ඛාපදානි අයං සික්ඛා පද පරියන්තා"යි

"කතමෙ කාලපරියන්තා උපාසකොපාසිකානං දානං දදමානා පරිභිසන පරියන්තං සීලං සමාදියන්ති පරිවෙණගතා පරිවෙණ පරියන්තං සීලං සමාදියන්ති විහාරගතා විහාරපරියන්තං සීලං සමාදියන්ති එකංවා වෙවා තයොවා භීයේ‍යාවා රත්තිං දිවාදි පරිච්ඡේදං කත්වා සීලං සමාදියන්ති අයං කාලපරියන්තා"යි

කාලපර්‍යන්ත ශීලය කවරයත්? ගිහිගෙයි වසන්නාවූ උපාසක උපාසිකාවන් විසින් දන්දෙනුලබන්නාහු දන් වළඳවා අවසන්වන තුරු සිල්සමාදන්වෙද්ද වෙහෙරට ගියාහුද පිරිවෙණට ගියාහුද ඒ විහාර පරිවෙණාදියෙහි වසනතාක්කල් අවසන්කොට සිල්රැක්කයුතුබවද ශික්ෂාපද එකක්හෝ දෙකක්හෝ තුණක්හෝ සතරක්හෝ පසක්හෝ තමනමන්ට හැකිපමණ ශික්ෂාපද සම්මදනවශයෙන් රැක්කයුතුබවද ක්ෂණයක් මුහුර්තයක් රෑයක් දවසක් අඩමසක් මසක් හවුරුද්දක්හෝ දිවි ඇතිතාක්හෝ රක්ෂාකටයුතුබවද හැගේ එහෙයින් ශික්ෂාපද එකක්හෝ දෙකක්හෝ ඉන් වැඩියක්හෝ රක්ෂාකළ පමණට අනුසස් ඇතිබවද කඩකළ පමණට අයුතු දෙස් ඇතිබවද දතයුත්තෙයි

මෙසේ එක් ශික්ෂාපදයක් ආදී වශයෙන් රක්ෂාකිරීම ගිහිගෙයි වසන්නාවූ ගෘහස්ථයන්ගේ පැදවගිලයෙහිමුත් අනික් ශීලයෙහ

නොපෙණේ. අෂ්ටාඞ්ග ශීලයෙහි වනාහි උපෝසථාඞ්ග අටකින්ම යුක්තවූ කල්හි උපෝසථශීලයවනබැවින් උපෝසථශීලයෙහි පැවැති ශීලයෙහිමෙන් අඞ්ග අඩුකිරීමෙන් රක්ෂාකිරීමෙක් නැත්තේයි දශ ශීලය යමනියම වශයෙන් රක්කයුතුබැවින්හා සාමණේර සාමණෙරින්හා සඞ්ගැබැවින්ද දශශීලය රක්නා කල්හි ගෘහස්ථයන් විසිනුදු සාමණේර සාමණෙරින් විසිනුදු එක් ශික්ෂාපදයකුදු නොකඩකොට රක්ෂාකටයුත්තේයි. එහෙයින් පැවැත්ශීලයෙහි වනාහි "එකංවා වෙවා තීණිවා චත්තාරි පඤ්චවා" යනුවෙන් වා ශබ්දයෙන් වෙන්වෙන්කොටද අෂ්ටාඞ්ගශීල දශශීලයෙහි "අට්ඨවා දස වා" යනුවෙන් වෙන්වෙන් නොකොටද අටුවායෙහි කියනලදී මෙයින් පඤ්චශීලය රක්නා ගෘහස්ථයාගේ යම්යම් ශික්ෂාපදයක් බිඳුනන්විත්ම ව්‍යතික්‍රමනය නොකළාවූ ශික්ෂාපදයන් රක්ෂාවන බවද අෂ්ටාඞ්ගශීල දශශීලයන්ගේ ශික්ෂාපද අටමනෝ දසයමහෝ එකට සඞ්ගැබ්කොට රක්ෂාකිරීමෙන්ම අෂ්ටාඞ්ග උපෝසථයහා දශශීලයද සම්පූර්ණවනබැවින් එක් ශික්ෂාපදයකුදු කඩවීමෙන් මසසු සතමහෝ නවයහෝ කුඛුරක බැඳි මියරෙහි යම්තැනක් බිඳියාමෙන් සියළු ජලය බැසයන්නාක්මෙන් එකවර ශික්ෂාපද අටදෙනාගේමහෝ දශදෙනාගේමහෝ භෙදයවන බව දතයුතුයි එසින් කීහ.

ප්‍රතිසම්භිදාමාගී ගණ්ඨි පදයෙහි "අට්ඨවා දසවාති එත්ථ එව උභතාඩිකභාගමවවනං උපොසථඞ්ගාදි නිබන්ධවසෙනෙව තෙසං පූරණ තබ්බතාතා සබ්බසාධාරණත්තාව යුත්තනං"යි අටහෝ දසයහෝ රක්කයුත්තේය යනමෙහි උභතාඩිකභාග (හෙවත් සතක් නවයක්හෝ නවයක්, එකොළොසක්නෝ) නොකීම හෙවත් අටුවාරිත් විසින් නොකියනලද්දේ ඒ ශීලයන්දෙදෙනාගේ අඞ්ග අටහෝ දශයහෝ එක සඞ්ගැයෙන් රැකිමෙන්ම ශීලනම්වනබැවින්ද ගෘහස්ථ සාමණේරයන්ට සාධාරණබැවින්ද ඒ ශීලදෙදෙනාගේ ශික්ෂාපදයන් "වා" ශබ්දයන්හෙන් වෙන්නොකිරීම උචිතයැයිසේයි "උපොසථඞ්ගාදි" යන්හෙහි ආදිශබ්දයෙන් නියමශීල නිත්‍යශීල බව ගතයුත්තේයි ඒ උපොසථශීලයහා දශශීලයත් නියමශීල නිත්‍යශීල වශයෙන් රක්ෂා කරණ කල්හි යම්යම් ශික්ෂාපදයක් බිඳිනියේවීනම් සංවරශීලය රක්ෂා කළබවට නොපැමිණෙන්නේයි එහෙයින් අෂ්ටාඞ්ග දශාඞ්ගශීලයන් විෂයෙහි අඞ්ගයන්ගේ අඩුවීමක්නැත්තේයි "න පන තෙසං අඞ්ග විකල්ල පූරණෙ සාවරණතාතං හොති" යනු ප්‍රතිසම්භිදාමාගී ගණ්ඨිපදයි. ඒ අෂ්ටාඞ්ග දශාඞ්ගශීලයන් ශික්ෂාපදාඞ්ගයන් අඩුකොට සම්පූර්ණ

කිරීමක් ඇති කල්හි සිලසංවරයන්ගේ පරිපූර්ණත්වය (හෙවත් සීලවි සුද්ධිය) නොවන්නේයි උපසම්පදා ශීලයෙහිද මෙම ක්‍රමයෙන් යතර පාරාජිකාපත්තීන් අතුරෙන් යම ශික්ෂාපදයක් කඩකළේවිනම් සංවරබව නොවන්නේයි.

පඤ්චශීලය නිත්‍යශීලවශයෙන් සියලුලන් විසින් රක්ෂා කටයුත් තේයි පුරුෂයාගෙන් වෙන්වහෝ භාර්‍යාවගෙන් වෙන්වහෝ පුරුෂ යාහෝ භාර්‍යාවහෝ ඇතුවහෝ පුරුෂ චිත්තය භාර්‍යා චිත්තය හැරදමාහෝ ශක්තී ඇතහොත් පඤ්චශීලයෙහි "කාමෙසුමිච්ඡාචා ර" ශික්ෂාපද ස්ථානයෙහි "අබ්‍රහ්මචරියා වෙරමණී" ශික්ෂාපදය බහා බ්‍රහ්මචරිය පඤ්චශීලය දිවිනිමියෙන්හෝ දිවස මාස සෘතු සංවත්සර පිරිසිදුහෝ රැක්කයුත්තේයි මේ බ්‍රහ්මචරිය පඤ්ච ශීලය රන්රුවන් මුතුවැණික් ආදි වස්තුවෙහි සවාමීව සිටගෙ ණුද රැක්කයුත්තේවී අප්‍රබුද්ධ ජීවමානව වැඩවසන සමයෙහි ගෝදර හෙරිසරක් ගම්බිම් ආදි වස්තුව ඇතුවම ජීවිතාන්තය මු ළුලලුනි බ්‍රහ්මචරිය පඤ්චශීලය රක්ෂාකරමින් ගිහිගයි සිටගණ දානවානාදි නොයෙක් කුශල ධර්මයන් රැස්කළ බව පුරුණ උපාසක යාගේ වස්තුවෙන්ද න කුලමාතා න කුලපිතා යන දෙදෙනාගේ න ථාවස්තුවෙන්ද උග්ගහනම ගෘහපතිදෙදෙනාගේ කථාවස්තුන්ගෙන් පෙණේ පුරුණ උපාසකයාගේ බ්‍රහ්මචරිය පඤ්චශීලය රක්ෂාකළපරිදි ඡ්ඣානඞ්ගුත්තර පාලියෙන්හා අට්ඨඞ්ගුත්තර පාළියෙහි ම්ගසාල සූත්‍ර යෙනුත් දතයුතුයි "පිතාමේ හදන්ත පුරුණෝ ද්විහම්වාරී අහෝසි ආරාවාරී විරතෝ මේථුනා ගාමධම්මා සොකාලං කත්වා භගව තා බ්‍යාකතෝ සකදාගාමිඵලත්තෝ තුසිතං කායං උපපන්නෝති" යනු ඡ්ඣානඞ්ගුත්තර පාලියි සැමිනි භාග්‍යවතුන්වහන්ස පුරුණ නම්වූ මාගේ පියාණෝ උතුම්වූ ශ්‍රේෂ්ඨ බ්‍රහ්මචර්‍යාව රක්ෂාකෙළේය මෛථුන සඞ්ඛ්‍යාත දුශ්චරිතයෙන් දුරුවූයේය ග්‍රාම්ය ධර්මය යන්ගේ චරිතයක්වූ මෛථුනයෙන් වැළකුනේය පුරුණත්වූ ඒ මාගේ පියාණෝ සකෘදාගාමී ඵලයට පැමිණියේය මෙසින් සැව තුසිතපුරයෙහි උපන්නේයයි තථාගතයන්වහන්සේ විසින් ප්‍රකා ශකර වදාරණලද්දේය යනු සූත්‍රාර්ථයි.

නකුලමාතා නකුලපිතා යන දෙදෙන අඛණ්ඩව සිටගෙණ දෙදෙනම ගිහි භූමියෙහ සොළොස්වර්‍ෂයක් බ්‍රහ්මචරිය පඤ්චශී ලය රක්ෂාකළනියාව එම ඡ්ඣානඞ්ගුත්තර පාලියෙන්ගෙණ සට දක් වනලද්දේයි උග්ගහනම ගෘහපතීන් දෙදෙනෙක්ම බ්‍රහ්මචරිය පඤ්ච ශීලය රක්ෂාකළ පරිදි අට්ඨඞ්ගුත්තරපාලියෙන් උධරණයකොට මෙම ප්‍රකරණයේ ප්‍රථමභාගයෙන් දක්වනලද්දේයි.

මෙම සිංහලවිපයෙනි යියඤ්ඤනම් මාණවකතෙමේ ගිහිගෙයි වෙසෙමින් බ්‍රහ්මචරිය පඤ්චශීලය රක්ෂාකරමින්ම මව්පියදෙදෙන පොෂ්‍ය කළ පරිදි සිහලවඤතුනම් ප්‍රකරණයෙහි ආයේසි උදයභද්‍ර රජුහා උදය භද්‍රානම් රජබිසවත් සත්සියයක් හව්රුදු ජාතියෙහි පවත් බ්‍රහ්මචරිය පඤ්චශීලය රක්ෂාකළ පරිදි ජාතක එකාදශනිපාතයෙහි ආයේසි දුකුල පාරිකාදිහුද එපරිදෙදන්ම කෞමාර බ්‍රහ්මචර්‍යාව ගිහිහුමියෙහිම රක්ෂාකළාහුය.

බුදුන්පාදකාලයෙහි සියළු බුදුවරයන් විසින් කාමසෙවනයෙන් දුරුව බඹසරවස් රක්ෂාකරත්වයි සියළු ගෘහස්ථයන්ටම ඛම්දෙශනාකරණුලබනබව සූත්‍රනිපාතාගත ධම්මිකසූත්‍රයෙහි "අබ්‍රහ්මචරියං පරිවජ්ජයෙය්‍ය" යනාදි ගාථාවෙන් ප්‍රකාශවේ එහෙයින් බුඩසාසනය පඤ්චශීලය බ්‍රහ්මචරිය පඤ්චශීලය බවහා දැන් ව්‍යවහාර පඤ්චශීලය උතුරුකුරු දිවස්න් වාසින්ගේ උත්පත්තියෙන්ම පුරුදුව එන්නාවූ ප්‍රකෘති ශීලය බවත් දතයුතුයි.

ඒ බ්‍රහ්මචරිය පඤ්චශීලයෙහි විකාලභොජන ශික්ෂාපදය බහා රන්රුවන් මුතුමැණික් ආදිය ඇතුවම ගිහිගෙයි වසමින් එක භක්තික අට්ඨකශීලය දිවිහිමියෙන්හෝ දිවස මාස පක්ෂ ඍතු සංවත්සරාදි කාලයන් නියමකරහෝ රක්ෂා කටයුත්තේයි අපබුදුන් ජීවමාන දවස රන්රුවන් මුතුමැණික් ආදී උපභොග පරිභොග සම්පත් ඇතුව ගිහිගෙයි වසමින් ජීවිතාන්තය මුළුලෙලහි බ්‍රහ්මචරිය පඤ්චශීලයෙහි විකාලභොජන ශික්ෂාපදය බහා එකභක්තික අට්ඨක ශීලය රක්ෂාකළනියාව ධාර්මික උපාසකයාගේහා නැඳුමාතානම් උපාසිකාවන්ගේද කථාවයතුන්හෙන් දතයුතුයි "අයං පන උපාසකෝ කිඤ්චාපි අනාගාමී පඤ්චයාව එකභත්තිකෝ" යන පරමාර්ථ ජෝතිකානම් අටුවාවෙන්හා වම්මිකසූත්‍ර අටුවාවෙන් නැඳුමාතා උපාසිකාවගේ එකභක්තික අට්ඨක ශීලයද දතයුතුයි ඒ මෙසේගි "උපාසිකායව අසමාදාභාවෝ පරිසුඩසීලාහොති නිච්චං විකාලභොජනා පටිවිරතා පිටකත්තයධාරිණී අනාගාමිඵලෙ පතිට්ඨිතා" යනුයි. මේ උපාසක උපාසිකාවෝ උපොසථදින පැමිණි කල්හි විශෙෂයෙන් අෂ්ටාඞ්ගශීලයද රක්ෂාකළාහුය.

මේ මහා භද්‍රකල්පයෙහි අපගේ ගෞතම බුදුරජාණන්වහන්සේට පෙරාතුව පහළව විසිදහසක් හව්රුදු දෙව්මිනිසුන්ට අනුශාසනා කළාවූ කසුප් බුදුන් දවස ගවෙසිනම් උපාසකෘතමේ පන්සියක්

උපාසකයන් විසින් පිරිවරණලදුව බ්‍රහ්මචරිය පඤ්චශීලය හා එක භත්තික අෂ්ටකශීලයන් රක්ෂාකළතියාව පඤ්චකඛුත්තාර පාලියෙහි වදරණලදී ඒ ශීලය රක්ෂාකළ පරිදි මෙසේ දතයුතුයි.

කසුප්බුදුරජාණන්වහන්සේ බුඩ්ඩයව පැමිණ ධම්දෙශනාකරවදරණ් කල්හි ගවෙසිනම් උපාසකතෙමේ පන්සියක් උපාසකයන්ට ප්‍රධානව සරණශීලයෙහි පිහිටා පඤ්ච ශික්ෂාපදයන් අතුරෙන් ඇතම් ශික්ෂාපදකෙනෙක් රක්ෂාකරන්නාහු ගවෙසිනම් මහා උපාසකතෙමේ මෙසේ කල්පනාකළේය මේ මාගේ පිරිවරවූ පන්සියක් උපාසකවරුද සම්පූණී පඤ්චසීලය නොරක්නාහුය මමද පඤ්ච ශීලය සම්පුණීනොකරන්නේමය මම වනාහි මාගේ පිරිවර උපාසකයන්ගෙන් ගිලාදි ගුණයෙන් අධිකවියයුතුයයි සිතා ඒ පන්සියයක් උපාසකයන් කරා එළඹ මෙසේ කිවාහුය පින්වත් උපාසකවරිනි තොපහා මමත් සම ශික්ෂා සම සිල් ඇත්තාහුය අදපටන් මම වනාහි පඤ්චශීලය සම්පුණීකොට රක්ෂාකරම්හයි කියේය ඉක්බිති අනවැසි පන්සියක් උපාසකවරු සිතන්නාහු අපගේ ආචාරීවූ ගවෙසී උපාසකයාණෝ පඤ්චශීලය රක්ෂාකරන්නේවිනම් අප පන්සියක්දෙනා විසිනුදු ඒ පඤ්චශීලය රක්ෂාකටයුතුයයි සාකච්ඡාකොටගෙණ ගවෙසිනම් මහා උපාසකයා කරා ගොස් ආචාරිනි අදපටන් අප පන්සියක්දෙනාද පඤ්චශීලය සම්පුණීකරණනියාව දැනගණුවයි කිවාහුය ඉක්බිති ගවෙසිනම් උපාසකතෙමේ මෙසේ සිතූහ මාගේ අතවැසිවූ පන්සියයක් උපාසකයන්හා සමශික්ෂා සම සිල් ඇතුව විසීම සුදුසුනොවෙයි එහෙයින් මාවිසින් මාගේ අතවැසි උපාසකයන්ට වඩා අධික ශීලයක් රක්ෂාකටයුතුයයි සිතා පන්සියක් උපාසකයන් කරාගොස් එඹා උපාසකවරිනි අදපටන් මම දෙවුන සෙවනයෙන් දුරුව බ්‍රහ්මචරිය පඤ්චශීලය රක්ෂාකරණනියාව දනුවයි කියා ග්‍රාමධම්යෙන් තොරව බ්‍රහ්මචරිය පඤ්චශීලය රක්ෂාකරන්නට පටන්ගත්හ ඉක්බිති අතවැසි පන්සියක් උපාසකවරුද ගවෙසිනම් මහා උපාසකයා කරා එළඹ ආචාරිනි නුඹවහන්සේව ඒ ශීලය රක්ෂාකටහැකිනම අප පන්සියක්දෙනාහට කෙසේනම නොහැකිවේද්ද එහෙයින් අදපටන් අප පන්සියක්දෙනාද බ්‍රහ්මචරිය පඤ්චශීලය රක්ෂාකරණනියාව දනුවයි කිවාහුය. ඉක්බිති ගවෙසිනම් මහා උපාසකතෙමේ බ්‍රහ්මචයෘවහා සමග විකාල භොජනයෙන්ද වෙන්ව එක භත්තික අට්ඨක ශීලය රක්ෂාකරන්නට පටන්ගත්හ ඉක්බිති අතවැසි පන්සියක් උපාසකවරුද විකාලභොජනයෙන් තොරව එකභත්තික අට්ඨකශීලය රක්ෂාකරන්නට පටන්

සන්තානාහුය ඉක්බිති ගවෙසිතාවී මහා උපාසකහෙමේ කසුප්බුදුන්ගේ සස්නෙහි පැවිදිව විදර්ශීනා වඩා නොබෝ කලකින් සියළු කෙලෙස් ගෙවා අර්හත් ඵලයට පැමිණීයේය ඊට අනතුරුව පන්සියක් උපාසකවරුද බුදු සස්නෙහි පැවිදිව විදසුන් වඩා රහත්වූහයි යන කථාප්‍රවෘත්තිය උදාහරණකොට අපගේ ගෞතම තථාගත සම්‍යක් සම්බුඩයන් වහන්සේ විසින් ආයුෂ්මත් ආනන්ද ස්ථවිරයන් වහන්සේට ධර්මදේශනාකරණලද්දේකි එසින් වදාළහ පඤ්චකඛ්ගුත්තරනිකාය ගවෙසී සූත්‍රයෙහි "තයමාතිහානන්ද එවං සික්ඛිතබ්බං උත්තරිං පණ්ඩිත පණ්ඩිතං වායම මානා අනුත්තරං විමුත්තිං සච්ඡිකරිස්සාමානි"යි.

එහෙයින් උපාසක උපාසිකාවන් විසින් තමතමන්ගේ ශක්‍යති ඇති පරිදෙන් පඤ්චශීලය හෝ රක්ෂාකොට ගැනීමට නොහැකිනම් එක් ශික්ෂාපදයක්හෝ දෙකක් තුණක් සතරක් පසක්හෝ බ්‍රහ්මචරියාව සමග බ්‍රහ්මචරිය පඤ්චශීලයවශයෙන්හෝ විකාලභොජන ශික්ෂාපදය බහා එකහත්තික ඡට්ඨක ශීලයහෝ අට්ඨාඩඟ සීලයහෝ දශශීලයහෝ රක්ෂාකටයුත්තේයි දශශීලය දිවස පක්ෂ මාස සෘතු සංවත්සරාදිය නියමකොට රන් රිදී මසු කහවණු ආදියෙහි මවිවිය ඇතුව යටකී මහාබොධිසත්වයන් වහන්සේ ආදි පුරාතන උත්තමයන්මෙන් හෝ කාලනියමයකොට රක්ෂා කවයුතුයි.

මේ දශශීලයෙහි ජාතරූප රජත පටිග්ගහණ ශික්ෂාපදය සඳහා නොයෙක් වාද විවාද ඇතිකුමුත් දෙශනා පාලි අර්ථ කථා ටීකා ග්‍රන්ථාන්තරයන් එකිනෙකට සමකොට උත්සාහයෙන් අර්ථ ගත යුත්තේයි ප්‍රතිපත්ති පිරිදෙහි අනන්‍ය සාධාරණවූ සර්වඥතාඥානය මුත් ශාරිපුත්‍රාදි මහා ශ්‍රාවකයන්ගේ ඤාණය පවා ප්‍රතිපත්ති පැණ. විමෙහි ප්‍රමාණ නොවනබව නුවණින් සලකා යම්යම් අයගේ අහනනොමනි ගරුකොට නොගෙණ ඒඒ ශික්ෂාපදයන්ගේ භාවාර්ථය සර්වඥතාඥානුකූලව අවබෝධකරගනු පිණිස උත්සාහ කට යුත්තේයි සර්වඥ වචනයන්ගේ භාවාර්ථය දීමෙහි අට්ඨකථාචාරීන් වහන්සේලාහා අටුවා වචනයේ භාවාර්ථය දීමෙහි ටීකා ගැටපදකාර යෝගීන්මුත් අනිකෙක් ප්‍රමාණනොවනබව සලකා බුඩවචනය නොවැරෙහෙනම් අටුවාවම බලා තේරුම්ගන්නාවද අටුවා වචනය නොගෙන රෙනම් ටීකාලිනාථී වණ්ණනා ගැටපදයන් නැවත නැවත බලා තේරුම්ගන්නාවද උත්සාහනොකොට ඒඒනන්හි උගත්අභිමානයෙන් වරදවා තේරුම්ගෙණ අනයව්‍යසනයට නොපැමිණියයුතුයි.

සාමණේරයන්මෙන් රත්රිදී මසු කහවනු ආලය හාත්පසින් සුන්කොට දශශීලය රක්ෂාකළහැකිවූවන් විසින් දසසිල් රක්ක යුතුයයි කියාද ඝටීකාර කුම්භකාරාදීන්මෙන් රන්රිදී මසු කහ වනු ව්‍යවහාරයෙන් තොරව ජීවිතාන්තය මුළුලෙලහි දසසිල් රක්ෂාකටහැකිවූවන් විසින් දසසිල් රක්කයුතුයයි කියාද මේ ජාත රූප රජත පටිග්‍රහණ ශික්ෂා පදයගැණ නොයෙක් මතාන්තර ඇත්තාහුය එතකුදුවුවත් සාමණේරවරුන්ට මේ දශශීලයෙහි ගෘහස්ථයන්ටමෙන් නිත්‍ය අනිත්‍ය සමනියම වශයෙන් ප්‍රභෙදයක් නැත්තේයි. සාමණේරවරු වනාහි ගෘහස්ථයන්ගේ නිත්‍ය පඤ්ච ශීලයමෙන් නිත්‍යශීල යෑ ශීලවශයෙන් එකාන්තයෙන් සාමණේරභාවය ඇතිතාක්කල් දශශීලය රක්ෂානොකොට නොඑසියහැක්කේයි එහෙයින් ගිහිගෙයි වසන ගෘහස්ථයන්ට සාමණේරවරු හාත්පසින්ම වෙනස්වූවාහුවෙත්මය ඇතම් ගෘහස්ථයෝ වනාහි ගිහිගෙයි ඇත්තාවූ රන්රුවන් මුතුමැණික් ආදි සියළු උපභොග පරිභොග වස්තූන්ගේ ආලය නසා භික්ෂූන්මෙන් දසශීලය රක්ෂාකරන්නාහුය එතකුදුවුවත් අනාගාමී ඇතින් පුද්ගලයන්මෙන් හාත්පසින්ම රන් රිදී මසු කහවණුකෙරෙහි ඇත්තාවූ ආලය දුරුනොකටහැක්කාහු වෙති මාගේ ගෘහස්ථකාලයෙහි මට මෙබඳු රන්රුවන් මුතුමැණික් අයිතිව තුබුනාහයි යන අතීත කාලය පිළිබඳව උපදනා ආලයෙන් හෝ මම අනාගතයෙහි ගෘහස්ථභූමියට පැමිණ මේ මේ ආකාර යෙන් රන්රුවන් සොයම්හයි හඤ්ඤාපනාහුවූ වස්තුවෙහි ආලය කෙළේද එපමණින් ශීලභෙදය නොවන්නේයි.

ඇතම් ගෘහස්ථයෙකු විසින් මේ රන්රුවන් ආදිය නුඹවහන්සේට වේවයි කියා ඉදිරිපිට තබා පුදනලද්දහෝ අසවල්තැන ඕස හතකින් නිබෙන රන්රුවන් නුඹවන්සේට වේවයි අනනිම්බයෙහි පුදනලද්දහෝ කයින්වත් වචනයෙන්වත් ප්‍රතික්ෂේපනොකොට සිතින් ඉවසනලද්දම ආගමාදනයකරණලද රන්රිදී මසු කහවණුනම්වේ උපාසකභාවයටහෝ ප්‍රව්‍රජ්‍යාවටහෝ පැමිණෙන්නට පුළුවන්භාගයෙහි තමන් සතුව තුබුනාවූ රන්රිදී ආදිය සිතින් කල්පනාකොට නොහොත් මා සතුනක මෙපමණ රන්රුවන් මිලමුදල් ඇතැයි මමකෙ හිකොට සතුටුවීම ආගමාදනයකිරීමෙක්නොවේ.

එසේන් කීහ. කංඛාවිතරණී රූපිය පටිග්ගහණ ශික්ෂාපද වණ්ණනා වෙහි ''උපනික්ඛිත්තං සාදියෙය්‍යාති ඉදං අය්‍යස්ස මහාතුනි එවං

සම්මුඛාවා අසුකසම්මං නාම ඨානෙ මම භිරඤ්ඤඤ්ච සුවණ්ණං තං තුය්හං හොතූති එවං පරම්මුඛා සිතං වා කෙවලං වාචාය හඤ්ඤ මුදාගණ්හා තුය්හනාති වත්වා පරිච්චත්තං යො කායවාචාහි අපවිකම්මිපත්වා විඤ්ඤත්ත අධිවාසෙය්‍ය අයං සාදියෙයය්‍යාති වුච්චති"සි.

මෙහි භාවය "උපනික්ඛිත්තං සාදියෙයය්‍ය" යන දෙශනා පදයේ භාවයනම් මේ රන්රුවන් මිලමුදල් ආදිය නුඹවහන්සේටවේවයි කියා අභිමුඛයෙහිහෝ අසවල්තැන අසවලා ලඟ මාසන්නක යම් රන්රුවන් මිල මුදලක් ඇත්තේවේද ඒ මිලමුදල්ආදිය නුඹවහන්සේට වේවාසි අසම්මුඛයෙහිහෝ තුබූ රන්රුවන් මිල මුදල් ආදිය හුදෙක් වචනයෙන්හෝ හස්තාමුද්‍රා සලකුණකින්හෝ නුඹවහන්සේට අයිති වේවයි කියා පරිත්‍යාගකරණලදද ඒ ම්ල මුදල යම් භික්ෂුවක්තෙමේ කයින්හෝ වචනයෙන්හෝ මට ඕනැනැතැයි ප්‍රතික්ෂෙප නොකොට සිටින් ඉවසන්තේවේද මෙසේ මිල මුදල් ප්‍රතික්ෂෙපනොකොට ඉව සන්කාවූ මහණතෙමේ රන්රුවන් මිල මුදල් ඉවසන්නේයයි කිය නුලැබේ ලොකයා අතුරෙහිද ගෘහස්ථ මනුෂ්‍යයෝත් යමෙකු විසින් මිලමුදලක් දුන්නේනම් කයින් වචනයෙන් ප්‍රතික්ෂෙපනොකොට ඉවසිම පිළිගැන්මයයි ව්‍යවහාරවේද එබදු මිල මුදලක් යමෙක් දුන් කල්හි වහාම ඒ මිල මුදල් සඹඳවූ තෘෂ්ණාවක් ඉපිද ඉව සන්නේමය නුමුත් ඊට පෙර තමන්ට අයිතිව තුබුනාවූ රන් රුවන් ආදියගැණ එබදු තෘෂ්ණාවකුත් නුපදනේය ඉවසිමකුත් නොවන්නේස එබැවින් ඒ දසසිල් සමාදන්ව රක්‍ෂාකරණ අතර ලැබෙන්නාවූ රන්රුවන් මිල මුදල් ආදිය ඉවසිමම සීලභෙදයට හෙතුවන්නේයි ඊට පෙර තමන්ට අයිතිව තුබුනාවූ රන්රුවන් මිල මුදල් ආදිය කල්පනාකිරිමහෝ ඒ වසතුව මා සන්තකයයි සිතීම හෝ සීලභෙදයට කාරණා නොවන්නේයි ඉදින් සිල් රක්‍ෂාකිරිමට පෙර රන්රුවන් මිල මුදල් අයිතිව තිබීමෙන් සීලභෙදයවියයුතු නම් අතීතයෙහි උරුවෙල කාශ්‍යපාදි තුන්බෑ ජටිලයෝය අතීත යෙහි රාජකුමාරව උපන් රාහුළකුමාරයාය සුමන රාජකුමාරව උපන් ආනන්දස්ථවිරය යනාදි ශ්‍රාවක බොධිසත්වවරයන්ට ඒඒ ජාති ෂයෙහි දසසිල් රක්‍ෂානොකවහැක්කාහුය දසසිල් රක්‍ෂාකරන්නාවූ උපාසක උපාසිකාවන්ටහෝ සාමණෙරයන්වහෝ ඒ සිල් රක්‍ෂා කරණකාලයෙහි රන්රුවන් මිල මුදල් ආදිය ලැබුනු කල්හි ඒ මිල මුදල් ගැණ ආශාවෙන් කයින්හෝ වචනයෙන්හෝ ප්‍රතික්ෂෙප නොකිරීමෙන්ම සීලභෙදයවන්නේයි අනින් නොඇල්වීම පමණක් ඒ ශික්‍ෂාපදය රක්‍ෂාකිරීමක් නොවනබව දතයුතුයි එබැවින් ජාත

රූප රජත ශික්ෂා පදය රක්නවුන් විසින් මිල මුදල් ආදියක් ලැබුනු කලහෝ ශික්ෂාපද විභාගය නොදත්තෙකු විසින් දුන් කලහෝ මේ මිලමුදල් අපට අයිති නැතැයි කැපනැතැයි කියයුත්තේයි.

එසින්කිහ. පාරාජිකවණ්ණනාවෙහි "සචෙ පන විඤ්ඤාත සාදියති ගණ්හිතුකාමොහොති කායෙනවා වාචායවා න සිදං කප්පතිති දට්ඨබ්බපති වට්ටති" යි. මේ අට්ඨවා පාඨයන්ගේ භාවාර්ථය පිඩුකොට ගත් කල්හි රන් රිදී මිල මුදල් ආදිය කය වචන දෙකින්මහෝ එකකින්හෝ ප්‍රතික්ෂෙප කිරීමෙන් ශීලභෙදය නොවනබව දක්වන්නේයි. පරාර්ථජනයන්ගේ රන්රිදී මිල මුදල් සම්බන්ධවැ හටගන්නා කැමැත්ත දුරුකරගැනීම අනාගාමී මාගියෙන්මුත් අනික් ක්‍රමය කින් ඉතා දුස්කරවන්නේයි එබැවින් සිතින් කැමැත්ත ඉපදවූ පමණින් ශීලභෙදය නොවනබවද මනොචාරය ආපත්තිකර නොවන බවද දතයුතු.

තමන් පිණිස යමෙකු විසින් පුදනලද රන්රිදී මිල මුදලක්හෝ නිමියෙක් තැත්තාවූ නිමියෙකු විසින් ආරක්ෂා නොකරණලද්දවූ වෘක්ෂමූල ආරණ්‍යාදියෙහි තුබූ යම්කිසි රන්රිදී මිල මුදලක්හෝ දැක ඒ මිල මුදල් ආදිය මා සන්තකයයි සිතුයේද තමා විසිනුත් නොගන්නාලද්දේනම් අනුන් ලවාත් නොගන්වනලද්දේනම් සීලභෙදයක් නොවන්නේයි ඒ මිල මුදල් ආදිය තමා විසින් ගන්නාලද්දේනම් හෝ අනුන් ලවා ගන්වනලද්දේනම් හෝ ශීලභෙදයවන්නේයි එයින් කිහ. කංඛාවිතරණී අට්ඨවාසෙයි "උග්ගහණෙය්‍යවාති අත්තනො අත්ථාය දිය්‍යමානංවා කප්පිය කතංවා නිපරිග්ගහිතං දිස්වා සයංවා ගහණහත්‍ථ උග්ගණ්හාපෙය්‍යවාති තදෙව අඤ්ඤං ගාහාපෙය්‍ය"යි මෙහි භාවය මේසේයි "උග්ගහණෙහත්‍ථවා"යනු තමාපිණිස යම්කිසි දායකයෙකු විසින් පරිත්‍යාගකරණලැබූ රන් රිදී ආදියහෝ අනුන් විසින් නොරක්නාලද යම්කිසි තැනක තුබූ මිල මුදලක්හෝ දැක තමා විසිනුත් අවුලාගන්නාලද්දේවීනම් අනුන් ලවාහෝ අවුල වාගන්නාලද්දේනම්හෝ ඒ වස්තුව නිස්සග්ගිය වෙයි හෙවත් නිරාලයව අත්හැර ඇවැත්මදසිමෙන් පිරිසිදුවියයුතුවූ පාවිත්තිනම් ඇවතක්වේ මහවත් ඒ වස්තුව සලාකුණුනොමහණ කසළගොඩට දමා ඔසා පවිනි ඇවත දේශනා කවියුතුය යනුහැඟිසි අසඟාමිකවූ රන්රුවන් ආදියක්දැක ඒ රන්රුවන් ආදිය තමාවිසින් ගන්නාලද්දේනම් හෝ අනුන් ලවා ගන්වනලද්දේනම් හෝ ශීලභෙදය වන්නේයයි දතයුතුයි මේ ශික්ෂාපදය දඟයිල් රක්නවුන්වද සාධාරණයි.

යම්කිසි දායකයෙකු විසින් බොහෝවූ රන්රුවන් මිල මුදල් ආදිය ගෙණවුත් පිදුයේවීනම් රන්රුවන් ආදි මිල මුදල් අපට කැපනොවන්නේයයි කීන්හෝ වචනයෙන්හෝ ඇහවිය යුත්තේයි ඉක්බිති ඒ දායකයා විසින් ඒ මිලමුදල් ආදිය ආරාමිකාදීන් අතටදීහෝ ඔහු අතේම තබාගෙණහෝ සඝාමිත්වහන්සේට යම් ප්‍රත්‍යයක් වුවමනාවූ කලක මේ මුදලින් ඒ ප්‍රත්‍යය පෙරළා ගතමැනවැයි පැරැණි තුබූ කල්හි ඒ මිල මුදල් මා පිණිස පිරිණමනලදුයි ඒ මිල මුදල්ගැණ සතුටුව ඉවසීම සීලභෙදයට හෙතු නොවන්නේයි එසින් කීහ. සංඝපාසාදිකා රාජ ශික්ඛාපද අට්ඨකථායෙහි "සචෙ පන භික්ඛුනි නවට්ඨතීනි පටික්ඛිත්තෙන කපියකාරකානංවා හත්ථෙ භවිස්සති මඤ්ඤවා මයාවා හත්ථෙ භවිස්සති කෙවලං තුමෙහ පච්චයෙ පරිභුඤ්ජථාති වට්ටති"යි මෙ අට්ඨවා පාඨයන්හේ භාවය විදුකරගත් කල්හි උපසම්පන්න භික්ෂූන්ට රන්රුවන් මිල මුදල් ආදිය සිතින් ඉවසා කායවාක්වාර දෙකින් ප්‍රතික්ෂෙපකරන්නේවීනම් සීලභෙදය නොවනබව ප්‍රකටවේ එබැවින් දසසිල් රක්නා උපාසක උපාසිකාවන් විසින් දසසිල් සමාදන්වීමෙන් පසු මිල මුදල් ආදිය පිළිගැණීමහෝ ඉවසීමහෝ නොකටයුතුය පුවෙසෙහි තෘන් සතුට ගේදෙර ඇතුවතුබූ රන්රිදී ආදිය ගැණ කලපනාකිර්මෙන්හෝ ඒ පෙර තුබූ දැතුවකෙරෙහි ආලය නිබිමෙන්හෝ සීලභෙදය නොවන්නේයි තමන්ගේ සන්තකින් ගේදෙර ඇත්තාවූ රන්රිදි මිල මුදල් ආදිය දසසිල් සමාදන්වූ පසු අතින් ඇල්වීමෙනහෝ ඒ සිල් රක්ෂාකරණ අතරතුරකාලයෙහි අඹුදරුවාදින් විසින් ගෙණවුත් දෙන මිලමුදල් ආදිය පිළිගැණීමෙන්හෝ ඒවා සිතින් ඉවසීමෙන්හෝ සීලභෙදය වන්නේයයි දතයුතුයි.

යම්කිසි භික්ෂුවක්හට යම් උපාසකයෙකු විසින් රන්රිදී මිල මුදල් කහවණු සියගණන් දහස්ගණන්හෝ ගෙණවුත් පාමුලතබා මේ මිල මුදල් ගුබවහන්සේට අයතිවේවයි කියා පූදන්නේවේද එකල්හි භික්ෂුව විසින් මේමිල මුදල් භික්ෂූන්ට අකැපයයි කියා ප්‍රතික්ෂෙප කරයුතුයි ඉක්බිති උපාසකතෙමේ සඝාමිනි මේ වැකුව මාවිසින් ගුබව හන්සේට පූදනලද්දේය නැවත මාවිසින් ඒ වසතුව නොගතයුත්තේයයි කියා ඒ වසතුව භික්ෂුවගේ පාමුල තබා ඔහු නික්මයන්නේවේද ඉක්බිති අනික් ගෘහසථ උපාසකයෙක් එතනට අවුත් සඝාමිනි මේ මිලමුදල් කාගේදැයි විචාල කල්හි ඒ මුදල් පිදූ උපාසකයා විසින් කියනලද වචනයහා තමන් විසින් කියනලද වචනයන් කී කල්හි ඉක්බිති ඒ උපාසකතෙමේ සඝාමිනි එසවිනම් මේ වැකුව මාවිසින්

ගොපනයකර තැබියයුත්තේය'නුබවහන්සේවිසින් ආරක්ෂා සථාන
යක් පෙන්වාදියයුත්තේයයි කියන්නේවේද ඉක්බිති ඒ භික්ෂුව සු
මහල්පායෙක මුදුන්මාලයට නැගිහෝ වෙන සුදුසු රක්ෂාසථානයක්
හෝ පෙන්වාදී උපාසකය මේ සථානය සොරුන්විසින් නොවැද්දයු
තු රක්ෂාසථානයයි කි කල්හි ඒ උපාසකතෙමේ ඒ දැසතුව එහි තැබූ
කල්හි භික්ෂූන්වහන්සේවිසින් දෙරගුළු හෙළා ආරක්ෂා කටයුත්තේ
යි මෙසේ නොකොට මේ පෙට්ටිපියලි අල්මාරි ආදියේ තබවයි නො
කියයුත්තේය ඊට පසු යම්කිසි පිරිකර වෙලෙන්දෙක් සිවුරු කුඩ ව
හන් ආදී තමන්ව වුවමනා යම් කැප දිරික් මුදලට විකිණිම්ම පිණිස
විහාරයට ගෙණ ආ කල්හි උපාසකය මේ පාසිවුරු ආදිය මට වුවම
නාය මෙබඳු අකැප අනාමාස වස්තුවක් හෙවත් මිලමුදලක් එක්තරා
උපාසකයෙකු විසින් ගෙණඑනලදුව මෙසේ තබා ඇත්තේය එත
කුදුවුවත් අපගේ කැපකරුවෝ නැතැයි කියයුත්තේයි ඉක්බිති ඒ
පාසිවුරු විකිණීමට ගෙණ ආ පුරුෂයාම සවාමිනි මම අදපටන් නුඹ
වහන්සේගේ කැපකරුවෙක්බව දැන වදුරවයි පැවරූයේනම් පෙර
මුදල් නැබූ ගබඩාවට ඔහු සමඟයොස් මේ සථානයෙහි තබනවා
දුටුයෙම්යි කියයුත්තේයි එසේ නොකියා මේ මුදලින් මෙපමණ
ගණුවයි නොකියයුත්තේයි ඉක්බිති ඒ පාසිවුරු ගෙණ ආ පුරුෂයා
විසින් ඒ මුදලින් වටිනා පමණ මුදල්ගෙණ පාසිවුරු තමන්ට දෙන
ලද්දේනම් ඒ පාසිවුරු ආදිය කැපසරුප්වන්නේයි. ඉදින් ඒ පුරුෂ
යාතමේ පරිස්කාරය අගනා මිලයට අධිකවූ මුදල් ගන්නේවිනම් ග
ණන්නිලව් නොකියා තොපගේ පරිස්කාරයෙන් මට ප්‍රයෝජන
නැත තොප කෙනෙහින් පහවෙවයි කියා දෙරගුළුහෙළා තැබිය
යුත්තේයි.

මෙසේ මිලමුදල් සඹඳ ගණුදෙනුආදිය කැපකරුවන් නැතුව්ම
විනයධර භික්ෂූන්ට සිඛාකරගතහැකිවන්නේයි. හෙරණුන් විසිනුදු
දසසිල් උපාසකයා විසිනුදු මේ නසින්ම අකැපවස්තුයෙහි පිළිපැදිය
යුත්තේයි දසසිල් උපාසකයාවිසින් නිරවද්‍යවූ කැප පරිභොගයෙන්
සිවුපසය පරිභොගකරන්නාක්මෙන් අනුන්විසින් යම් මිල මුදලක්
ආරක්ෂාකරදෙවයිකියාහෝ තමන්ගේ අඹුදරුවන් සතු මිලමුදල්ක්
ආරක්ෂාකරදෙවයිකියාහෝ පාවාදෙනලද්දේවිනම් ඒ දැසතුව ශක්ති
ඇතහොත් ආරක්ෂාකොටදියයුත්තේයි. අනුන්ගේහෝ අඹුදරුවන්
ගේහෝ මිලමුදල් පමණක්නොව ඒ දසසිල් රක්ෂාකරණ කාලය
මුළුල්ලෙහි යම්කිසිවෙක් මිලමුදලක් ගෙණවුත් තමාගේ පාමුල තබා
මේ තොපටවේවයි කීයේනම් මිලමුදල් අපව කැපනැතැයි දැනිසා

පකොවත් ඔහු මිලමුදල් දමානියේකම් ඒ මිලමුදල් ආදියද ආරක්ෂා සථානයක තබා හොපනය කටයුත්තේයි. එසෙම යමෙකුගේ රන් රිදි ආභරණ මිලමුදල් ආදිය සිහිමුලාවීමෙන් විහාරයෙහිහෝ තමා අභිමුඛයේහෝ දමාගියේනම් ඒ මිල මුදල් ආදියද විනාශනොවන පරිදි ආරක්ෂාකොට දියයුත්තේයි. දැසිල් උපාසකයන්ව අනාරිය දුස්සීලතාපතතියක් නැතිනුමුත් අතින් නොඇල්වියයුත්තේයි පෙර කී නයින් යම්කිසි කැප වැඩකුවක් ආරාමයට ගෙණ ආකල්හි පෙර කී කපපිය විචාරණයෙන් ලබාගත් පරිස්කාරාදියම කැපවන්නේ මැයි. මෙහි පාලිපාඨය ඉතා විසතාරකැවින් මෙහි නොදක්වනලද නුමුත් පාලිපාඨය දැනගණු කැමැත්තවුන් විසින් සමනතපාසාදිකා චිනය අටුවාව බලා තේරුම්ගතයුතුයි.

මෙසේ අභිමුඛයෙහි යමෙකුවිසින් ගෙණවුත් තබනලද රන්රිදී මිල මුදල් ආදිය කයින්හෝ වචනයෙන්හෝ ප්‍රතික්ෂෙපකොට යටකී ක්‍රමයෙන් ලබනලැදද කපපිය විචාරණ විධියෙන් පෙරළා සපයාගත් කපපිය පරිස්කාරාදියද එකානතයෙන් කැපසරුප් බව චිනය පෙල අටුවාදියෙහි ආයේය කපපිය විචාරණ විධිය මනාසේ දැන අකැපවූ කායවාක් ප්‍රයොගයෙන් තොරව පිළිපැදිය යුතුයි.

දශශීලය සමාදන්වනු කැමති උපාසක උපාසිකාවන් විසින් ත මන්ගේ ශරීරයෙහි පැලඳි මුදු වලළු මාල ඔර්ලෝසු මේස් සපත්තු ආදියහා රන්රිදී තඹ මුදල් පටන් යටත්පිරිසෙයින් මුදල්වෙනුවට ව්‍යවහාරයට පැමිණි නෝට්ටු මුදල් ඔප්පුමුද්‍ර ලිඝුමිමුද්‍ර ආදියද සුදුස් සන්ව පාවාදී ඉස්සෝදෑ කසාකල්කය ඇඟඵලා නහා ගිහි ඇඳ දුරු කොට සුදු චසත්‍රයක් හැඳ සුදු වසත්‍රයක් එකාංශකොට පොරවා දශ ශීල ලක්ෂණ දන්නා උපාසකයෙක්හෝ භික්ෂුයාම්ණෙරතැනක්හෝ කරා පැමිණ උත්කුටිකයෙන්නිඳ සිරින් පරිදි යාඤ්ඤකොට සරණශීල යපටන් දශශික්ෂා පදය සමාදන්වියයුත්තේයි මෙසේ දැසිල් සමා දන්වූ උපාසකයා විසින් එතැන් පටන් රන්රිදී මසුඇඟවණු හෝ කළ ගොකළාවූ රන්රුවන් ආභරණාදියහෝ යමෙකු විසින් දෙනලදැනුමුත් කයින් වචනයෙන් නොඉවසා අඹුදරුවන්ට පාවා දුන් රන්රුවන් ආදිය කෙරෙහිත් තෘෂ්ණානොඇඇකොට තමන්ට පළමුව අයිතිව තුබූ රන්රුවන් මුතුමැණික් ආදිය කලපනාකොට මා සතු මෙපමණ රන්රුවන් මිලමුදල් ආදිය ඇතැයි සිතූප මණින්හෝ ඒ වසතුවකෙරෙහි ආලය නොසිඳීමෙන්හෝ දශශීලය නොබිඳෙන්නේයි.

වර්තමානකාලයෙහි සියළු නිකායවල මහණුන්නාන්සේලාටම

රත්රුවන් මිලමුදල් ආදිය තමා සතුවහෝ සඬ්ඝ සන්තකවහෝ ඇතුවම මිලමුදල් ආදි අකැප දෙයතුව පරිහරණයකරම්න්ම උපසම්පදා සාමණේර සිල් රක්ෂාකලහැකිවෙන්නම් ගිහිගෙයි වසන්නාවූ යම් උපාසක උපාසිකාකෙනෙක් මේ උතුම්වූ අධිශීලය දවසක්හෝ රාත්‍රි වැසිකාලයක්හෝ රක්ෂාකරම්හයි සිතා තමන් සතු මිලමුදල් රන් රිදි ආභරණාදිය අඹුදරුවන්ට පාවාදී දසසිල් සමාදන්ව ඒ සිල් රක්ෂාකරණ කාලයතුළ රන්රිදි මිලමුදල් ව්‍යවහාරයෙන් තොරව සිල් රක්නට නොහැකියයි කිම කෙසේ ගැළපෙන්නේදැයි කල්පනා කටයුතුයි.

ගිහිගෙයි වසන්නවුන් විසින් රන්රිදී මිලමුදල් ආදි ධනයට සිටිමිව සිටගණ සිල්රක්ෂාකරණ කාලයතුළ මිලමුදල් ව්‍යවහාරයෙන් තොරව දසසිල් නොරැක්කයුතුයයි ප්‍රකාශකරන්නාවූ හවතුන්ට ඒකාන්තයෙන් ඒ අර්ථය දෙශනා පාලි අර්ථ කථාදියකින් නොපෙන් විසහැකි බව නිශ්චිය කවයුතුයි. ආගම පිළිබඳවූ යම් ශික්ෂා පදයක් සඳහා පෙළ අටුවාදියකින් උදාහරණ නොපෙන්වා මුඛාරූඪ බස් කියන්නවුන්ට කන්යොමුකොට ඔවුන්ගේ වචන ඇදහිම ඉහළොක පරලොක දෙක්හිම පිරිහිමට කාරණයකි එබැවින් මේ දශශීලය ගැණ දෙශනා පාලි අර්ථකථාවන් නිදක්ෂනතොකොට මුඛාරූඪ බස් කියන්නවුන්ගේ වචන නොඇදහියයුත්තේයි. රන්රිදි මිලමුදල් ආදියෙහි ආශාව දුරුනොකොට දසසිල්නොරැක්කහැකිය යන සම්හරුන්ගේ මතය ධර්මයට එකඟනොවන්නේයි ආගම ධර්මයෙහි නියමය "ජාතරූප රජත පටිග්ගහණා වෙරමණී" යන මාත්‍රයක් බැවින් දසසිල් සමාදන්වූවන් විසින් රන්රිදි මසුකඟවත්‍ර පිළිගැණීමෙන් හෙවත් අන්‍රන් විසින් දෙනලද්දක්හෝ යම්කිසි තැනක අසවාමිකව තුබූ දෙයතුවක්හෝ කසින්හෝ දිවයෙන්හෝ පිළිගැණීමය සිතින් ඉවසීමය යන ත්‍රිවිධාකාරයෙන් වැළකීම මාත්‍රයක් මුත් පෙර තමන් සතුවතුබූ වසතුදකෙරෙහි පැවති ආශාව සිදීමක් ආගම ධර්මයෙහි නොදැරණුලද්දේමය ඉදින්දසතු ආශාව දුරුකවහැක්කේනම් ඒ ඉතා යහපත් ගුණධර්මයක්වෙයි ඒ ආශාව ඛාත්පසින් දුරුකිරීම අනාගාමී නොවූ කිසිවෙක්හටත් නොකළහැක්කැමැයි.

ඇතම් ගෘහස්ථ ප්‍රව්‍රජිතයෝ වනාහි "පඤ්චිමං පන සාමණේරානමෙව විසෙසභූතං" යන ඛුද්දක පාඨ අටුවා වචනය අටුවාචාරීන්ගේ අභිප්‍රායට පටහැණිව තමතමන්ගේ වැරදිම් පරිද්දෙන් ජාතරූප ප්‍රතිග්‍රහණ ශික්ෂාපදය හෙළණුන්ටම විශෙෂවූ ශික්ෂාපදයෙක

ගෘහස්ථයන්ට සාධාරණ ශික්ෂාපදයක් නොවෙයි කිහින්විසින් රැක් කයුතු ශික්ෂාපදයක් නොවෙයි කියනි එතකුදුවුවත් ඒ මතය ආගම යුක්තියට නොගැළපෙන්නේකි කුමක්හෙයිනයත්? අටුවාචා රීන් වහන්සේගේ අභිප්‍රාය නොවනහෙයින්ද සෙසු අර්ථකථාවන් හා ඉඳුරා විරුද්ධහෙයින්ද නොගැළපෙන්නේයි. අටුවාචාර්ය්‍යන්ගේ අභිප්‍රාය නොමවයි යනු කෙසේ දතයුත්තේදයත්? අටුවාචාරීන් වහන්සේ වනාහි මෙබඳු අදහසක් කල්පනා නොකෙළේය අටුවා චාරීන්ගේ අභිප්‍රාය වනාහි දශශික්ෂා පදයන් අතුරෙන් පළමුවන දෙවන සතරවන පස්වන ශික්ෂාපදයෝ සතරදෙන ගෘහස්ථ සාම ණේර යන උභය පක්ෂය විසින්ම නිරන්තරයෙන් නොකඩව රක්ෂා කටයුතු නිත්‍ය ශීලවශයෙන් සාධාරණවන්නාහුය සමානවන්නා හුය සත්වෙනි අටවෙනි ශික්ෂාපද යුගළය එක් අඞ්ගයක්කොට හෙ වත් දශශීලයෙහි "නච්ච ගීත වාදිත විසූකදස්සනා වෙරමණී—මා ලාගන්ධ විලේපන ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී" යන ශික්ෂා පදවය "නච්ච ගීත වාදිත විසූක දස්සන මාලා ගන්ධ විලේප න ධාරණ මණ්ඩන විභූසනට්ඨානා වෙරමණී" යනුවෙන් එක් ශික්ෂා පදයක්කොට අවශානයෙහි "ජාතරූප රජත පටිග්ගහණා වෙර මණී" යන ශික්ෂාපදයෙන් අන්‍යවූ ශික්ෂාපදයෝ අවදෙනතුමූ අෂ්ට ඞ්ග උපෝසථ ශීලයාගේ වශයෙන් සාමණේරයන්හා සාධාරණවූ වාහූ සදෘශවූවාහුවෙති අවශ්‍යතායෙහිවූ "ජාතරූප රජත පටිග්ගහ ණා වෙරමණී" ශික්ෂාපදය වනාහි භෙරණුන්වම නිත්‍යශීල වශ යෙන් සදෘශවනහෙයින් ගිහිගෙයි අඹුදරුවන් පොෂ්‍යයකරන්නාවූ ගෘහස්ථ උපාශක උපාශිකාවන්ට වනාහි උපොසථ ශීලයාගේ වශ යෙන් සාධාරණනොවෙයි පෙහෙවස් සමාදන්වූවාහට ජාතරූප රජත ශික්ෂාපදයත් සාධාරණයයි නොකියයුත්තේයි ජාතරූප ශික්ෂාපදනමේ උපෝසථ ශීලභාවයෙන් භෙරණුන්හා සමානව ගෘහස්ථයන් විසින් රැක්කයුතුයයි නොවදළේයි සාමණේර භෙර ණුන් විසින් ජාතරූප ශික්ෂාපදය නොරැක නොවිසිය යුත්තේය විශෙෂවශයෙන් ජාතරූප ශික්ෂාපදය භෙරණුන් විසින් නිත්‍ය ශීල වශයෙන් රැක්කයුත්තේයි. ගෘහස්ථ උපාශකයන් විසින් ශක්‍යති ඇතහොත් රක්ෂාකටයුත්තේය එනකුදුවුවත් ශක්‍යති නැතහොත් නොරැකීමෙන් ශීලීන්ට යම් පවක් වරදක් නොවේත්තේයි. ඛුද්දක පාඨ අටුවායෙහි ආ "පබ්බජිතං පන සාමණේරං නමේව විසෙසතුතං" යන පාඨයාගේ විස්තරගාවය මෙසේ දතයුත්තේයි.

ශක්‍යති ඇත්තාවූ ගෘහස්ථ උපාසකයන් විසින් දිවා රාත්‍රි මාස

සෘතුසංවත්සරාදිය නියමකොට මෙතෙක්කල් දශශීලය නොකඩ කොට රක්‍ෂාකරම්හයි අධිෂ්ඨානකොටහෝ ඊට වත් වඩා අධික වියයි ඇතහොත් ජීවිතාන්තය මුළුල්ලෙහි රක්‍ෂාකරම්හයි ඉටාගෙණහෝ රක්‍ෂා කටයුත්තේයි මෙසේ කාල පරිච්ඡේදයකොට රක්‍ෂාකරන්නා වූ දශශීලය නියම නිත්‍යශීලයයි කියාද දිවි ඇතිතෙක් රක්‍ෂාක රන්නාවූ ශීලය යම නිත්‍යශීලයයි කියාද ව්‍යවහාරකරත් මේ විප්‍ර කාර ශීලයම ඒ කියමිත කාලය මුළුල්ලෙහි අඛණ්ඩකොට රක්‍ෂා කරණබැවින් නිත්‍යශීලයයි කියති.

මෙහි දක්වනලද්දාවූ සියළු පාලි අර්ථකථා ටීකාවන්ගෙන් හකු ළුවා පිඩුකොට ගතයුතු අර්ථයනම් මේ ශාසනයෙහි ප්‍රව්‍රජ්‍යාවට ඇතුළත්වන්නාවූ ගෘහස්ථයන් විසින් සිපිල ධනිතාදි දශවිධ ව්‍යඤ්ජන සම්පත්තිය සම්පුණ්කොට ආචාර්‍ය්‍ය ශිෂ්‍ය දෙපක්‍ෂය විසින් උපුරුවිමෙන් සරණගිලය පිහිටීමහා සමගම සම්පණක් සංවර යන්ගෙන් සම්පූර්ණවූ සාමණේර ප්‍රව්‍රජ්‍යාව පිහිටන්නේය සාමණේ යන්ට දශශීලය ප්‍රභුණුව ඇත්තේවිනම් දශශීලය වෙනම සමාදන් නොකළේනමුදු සරණගිලයෙන්ම දශශීලයද පිහිටන්නේය ඒ සාම ණේරයන්ගේ සාමණේරභාවය යම්තාක්කල් පවත්නේනම් ඒ තාක්කල් දසශීලය නොකඩකොට රක්‍ෂාකටයුත්තේයි. ඔවුන්ගේ දශ ශීලය සමශීලයයි කියාද නිත්‍යශීලයයි කියාද ව්‍යවහාරකරත්.

ගෘහස්ථයන් විසින් උන්සාහ ඇතිතාක්කල් මුළුල්ලෙහි සාමණේ රයන්මෙන්ම දසශීලය සමාදන්ව රක්‍ෂාකටයුත්තේයි. මේහි යට දැක්වූ සූත්‍රාභිධම්මිනය පාලි අර්ථකථාවන්හි ගෘහස්ථයන් විසිනුදු දශශීලය රක්‍ෂා කටයුතුබවද ඒ රක්‍ෂාකිරීම උත්සාහ ඇතිතාක්කල් මුළුලෙලහි රක්‍ෂාකටයුතු බවද විවාද රහිතව ආයේසි.

ඛුද්දක පාඨ අට්ඨවණ්ණයහි ප්‍රකාශවූ ආදුන චිනිච්ඡයෙහි "ආදුන තොව යථා පුරිමානිව සාමණේරෙනවා උපාසකෙනවා සමාදිය නෙන්න සමාදිනානානි හොන්ති තථා එතානිපි" යන පාඨයෙන් මේ අර්ථය සුබොධවෙයි එහි අර්ථ මේසේසි—ආදුනතොව, ශික්‍ෂාපද සමාදන්ව ගැණීම වශයෙන්ද; පුරිමානි, පූර්වවූ පඤ්චශික්‍ෂා පදයෝ; සාමණේරෙනවා; හෙරණු විසින්හෝ; උපාසකෙනවා, උවසුමඩිකු වි සින්හෝ; සමාදියනෙන්න, සමාදන්වීමෙන්; සමාදිනනානිහොන්ති යථා, යම්සේ මොනවට සමාදන්වනලද්දාහුවෙද්ද; තථා, එපරි දෙදන්; එතානිපි, ඒ පඤ්චවිධවූ පඤ්ච ශික්‍ෂාපදයෝද; සාමණේරෙන වා. හෙරණෙකු විසින්හෝ; උපාසකෙනවා, උවසුවෙකු විසින්හෝ; සමාදියනෙන්න, සමාදන්වීමෙන්; සමාදිනනානි හොන්ති, මොන වට සමාදන්වන ලද්දාහුනම් වෙත් යනු මෙහි පදභාජනීයයි.

මෙහි භාවය සාමණේරී උපාසක යන දෙපක්‍ෂය විසින්ම "පාණා නිපාතා වෙරමණී ආදී,වූ සුරාමෙරය මජ්ජපමාදට්ඨානා වෙරමණී" අවසන්කොට ඇති ශික්‍ෂාපද පඤ්චකය යම්සේ සමාදන්වනලද්දා හුද එපරිදෙන්ම "විකාලභොජනා වෙරමණී" ශික්‍ෂාපදය ආදිකොට ඇත්තාවූ "ජාතරූප රජත පටිග්ගහණා වෙරමණී" ශික්‍ෂාපදය අවසන්කොට ඇත්තාවූ ශික්‍ෂාපද පඤ්චකයද සමාදන්වීමෙන් මොනවට සමාදන්වනලද්දාහුය යනාඑසි මෙසේ එළු කථාදියෙහි ආවාවූ පාළි පාඨයන්ගේ නියම භාවාර්ථය ගළපා තේරුම්ගතයුතුයි.

එසේහෙයින් විභඞ්ගයෙහි "උස්සාහෙසහි" යන පදයට හෙරණුන්මෙන් පෙර තම්බසුව තුබූ රන්රිදී මුතුමැණික් ආදියකෙරෙහි ආලය සිඳිමට උත්සාහ ඇත්කල්හිය යන සමඟරුන්ගේ අර්ථ යොජනාව විනය අර්ථකථාදිය ඉක්මවා සිටියේයි මෙසේ විනය මදඟනාව ඉක්මවා සිටි අර්ථයොජනාව ඇතම් දුෂ්ප්‍රාඥ පුද්ගලයෝ ගරුකොට සලකා තමන් සන්තකව තුබූ රන්රිදී මුතුමැණික් ආදියෙහි ආලයනොසිඳියහැකිබැවින් දසසිල් රක්‍ෂානොකොට මහත්වූ අර්ථසිද්ධියෙන් පිරිහෙති එහෙයින් "උස්සාහෙසහි, පඤ්චසීලයට වඩා අධිශීලයක් රක්‍ෂාකිරීමෙහි උත්සාහයක් ඇති කල්හි; දසවා, දශශීලයහෝ" යනුවෙන් සෙසු අටුවා ඒවනයන්ට සමානකොට අර්ථයොජනා කටයුතුයි එසේහෙයින් පූර්වයෙහි තමා සන්තකව තුබූ රන්රුවන් මිලමුදල් ආදියෙහි ආලයනොසිඳ දශසිල් සමාදන් වූවාට පසු යමෙකු විසින් තමන් උදෙසා පුදනලද රන්රුවන් මිල මුදල් ආදිය කයින්හෝ වචනයෙන්හෝ සිතින්හෝ නොඉවසී මෙන්හා පිළිනොගැණීමෙන්ද පරාමර්ශනය නොකිරීමෙන්ද විනයෙහි නිශ්‍රුන් උදෙසා පණවා වදාළ රූපිය පටිග්ගහණ ශික්‍ෂාපදයෙහි ප්‍රකාශවූ අඞ්ගයන් සම්පූර්ණකිරීමෙන් සාමණේරයන් විසිනුදු උපාසකයන් විසිනුදු ජාතරූප රජත ශික්‍ෂාපදය සමඟ දශශීලය රක්‍ෂා කටයුතුයි.

යට දැක්වූ විනය අර්ථ කථා කඞ්ඛාවිතරණී අර්ථ කථාවන්හි ආවාවූ ක්‍රමයෙන් ගිහිකාලයෙහි රන්රුවන් මුතුමැණික් ආදී වයතුවෙන් ආඪ්‍යවූ ගෘහපතියෙක්ම සාමණේර ප්‍රව්‍රජ්‍යා උපසම්පදා ශීලයන් රක්‍ෂාකිරීමට පැමිණෙන්නාවූ කල්හි ඒ රන්රිදී ආදිය මාගේ රන්රිදීයයි කල්පනාකළේනමුදු ඒ රන්රිදී ආදිය පිළිගැණීමකරණතාක් පරාමර්ශනයකරණතාක් ඇවතට පැමිණියේයයි නොකිය යුතුවාක්මෙන් ගිහිගෙයි වසන්නාවූ උපාසක උපාසිකාවන් විසිනුදු පූර්වයෙහි දසසීලය සමාදන්වීමට මත්තෙන් තම්තමන් සන්තකව

තුබූ රන්රිදී මිලමුදල් ආදිය මාසතු නොවේයයි ආලය නොසිදිය හැක්කේය එතකුදුවුවත් මේ ඒ රන්රුවන් මිලමුදල් ආදිය මාගේ සීලය රක්ෂාකරණතාක්කල් මුළුල්ලෙහි පිළිනොගණිමි පරාමර්ශිනය නොකරමියි සතිවුහත්කොටගණ එසේම දශශීලය රක්ෂාකරණ තාක් රන්රුවන් මිලමුදල් පිළිනැණිමි ඉවසිමි පරාමර්ශනයකිරීමාදි යෙන් තොරව දසසිල් රක්නවුන්ගේ ගිලහෙදය වන්නේයයි නොකියයුතු බව සථිර වශයෙන් සිත්හි තබාගතයුතුයි.

ඇතම් ධම්මධරයෝතුමු මේ ශාසනයෙහි විශාඛා මහා උපාසිකා අනේපිඩු මහසිටාණන් ආදීන්වැනි ශ්‍රද්ධාවන්ත උපාසක උපාසිකා වරු නොසිටියෝය ඔවුන් අෂ්ටාඞ්ගශීලයමුත් දශශීලය රක්ෂාකළ නියාවක් නොපෙණෙන්නේයයි උදාහරණ වශයෙන් දක්වන්නා හුවෙහි ඔවුන්ගේ දශශීලය නොරැකීමී මාත්‍රයක් දෙසනා ක්‍රමයට උදාහරණ වශයෙන් නොගතයුත්තේයි විශාඛා අනාථපිණ්ඩික චිත්‍රක ගෘහපති ආදි උපාසක උපාසිකාවෝතුමු මේ ශාසනයෙහි බුඩප්‍රමුඛ මහාසඞ්ඝයා වහන්සේ දන්දීමෙන් අග්‍රඵලප්පත්වූ දෘෂ්ටාපති හුවෙහි ඔවිහුතුමූ නිරන්තරයෙන් බුඩප්‍රමුඛ මහාසඞ්ඝයා වහන්සේ දන්දීමෙහිම ව්‍යාවෘතවූබැවින් රන්රිදී මුතුමැණික් මිල මුදල් පරිහරණයකිරීමෙන් වෙන්වය ඉතාඇතිබැවින් නිත්‍ය දශශීලය නොරක්කබව ප්‍රසිඩ කාරණයක්වනහුමුත් ඒ විශාඛා උපාසිකා අනාථපිණ්ඩිකාදීන්ට වඩා සියක්ගුණයක් රන්රිදී මිලමුදලින් ආඪ්‍යවූ සංයම රජු ආදී මහා ධනවන්තයෝ පවා දිවිහිමියෙන් රන් රිදී මිල මුදල් ආදියෙහි ආශාවහෝ යමාමි බවහෝ රාජ්‍ය සම්පත්හි යහෝ අත්හොඇරම නියම ශීල වශයෙන් දශශීලය රක්ෂාකළ පරිදි යට දක්වනලද කථාවස්තුන්හෙන් අවබෝධ කටයුතුයි.

උරුවෙල කාශ්‍යපාදි මහා ශ්‍රාවක බොධිසත්වවරයෝ පවා රාජ්‍ය සම්පත්හිය අත්නොහැරම දශශීලය රක්ෂාකළ පරිදි මනොරථ පූරණී අට්ඨකථායෙහි ආයේයි ඒ උරුවෙල කාශ්‍යපාදී ශ්‍රාවක බොධි සත්වයෝ තුමූ මේ මහා භද්‍රකල්පයට දෙසානුවක කල්පයෙහි පහළවූ බුඩසනම් බුදුන් සමයෙහි ඒ බුදුරජාණන් වහන්සේගේ සුළු මව්ව පුත්ව උන්වහන්සේගේ පියමහ රජ්ජට දව ඉපිද යෞවන වයසට පැමිණි කල්හි ප්‍රත්‍යන්ත ජනපදයෙහි සොරුන්ගේ උවදුරු සන්නවීමෙන් ඒ ප්‍රත්‍යන්තජනපදයෙහි මනුෂ්‍යයන්ට සොරුන්හෙන් මහත් හැහැට පැමිණි කල්හි මහරජුගේ නියෝගයෙන් පසල් දනව්වටගොස් යුඩකොට සොරුන් පලවාපියා පෙරළා නගරයට ආ කල් පිය මහරජු සතුටුව තොප ඉල්වන්නාවූ වරයක් දෙමියි ප්‍රති

ඤාතළබැව්න් එසේවීනම් නුඹවහන්සේ බුදුනුත් මාගේය ධර්මයත් මාගේය සඞ්ඝයාත් මාගේයයි අන්කිසිවෙකුට දන්දීමට අවකාශ නොතබා තනිවම දන්දෙන්නේය ඒ බුදුන් ප්‍රමුඛ මහසඞ්ඝයාට තේ මසක් දන්දීම පිණිස අපවරයක් දුනඋතැනැයි ඉල්වූ කල්හි ඒ වරය පමණක් නොඉල්වව අනික් කැමති වරයක් ගණුවයි කී කල්හි අනික්වරයකින් අඋට කමිනැත මේ වරයම දෙවැ යාඤාකළ කල්හි පළමු වරයක් දෙමැයි ප්‍රතිඤාකළබැව්න් තෙමසක් බුඩප්‍රමුඛ සඞ්ඝ යාට දන්දෙවූ වරය පූර්ණේය ඉක්බිති ඒ රාජකුමාරයන්ට මෙබදු අදහසක් උපන මේ තුන්මස මුළුල්ලෙහි භාග්‍යවතුන්වහන්සේට උපස්ථානකරන්නාවූ අපමිසින් සුදුසු පරිද්දෙන් උපස්ථාන කට යුතුයැ යි එක් අමාත්‍යයෙකු වසතු උපදවන තනතුරෙහි ප්‍රධාන කොට තබා එක් අමාත්‍යයෙකු අසවැය බලන තැනතුරෙහි තබා එක් අමාත්‍යයෙකු බුදුපාමොක් මහසඞ්ඝනට දන් වළඳවන කටයුත් තෙනී ප්‍රධානීයෙක්ගොට තබා තුමූ දසසිල් සමාදන්වගෙණ තුන් ම සක් මුර්ළුලුනි දහසිල් ශික්ෂාපදයන් රැකුණාකලාහුය ඒ අමාත්‍යයෝ තුන්දෙන අපගේ ගෞතම බුදුන් සමයෙහි සටකිසඳලද නසින් බිම්සාර රජුය විශාඛනම් උපාසකය රවඋපාල මහතෙරුන්ය යනමොවුන් වූවාහුය එසින් කීහ. අටුවායෙහි ''තෙ මෙවඋා වුත්තනයෙන කුපිතං පච්චන්තං වූපසමෙත්වා පිතුසන්තිකාවරං ලභිත්වා තෙමාසං දසබලං පටිජග්ගිංසුවා'නි වරං ගණ්හිංසු අථනෙසං එතදහොසි අම්හෙහි දසබලං පටිජග්ගනෙනාහි අතුච්ඡවිකං කාතුං වට්ටතීයි එකං අම්චිවං උපපාදකට්ඨානෙ ඨපෙත්වා එකං ආපවය ඡාතනකං කත්වා එකා බුඩපමුඛස්ස සඞ්ඝස්ස පරිවෙසකට්ඨානෙ ඨපෙත්වා අහන්නා නෙ දසසීලානි සමාදාය තෙසංසං සිඤ්ඛාපදානි රකිංසු මෙ තයෝ අම්චිවා නෙවඋා, වුත්තනයෙනෙව ඉමස්මිං බුඩුපපාදෙ බිම්බිසාර විසාඛ රවඋපාලාඉතා'' සනු ගිහ.....

තවද එම ශ්‍රාසනාම බුදුන් දවස රාහුල මහා ශ්‍රාවක බොධි සත්වාදි රාජකුමාරයෝද ඒ මහිඳුනම රජුට පුත්‍රව ඉපිද පසල්දනවිටෙහි සතුරන් සාධනපිණිසයෝ සතුරන් පරදවා ජයගෙණ ආකල්හි පෙරසේම මහරජුගෙන් වරගණුවීයි කී කල්හි පෙරසේම බුඩප්‍රමුඛ මහ සඞ්ඝයාට තෙඉසක් දන්දීමට වර දෙවයි යාඤාකොට ඔවුන්ගේ නැවත නැවත යාඤාකිරීම හෙතුකොටගෙණ සහපත දන්දෙවයි දරදී මෙසේ කීවාහුය ''තාතා අහං තුඹ්හාකං වරං දෙම් අථව බොපන බුඩානම්ඉ දුරාසදතාහානහි සිහාවිය එක වරං දසබලං පටිජග්ගථ තා, අපපමත්තා, හවෙය්‍යාථාති තෙ චින්තයිංසු අථෙහහි තථාගතං

පටිජග්ගාපෙතුං අනුච්ඡවිකං කත්වා පටිජග්ගිතුං වට්ටතීති සඤ්ඤී එකවිහාරද්වාරකොට්ඨකා දසසීලානි සමාදාය නිරාමිසං ගන්ධාහාරං සජ්ජුදාන ගහ පරිවිසනකෙ තයො පුරිසෙ යඤ්ඤංසු තෙසු එකෙ ධනඛණ්ඩෙ පාදකො අහොසි එකො ඡත්තකො එකො දූතසංවිධායකො තෙසං උප්පාදකො පච්චුපතෙන බිම්බිසාරො මහාරාජා ජාතො මාපකො ඉසා ඛෙ උපාසකා දූතසංවිධායකො රට්ඨපාලත්තෙරොති" යනු මෙතා රථපූරණී අට්ඨකතායි. එහි භාවය දරුවෙනි තොපට බුඩුවරයන් වහන්සෙ ට දන්දීම පිණිස වර දෙමි එතකුදුවුවත් බුදුවරයෝ වහන්සි ලංඝිය තොහැක්කාහුවෙති සිංහරාජයන්මෙන් හුදකලාව හැසිරෙන්නාහු වෙති එහෙයින් බුඩුපසථානකරන්නාවූ තෙපිද අප්‍රමාදවිය යයි කිහ ඉක්බිති ඒ රාජකුමාරයෝ තුවූ මෙසේ සිතූහ බුදුන්ව උපසථාන කරන්නාවූ අපවිසින් සුදුසු පරිදිකොට උපසථානකරන්නට වටතේ යයි සිතා සියල්ලම එක් අදහස් ඇතුව දසසිල් සමාදන්ව මත්සය මාංශාදිය අනුභවකිරීමෙන් තොරව ශාසනයන් වහන්සේට දන් පිළිගැන්වීමෙහි පුරුෂයන් තුන්දෙනෙකු නැබුවාහුය ඔවුන් අතු රෙන් එනෙක් ධනධාන්‍ය උපදවන්නෙක්වූයේය එනෙක් දූතශා ලාදිය මවන්නෙක්වූයේය එනෙක් දන්විධානකරන්නෙක්වූයේය ඔවුන් අතුරෙන් ධනධාන්‍ය උපදවන පුරුෂතෙමේ අපබුදුන් සම යෙහි බිම්බිසාර රජවූයේය දූතශාලාදිය මවන්නාවූ පුරුෂතෙමේ විශාඛනම් උපාසකයාවිය දන්විධානකරන්නාවූ පුරුෂතෙමේ රට්ඨ පාලනම් මහතෙරවිය මේ රාහුලබොධිසත්වයෝ එයින් සැව දෙවිලොව ඉපිද බොහෝකල් වැස කසුප්බුදුන් දවස කිකිනමී රජහව දුත්ත ව ඉපිද පඨවිඤ්ඣර කුමාරයයි ප්‍රසිඛ්‍යය ඉක්බිති ඒ පඨවිඤ්ඣර කුමාර නම්වූ උපරජතෙමේ ථූසනම් බුදුන්ව පන්සියයක් විහාරහා වන්සි යයක් පිරිවෙන්කරවා එයින් සැව දෙවිලොව ඉපිද අනුලොමප්‍රති ලොම වශයෙන් සපතකාම් සඛගීතයහිවැස අපබුදුන් දවස රාහුලනම් කුමාරව සසුන්වැද පැවිදිව රහත්ව මහා ශ්‍රාවක තනතුරු ලැබුවේ යයි දතයුතුයි.

උපාසකජනාලංකාරයෙහි "නිරුස්සාහෙන පන උපාසකෙන පඤ්චසීලානියෙව නිච්චසිලවසෙන රක්ඛිතබ්බානි උස්සාහවතාපන ඉමානි දසසික්ඛාපදානි නිච්චසීලවසෙන රක්ඛිතබ්බානීති වෙදිතබ්බානි තෙනවුත්තං පිසුඛ්මගෙහ සතිවා උස්සාහෙ දසාති" යන්හෙයි භාවය උත්සාහ අඩුවූ උපාසකයා විසින් පඤ්චශික්ෂා පදයන් නිත්‍ය ශීලවශයෙන් රක්කයුත්තාහුය උත්සාහවත්වූ උපාසකයා විසින් දශශික්ෂාපදයන් නිත්‍යශීල වශයෙන් රක්කයුත්තාය යනුයි.

එහෙයින් විශුද්ධිමාර්ගී අට්ඨකථායෙහි "උපාසකොපාසිකානං නිච්චසීල වසෙන පඤ්චසික්ඛාපදානි සතිවා උසෝසථඞ්ග වසෙන් අට්ඨානි ඉමානි ගහට්ඨ සීලානි නාම" යනු දක්වනලද්දේයයි කි නියාගියේය.

එම විශුද්ධිමාර්ගයෙහිම "පඤ්චමදුකෙ කාලපරිවෙච්ඡදං කත්වා සමා දිනනසීලං කාලපරියන්තං යාවජීවං සමාදියත්වා තථෙව පවත්තිතං ආපාණකොටිකන්ති එවං කාලපරියන්ත ආපාණ කොටික වසෙන දුවිධං" යනුවෙන් කාලයක් නියමකොට හෙවත් අසවල් කාලය දක්වා මේ ශීලය රක්ෂාකරම්හයි සිතින් නියමකොටගෙණ සමා දන්ව රක්ෂාකරන්නාවූ ශීලය කාල පරියන්ත ශීලනම් දිවිඇතිතාක් රක්ෂාකරම්හයි ඉවාගෙණ සමාදන්ව එසේම දිවිහිමියෙන් රක්ෂා කරන්නාවූ ශීලය ආපාණකොටික ශීල නම මෙසේ ශීලය දෙවැද රැම්වන්නේයි.

විශුද්ධිමාර්ගී ශීලනිදේශ පඤ්චමදුකයෙහි ආවාවූ මේ නියමයෙන් කාල නියමයක්කොටහෝ දිවිහිමියෙන්හෝ නොරැකනයුතු ශීල යක් මේ ශාසනයෙහි නැතිබව අවබොධකටයුතුයි. සාමණෙර උප සම්පද ශීලයන් රක්ෂාකිරීමට පැමිණෙන්නාවූ සියළුදෙනාම ආපා ණකොටික විශයෙන් රක්ෂාකරම්හයි සිතා සඟවැද පොරොන්දුව ඒ ශීලයන් පවා පක්ෂ මාස වශියන් රක්ෂාකොට ගිහි බවට පැමිණෙන්නාවූ සියදහස් ලක්ෂගණන් ගෘහස්ථ උපාසකයෝ ඇත් තාහුය ඔවුන්ගේ පළමු රක්ෂාකරණලද සීලයන් අප්‍රයොජනවූබවක් හෝ උත්සාහ ඇති පමණ කාලයක් මුළුල්ලෙහි සිල් රක්ෂාකිරී මෙන් අපායගතවනබවක්හෝ ආගම ධර්මයෙහි නොම ආයේයි.

මහා පරිනිර්වාණ සූත්‍ර අට්ඨවාවේ "යොපන තීසු සරණෙසු පඤ්චසු සිලෙසු දසසු සිලෙසු පරිපූරකාරිනොනි මාසස්ස අට්ඨ උපොසථෙ කරොති දානංදෙති ගන්ධපූජං මාලාපූජං කරොති මාතරං පිතරං උපට්ඨානි ධම්මිකෙ සමණබ්‍රාහ්මණෙ උපට්ඨානි අයං ධම්මානුධම්ම පටිපන්නො නාම උපාසිකායපි එසෙවනයෙ" යනුවෙන් ආවාවූ පාඨයෙහි භාවය යම් උපාසකයෙක්තෙමේ තුන්සරණයෙහිහෝ පඤ්චශීලයෙහිහෝ දශශීලයෙහිහෝ සම්පූර්ණකාරිවේද මසකට අට වාරයක් පෙහෙවස් රක්නේවේද දන්දේද සුවඳමල් සුවඳදුම්විල වුන් ආදියෙන් රත්නත්‍රය පුදන්නේවේද මව්පියන්ට උපස්ථාන කෙරේද ධාර්මික මහණ බමුණන්ට අත්පාමෙහෙකිරීමෙන් උපස්ථා න කෙරේද මේබදු සවභාව ඇත්තාවූ උපාසකතෙමේ ධම්මානුධම්ම ප්‍රතිපන්නයෙකි පිළිපන් උපාසකනමවෙයි උපාසිකාවද මේ ක්‍රම

යෙන්ම යොදුගනයුතුවේයි මේ පාඨයෙහි ආවාවූ සරණශීලය නිත්‍ය
ශීල වශයෙනුත් සෙසු දශශීල උපෝෂථ ශීලයෝද දන්දීම් මල්
පහන් පිදීම් මච්චිය උපහාන ශ්‍රමණබ්‍රාහ්මණ උපස්ථානයන් ශක්‍ති
ඇතිකල්හිද පිරියයුතු රැකියයුතුබව සුදුසු පරිද්දෙන් යොදු අයුරු
ගතයුතුයි.

යම්කිසි ශීලාදි ගුණධර්මයක් මෙපණකල්ව රැක්කයුතුය වෙයින්
අඩුවහෝ වැඩිවහෝ රක්‍ෂා නොකටයුතුය යන නියමයක් ආගව ධර්ම
යෙහි කිසි ප්‍රතිපත්තියක් සඳහා නියමනැති බව දතයුතුයි මේ ශාස
නයෙහි ශීලගුණයක්හෝ ධුතාඞ්ගගුණයක්හෝ මෙපමණ කාලයක්
නොරැක්කේවිනම් ඒ ශීලයහෝ ධුතාඞ්ගයහෝ නිෂ්ඵලවන්නේය
අපායට හෙතුවන්නේය යන නියමයක් ආගව ධර්මයෙන් නොදක්
වියහැක්කේමැයි භික්‍ෂූන්ගේ පිරිවෙස් සුඛාත වත්මානත් ආදි
දණ්ඩවිනය කර්මයන් නියමිතකාලයක්ම පිරියයුත්තේය ඉන් අඩුව
හෝ වැඩිවහෝ නොරැක්කයුත්තේය යන නියමයක් ඇතත් අන්
කිසි ප්‍රතිපත්තියක්හෝ ශීල ධුතාඞ්ගාදියක්හෝ මෙයින් අඩුවහෝ
වැඩිවහෝ නොරැක්කයුතුයයි කියන්නම් අඩ උපොසථාදිය රක්‍ෂා
කොට ඉෂ්ටවිපාක නොලැබිය යුතුවේ.

පඤ්චශීලය උපාසකයන් විසින් නිරන්තරයෙන් රක්‍ෂාකටයුතු
බවත් සෙසු බ්‍රහ්මචරිය පඤ්චශීලය චිකාලභෝජන ෂට්ක ශීලය
අෂ්ටාඞ්ග උපොසථ ශීලය ආජීවාෂ්ටමක ශීලය නවාඞ්ගුපොසථශීලය
දශශීලය ගෘහයෝ සාධාරණවූ ධුතාඞ්ගයෝය සමථවිදර්ශනා භාවනා
වෝය යන ශීලධුත ව්‍රතාදීහු ගෘහයන්ට උත්සාහ ඇතිතාක්කල්
මුළුල්ලෙහි රක්‍ෂාකරන්නට අවකාශ ඇතිකොට භාග්‍යවතුන්වහන්
සේ විසින් පණවා වදාරණලද්දහුය.

එසේම අධිශීල සඞ්ඛ්‍යාත සාමණේරශීල උපසම්පදාශීලයන්හා
තෙලෝ ධුතාඞ්ගයන්ද සමසතළිස් සමථ භාවනාවන්හා ත්‍රිවිධ
විදර්ශනා භාවනාවන්ද උත්සාහ ඇතිතාක්කල් මුළුල්ලෙහි කැමති
පරිද්දෙන් රක්‍ෂාකරන්නටද ආගම ධර්මයෙහි නියමව ඇත්තේය
තවද එම ප්‍රතිසම්භිදාමාගී අටුවාවෙහිව "ඉමෙසු පඤ්චසු පරියන්තසු
සික්‍ඛාපද පරියන්තං කත්වා සමාදිනනං සීලං විනිඡ්ඡමනෙනවා
මරණෙනවා පටිප්පස්සම්භති කාලපරියන්තං කත්වා සමාදිනනං සීලං
තංතං කාලාතික්කමනෙන පටිප්පස්සම්භති" යන පාඨයෙන් යම් උ
පාසකයෙක්හෝ උපාසිකාවක්හෝ එක්රැයක් එක්දවාලක් එක්දව
සක් දෙදවසක් තුන්දවසක්හෝ ඉන් වැඩිකාලයක්හෝ සිල් රක්‍ෂා
කරම්හයි ඉටාගෙණ සිල් සමාදන්වීද මෙබඳු ශීලය කාලපරිච්ඡින්න

ශීල නම දිවිහිමිකොට රක්ෂාකරමිහයි ඉවාහෙණ සමාදන්වන්නාවූ ශීලය ශික්ෂාපද පඤ්චනා ශීලනම මේ දෙවැදෑරුම් පඤ්චනා ශීලයන් අතුරෙන් ශික්ෂාපදය අවසන්කොට සමාදන්වූ ශීලය ඒ ඒ ශික්ෂාපදය ඉක්මවීමෙන්හෝ කාලත්‍රියාවෙන්හෝ ප්‍රතිප්‍රශ්‍රබ්ධන සඛ්‍යාතවූ සන්සිඳීමවන්නේය දිවා රාත්‍රි දිවස පක්ෂ මාස ඍතු සන්වත්සරාදි කාලනියමකොට සමාදන්වන්නාවූ ශීලය ඒ කාලය ගෙවී මෙන් සන්සිඳෙන්නේයි මේ කාලයෙහි අටසිල් සමාදන්වන්නාවූ උපාසක උපාසිකාවන්විසින් "ඉමඤ්ච රත්තිං ඉමඤ්ච දිවසං උපොසථං උපවසාමි" සනුවෙන් නියමකොට සමාදන්වන ශීලය ඒ දවස ඉතවූ කල්හි හෙවත් පසුවදා උදැසන සිල් මිදෙමිනයි කියා පඤ්ච ශීලය සමාදන්වන නුවුන් උපොසථ ශීලය දින උපොසථයබැවින් ඒ දවස සම්පුණීවීමහා සමග සවයං ප්‍රතිප්‍රශ්‍රම්භනයවන්නේයි හෙවත් ආහනනුක වශයෙන් ගත් අඞ්ගඛසීලය නිවීගොස් ප්‍රකෘතියෙන් රක්ෂාකරන්නාවූ පඤ්චශීල මාත්‍රයක්ම අවශිෂ්ට වන්නේයි.

තවද මෙම ලක්දිව පුලත්තිපුරයෙහි මහා ජෙතවන විහාරාධිවාසිවූ සාරිපුත්‍රාදිපනී විනය විකා අසිතව අඞ්ගුත්තර ටීකාදී ප්‍රශස්ත ග්‍රන්ථ ඝන්නේ කතීෘභූතවූ ත්‍රිපිටකධාරීවූ මහාශාරිපුත්‍රසථවිරපාදයන්විසින් රචනාකරණලද "පටිපත්තිදීපනී" නම් ධම්සඞ්ග්‍රහයෙහි "තම්පනෙතං දුවිධා නිච්චසීලං උපොසථසීලඤහි තත්‍ථ නිච්චසීලං නාම කාල පරිවෙජදංවා ආපාණකොටිකංවා කත්වා සබ්බකාලං රක්ඛිතබ්බාති පඤ්චසික්ඛාපදානි" සනුහා "සරණ ගමන පුබ්බකං සීල සමාදානං පුජ්ජතෙව සමාදියන්තෙන පන සීල ලක්ඛණඤ්ඤූනෝ භික්ඛුස්ස වා භික්ඛුනියාවා උපාසකස්සවා උපාසිකායවා සන්තිකෙ සත්ථරිගාර වා උපපාදෙත්වා පසාද සොම්මහදය නයනෙන අජ්ජදිවසතනිවා අජ්ජ ආදිං කත්වා ඉමස්මිං පකෙඛ මාසෙ උතුමහි සංවච්ඡරෙයිවා කාලපරිවෙජදං කත්වාවා සතිවා උස්සාහෙ ආපාණ කොටිකන්ති සීලදූසකෙන වුත්තනයිනා ඒත්වා නිච්චසීලවසෙන පඤ්චසික්ඛා පදානි සමාදියාමිති එකතෝ සමාදාය පුන පවෙචකං පාණාති පාතාවෙරමණී සික්ඛාපදං සමාදියාමි අදිනාදානා පෙ කා මෙ සු පෙ මුසාවාදා පෙ සුරාමෙරය පෙ සමාදියාමි ති ඨථාපාලියාවා පාලිනිං අජ්ඣත්තෙන්න සකසක භාසාය වවිහෙදං කත්වා සමාදාතබ්බා" යනුදැන්වනලදී මෙහි භාවය ඒ ශීලය වනාහි නිත්‍ය ශීලය උපොසථසීලයයි දෙවැදෑරුම්වන්නේය ඒ දෙවැදෑරුම් ශීලයන් අතුරෙන් කාලනියමයක්නොකොට දිවි ඇතිතාක් රක්ෂාකරන්නෙමියි සිතා සමාදන්ව සියළු කල්හි

රැක්කයුතුවූ පඤ්චශීලාදියෝ නිත්‍යශීල නම පොහෝ දවස්හි සමාදන්වගෙණ රක්ෂාකරන්නාවූ ශීලය උපොසථශීලනම්වන්නේයි මීමසින් යම්කාලයක් නියමකොට භවත් පස්ස මාස සෘතු සංවත්ස රාදිකාලයක් නියමකොට සමාදන්වූ සීලය ඒකාලය මුළුලෙලහි නිර තුරු රක්ෂාකිරීම නිත්‍යශීලයයි කියනි කාලපරිච්ඡේදයකොට රක්ෂා කරන්නාවූ ශීලය නිත්‍යශීලයයි කියනුම්ස ආපාණ කොටික වශ යෙන් හෙවත් දිවිහිමකොට රක්ෂාකරම් සිතා සමාදන්වූ ශීලය නිත්‍යශීලයයි නොකියන බව ආපාණ කොටික ශබ්දයෙන් හැඟේ.

ඊට අනතුරුව සාමාන්‍යයෙන් සීල සමාදාන ක්‍රමය මෙසේ දක් වයි ඒ කෙසේදයන්? සිල් සමාදන්වන කල්හි සරණ ගමනය පෙර ටකොට සිල් සමාදන්වීම යෙදෙන්හේතැයි ඒ සිල් සමාදන්වන උපාසක උපාසිකාවන් විසින් සිල ලක්ෂණ දන්නාවූ භික්ෂුවක්හෝ භික්ෂුණියක්හෝ උපාසකයෙක්හෝ උපාසිකාවක්හෝ සමීපයෙහි අඩිජණුකව උක්කුටිකයෙන් හිඳ බබාඤ්ජලීව ශාස්තෘන්කෙරෙහි ගෞරව උපදවා හෙවත් සකල බුද්ධගුණ සමූහය සංක්ෂේපයෙන් හකුළුවා බ්‍රහ්මායු බ්‍රාහ්මණාදි උත්තමයන් විසින් බුදිසොත්‍රකළාවූ "නමොතස්ස භගවතෝ අරහතෝ සම්මාසම්බුද්ධස්ස" යන මහා න මස්කාර පාඨය තුන්යළක් කියා රත්නත්‍රයෙහි පැහැදීමෙන් සෞ ම්‍යවූ මනනුවන් ඇත්තහුවිසින් අද දවසහෝ අදපටන් මේ පක්ෂය මාසය සෘතුව අවුරුද්දමුළුලෙලහිහෝ නිරන්තරයෙන් රක්ෂාකරම් හයි කාලපරිච්ඡේදයකොටහෝ උත්සාහ ඇත්තේවිනම් දිවිහිම් කොටහෝ රක්ෂාකරම්හයි සිතින් ඉටාගෙණ සිල්දෙන්නහු විසින් කියනලද ක්‍රමයෙන් කියා "නිත්‍යශීලවශයෙන් පඤ්චශික්ෂාපදයන් සමාදන්වෙමි"හි එකදට එකම වචනයෙන්හෝ සමාදන්වගෙණ නැවත දළනිකරණය පිණිස එකෙකී ශික්ෂාපදයක් "පාණාතිපාතා වෙරමණි සික්ඛාපදං සමාදියාමි" යනාදීන් ශික්ෂාපද පඤ්චකය පාලියෙහි ආ නයින් කියාහෝ පාලිභාෂාව නොදන්නහු විසින් අඩික දමිළ සිංහලාදි තමතමන්ගේ ව්‍යවහාර භාෂාවෙන්හෝ වාක්භෙදයකොට සමාදන්වියයුත්තේයයි දක්වනලදී මේ පාඨ යෙන් එක්දිනක්හෝ ඉන් වැඩිකාලයක්හෝ වෙන්කොට සමාදන් වන්නාවූ ශීලය නිත්‍යශීලයයි කියාද දිවිහිමකොට රකිම්හයි ඉටා සමාදන්වන ශීලය ආපාණකොටික ශීලයයි කියාද හතයුතුබව පෙණේ. මෙසේ සමාදන්වන්නාවූ ගෘහස්ථ ශීලයන් පාලිභාෂාවෙන් හෝ පාලිභාෂාව නොදන්නාවුන් විසින් තමතමන්ගේ භාෂාවෙන් හෝ සරණසීලාදිය සමාදන්වියයුතුබවද සාමණේර සාමණේරීන්

ගේ සරණගිලිමාත්‍රයක් සිදීල ධනිතාදි දසවිධ ව්‍යඤ්ජන සම්පත්තිය සම්පූර්ණකොට නිරාහතිතානන්ත මකාරාන්ත වශයෙන් දෙවරක් යථා පරිපාටියෙන් ආචාර්‍ය ශිෂ්‍ය දෙපක්ෂය විසින් දියයුතුබවහා ගත් යුතුබවද මේ ශාසනයෙහි අක්ෂරශුද්ධිය සම්පූර්ණකොට මේ සරණ ගිලිමාත්‍රයක්ම උභතොශුද්ධියෙන් පිහිටනබවද උපසම්පදාදි විනය කර්මකරණ කාලයෙහි එකතොශුද්ධියෙන් හෙවත් කර්මවාරීන්ගේ අක්ෂරශුද්ධියෙන්ම කර්මසිද්ධිවනබවද අවබොධ කටයුතුයි.

එම පරිපත්තිදීපනියෙහිම "නනුවසතිවා උස්සාහෙ දසපිහි අට්ඨ කථායං වචනතෝ දසපි සික්ඛාපදානි නිච්චසීලවසෙන සමාදියිත්වා රක්ඛිතබ්බානි යෙව අථකසමා පඤ්චසික්ඛා පදානි වුත්තානීනි සච්චං රක්ඛිතබ්බානි යෙව තථා විධෙන උස්සාහවතා ඉධ පන ගිහිකම්මං විවාරෙන්තස්ස ජාතරූප රජත පටිග්ගහණ පච්චෙක්ඛණං භාරියතෝ මඤ්ඤමානස්ස උපාසකස්සවසෙන පඤ්චව සික්ඛාපදානිවුත්තානි තානිහි න කෙනචි රක්ඛිතුං න සුකරානිති—අථවා ආදිකම්මිකස්ස උපාසකස්සවසෙන පඤ්චව වුත්තානි සොහි දසසික්ඛාපදානි අඛණ්ඩිතබ්බානීති ඛණ්ඩනෙ ආදීනවං දස්සන්තා වුච්චමානෝ සම්භන්නෝ වෙසිතංව්‍ය අත්තානං මඤ්ඤමානෝ න කිඤ්චි රක්ඛිතුං උස්සාහෙය්‍ය රක්ඛනෙනාවා සික්ඛාපදභෙදං පාපුණෙය්‍ය තස්මා තස්ස ඔතරණත්ථං පඤ්චවවුත්තානීනි" යනු දක්වනලදී විශුද්ධිමාර්ග අට්ඨ කථාවෙහි උත්සාහ ඇතිකල්හි දශශික්ෂාපදයන් රක්ෂා කටයුතුයයි කී බැවින් දශශික්ෂාපදයන් නිත්‍යශීලවශයෙන් සම්පාදන්වගෙණ රක්ෂා කටයුත්තාහුමනොවේද? එසේ ඇතිකල්හි පඤ්ච ශික්ෂාපදයන් කුමක්හෙයින් කියනලද්දහුදැයි? ප්‍රශ්නයක්වෙහි සැබැයි එබදු උත්සාහවන්තයෙකු විසින් රක්ෂාකටයුත්තාහුමැයි මෙතන්හි වනාහි ගිහිශ්‍රාවකයා කටයුතු කර්මාන්ත විචාරණයකරන්නාවූ රන් රුවන් මුතුමැණික් ප්‍රතිග්‍රහපරිභෝග බැරෑරුම් වශයෙන් කල්පනාකරන්නාවූ උපාසකයාගේ වශයෙන් පඤ්චශික්ෂා පදනෙනෙක්ම වදරණ ලද්දහුය ඒ පඤ්චශික්ෂා පදයෝවනාහි කිසිකෙනෙකු විසින් නොරැකිය හැකි නොවේත්මය නොහොත් ආදිකර්මිකවූ නොහොත් පළමුකොට පඤ්චශීලය රක්නට පටන්ගන්නාවූ උපාසකයාගේ වශයෙන් ශික්ෂාපද පසෙක්ම කියනලද්දහුය පළමුවකාට බුද්ධිය පිළිනන්නා ඒ උපාසකපෙදෙහි දශශික්ෂාපදයන් නොකඩකොට රැකගන්නාහුමයනි ශික්ෂාපද බිඳීමෙහි අයුක්ති දක්වා අවවාදකරණුලබනකල්හි ආත්මාබාධ භාත්පසින් වෙළනලද්දෙකුමෙන් තමා කල්පනාකරණුයේ කිසිවක් රක්ෂාකරන්නට නොම උත්සාහ

කරන්නේයි රක්ෂාකරන්නේහෝවීනම් ශික්ෂාපදභෙදයට පැමි
ණෙන්නේයි එසේහෙයින් එබදු උත්සාහවදවූවන්ට පළමුකොට
ශාසනොතරණය පිණිස ශික්ෂාපද පසෙක්ම වදුරණුලද්දාහුයයි දහ
යුතුයි.

එනිම "උපොසථඞ්ගවසෙන වුත්තානිපි අට්ඨසිකඛාපදානි නිච්ච
සීලවසෙන රක්ඛිතබ්බානි යෙව නෙසම්පි ඉධ අධිප්පෙතො වුත්තමෙව
කාරණං දට්ඨබ්බං කෙචි පන වදන්ති උපොසථඞ්ගවසෙන වුත්තා
නානාවිතානි අනුපොසථෙ රක්ඛිතබ්බානි අට්ඨඞ්ගසමන්නාගතෙපි
නිච්චසීලවසෙන පඤ්චසික්ඛාපදානි එව සමාදියිතබ්බානි උපොසථෙ දසපි
වදන්නොති අට්ඨසික්ඛාපදං නිච්චසීලවසෙන රක්ඛිණං අට්ඨඞ්ගෙ
වුත්තමෙවාති තම්පනෙතං යසමා උපොසථදිවසතො අඤ්ඤදාපි
උපොසථඞ්ගවසෙන වුත්තාසික්ඛාපදානං සමාදාන රක්ඛණානි පඤ්ඤ
ඤාති තසමා න සාරතො පච්චෙතබ්බානි" යනු කියනලදි එසේ නා
මය උපොසථාඞ්ගවශයෙන් කියනලද්දවූද අෂ්ටශික්ෂාපදයෝ නි
ත්‍යශීලවශයෙන් රක්ෂාකුරුහුමැයි ඒ අෂ්ටශික්ෂාපදයන්ගේද
මෙහි අඞ්ගවශයෙන් කියනලද කාරණයම් දතයුත්නේය සම්භර
ආචාර්‍යවරයෝනුමු මේ අෂ්ටාඞ්ගශීලය උපොසථාඞ්ගවශයෙන් වදු
ළබැවින් මේ ශික්ෂාපදයෝ අවදෙහ වාතුද්දශී පංචදශී අෂ්ටමී
යන පොහෝදිනයක් නොවන්නාවූ දවස්හි හොරුක්කයුත්තාහු
යයි කියන් අටුවා ඇඟරත් විසිනුදු නිත්‍යශීලවශයෙන් පඤ්චශික්ෂා
පදයන් වදුරා උත්සාහ ඇතිකල්හි දශශික්ෂාපදයෝන් රක්කයුත්
තාහුයයි කියන්නවුන් විසින් අෂ්ටශික්ෂාපදයද නිත්‍යශීලවශයෙන්
රක්ෂාකිරීම අපිවශයෙන් කියනලද්දේවැයි එසේහෙයින් ඒ අෂ්ටා
ඞ්ගශීලය මහානි සමහොදරයන් පොහෝදවසින් අනික් දවස්හිද උ
පොසථාඞ්ගවශයෙන් වදුරණුලද්දාවූ ශික්ෂාපදයන් සමාදන්විමහා
රක්ෂාකිරීවද පැණෙන්නේය එසේහෙයින් අනුපොසථයෙනි හෙවත්
පොහොය නොවන්නාවූ දවස්හි අෂ්ටාඞ්ගශීලය නොරුක්නයුත්තා
හුය යන වාදය සාරවශයෙන් කලපනා නොකටයුත්තේයි.

එම ප්‍රකරණයෙහිම "හදන්ත ජෝතිපාලාචාර්‍යෙන හථා නිච්ච
සීල උපොසථ නියමාදිවසෙන පඤ්ච අට්ඨ දසවා සීලානි සමාදිය
න්නාසෙසහි වත්වා තසය අත්ථං වදන්තෙන වාසාදූන සථාසත්ති
එකංවා වෙදා සමාදියන්තයෙසනි සබ්බං සීලං චිකාපථියතීනි වුත්තං"
යනු කියනලදී මෙහි ආයුෂ්මත් ජෝතිපාලාචාර්‍යන් විසින් එ
සේම නිත්‍යශීල උපොසථශීල නියමිතශීලාදිවශයෙන් පඤ්චශීලයහෝ
අෂ්ටාඞ්ගශීලයහෝ දශශීලයයෝ සමාදන්වන්නහුගේයයි කියා

ඒ පාඨයාගේ අර්ථ කියන්නහු විසින් වාග්බදය කරණකොටගෙණ ශක්‍යයි. පරිද්දෙන් එකත්හෝ දෙකක්හෝ ශීලයන් හෙවත් ශික්ෂාපදයන් සමාදන්වන්නහුගේයයි සියළු ශීලයම විකල්පනය කරණලදී දේශයි කියනලදී.....

එහිම 'කිඤ්චාපථා න ලොකෙ විසුං ජනදිවසො නාම අත්ථි සත්ථ යන්ථ පන ලොකො ජනං අනුහොති සො සො ජනදිවසොති වුච්චති එවං නත්ථි ඉසාදිසු දාට්ඨපදුමයොච්ච විසුං උපොසථ දිවසො නාම අත්ථි යත්ථයත්ථ පන අත්ථකාමා උපොසථං උපවසන්ති තෙතෙ පඤ්ච ම ආදයො උපොසථ දිවසාති එවං එකං කාලං ධම්මෙඝා න චරිත ඛ්බානි වචන මාගම්ම සදා උපවසිතුකාමානං සබ්බපි උපොසථ දිවසා යෙවානි සබ්බදාපි රක්ඛිතබ්බමෙව උපොසථසීලං යථාහ.....

සුඛසස්සවෙ සදා ඵෙගු, සුඛස්සු පොසථො සදා
සුඛස්ස සුවි භූතස්ස, සදා සඤ්ඤතෙ වතන්ති.....

නිච්චුපොසථ සීලානම්පි ගහඨිඨ සීලත්තා නෙසු නෙ යංයං වීති ක්කමනහි තං තදෙව භින්දති අවසෙසං න භින්දති යතො නෙසං තං සමාදානමෙනෙව පුන පඤ්චඞ්ගිකත්තා අට්ඨඞ්ගිකත්තාංච සම්පා දෙති නහි නෙසං සාමණෙරානං මිව එකයම්පි භින්නන සබ්බානිපි භින්නානි හොන්ති" යනු කිහ.....

මෙහි භාවය වැලිදු යම්සේ ලොකයෙහි සැනකෙළිදිනයයි නම්වූ දවසක් නැත්තේවේද සමයම් තැනෙක ලොකවාසී සත්වතෙම් සැනකෙළි උත්සව ප්‍රීතිය අනුභවකෙරේද ඒඒ දවස සැනකෙළි දවසයයි කියනුලැබේද එපරිද්දෙන්ම මාසාදියෙහි පැළඳිය ආදීන් මෙන් වෙනම පොහෝ දවසක්නම් නැත්තේමය යම්යම් කලෙක වනාහි වැඩකැමැති උපාසක උපාසිකාවෝතුමූ පෙහෙවස් වෙසෙද්ද විසේනිය ආදිවූ ඒඒ දවස්හු පොහෝ දවස්යයි කියනුලැබෙත් මෙසේ එක කාලයක් ධර්මයෙහි නොහැසිරියයුත්තේය යන නියම යක් හෙවත් අසවල් කාලයෙහි සුචරිත ක්‍රියාවෙහි නොහැසිරිය යුත්තේයයි නියමයක් නැතිබැවින් පෙහෙවස් වසනු කැමැත්ත වුන්ට සියළු දවස්හු පොහෝ දවස්මවෙත්නුයි උපොසථශීලය හැ මිකල්ම රක්කයුත්තේමැයි එහෙයින් වදාළහ කායවාක් කර්මයෙන් පිරිසිදුවූවාහට සියළුකල්හිම එකාකාරයෙන් ඒ ගුණ පෙරුම ලාසී හිඩිසනම්වෙයි එසේම පිරිසිදු සත්වයාහට හැමකල්ම පොහෝ දවසවෙයි කායවාඩ් මනස්යන ත්‍රිවිධදුරාචරයෙන් පිරිසිදුවූ පවිත්‍ර තම් ඇත්තාහට හැමකල්ම ව්‍රතසමාදානය සම්පූර්ණවෙයි යනුහාවයි

නිරන්තරයෙන් පෙහෙවස් රැකගන්නවුන්ට ගෘහස්ථශීලයන් බැවින් ඒ ශීලයන් අතුරෙන් ඒ සිල් රැකගන්නාවූ ශ්‍රාවකයෝ තුමූ යම්යම් ශික්ෂාපදයක් ඉක්මවද්ද ඒ ඒ ශික්ෂාපදයක්ම බිඳෙන්නේවෙයි නොඉක්මවූ ශික්ෂාපදය නොබිඳෙන්නේවෙයි යන්නෙහයි කින් ඒ ශ්‍රාවකයන්ගේ ඒ ගිහිනවූ ශික්ෂාපදය සමාදන්වීමෙන්ම නැවත පසළොස්සතියහෝ අටසතියහෝ සම්පූර්ණවෙයි ඒ ගෘහස්ථයන්ට වනාහි හෙරණුන්ටමෙන් එක් ශික්ෂාපදයක් බිඳුනාවූ කල්හි සියළු ශික්ෂාපදයෝම බිඳෙනලද්දාහු නොවෙත්මයැයි දතයුතුයි.

තවද එහිම "ඉදංනිස්ස නිවුත්තෝපාසථසීලෙසු ආදිම්හිවා අන්තිමා සික්ඛාපදං භින්නභාවහි තස්ස සීලං පරිපූතෙන භින්නසාටකෙ, විය බණ්ඩසීලා නාම" යනුවෙන් ඒ උපාසකයාගේ නිත්‍ය උපොසථශීලයට අයත් ශික්ෂාපදයන් අතුරෙන් මුලහෝ අගහෝ යම් ශික්ෂාපදයක් බිඳුනාලද්දේවේද ඔහුගේ ඒ ශීලය කෙළවර බිඳිගිය සළුවමෙන් බණ්ඩශීලයනම්වන්නේයයි කී බැවින් ගෘහස්ථයන් විසින් රක්ෂාකරණලද පඤ්චශීල අෂ්ටාඞ්ගශීල දශශීලයන් අතුරෙන් යම් ශීලයක යම් ශික්ෂාපදයක් බිඳුනේවීනම් ඒ ශික්ෂාපදයහැර සෙසු ශික්ෂාපදයන්ගේ බිඳීමක් නොවන්නබවත් නැවත ඒ ශික්ෂාපදය සමාදන්වීමෙන් ශීලය සම්පූර්ණවනබවත් පෙණේ.

බුරුම්දේශයෙහි ඉංග්‍රීසි ආණ්ඩුව විසිනුදු උසස්කොට සලකනු ලබන්නාවූ ත්‍රිපිටකධරයයි ව්‍යවහාරකරණුලබන්නවූ "ලේඞ්" නම් මෙකල ජීවමානවූ මහතෙරුන් විසින් ලියනලද පරමාර්ථධම්මවිභාවනී "පකති ගහට්ඨානං පන අට්ඨඞ්ගුපොසථසීලං අනිච්චං නාමතං භිභයං වුච්චතෙන නිච්චඛ්ඩිවට්ටති අනිච්චම්පි වට්ටති තථා දසසීලඤ්ච තාහි පකතිගහට්ඨානං අනිච්චසිලමේවාති" යනුවෙන් ප්‍රකෘති ගෘහස්ථයන්ට වනාහි අෂ්ටාඞ්ග උපොසථශීලය අනිත්‍යනාමවෙයි ඒ ශීලය වනාහි ඒ ගෘහස්ථයන්ට ක්ෂයනලද ක්‍රමයෙන් නිත්‍යවශයෙනුත් වටනේය අනිත්‍යවශයෙනුත් වටනේයි එසේම දශශීලයන් නිත්‍යවශයෙන්හා අනිත්‍යවශයෙන්ද වටනේයි ඒ දශශීලය වනාහි ප්‍රකෘති ගෘහස්ථයන්ට අනිත්‍යශීලයක්මවන්නේයි මුත්වහන්සේගේ මේ විනිශ්චය සියළු ත්‍රිපිටකය අලලා සාරාසීවිය හැකුළුවා කාරණලද විනිශ්චය සදෘශයි.

"පඤ්චසීල දසසීලානි සීලමේව පානිමොක්ඛ සංවරසීලං බුද්ධුප්පාදෙයෙව පවත්තනත්තා අධිසීලං චිත්තපකුසුදයපි එසසවතයෝ--අභිච්ච නිබ්බානං පත්ථයනෙතත සමාදිනනං පඤ්චසීලං දසසීලං අධිසීල

මෙවට සමාපත්තා අට්ඨසමාපත්තියොපි අධිවිත්තෙව සබ්බං
ලොකියං සීලං සීලමෙව ලොකුත්තරං අධිසීලං විත්ථාපත්තුසුසුපි
එසෙවත්තයෝ" යනු සංයුත්තත්ථ කථාපාඨයි මෙහි භාවය පඤ්චසීල්
දශශීලයෝ සාමාන්‍යශීලයෝමැයි ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය බු
ඩොන්පාදකාලයෙහිම පවත්නාසේහසින් අධිසීලනම විත්ථාපත්තුවන්
හිද මේ ක්‍රමය දනයුතුයි තවද නිවන් ප්‍රාර්ථනාකරන්නහු විසින්
සෝදත්විනලද පඤ්චශීලයෙහා දශශීලයද අධිශීලනම සම්වතට පැ
මිණී අෂ්ට සමාපත්තිහුද අධිචිත්තනම සියළුම ලෞකික ශීලය ශීල
නමවෙයි ලොකුත්තර ශීලය අධිශීලනම්වෙයි විත්ත ප්‍රඥාවෙහිද
මේ ක්‍රමය දනයුතුයි. අධිශීලය යනු අධිකශීලය ශ්‍රේෂ්ඨශීලය උතුම
ශීලය යනාර්ථයි.

අඞ්ගුත්තරනිකාය සත්තකනිපාතයෙහි "සත්තිමේභික්ඛවේ ධම්මා
උපාසකස්ස පරිහානාය සංවත්තන්ති කතමේ සත්ත භික්ඛු දස්සනං
හාපෙති ධම්මස්සවණං පච්ඡාජනි අධිසීලේ න සික්ඛති අප්පස්සාද බහු
ලොහොති භික්ඛූසු ථෙරෙසුවෙව මජ්ඣිමෙසුවව උපාගමිවිත්තෙහා
ධම්මං සුණාති රක්ඛිතචේසි ඉතොව බහිධා දක්ඛිණෙය්‍යං ගවෙසති
තත්ථව පුබ්බකාරං කරොති ඉමේවඛො භික්ඛවේ සත්තාධම්මා උපා
සකස්ස පරිහානාය සංවත්තන්ති."

මෙහි හාවය මෙසේයි මේ මතු දෙශනාකරණුලබන්නාවූ ධම්මයෝ
සත්දෙනෙක්තුමූ උපාසකයාගේහෝ උපාසක ධම්මයාගේහෝ පිරිහී
ම නොහොත් විනාශය පිණිස පවත්නාහුවෙති ඒ සත්ත ධම්මයෝ
සත්දෙනෙක්දයන්? භික්ෂූන්ඉඳියා දැකීම පිණිස ගමනාගමනයකිරීම
පිරිහේදු හෙවත් භික්ෂූන් දැන නිරතුරු අවවාද නොලබන්නේමවි
ද 1 සද්ධර්ම ශ්‍රවණයෙහි ප්‍රමාදවේදු 2 පඤ්චශීල දශශීල සඞ්ඛ්‍යාතවූ නි
වන් ප්‍රාර්ථනාකොට රැකගනුතුවූ උත්තමශීලයෙහි නොනික්මේද
හෙවත් නිත්‍ය පඤ්චශීලයහා උත්සාහ ඇති කල දශශීලයත් නො
රක්නේවේද 3 ඇත්තවූද මඩ්‍යමවූද නවකවූද සියළු භික්ෂූන් විෂ
යෙහි පැහැදීම බහුල නොකෙරේද හෙවත් මේ භික්ෂූන්වහන්සේ
ලා අවවාදානුශාසනී ලබා මහා සඞ්ඝ පරම්පරාව ගෙණයන්නාවූ භික්ෂූහු
යනි සිතා ආර්යයන් විෂයෙහිමෙන් පැහැදීම වඩනය නොකෙරේ
ද 4 නිතුකරණ අදහසින් සිදුරු සෙවීම පෙරටුකොටගෙණ බණ
අහන්නේවේද 5 මේ සාසනයෙන් පිටත්ගිවූ තීර්ථකාදීන්කෙරෙහි
දැහැමිණාකීයන් සොයාද නොවන් බාහිරවූ තීර්ථකයන් විෂයෙහි දැහැ
මිණාව මනත්ථල මහානිදංසකිරීමෙහි පොහොසත්වූ ආර්යයන් ඇ
තැයි ගෞරවණයකරන්නේවේද 6 ඒ බාහිර තීර්ථකාදීන්කෙරෙහි

පුබ්බාරාම සඞ්ඝාරාමවූ පළමුකොට දන්දීම්දියකෙරේද 7 මහණෙහි ඉඳුම් ධම්මයෝ සඳහන උපාසකයාගේනෝ උපාසක ධර්මය දේහෝ පිරිහීම හෙවත් විනාශයපිණිස පවත්නාහුය යනුයි. මේම සූත්‍ර අටුවායෙහි "භික්ඛූ දන්තකං භාපෙත්වා භික්ඛූසඞ්ඝං දන්තකාය ගමනං භාපෙති අධිසීලෙනි පඤ්චසීල දසසීල සඞ්ඛාතෙ උත්තරිසීලෙ හුනෙ, ඛණ්ඩානි ඉම්මෙහා සාසනා ඛණ්ඩා" යන පාඨයෙන් මේ දෙශනා පාලියෙහි අසියලයහි දැක්වූ ගෘහස්ථයන් විසින් නිත්‍යානුසිද්ධකවූ වශයෙන් රක්ෂාකටයුතුවූ පඤ්චශීල දශශීලයන් බවත් මේ සූත්‍රයෙන් වදාළේ ශීලයෙහි හොවිනැන් වෙළඳුවිකරම්න් අබුදුරුවන් ඇතුව වසන්නාවූ සාමාන්‍ය ගෘහස්ථයන් දවත් මනාසේම වැඩිහිත් මේ සූත්‍රයහි වදාළ කාෂණ පඤ්චයෙන් ඊට විපරීතවූ ගුණලපඤ්චයද අවබොධ කටයුතුයි ඒ එසේමැයි නිරන්තරයෙන් භික්ෂූන් දැකීමය නිරතුරු ධර්මශ්‍රවණයකිරීමය පඤ්චශීලයෙහි හික්මීමය යථෝචිත මධ්‍යම නවක භික්ෂූන් විෂයෙහි බහුළවශයෙන් පැහැදීමය නිදුකරණ අදහසින් තොරව සිදුරු නොසෙවීමෙන් ධර්මශ්‍රවණයකිරීමය බුදුශාසනයෙන් පිටත්හි අන්‍ය ශාස්තෘන් විෂයෙහි දක්ෂිණාදීන් නොසෙවීමය අන්‍ය තීර්ථිකයන් විෂයෙහි පළමුකොට සත්කාර නොකිරීමය යන සත්දැහැම් කාරණයෝ උපාසකයාගේනෝ උපාසක ධර්මයාගේනෝ අභිවෘද්ධිය හෙවපුලුන්‍යය පිණිස පවත්නාහුයයි දතයුතුයි.

තවද අඞ්ගුත්තරනිපාතයේ ආ විශාඛාපොසථ සූත්‍රයෙහි "උපක්කිලිට්ඨස්ස භික්ඛවෙ චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති කථඤ්ච භික්ඛවෙ උපක්කිලිට්ඨස්ස චිත්තස්ස උපක්කමෙන පරියොදපනා හොති ඉධ භික්ඛවෙ අරියසාවකො අත්තනො සීලානි අනුස්සරති අඛණ්ඩානි අච්ඡිද්‍රානි අසබලානි අකම්මාසානි භුජිස්සානි විඤ්ඤූප්පසත්ථානි අපරාමට්ඨානි සමාධි සංවත්තනිකානි තස්ස සීලං අනුස්සරතො චිත්තං පසීදති පාමුජ්ජං උප්පජ්ජති යෙවිත්‍තස්ස උපක්කිලෙසා තෙ පහීයන්ති" යනාදීන් සිලුපොසථ ශීලය වදාරණලදී මේම සූත්‍ර අටුවාව මෙසේයි "සීලුපොසථන්ති අත්තනො සීලානුස්සරණදීසෙනා උපවුත්ථො උපොසථො සීලුපොසථො නාම සීලන්ත සඞ්ඛ්‍යාති අත්තනො පඤ්චසීල දසසීලෙන සඞ්ඛං සීලං ආරබ්භාති පඤ්චසීල දසසීල මෙව ආරබ්භ" යනුයි.

එම්බා විශාඛා උපාසිකාවෙනි දශඋපක්ලෙසයන්ගෙන් කෙලෙසුනාවූ චිත්තයාගේ පිරිසිදුබව උපක්‍රමයෙන්වෙයි එම්බා විශාඛාවෙනි කෙලෙසුනාවූ චිත්තයාගේ පවිත්‍රභාවය උපක්‍රමයෙන් කෙසේවින්

නේදයත්? එම්බා විශාඛාවෙනි මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවකතෙමේ තමාගේ අඛණ්ඩවූ අවිජිදුවූ අසබලවූ අකල්මාෂවූ වාල්නුවූ ඤාණැත්තාන් විසින් පසස්නාලද්දාවූ තෘෂ්ණාදෘෂ්ටීන් විසින් අල්වා නොගන්නාලද්දාවූ විතෙතකාග්‍රතාව පිණිස පවත්නාවූ පැදුවශීල දශශීලයන් නැවත නැවත සිහිකරන්නේවේද ඒ පැදුවශීල දශශීලය නැවත නැවත මෙනෙහිකරන්නාවූ ඒ ආර්‍යශ්‍රාවකයාගේ සිත පහදින්නේය ප්‍රමුදිතභාවය උපදනේය සිත කිළුටුකරන්නාවූ යම් කෙලෙශයක් වේද්ද ඒ කෙලෙස් ප්‍රහීනවූවාහුවෙනි එම්බා විශාඛාවෙනි ඵලබැඳීමෙන් කිළුටුවූ කැවපත්තලයාගේ පවිත්‍රභාවය උපක්‍රමයෙන්වේය එම්බා විසාඛාවෙනි කිළුටුවූ කැවපත්තලයාගේ පවිත්‍රතාවය උපක්‍රමයෙන් කෙසේවන්නේදයත්? තෙලින්හැර අළුද රෝමයෙන්කල කොස්සද පුරුෂයාගේ ඊට සුදුසු ඉලිම් සඞ්ඛ්‍යාතවූ උත්සාහයද යනමේ තුන්ප්‍රකාර උපක්‍රමයනියා කිළුටුවූ කැවපත්තලයාගේ පවිත්‍රතාවයවේද එම්බා විසාඛාවෙනි එපරිද්දෙන්ම කිළුටුවූ චිත්තයාගේ පවිත්‍රතාවය උපක්‍රමයෙන්දන්නේය එම්බා විසාඛාවෙනි කිළුටුවූ චිත්තයාගේ පවිත්‍රතාවය උපක්‍රමය කරණ කොටගෙණ කෙසේවන්නේදයත්? එම්බා විසාඛාවෙනි මේ ශාසනයෙහි ආර්‍යශ්‍රාවකතෙමේ අඛණ්ඩාදි ගුණයෙන් පරිපූර්ණවූ තමාගේ පැදුවශීල දශශීලයන් නැවත නැවත මෙනෙහිකෙරේද මෙසේ ශීලය නැවත නැවත මෙනෙහිකරන්නාවූ ඒ ආර්‍යශ්‍රාවකයාගේ සිත පහදින්නේය ප්‍රමොදය උපදනේය චිත්තයාගේ යම් කෙලෙශයෙක් වේද්ද ඒ කෙලෙශයෝ ප්‍රහීනවූවාහුවෙති එම්බා විශාඛාවෙනි මේ ආර්‍යශ්‍රාවකතෙමේ පැදුවශීල දශශීල සඞ්ඛ්‍යාතවූ ශීලූපොසථය වසන්නේනම්වෙයි පැදුවශීල දශශීලයන්හා සමග වාසයකරන්නේ නම්වේයි ඒ ආර්‍යශ්‍රාවකයාගේ පැදුවශීල දශශීලය අරහයා සිත පහදින්නේය ප්‍රමොදය උපදනේය චිත්තය කෙලෙසන්නාවූ යම් උපක්ලෙශයෙක් වේද්ද ඒ උපක්ලෙශයෝ ප්‍රහීනවූවාහුවෙති එම්බා විශාඛාවෙනි මේසේ උපක්‍රමය කරණකොටගෙණ කිලිටුවූ චිත්තයාගේ පවිත්‍රබවවන්නේයයි වදාළේයි.....

මෙසේ මේ විශාඛූපොසථ සූත්‍රයෙහි පළමුකොට නිගණ්ඨයන්ගේ ගොශීල ගොවෘතාදිය දක්වා ඊට අනතුරුව ශාසනිකයන්ගේ බ්‍රහ්මූපොසථාදියද තදනන්තරව සිලූපොසථයද ඊට අනතුරුව අට්ඨඞ්ගූපොසථයද දක්වූබැවින් පැදුවශීල දශශීලයන්හා අෂ්ටාඞ්ග ශීලයද යන තුන්ප්‍රකාර ශීලයම අඹුදරුවන් ඉපි ශ්‍රෙයස්කරමින් ගිහිගෙයි වසන්නාවූ ගෘහස්ථයන්ගේ ශීලයන්ට වඩා මනාසේ වැටහේ

ඈසි වෙසින් විශුද්ධිමාගියෙහි අ වාවූ "නිදවසිලවසෙන පාතිමොක්ඛසංවරසීලසංඛාතා පදුනි සතිවා උසසාහෙ දස" යනාදි පාඨයට අනුව නිත්‍ය සීලවශ යෙන් පාතිමොක්ඛසංවර පදයහා උත්සාහ ඇතිතාක් කල් මුළුල්ලෙහි දශශීලයද පොහෝදවස අෂ්ටාඞ්ග උපොසථ ශීලයද රක්ෂාකිරීම ආර්‍ය්‍යශ්‍රාවකයාගේ නොහොත් රත්නත්‍රය සරණපරුයනවූ උපාසක උපාසිකාවන්ගේ චාරිත්‍රය බව පෙණේ.

තවද සියළුම ශීලයෝ හානභාගිය ස්ථිතිභාගිය වාසනාභාගිය විශෙෂභාගිය වශයෙන් සතරාකාරයයි දේශනා කෙරේදයත්?

"යොධසෙවති දුස්සීලෙ-සීලවන්තෙනසෙවති
වඩ්ඪතිඤාණතාමේ දෙසංනපටිසති අවිදදසු

මිච්ඡාසඞ්කප්ප බහුලෙසා-ඉන්ද්‍රියානි තරක්ඛති
ඒවරූපයසසෙ සීලං ජායතෙ හානභාගියං

යොපනභාවා මනොහොති-සීලසම්පහාරියා ඉධ
කම්මට්ඨානානු යොගම්හි න උප්පාදෙති මානසං

තුට්ඨිස්ස සීලමෙතෙන-අඤ්ඤතරස්ස උත්තරි
නස්සයං සීති භාගියං-සීලං භවති භික්ඛුනො

සම්පනභා සීලෝ ඝටති-සමාධත්ථාය යොපන
විසෙසභාගියං සීලං-නොහිඒතස්ස භික්ඛුනො

අතුට්ඨා සීල මෙතෙන-නිබ්බිදා යොනු යුඤ්ජති
හොති නිබ්බෙධ භාගියං-සීලමෙතස්ස භික්ඛුනොති

යනු විශුද්ධිමාගී අට්ඨවාසී මෙහි භාවය මේ ශාසනයෙහි යම් අඥාන උපාසකයෙක්හෝ අඥාන උපාසිකාකෙනෙක්හෝ දුසීල පුද්ගලයන් සෙවීනේවද ශීලවන්ත පුද්ගලයන් නොසෙවීනේවේද විසතු ඒහිපස්සිකයෙහි හෙවින් ශික්ෂාපද බිඳිමෙහි අයුතු නොකළ නේවේද මිථ්‍යාසංකල්ප සඞ්ඛ්‍යාත කාමවිතර්කාදීන් බහුලකොට ඇත්නේවේද පංචෙන්ද්‍රියයන් නොරක්නේවේද මෙබඳු සවභාව ඇත්තාවූ අඥාන උපාසකයාගේ ශීලය හානභාගිය ශීලනම් හෙවත් පිරිහීම භජනය කරන්නාවූ ශීලනම් කෙබඳු ශීලයක්වූවත් මෙසේ රක්නේනම් ඒ ශීලය පිරිහීම භජනයකරන්නාවූ ශීලයනමැයි දතයුතුයි.

මේ ශාසනයෙහි යම් තුවනැති උපාසකයෙක්හෝ උපාසිකාකෙනෙක්හෝ ශීලයාගේ සම්පුණ්ණත්වය හෙතුකොටගෙණ සතුටුසිත් ඇත්නේවද ඒ ශීලයාගේ සම්පුණ්ණකිරීමෙන් ඊත්තෙහි කෂීණයොනා

නුයොනයෙහි සින නුපදවාද ශීලමාත්‍රයකින් සතුටුවූ මිතුමත්තෙහි උත්සාහ නොඅඩන්නාවූ ඔහුගේ ඒ ශීලය සීනිභාගිය හෙවත් මිතුමත්තෙහි සමථ විදර්ශනාවන්ගේ නැවත්ම භජනයකරන්නාවූ ශීලය නම්වෙයි.

මේ ශාසනයෙහි යමෙක්තෙමේ ශීලසංවරයත් සම්පූර්ණකෙරේද සම්පූර්ණ සිල් ඇත්තාවූ ඒ සිලවතතෙමේ සම්මාධිය වඩනුපිණිස මිතුමත්තෙහි උත්සාහකෙරේද ඒ ශීලවතයාගේ ශීලය විශෙෂභාගිය හෙවත් රූප අරූපධ්‍යාන සඞ්ඛ්‍යාත අෂ්ටසමාපත්ති පඤ්චාභිඥා සඞ්ඛ්‍යාත විශෙෂ ගුණය භජනයකරණ ශීලයනම්වේ.

මේ ශාසනයෙහි යම් ශීලවතාකෙක්තෙමේ ශීලමාත්‍රයකින් සතුටුනොවී නිර්විද්‍ධුපසසනා සඞ්ඛ්‍යාත විදර්ශනාභාවනාවෙහි යෙදෙන්නේවේද ඒ සිල්වත්හුගේ ඒ ශීලය නිර්භෙදභාගිය හෙවත් නිර්භේදභාගිය භජනයකරන්නාවූ ශීලනම මේ ක්‍රමය නුවණින් විමසා බලනකල්හි පඤ්චශීලාදි යම් ශීලයක් භාවනාභාගිය වශයෙන් රක්‍ෂා කෙළේනම් ඒ ශීලය අවැඩ පිණිස අනර්ථ පිණිස පවත්නාබවමුත් සෙසු ශීලයන් තුන්දෙනම එසේ නොවනබව ඥානයේ අවබොධවන්නේයි මේනයින් කල්පනාකර බලනකල දශශීලයහෝ අනික් ශීලයක්හෝ උත්සාහ ඇතිතාක්කල් මුළුල්ලෙහි රක්‍ෂාකිරීමෙන් නිෂ්ප්‍රයෝජන නොවනබවද වැඩක්මිස අවැඩක් නොවනබවද අවබොධවේයි යම්නිසි ගුණධර්මයක් තමන්ට ශක්‍යති ඇතිතාක්කල් මුළුල්ලෙහි රක්‍ෂාකිරීම තඟනම්කොට නොවදුලබව සලකා බුඩොත්පාද අබුඩොත්පාද දෙකිහිම අවසිල් දසසිල් ආදි ශ්‍රෙෂ්ඨ ගුණධර්මයන් රක්‍ෂාකළාවූ ගවෙසීනම් මහා උපාසකයා ප්‍රධානකොට ඇති පන්සියයක් උපාසකවරුය ආනන්ද මහාශ්‍රාවක බොධිසත්ත්වරාජකුමාරය රාහුල මහාශ්‍රාවක බොධිසත්ව රාජකුමාරය උරුවෙලකාශ්‍යප ශ්‍රාවක බොධිසත්ව රාජකුමාරය නකුලමාතාවෝය නකුලපිතාය පුරාණ උපාසකයාය ඝටිකාර කුම්භකාරයාය උගහනම් ගෘහපතියාය බාර්මික උපාසකයා ප්‍රධානකොට ඇති පන්සියයක් උපාසකවරුය නන්දමාතා උපාසිකාවෝය ලක්දිව අනුලාදෙවි ප්‍රධානකොට ඇති දහසක් ස්ත්‍රීහුය යනාදී සාධු සත්පුරුෂ පණ්ඩිත උපාසක උපාසිකාවන්මෙන් සරණශීලය ගැණීමෙන් බෞඩ උපාසකභාවයට පැමිණ නිත්‍ය පඤ්චශීලය රක්‍ෂාකරමින් ශීලවතභාවයට පැමිණ ඉන් මත්තෙහි උත්සාහඇති පරිදි බ්‍රහ්මචරිය පඤ්චශීලය එකභක්තික ෂටික ශීලය ආජීවාෂ්ටමක ශීලය අෂ්ටාඞ්ග උපොෂථ ශීලය නවාංගුපොෂථ ශීලය දසසිලයද රක්‍ෂාකොට මත්තෙහිත් උත්සාහ ඇතහොත්

පොහෝ දවස්හි අධිශීලයක් සමාදන්ව වසන කාලයෙහි වාසනා භාග්‍යවන්ත පිණිස එකාශනිකාඞ්ගය පත්තපිණ්ඩිකාඞ්ගය යන අඞ්ග ඒක උපාසක උපාසිකාවන්ව සාධාරණබැඳින් ඒ අඞ්ගදෙකද රක්‍ෂා කටයුතුයි "නාහාරත්ථ හොජනං පරිභුඤ්ජිස්සාමි එකාසනිකඞ්ගං සමාදියාමි" යන වාක්‍යයෙන් සමාදන්ව ආහාරකෘත්‍යයකරන්නාවූ කල්හි තමන්ට වැඩිසිටිය ආවාසවාසීන් පැමිණි කල්හිත් නොනැගිටුවිය යුතු ආසනයක් සොයා වැඩහිඳ ආහාරයට අතතැබුවාසින් පසු නැවත නොනැගිට ආහාරවැලඳීම එකාශනිකාඞ්ගයයි "දුතියකභාජනං පටික්ඛිපාමි පත්තපිණ්ඩිකඞ්ගං සමාදියාමි" යන වාක්‍යයෙන් අඞ්ගය සමාදන්ව තමන්ට යැපෙන පමණ ආහාරය එක් වරම එක් භාජනයකින් පිළිගෙණ පිටතින් යමක් ආහාර බදුනටහෝ නොගෙණ ආහාර බදුනෙන් යමක් පිටතටහෝ නොදමා එක් භාජනයෙන්ම වැලඳීමෙන්හා ඉතුරුනොකොට වැලඳීමෙන්ද අඞ්ගය රක්‍ෂාකටයුතුයි එකට වැලඳීමෙන් පිළිකුල් උපදිනා මත්සෘමාංස කිරි පැණි ආදී ද්‍රව්‍ය පිළිනොගෙණ වැලඳීමට පටන්ගත් පසු උන් සපඇර මස් මාංශ කටු ආදියක් පවා පිටතට නොදමා ආහාර වැලඳීමෙන් අඞ්ගය රක්‍ෂාකටයුතුයි. ආහාරකෘත්‍යයට පළමු කටු පොතු ඇට ආදී නොකෑයුතු ද්‍රව්‍ය ඉවත්කළයුතුයි මේ ධුතාඞ්ගයන් රක්‍ෂාකිරීමෙහි ප්‍රයෝජනයනම් තෘෂ්ණාවට නිග්‍රහකිරීමයි. මෙසේ රක්‍ෂාකරණලද ශීලයාගේ ආනිසංසයෝනම් මෙසේයි

1 "තස්ස පාසාදිකං හොති-පත්තචීවර ධාරණං
පබ්බජ්ජා සඵලා තස්ස-යස්ස සීලං සුනිම්මලං

2 අත්තානුවාදාදි භයං-සුඛසීලස්ස භික්ඛුනෝ
අන්ධකාරංච්ය රවිං-භදයංනාව ඔහති

3 සීලසම්පත්තියා භික්ඛු-සොභමානෝ තපොවනෙ
පභාසම්පත්තියා චන්දෝ-ගගනෙවිය සොභති

4 කාෂගණෙඕපි පාමොජ්ජං-සීලවන්තස්ස භික්ඛුනෝ
කරොති අපි දෙවානං-සීලගණෙ කථාවකා

5 සබ්බෙසං ගන්ධ ජාතානං-සම්පත්තිං අභිභුය්‍යති
අවීඅාගි දිසා සබ්බා-සීලගන්ධෝ පවායති

6 අප්පකාපි කතාකාරා-සීලවන්තෝ මහප්ඵලා
හොන්ති සීලවාහොති-පුරාසඛාකාර භාජනං

7 සීලවතානං න බාධෙනති-ආසවා දිට්ඨ ධම්මිකා
සම්පරායික දුක්ඛානං-මූලංඛණති සීලවා

8 යා මනුස්සෙසු සම්පත්ති-යාව දෙවේසු සම්පදා
තසාසම්පතන සීලස්ස-ඉච්ඡිතොහොති දුල්ලභා

9 අච්චන්ත සන්තාපත්‍යා-අයං නිබ්බාන සම්පදා
මනොසම්පතන සීලස්ස-තමෙව අනුබාවති

10 සබ්බසම්පත්ති මූලම්හි-සීලම්හි ඉති පණ්ඩිතො
අනෙකාකාර ඔකාරං-ආනිසංසං විභාවයෙති

මෙහි භාවය මෙසේයි—යම් භික්ෂුවක්හුගේහෝ උපාසක උපාසිකා කෙනෙකුන්ගේහෝ ශීලය අතිශයින් නිම්ලවීනම් ඒ ශීලවන්තයා ගේ පාසිවරාවසථ ධාරීමහා ගමනාගමනාදි ඉරියව්පැවැත්වීමද රූපශොභාවද සිවුරු පරිසකාරාදියද ප්‍රශාදවහවෙයි එසින්ම ඒ ශීල වන්තයාගේ ප්‍රව්‍රජ්‍යාව සඵලවන්නියසි දතයුතුයි (1)

පිරිසිදු සිල් ඇත්තාවූ භික්ෂුහුගේ සිතට ආත්මානුවාද භය පරානු වාද භය දණ්ඩ භය දුගතිභය යන සතරාකාර භය නොබස්නේයි කුමක්හෙන්දයත්? අන්ධකාරය නසන්නාවූ සූයස්මාමෙනි (2)

තපස්වනයෙහි ශීලසම්පත්තියෙන් ශොභනාවූ භික්ෂුතෙමේ ප්‍රභා සම්පත්තියෙන් ආකාශයෙහි බබලන්නාවූ චන්ද්‍රයාමෙන් ශොභතේ සි (3)

සිල්වත් භික්ෂුහුගේ ශරීර ගන්ධය දෙවියන්ට පවා ප්‍රමොදයකර වයි ශීලගන්ධයෙහි ප්‍රමොදය කියතු කිම! (4)

ලොව ඇත්තාවූ කැතතුරි කපුරු ආදි සියළු සුගන්ධ ජාතීන්ගේ ගන්ධ සම්පත්තිය මැඩපවත්වා සියළු දශදිශාවෙහි නොහැපි ශීල සුගන්ධය හමන්නේසි (5)

සිල්වතුන්කෙරෙහි කරණලද්දාවූ සවල්පවූද උපකාරයෝ මහත්ඵල මහානිසංස ඵලවන්නාහුවෙති කුමක්හෙන්දයත්? යහපත් පෘථිවි ඔජාවෙන් යුක්තවූ කෙතෙහි වපුළ ධාන්‍යයෙන් ප්‍රමාණ නොකළැකි අස්වැන්න ලැබිමක්ද එක ඇවයක් සිටුවිමෙහ් සියක් අවුරුද්දක් මුළුල්ලෙහි ලක්ෂකොටිගණන් ඵල ලබාගැනීමක්දමෙනි එසේහෙයින් සිල්වන්තෙමේ පූජාසත්කාරයන්ට භාජනවෙයි (6)

දෘෂ්ට ධාර්මිකවූ හෙවත් මේ ආත්මයෙහි ඇත්තාවූ කාෂ්ඨාසවාදි චතුරාශ්‍රවයෝ ශීලවන්තයා නොපෙළන්මය සිල්වත්තෙමේ පරලොව ඉපදියයුතු දුකඛයන්ගේ මූල් උදුරා දමන්නේ වෙයි (7)

මනුෂ්‍යයන්කෙරෙහි චක්‍රවර්ත්ති ප්‍රභෘති රාජ්‍ය සම්පත්ති ආදිවූ යම් සම්පත්තියක්වේද දෙවියන්කෙරෙහි උපපාතික නන්දන කල්පවෘක්ෂ දිව්‍යප්සරාවන් ආදීවූ සිතුපැතුකෙණෙහි ඉසි වාසයෙක් නොකොව ලැබියයුතුවූ යම් සම්පත්තියක්වේද සම්පූර්ණ සිල් ඇත්තාවූ ඒ සම්පත් කැමති සීලවන්තයාහට ඒ සම්පත්තිය දුලීහ නොවන්නීය (8)


රාහාදි සියළු කෙලෙසුන්හා ජාත්‍යාදි සියළු දුක් අශේෂයින් සත් සිදුවන්නාවූ යම් නිර්වාණ සම්පත්තියක්වේද සම්පූර්ණ සිල් ඇත්තාවූ පුද්ගලයාගේ චිත්තය ඒ නිර්වාණ ධර්මය කරාම ධාවනයකරන්නේ සී (9)

පණ්ඩිතවූ සීලවන්ත පුද්ගලතෙමේ සකල සම්පත්තීන්ට මුල්වූ ශීලයෙහි මේ උක්තප්‍රකාරයෙන් නොයෙක් ආකාර ශ්‍රේෂ්ඨත්වා ආනිසංසයද ප්‍රකාශකරන්නේසී (10)

බුද්ධසාසන මහාසූරසෙනාපති යන රාජදත්තිය නාමෝපලක්ෂිතවූ ඇම්. ධම්මරත්න ලක්මිණිපහන් කතෘහූත පඬිතුමා විසින් ගෘහස්ථ සාධාරණවූ සියළු ශීලයන්ගේ විස්තර කථාව නොයෙක් පාළි අට්ඨ කථා ටීකානුටීකා ප්‍රකරණයන්ගෙන් සංක්ෂේපයෙන් ප්‍රථමභාග විතී යහාන යන භාණවයකින් සම්පූර්ණවූ මෙම ගිලනීදීපනත්වූ ධම් සඞ්ග්‍රහය රචනාකොට නිමවා මුද්‍රණයකරවන්නලදී.

සි ඞි ර ත්‍රු.

සබ්බ දානං ධම්ම දානං ජිනාති



නිබ්බාන පච්චයෝ හෝතු